# කොළඹ විශ්වවිද්‍යාලය
# ශ්‍රී ලංකාව

# වාර්ෂික වාර්තාව
# 2018

## අපගේ මෙහෙවර

**සමාජයේ අභිවෘද්ධිය උදෙසා අධ්‍යාපනය, පර්යේෂණ හා මානව හැකියාවන් සුපෝෂණය කිරීම සඳහා සිය පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වය මගින් ගෝලීයව විශිෂ්ට මධ්‍යස්ථානයක් වීම.**

## අපගේ මෙහෙවර

කර්මාන්ත හා ප්‍රජාව සමග සහයෝගීත්ව සහභාගීත්වය මගින් විශ්වවිද්‍යාලය තුළ හා ඉන් ඔබ්බට දැනුම අනාවරණය හා ව්‍යාප්ත කිරීම , නවෝත්පාදන වැඩිදියුණු කිරීම හා පෘථුල ගවේෂණාත්මක සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම

## උපකුලපතිතුමාගේ පණිවිඩය:



2018 වර්ෂය සඳහා වූ කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම මහත් ප්‍රීතියක් සහ අභිමානයක් සේ සලකමි.

2018 ටයිම්ස් උසස් අධ්‍යාපන විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් මගින් කොළඹ විශ්වවිද්‍යාලය ලොව ඉහලම විශ්ව විද්‍යාල 1000 අතරින් එකක් ලෙස තෝරා ගන්නා ලද බව සතුටින් දැනුම් දෙමි.

අධ්‍යයනය, පර්යේෂණය දැනුම් සම්ප්‍රේෂණය හා අදාළ ක්‍රියාකාරකම්වලට හිතකර පරිසරයක් කොළඹ විශ්වවිද්‍යාලය තුළ පැවති බව සඳහන් කළ යුතුය. අධ්‍යයන හා ඒකාබද්ධ සහයෝගිතා වැඩසටහන් ව්‍යාප්ත කිරීමට විදේශීය විශ්ව විද්‍යාල ගණනාවක් සමග අවබෝධතා ගිවිසුම් අත්සන් තබන ලදී. 2018 වර්ෂයේ මුල් භාගයේදී විශ්වවිද්‍යාලයීය තාක්ෂණ පීඨය හා හෙද පීඨය ස්ථාපිත කරන ලද අතර පීඨ දෙකටම අදාළ ශික්ෂණයන් හැදෑරීමට ශිෂ්‍යයෝ ඇතුළත් කර ගන්නා ලදහ.

විද්‍යා පීඨයේ තොරතුරු සේවා හා අධ්‍යයන කේන්ද්‍රය, විද්‍යා පීඨයේ ශිෂ්‍ය සේවා මධ්‍යස්ථානය සහ විද්‍යා පීඨයේ සංඛ්‍යා ලේඛන ගොඩනැගිල්ල වැනි ප්‍රධාන ඉදිකිරීම් කිහිපයක් සඳහා වර්ෂය තුළදී විශ්ව විද්‍යාලය විසින් මුල්ගල් තබන ලදි. කළමනාකරණ හා මූල්‍ය පීඨයේ බටහිර පර්යන්තය, තාක්ෂණ පීඨයේ ප්‍රධාන ගොඩනැගිලි සංකීර්ණය, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ සත්මහල් ගොඩනැගිල්ල, සායනික වෛද්‍ය විද්‍යා ගොඩනැගිලි සංකීර්ණය වැනි අනෙකුත් ගොඩනැගිලි කීපයක් වර්ෂය තුළ ඉදිකෙරෙමින් පැවතිණි.

විශ්වවිද්‍යාලයේ වාර්ෂික පර්යේෂණ සැසිවාරය 2018 නොවැම්බර් මස මුලදී කොළඹ විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විනි. එසේම සිදු කරන ලද ශාස්ත්‍රීය පර්යේෂණවල සොයාගැනීම් ගැන දැනුම ව්‍යාප්ත කිරීමට පීඨ/ ආයතන විසින් වෙනත් ජාත්‍යන්තර සම්මේලන කීපයක්ම සංවිධානය කරන ලදී. සාමාන්‍ය හා පශ්චාත් උපාධිධාරීන්ගේ උපාධි ප්‍රදානෝත්සව පිළිවෙලින් 2018 ජූලි හා නොවැම්බර් මාසවල උත්කර්ෂවත් අයුරින් පවත්වන ලදී.

අධ්‍යයන කටයුතු වලට අමතරව සිසුහු ක්‍රීඩා, විවාද, සෞන්දර්ය, සංස්කෘතික, හා ප්‍රජා මූලික වැඩසටහන් වැනි විෂය බාහිර සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් වල නිරත වූහ. 2018 අන්තර් විශ්වවිද්‍යාල ක්‍රීඩා උළෙලෙහි සමස්ත ශූරතාව කොළඹ විශ්වවිද්‍යාලය විසින් දිනා ගන්නා ලදී. කොළඹ විශ්ව විද්‍යාලය උසස් අධ්‍යාපන අමාත්‍යංශය සමඟ එක්ව ශ්‍රී ලාංකික විශ්ව විද්‍යාලයක් විසින් නිෂ්පාදනය කරන ලද ප්‍රථම බැලේ ඔපෙරාව වන "රාවණ: නොකී පුරාවත" ඉදිරිපත් කරන ලදී. මෙම බැලේ ඔපෙරාවේ සියලුම චරිත කොළඹ සරසවියේ උපාධි අපේක්ෂක සිසුන් විසින් ඉදිරිපත් කරන ලදී.

පර්යේෂණ ප්‍රවර්ධනය, පර්යේෂණ පැතිකඩ වැඩිදියුණු කිරීම, බාහිර ප්‍රජා පර්යේෂණ සහ කර්මාන්ත සහයෝගිතාව සම්බන්ධ කර ගැනීමෙන් විශ්ව විද්‍යාලයේ තත්ත්වය ඉහළ නැංවීමට අපි සමත්ව සිටිමු.

මේ සඳහා ආචාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන්ද ඇතුළුව විශ්වවිද්‍යාල ප්‍රජාවේ සියලුදෙනාම සක්‍රීයව දායකත්වය දැක්වූහ.

2018 ඵලදායි වසරක් කරගැනීම සඳහා දායක වූ පාලක සභාවට, සනාතන මණ්ඩලයට, ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරි ඇතුළු කොළඹ විශ්වවිද්‍යාලයේ සමස්ත කාර්ය මණ්ඩලයට මාගේ කෘතඥතාව පළ කිරීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක**
උපකුලපති/ කොළඹ විශ්වවිද්‍යාලය
2019 ජනවාරි

## 2018 - සුවිශේෂ සිදුවීම්

- කොළඹ විශ්ව විද්‍යාලය උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව ශ්‍රී ලාංකික විශ්ව විද්‍යාලයක් විසින් නිෂ්පාදනය කරන ලද ප්‍රථම බැලේ ඔපෙරාව වන "රාවණ: නොකී පුරාවත" ඉදිරිපත් කරන ලදී. මෙය 2018 ජනවාරි 05 වන දින විශ්වවිද්‍යාලයේ කුලපති ආචාර්ය ඔස්වල්ඩ් ගෝමිස් පියතුමන් හා උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක ඉදිරියේ රඟ දක්වන ලදී.

- " බිම් මට්ටමේ ව්‍යාපෘති සඳහා සහාය ප්‍රදාන" වැඩ සටහන යටතේ කොළඹ විශ්ව විද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ ජනමාධ්‍ය අධ්‍යයන අංශයට බහු කැමරා පද්ධතියක්, පශ්චාත් නිෂ්පාදන හා වර්ණ ශ්‍රේණිගත කිරීම් පහසුකම් වලින් සමන්විත ශ්‍රව්‍ය දෘෂ්‍ය ශබ්දාගාරයක් ස්ථාපිත කිරීමට ජපන් රජය විසින් රු.මි. 12 ක් ලබා දී ඇත. මෙමගින් අප විද්‍යාර්ථීන්ට තම විශේෂ ප්‍රාගුණ්‍යය සහිත විෂයයෙහි ප්‍රායෝගික පුහුණුව පිළිබඳ සංරචකය වැඩිදියුණු කර ගැනීමට දායකත්වය සැපයේ.

- චිකාගෝ විශ්වවිද්‍යාලයේ දේවධර්ම විද්‍යාලයේ (Divinity School) කණ්ඩායමක් බෞද්ධ අධ්‍යයන අංශයේ සහයෝගිතාවයෙන් 2018 පෙබරවාරි 16 හා 17 දිනවල කොළඹ විශ්වවිද්‍යාලයට පැමිණියහ.

- දේශගුණ විපර්යාස පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණය 2018 පෙබරවාරි මස 15 සිට 16 දක්වා පවත්වන ලදී. මෙහි ශාස්ත්‍රීය අනුග්‍රාහකත්වය ඇමරිකා එක්සත් ජනපදයේ කොලරාඩෝ ප්‍රාන්ත විශ්ව විද්‍යාලය සමග සහයෝගීව කොළඹ විශ්වවිද්‍යාලය විසින් ලබා දෙනු ලැබීය. ලෝකය පුරා රටවල් 20 කට අධික සංඛ්‍යාවක් නියෝජනය කරමින් සහභාගි වූ 100 දෙනෙකුට වැඩි පිරිසක් මෙම සම්මන්ත්‍රණයට සහභාගි වූහ.

- ලැට්වියාවේ අන්තර්ජාතික රිගා තාක්ෂණික විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය මණ්ඩපාධිපති මහාචාර්ය ඉගෞස් ටිපන්ස් මහතාගේ නායකත්වයෙන් යුත් නියෝජිත පිරිසක් 2018 ජනවාරි 26 වනදා කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා හමුවිය.

- චීනයේ බෙයිජිං විදේශ අධ්‍යයන විශ්ව විද්‍යාලයේ උප සභාපති මහාචාර්ය ජියා වෙන්ජින් 2018 මාර්තු 16 වනදා කොළඹ විශ්වවිද්‍යාලයට පැමිණියේය. මෙහිදී එතුමා විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක, ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපති මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා, කොළඹ විශ්වවිදලයේ කොන්ෆියුසියස් ආයතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය එම්. ධම්මජෝති හිමි සහ ජාත්‍යන්තර කාර්යාලයේ අධ්‍යක්ෂිකා ආචාර්ය කෝකිලා කෝනසිංහ යන මහත්ම මහත්මීන් හමුවිය. මෙහිදී විශ්ව විද්‍යාල අතර දැනට පවතින හා ඉදිරියේ ඇතිකර ගතහැකි ශාස්ත්‍රීය සහයෝගිතා පිළිබඳ සාකච්ඡා කරන ලදී.

- මාලඹේ පරිශ්‍රයේ පිහිටි තාක්ෂණ පීඨයේ විවෘත කිරීමේ උත්සවය 2018 මාර්තු මස 14 වන දින විශ්ව විද්‍යාලයේ උප කුලපති මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා, පීඨාධිපති මහාචාර්ය ජේ.කේ.ඩී. එස්. ජයනෙත්ති සහ පීඨයේ අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් සිදුවිය.

- කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ පෞද්ගලික හා තුලනාත්මක නීති අධ්‍යයන අංශය විසින් සංවිධානය කරන ලද 2018 කාන්තා දින සැමරුම් උත්සවය 2018 මාර්තු මස 8 වන දින බස්නාහිර පළාත් සෞන්දර්ය කේන්ද්‍රයේ "සමානාත්මතාවය උදෙසා කාන්තාව: ප්‍රගතිය උදෙසා බල කිරීම " යන තේමාව යටතේ පවත්වන ලදී. ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු විනිසුරු ගරු ශිරානි තිලකවර්ධන මැතිණිය ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගි වෙමින් මුඛ්‍ය දේශනය ඉදිරිපත් කළාය.

- එසෙක්ස් විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ඇන්තනි ෆෝස්ටර් හා හවුල්කාරත්වය පිළිබඳ පීඨාධිපති ඩොමිනික් මික්ල්රයිට් මහතා 2018 මාර්තු මස 2 වන දින කොළඹ විශ්වවිද්‍යාලයට පැමිණියහ.

- ප්‍රධාන පුස්තකාලයේ ස්ථාපිත කරන ලද දෘශ්‍යාබාධිත පරිශීලකයන් සඳහා වූ සම්පත් මධ්‍යස්ථානය 2018 පෙබරවාරි මස 23 වන දින විවෘත කරන ලදී. විශ්ව විද්‍යාලයේ උප කුලපති මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා ප්‍රධාන ආරාධිතයා ලෙස මෙම අවස්ථාවට සහභාගී විය.

- 2018 අප්‍රේල් 14- 15 දිනවල මැලේසියාවේ ක්වාලා ලාම්පූර් නුවර ජාත්‍යන්තර වෛද්‍ය විද්‍යාලයේ (IMU) පවත්වන ලද විශ්වීය විශ්වවිද්‍යාල වෛද්‍ය අභියෝග්‍යතාවයේ ප්‍රථම ස්ථානය කොළඹ විශ්වවිද්‍යාලයීය වෛද්‍ය

පීඨයේ කණ්ඩායමක් විසින් දිනා ගන්නා ලදී. මෙය පූර්ව සායනික හා සායනික යන දෙඅංශයෙහිම පෘථුල විෂය පථයක දැනුම් සමුදායක් මත පදනම් වූවකි.

- ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් තරංජිත් සිං සන්ධු මහතා විසින් " සබ් කා සාථ් සබ් කා විකාස් (එක්සත්ව ප්‍රගතිය කරා: ඉන්දීය අසල්වැසි ප්‍රමුඛ ප්‍රතිපත්තිය යටතේ ඉන්දු ලංකා සබඳතා " යන මැයෙන් 14 වන වාර්ෂික සුජාතා ජයවර්ධන අනුස්මරණ දේශනය 2018 අප්‍රේල් 3 වනදා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විනි.

- 2018 මාර්තු 29 වනදා සිට අප්‍රේල් 01 වනදා දක්වා උසස් අධ්‍යාපනය සඳහා වූ ICFAI පදනමෙහි අනුග්‍රහයෙන් ඉන්දියාවේ හයිද්‍රාබාද් නුවර පවත්වන ලද ශ්‍රී එන්.ජේ. යසස්වි අනුස්මරණ ආසියානු පැසිපික් සමාකරණ විනිශ්චය සභා (Moot Court ) තරඟාවලියෙහි ශූරතාවය කොළඹ විශ්වවිද්‍යාලයීය නීති පීඨයේ කණ්ඩායමක් විසින් දිනා ගන්නා ලදී.

- 2018 ආසියානු පැසිපික් සම්මේලනයේ සමාරම්භක උත්සවය 2018 මාර්තු මස 19 වන දින කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගනක පාසලේ ශ්‍රවනාගාරයේදී පැවැත්විණි. උත්සවය නිල වශයෙන් ආරම්භ කරන ලද්දේ ව්‍යාපෘති කළමනාකරණ, තරුණ කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍ය සාගල රත්නායක මහතා විසිනි.

- තායිවානයේ තායිපේ වෛද්‍ය විද්‍යාලයේ නියෝජිත පිරිසක් කොළඹ විශ්ව විද්‍යාලයේ උප කුලපති මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක, වෛද්‍ය පීඨයේ මහාචාර්ය ඉන්දික කරුණාතිලක හා ජාත්‍යන්තර කාර්යාලයේ අධ්‍යක්ෂිකා ආචාර්ය කෝකිලා කෝනසිංහ යන මහත්ම මහත්මීන් හමුවිය. මෙහිදී විශ්ව විද්‍යාල අතර දැනට පවතින ශාස්ත්‍රීය සහයෝගිතා පිළිබඳ සාකච්ඡා කරන ලදී.

- නොබෙල් ත්‍යාගලාභී රවීන්ද්‍රනාත් තාගෝර්තුමන්ගේ 157 වන ජන්මදින සැමරීම් වස් 2018 මැයි මස 08 වන දින පෙ.ව. 9.30 ට කොළඹ විශ්ව විද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලයේ ස්ථාපිත රවීන්ද්‍රනාත් තාගෝර්තුමන්ගේ උඩුකය පිළිරුවට මල්දම් පළඳවන ලදී. ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් තරංජිත් සිං සන්ධු මහතා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස මෙම අවස්ථාවට සහභාගී විය.

- කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ නැගෙනහිර පර්යන්ත ගොඩනැගිල්ල විවෘත කිරීමේ උත්සවය 2018 මැයි මස 10 වන දින කොළඹ විශ්ව විද්‍යාලයේ උප කුලපති මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා හා අනෙකුත් විශ්වවිද්‍යාලීය කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

- ඔස්ට්‍රේලියාවේ ග්‍රිෆිත් විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පාසලේ පීඨාධිපතිතුමාගේ නායකත්වයෙන් යුත් නියෝජිත පිරිසක් ජූනි 05 වනදා කොළඹ විශ්වවිද්‍යාලයට පැමිණියහ. ග්‍රිෆිත් විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පාසල නියෝජනය කරමින් පීඨාධිපතිතුමා සමග මහාචාර්ය ජයතිලක බණ්ඩාර, මහාචාර්ය පීටර් වුඩ්ස් හා ආචාර්ය කාංචන කාරියවසම් මීට සහභාගි වූහ. මේ හමුවේදී විශ්ව විද්‍යාල අතර ඇති කරගතහැකි අධ්‍යයන සහයෝගිතාවයන් ගැන අවධානය යොමුවිය.

- ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන් දෙදෙනෙකු වන භෞතික විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය මහේෂ් එදිරිසිංහ හා භෞතික විද්‍යා අධ්‍යයන අංශයේ විද්‍යාර්ථියකු වූ දැනට භෞතික විද්‍යා අධ්‍යයන අංශයේ තාවකාලික ශිල්ප ප්‍රදර්ශකවරයකු ලෙස සේවය කරන තිමිර සනුක තිලකරත්න මහතා තම නවෝත්පාදක වෛද්‍ය උපාංගය වන **නාසික වායුසංසරණ අනාවරණ හා වාහ පරිමා මිනුම් පද්ධතිය (NAMS)** සඳහා ඉහළම මට්ටමේ අන්තර්ජාතික කීර්තියක් ලබා ඇත.

- කොළඹ විශ්වවිද්‍යාලයීය වෛද්‍ය පීඨයේ ග්‍රාමීය සෞඛ්‍ය පර්යේෂණ මධ්‍යස්ථානය (RHRC) විවෘත කිරීම 2018 මැයි මස 30 වන දින කතරගම පැවති මැලේරියා පර්යේෂණ ස්ථාන පරිශ්‍රයේදී උත්සවාකාරයෙන් පැවැත්විණි. කොළඹ විශ්ව විද්‍යාලයේ උප කුලපතිවරයා නියෝජනය කරමින් මෙය විවෘත කිරීම නිලවශයෙන් සිදු කරන ලද්දේ ශ්‍රීපාලි මණ්ඩපයේ මණ්ඩපාධිපති මහාචාර්ය රංජන් හෙට්ටිආරච්චි විසිනි.

- එක්සත් රාජධානියේ ස්ටැෆර්ඩ්ෂයර් විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ලියුආන් එලිස් 2018 ජුනි මස 5 වන දින කොළඹ විශ්වවිද්‍යාලීය උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා හමුවිය.

- 2018 ආසියානු ආංශික කොන්ෆියුසියස් ආයතන සම්මේලනය 2018 ජුනි 27 – 28 දිනවල බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රන ශාලාවේදී පැවැත්විනි. මෙය සංවිධානය කරන ලද්දේ චීනයේ කොන්ෆියුසියස් ආයතන මූලස්ථානය ( හම්බන්), කොළඹ විශ්වවිද්‍යාලය හා කැළණිය විශ්වවිද්‍යාලය විසිනි. ඇෆ්ගනිස්තානය, පාකිස්තානය, බංගලාදේශය, නේපාලය, ශ්‍රී ලංකාව, ඉන්දියාව, ඉරානය හා තුර්කිය යන රටවල දූත පිරිස් මීට සහභාගී වූහ.

- නොදම්බ්‍රියා විශ්වවිද්‍යාලයේ දුරස්ථ ඉගනුම් හා ඉගැන්වීම් පිළිබඳ අධ්‍යක්ෂක මහාචාර්ය ස්ටැන්ලි ඔලිවර් 2018 ජුලි මස 9 වන දින කොළඹ විශ්වවිද්‍යාලයට පැමිණියේය.

- ජර්මනියේ බර්ලින් නුවර රොබට් කෝච් ආයතනයේ ආචාර්ය ඇන්ඩ්‍රියාස් ඩෙට්ලෙෆ් නීෂේ දූත පිරිසක් සමග 2018 ජුලි මස 9 වන දින කොළඹ විශ්වවිද්‍යාලයට පැමිණ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා හමුවිය. කොළඹ විශ්වවිද්‍යාලය හා රොබට් කෝච් ආයතනය එක්ව ඒකාබද්ධ පර්යේෂණ සහයෝගිතා වැඩසටහනක් පවත්වාගෙන යයි.

- ලෝක සෞඛ්‍ය සංවිධාන කාර්යාලයේ දූත පිරිසක් 2018 ජුලි මස 13 වන දින කොළඹ විශ්වවිද්‍යාලයට පැමිණියේය.

- ට්‍රී ඔෆ් ලයිෆ් සමූහ ව්‍යාපාරයේ සභාපති තදෂි ෂිගෙන්යා මහතා හා එහි අධ්‍යක්ෂිකා උමී ෂිගෙන්යා මහත්මිය 2018 අගෝස්තු 7 වන දින කොළඹ විශ්වවිද්‍යාලයට පැමිණ විශ්වවිද්‍යොලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා හමුවූහ. මෙහිදී ජපන් ප්‍රජාවට ආයුර්වේද ප්‍රතිකාර හඳුන්වා දීමට ට්‍රී ඔෆ් ලයිෆ් සමූහ ව්‍යාපාරය හා එක්වන ලෙස තදෂි ෂිගෙන්යා මහතා කොළඹ විශ්වවිද්‍යාලයට ආරාධනා කළේය.

- තායිවානයේ ජාතික මධ්‍යම විශ්වවිද්‍යාලයේ විදුලි ඉංජිනේරු හා පරිගනක විද්‍යා පාසලේ උප පීඨාධිපති මහාචාර්ය තිමති කේ. ෂිහ් ගේ නායකත්වය යටතේ දූත පිරිසක් 2018 ජුනි මස 25 වන දින කොළඹ විශ්වවිද්‍යාලයට පැමිණියේය.

- කොළඹ විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය උපාධිධාරීන්ගේ උපාධි ප්‍රදානෝත්සවය 2018 ජුලි 24 හා 25 දිනවල බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රන ශාලාවේදී අති උත්කර්ෂවත් අයුරින් පවත්වන ලදී.

- කොළඹ විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමයේ 36 වන වාර්ෂික මහා සභා රැස්වීම කොළඹ විශ්වවිද්‍යාලයේ පූර්වගාමී ආයතනය වූ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ ආදි විද්‍යාර්ථීන් වූ ජාතියට අනභිභවනීය මෙහෙවරක් ඉටුකළ සුවිශේෂ ජ්‍යෙෂ්ඨ පුරවැසි විද්වතුන් සත් දෙනෙකුගේ ජාතික මෙහෙවර හඳුනා ගැනීමට හා ඔවුන්ට උපහාර පිදීම සඳහා වෙන්වූ මනහර අභිනන්දන උළෙලකින් සමන්විත විය. වෛද්‍ය පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ක්ෂුද්‍රජීව වෛද්‍ය විද්‍යාව පිළිබඳ පුරෝගාමී මහාචාර්ය , හිටපු කැබිනට් ඇමති විද්‍යාජෝති තිස්ස විතාරණ, අධ්‍යාපනඥ, කාන්තා අයිතිවාසිකම් ප්‍රවර්ධක, අධ්‍යාපන විද්‍යාව පිළිබඳ සම්මානිත මහාචාර්ය දේශබන්දු කලා කීර්ති මහාචාර්ය ස්වර්ණා ජයවීර, මාගා ආයතනයේ සම පුරෝගාමී දේශමාන්‍ය ආචාර්ය ගොඩ්ෆ්‍රි ගුණතිලක , ඇට්කින් ස්පෙන්ස් සමාගමේ හිටපු සභාපති මෙන්ම දශක දෙකකට ආසන්න කාලයක් පුරා කළමනාකරණ අධ්‍යක්ෂ ධූරය හෙබවූ , LOLC සමාගමේ හා වෙනත් සමාගම් කීපයක පුරෝගාමී සභාපතිවරයා වන දේශමාන්‍ය චරිත ප්‍රසන්න ද සිල්වා , 'සීගිරිය හා එහි සුවිශේෂත්වය' හා 'ඉතිහාසයේ විකෘතීන්' ආදි ප්‍රකාශන කීපයක කතුවරයා හා හිටපු පුරාවිද්‍යා කොමසාරිස් විද්‍යාජෝති ආචාර්ය රාජේන්ද්‍ර හේමපාල ද සිල්වා, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පද්ධතියේ ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පළමු මහාචාර්ය, මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු හා ගෘහ නිර්මාණ ශිල්ප අධ්‍යයන අංශයේ ප්‍රාරම්භක පීඨාධිපති හා මොරටුව විශ්වවිද්‍යාලයේ කුලපති විද්‍යාජෝති මහාචාර්ය කේ.කේ.වයි.ඩබ්. පෙරේරා සහ අග්‍රාමාත්‍යවරුන් සත් දෙනෙකුගේ ලේකම් වශයෙන් සේවය කළ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය සේවක දේශමාන්‍ය බ්‍රැඩ්මන් වීරකෝන් යන මහත්ම මහත්මීන්ට මෙහිදී උපහාර පිරිනමන ලදී.

- එක්සත් රාජධානියේ හඩර්ස්ෆීල්ඩ් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය දිලන්ති අමරතුංග 2018 අගෝස්තු 27 වන දින කොළඹ විශ්වවිද්‍යාලයට පැමිණ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා හමුවී මෙම විශ්වවිද්‍යාල අතර පවතින අධ්‍යයන සහයෝගිතාවන් පිළිබඳව සාකච්ඡා කළාය.

- රසායන විද්‍යා අධ්‍යයන අංශයේ අලුතෙන් ඉදි කරන ලද උසස් ද්‍රව්‍ය හා උපාංග මධ්‍යස්ථානය (CAMD) විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා විසින් 2018 අගෝස්තු 23 වන දින විවෘත කරන ලදී.

- එක්සත් රාජධානියේ ලීසෙස්ටර් විශ්වවිද්‍යාලයේ උපකුලපති, ජීවන විද්‍යා උසස් විද්‍යාලයේ අධිපති හා වෛද්‍ය අංශයේ පීඨාධිපති මහාචාර්ය පිලිප් බේකර් 2018 අගෝස්තු 10 වන දින කොළඹ විශ්වවිද්‍යාලයට පැමිණියේය.

- 2018 සැප්තැම්බර් 11 වනදා පැවති වාර්ෂික රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළෙලේදී හොඳම පරිවර්තිත ශාස්ත්‍රීය කෘතිය වෙනුවෙන් වූ සම්මානය සිය සම කතුවරයා වූ අබේරත්න අත්තනායක මහතා සමග දිනා ගැනීමට නූතනත්වය, පශ්චාත් නූතනත්වය සහ නව සමාජ විද්‍යාත්මක න්‍යාය නම් කෘතියේ රචක ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපතිවරයා සමත් විය.

- ඔස්ට්‍රේලියාවේ ක්වීන්ස්ලන්ඩ් තාක්ෂණ විශ්වවිද්‍යාලයේ නියෝජ්‍ය උපකුලපති හා උප සභාපති ( ජාත්‍යන්තර හා සංවර්ධන) මහාචාර්ය ස්කොට් ෂෙපර්ඩ් 2018 අගෝස්තු 10 වන දින කොළඹ විශ්වවිද්‍යාලයට පැමිණියේය. විද්‍යාල මන්දිරයේදී විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා හමුවූ ඔහු විශ්වවිද්‍යාල දෙක අතර පවතින වැඩසටහන් පෘථුල කිරීම හා වෙනත් ක්ෂේත්‍ර පිළිබඳ සාකච්ඡා කරන ලදී.

- බටහිර සිඩ්නි විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු විද්‍යාව හා පරිගනක විද්‍යාව පාසලේ පීඨාධිපති මහාචාර්ය සුරේන්ද්‍ර ශ්‍රේෂ්ඨා 2018 සැප්තැම්බර් 07 වනදා කොළඹ විශ්වවිද්‍යාලයට පැමිණියේය. මෙහිදී විශ්වවිද්‍යාල දෙක අතර පවතින වැඩසටහන් පෘථුල කිරීම හා වෙනත් ක්ෂේත්‍ර පිළිබඳ සාකච්ඡා කරන ලදී.

- ටෝකියෝ විශ්වවිද්‍යාලයේ රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ පශ්චාත් උපාධි විද්‍යාලයේ ව්‍යාපෘති මහාචාර්ය ටොෂිරෝ නිෂිසාවා මහතා 2018 අගෝස්තු 27 වන දින කොළඹ විශ්වවිද්‍යාලයට පැමිණ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා හමුවූ අතර විශ්වවිද්‍යාල දෙක අතර සහයෝගිතාවයන් ඇති කිරීම හා වෙනත් ක්ෂේත්‍ර පිළිබඳ සාකච්ඡා කරන ලදී.

- ප්‍රජාතන්ත්‍රවාදය හා පාලනය සංවර්ධනය පිළිබඳ ප්‍රජාධිපොක් රාජ ආයතනයෙහි සිසුහු 2018 සැප්තැම්බර් 11 වනදා කොළඹ විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයට පැමිණියහ. පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නයනි මෙලගොඩ හා ජාත්‍යන්තර සම්බන්ධතා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චමින්ද පද්මකුමාර විසින් මෙහිදී ශ්‍රී ලංකාවේ සංහිඳියාව හා ධරණීය සාමය පිළිබඳ ඉදිරිපත්කිරීමක් කරන ලදී.

- සිංහල අධ්‍යයන අංශයේ ආචාර්ය ලතා ගුරුසිංහ හා ඉංග්‍රීසි භාෂා ඉගෙනුම් අධ්‍යයන අංශයේ සාවිත්‍රි ඩයස් යන ආචාර්ය මණ්ඩල සාමාජිකයෝ 2018 සැප්තැම්බර් 09 වනදා සිට 29 වනදා දක්වා චීනයේ චැංග්චුන් නුවර පැවති "BRI ( Belt and Road Initiatives) සංවිධානයට අයත් සංවර්ධනය වෙමින් පවතින රටවල් හා කලාපවල විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සමුළුව - 2018" ට සහභාගි වූහ. ආචාර්ය ලතා ගුරුසිංහ හා සාවිත්‍රි ඩයස් මිය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳව පත්‍රිකාවක් ඉදිරිපත් කළ අතර එය සමුළුවේදී ඉදිරිපත් වූ හොඳම පත්‍රිකා තුන අතරට තෝරා ගන්නා ලදී. එසේම නායකත්ව ක්ෂේත්‍රය තුළ වෘත්තීය සංවර්ධනය සහ ගුරුවරයාගේ අනන්‍යතාව හඳුනා ගැනීම යන මැයෙන් සැප්තැම්බර් 27 වනදා චැංග්චුන් නුවර රෙඩ්බඩ් හෝටලයේ පැවති "20+20" සහයෝගිතා වැඩසටහනෙහි (111) වන සංකථන මණ්ඩපයෙහි ප්‍රධාන දේශනය පැවැත්වීමට සාවිත්‍රි ඩයස් මිය තෝරාගනු ලැබුවාය. "ශ්‍රී ලංකාවේ ගුරුවරයාගේ අනන්‍යතාව උදෙසා ප්‍රතිපත්තිමය සහයෝගය"යන්න ඇගේ දේශනයෙහි තේමාව විය.

- නැඟී එන කලාපයන්හි තොරතුරු සන්නිවේදන තාක්ෂණ ප්‍රගමනයන් පිළිබඳ 18 වන ජාත්‍යන්තර සමුළුව (ICTer2018) 2018 සැප්තැම්බර් 27 හා 28 කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගනක පාසල් ශ්‍රවනාගාරයේදී පැවැත්විණි. පරිගණක විද්‍යාව හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයේ විශිෂ්ටතම ප්‍රවීණයන් විසින් පවත්වන ලද පූර්ව සහ පශ්චාත් සම්මන්ත්‍රණ වැඩමුළු කීපයක් සැප්තැම්බර් මස 26 සහ 29 යන දිනවල පැවැත්විණි.

- 11 වන වාර්ෂික විද්‍යාජෝති මහාචාර්ය වී.කේ. සමරනායක අනුස්මරණ දේශනය හා 2018 ICTer සමුළුවේ සමාරම්භක උත්සවය 2018 සැප්තැම්බර් 26 වනදා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසලේ ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී.

- කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ තොරතුරු හා ඉගෙනුම් මධ්‍යස්ථානයට මුල්ගල තැබීම 2018 ඔක්තෝබර් 18 වනදා විද්‍යා පීඨ පරිශ්‍රයේදී පවත්වන ලදී. විශ්වවිද්‍යාලයේ කුලපති අතිඋතුම් ඔස්වල්ඩ් ගෝමිස් රදගුරු හිමිපාණන් හා විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යොෂ්ඨ මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා ඇතුළු සම්භාවනීය අමුත්තෝ මීට සහභාගි වූහ.

- කොළඹ විශ්වවිද්‍යාලයේ 2017 පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවය 2018.11.12 හා 13 දිනවල බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රන ශාලාවේදී පැවැත්විනි.

- කොළඹ විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි ප්‍රදානෝත්සවය 2018 නොවැම්බර් 10 වනදා විද්‍යාජෝති මහාචාර්ය වී.කේ. සමරනායක ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී. මෙහිදී තොරතුරු තාක්ෂණවේදී (බාහිර), මූල්‍ය ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී (බාහිර) හා ඉලෙක්ට්‍රොනික විද්‍යාව හා ස්වයංකරණ තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී යන උපාධි පිරිනමන ලදී.

- කොළඹ විශ්වවිද්‍යාලයේ වාර්ෂික පර්යේෂණ පත්‍රිකා සැසිවාරයේ සමාරම්භක උත්සවය 2018 නොවැම්බර් 08 වනදා කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසලේ විද්‍යාජෝති මහාචාර්ය වී.කේ. සමරනායක ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී. ශ්‍රී ලංකා හා මාලදිවයින් සඳහා ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස් බ්‍රයිස් හචිසන් මහතා මෙහි ප්‍රධාන ආරාධිතයා විය. ස්වීඩනයේ ස්ටොක්හෝම් විශ්වවිද්‍යාලයේ පරිගනක හා පද්ධති විද්‍යා අංශයේ සහකාර මහාචාර්ය හෙන්රික් හැන්සන් මහතා මෙහි ප්‍රධාන දේශනය පැවැත්විය.

- දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයෙහි ද්‍රව්‍යගුණ විඥාන අධ්‍යයන අංශය කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනය හා එක්ව 2018 නොවැම්බර් 06 වනදා හම්බන්තොට නගරයේ වැලිගත්ත නගරයේ ඖෂධ උයනක් පිහිටවීය.

- 2018 අන්තර් විශ්වවිද්‍යාලයීය ශූරතාවලිය ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල 14 ක සහභාගිත්වයෙන් 2018 ජූනි 2 වනදා සිට නොවැම්බර් 4 වනදා දක්වා පැවැත්වුනු අතර එහි සමස්ත ශූරතාවය කොළඹ විශ්වවිද්‍යාලය විසින් දිනා ගන්නා ලදී.

- ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය සංවිධානය කළ 'කොළඹ යොවුන් ආර්ථික විද්‍යා සමුළුව 2018 නොවැම්බර් 19 වනදා කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේදී පැවැත්විණි. කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යොෂ්ඨ මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා මෙහි ප්‍රධාන ආරාධිතයා වූ අතර ආචාර්ය සරත් රාජපතිරණ විසින් ප්‍රධාන දේශනය පවත්වන ලදී.

- කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨය විසින් සංවිධානය කළ 2018 ජාත්‍යන්තර නීති පර්යේෂණ සමුළුව (ILRC) 2018 නොවැම්බර් 16 හා 17 දිනවල කොළඹ 06 මිරේජ් හෝටලයේදී පැවැත්විණි. නීති පීඨයේ 70 වන සංවත්සරයට සමගාමීව පැවති මෙම සමුළුව 'නීතිය ආලෝචනය: හානිය, නොදැනුම හෝ අභිංසකත්වය?" යන තේමාවවෙන් සමන්විත විය. හිටපු ඉන්දීය අග්‍රවිනිශ්චයකාර ගරු දීපාක් මිස්රා මහතා මෙහි ප්‍රධාන දේශකයා විය. ප්‍රධාන ආරාධිතයා ලෙස ගරු නීතිපති ජයන්ත ජයසූරිය මහතා සහභාගී විය.

- 2018 නොවැම්බර් 16 වනදා පැවති 13 වන ජාත්‍යන්තර කළමනාකරණ හා මූල්‍ය සමුළුවට පසුව කාර්මික සංකථනයක්ද පවත්වන ලදී. මෙහි ප්‍රධාන දේශනය සිංගප්පූරුවේ නැන්යැන්ග් තාක්ෂණ විශ්වවිද්‍යාලයේ නැන්යැන්ග් ව්‍යාපාර පාසලේ ආරම්භක සභාපති මහාචාර්ය ජේසන් ඩී. ෂෝ විසින් පවත්වන ලදී.

- කොළඹ විශ්වවිද්‍යාලය හා නෙදර්ලන්තයේ පිලිප්ස් වෛද්‍ය පද්ධතිය 2018 දෙසැම්බර් 21 වනදා පර්යේෂණ එකඟතාවයක් ඇති කර ගන්නා ලදී. කොළඹ විශ්වවිද්‍යාලය වෙනුවෙන් විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා විසින් අත්සන් තබන ලද අතර පිලිප්ස් ඉන්ඩියා සමාගමේ සායනික විද්‍යාඥ ආචාර්ය ඉන්ද්‍රජිත් සහාගේ නායකත්වයෙන් යුතු දූත පිරිසක් පිලිප්ස් ඉන්ඩියා සමාගම නියෝජනය කරන ලදී.ශ්‍රී ලංකාවේ සුවිශේෂ සැලකිල්ල යොමුවන මානව ආබාධ විනිශ්චය කිරීමට හා ස්ථරීකරණය කිරීමට අවශ්‍ය නව අතිධ්වනි හා චුම්බක අනුනාද  ප්‍රතිරූපණ මෙවලම් සංවර්ධනය කිරීම සඳහා ජෛව වෛද්‍ය ප්‍රතිරූපණ පර්යේෂණ කණ්ඩායම උත්සහ කරමින් සිටියි.

- විද්‍යා පීඨයේ ඉදිකිරීමට යෝජිත ශිෂ්‍ය සේවා මධ්‍යස්ථානය (SSC) සඳහා මුල්ගල් තැබීමේ උත්සවය 2018 දෙසැම්බර් 21 වනදා  විද්‍යා පීඨ පරිශ්‍රයේදී පැවැත්විණි. විශ්වවිද්‍යාලයේ කුලපති අතිඋතුම් ඔස්වල්ඩ් ගෝමිස් රදගුරු හිමිපාණන් හා  විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා ඇතුළු සම්භාවනීය අමුත්තෝ මීට සහභාගි වූහ.

| පටුන | | පිටු අංකය |
|---|---|---|
| **1** | **දළ විශ්ලේෂණය** | 12 |
| **1.1** | පාලක සභාව | 14 |
| **1.2** | සනාතන සභාව | 15 |
| **1.3** | රැස්වීම් | 20 |
| **1.4** | විශ්වවිද්‍යාලයේ දළ විශ්ලේෂණය | 20 |
| **1.5** | විශ්වවිද්‍යාලයේ සමස්ත කාර්ය සාධනය | 22 |
| **2** | **පීඨ, මණ්ඩප, මධ්‍යස්ථාන හා ඒකක** | 24 |
| **2.1** | ශාස්ත්‍ර පීඨය | 24 |
| **2.2** | අධ්‍යාපන පීඨය | 36 |
| **2.3** | පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | 45 |
| **2.4** | නීති පීඨය | 49 |
| **2.5** | කළමනාකරණ හා මූල්‍ය පීඨය | 54 |
| **2.6** | වෛද්‍ය පීඨය | 63 |
| **2.7** | විද්‍යා පීඨය | 100 |
| **2.8** | හෙද පීඨය | 112 |
| **2.9** | තාක්ෂණ පීඨය | 115 |
| **2.10** | ශ්‍රීපාලි මණ්ඩපය | 121 |
| **2.11** | සමකාලීන ඉන්දියානු අධ්‍යයන මධ්‍යස්ථානය (CCIS) | 128 |
| **2.12** | සමාන ස්ත්‍රීපුරුෂ සමාජභාවය සඳහා වූ මධ්‍යස්ථානය (CEGE) | 131 |
| **2.13** | මානව හිමිකම් මධ්‍යස්ථානය | 132 |
| **2.14** | ශාරීරික අධ්‍යාපන අධ්‍යයන අංශය | 134 |
| **2.15** | වෛද්‍ය මධ්‍යස්ථානය | 135 |
| **2.16** | ජාතික අධ්‍යාපන පර්යේෂණ හා ඇගයුම් මධ්‍යස්ථානය (NEREC) | 135 |
| **2.17** | කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය | 137 |
| **2.18** | සමාජ ප්‍රතිපත්ති විශ්ලේෂණ හා පර්යේෂණ මධ්‍යස්ථානය (SPARC) | 143 |
| **2.19** | ජාත්‍යන්තර කාර්යාලය | 146 |
| **2.20** | පුස්තකාලය | 152 |
| **2.21** | තත්ත්ව සහතික හා ප්‍රතිතන ආයතනය IQAU | 156 |
| **3** | **කොළඹ විශ්වවිද්‍යාලය පිළිබඳ දළ විශ්ලේෂණයක්** | 158 |
| **3.1** | සම්පත් හා ශිෂ්‍යයන් පිළිබඳ විස්තර | 158 |
| **3.2** | දේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර | 158 |
| **3.3** | විදේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර | 160 |
| **3.4** | පත්වීම් හා කාර්ය මණ්ඩල තොරතුරු | 160 |
| **3.5** | අනධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු | 165 |
| **4** | **පර්යේෂණ හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු** | 166 |
| **5** | **ශිෂ්‍ය හා සේවක කටයුතු** | 167 |
| **6** | **ප්‍රාග්ධන කාර්යයන් හා සැලසුම්** | 172 |
| **7** | **අභ්‍යන්තර විගණනය** | 175 |
| **8** | **කොළඹ විශ්ව විද්‍යාලය විසින් විශ්ව විද්‍යාලයේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගවල සාරාංශය.** | 179 |
| **9** | **සුදුසු සංවර්ධනය මත පදනම් වූ අනාගත ප්‍රක්ෂේපන වාර්තාවක්** | 181 |
| **10** | **මූල්‍ය සමාලෝචනය** | 184 |
| **10.1** | මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන් | 191 |
| **11** | **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වෙත යැවූ වාර්තාව** | 244 |
| **11.1** | විගණන නිරීක්ෂණ පිළිබඳ වාර්තාව | 253 |

# 1. දළ විශ්ලේෂණය

කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාවේ අගනගරය වන කොළඹ නගරයේ හදවත බඳු කේන්ද්‍රස්ථානයක විසිර පවතින්නකි. එය සිය ආදර්ශ පාඨය වන “ බුද්ධි සර්වත්‍ර භ්‍රාජතේ.‘ (බුද්ධිය ඥානාලෝක කරයි) යන්න අනුව යමින් තම ව්‍යාප්තියේ පවතින සියලු අංශවල සිය ශාස්ත්‍රීය විශිෂ්ටත්වය පවත්වා ගෙන යාමට දැඩිව තැත් දරයි.

කොළඹ විශ්වවිද්‍යාලය පීඨ නවයකින් (9) සහ එක් මණ්ඩපයකින් සමන්විත වෙයි, ඒවා මෙසේය:

- ශාස්ත්‍ර පීඨය
- අධ්‍යාපන පීඨය
- නීති පීඨය
- කළමනාකරණ සහ මූල්‍ය පීඨය
- වෛද්‍ය පීඨය
- විද්‍යා පීඨය
- පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය
- තාක්ෂණ පීඨය
- හෙද පීඨය
- ශ්‍රී පාලි මණ්ඩපය

විශ්වවිද්‍යාලය සතුව අනුබද්ධ ආයතන හතක් (7) හා එක් පාසලක් පවතී. ඒවා නම්,

- මානව සම්පත් අභිවර්ධන ආයතනය (IHRA)
- දේශීය වෛද්‍ය ආයතනය(IIM)
- වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIM)
- ජාතික පුස්තකාල සහ තොරතුරු විද්‍යා ආයතනය (NILIS)
- ජීව රසායන විද්‍යා, අණුක ජීවවිද්‍යා සහ ජීවතාක්ෂණවේද ආයතනය (IBMBB)
- කොළඹ විශ්වවිද්‍යාලයීය කෘෂි තාක්ෂණ සහ ග්‍රාමීය විද්‍යා ආයතනය (IARS)
- දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIIM)
- කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල (UCSC)


Faculties and Institutes
1. Faculty of Arts
2. Faculty of Education
3. Faculty of Law
4. Faculty of Management and Finance
5. Faculty of Medicine
6. Faculty of Science
7. Faculty of Graduate Studies
8. Sri Palee Campus
9. University of Colombo, School of Computing (UCSC)
10. Institute of Human Resource Advancement (IHRA)
11. Institute of Indigenous Medicine (IIM)
12. Postgraduate Institute of Medicine (PGIM)
13. National Institute of Library and Information Sciences (NILIS)
14. Institute of Biochemistry, Molecular Biology and Biotechnology (IBMBB)
15. University of Colombo, Institute for Agro-Technology and Rural Sciences (UCIARS)
16. Faculty of Nursing
17. Faculty of Technology
18. Postgraduate Institute of Indigenous Medicine (PGIIM)
University of Colombo

## 1.1 පාලක සභාව

විශ්වවිද්‍යාලයීය පාලක සභාව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන වගන්තියේ අංක 16 සහ 1985 24 වන වගන්තියේ අංක 07 (සංශෝධිත) පනතින් ස්ථාපිතය. විශ්වවිද්‍යාලයේ පාලන අධිකාරිය වන එය උපකුලපති (නිලබලයෙන් පත් විධායක මණ්ඩල සභාපති ලෙස), ශ්‍රී පාලි මණ්ඩපයේ මණ්ඩපාධිපති, පීඨ හතේ පීඨාධිපතිවරුන් (සමස්තයක් ලෙස නිලබලයෙන් පත් විධායක මණ්ඩල සාමාජිකයන් 09 දෙනෙකු), සනාතන මණ්ඩල නියෝජිතයන් දෙදෙනෙකු, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙන් පත් කළ සාමාජිකයන් එකොලොස් දෙනෙකුගෙන් සමන්විත වෙයි. 2018 වසරේදී එය පහත සාමාජිකයන් ගෙන් සමන්විත විය.

| **නිලබලයෙන් පත්** | |
|---|---|
| **සභාපති :** උපකුලපති | මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක |
| මණ්ඩපාධිපති, ශ්‍රීපාලි මණ්ඩපය | ආචාර්ය ආර්.සී.කේ. හෙට්ටිආරච්චි |
| පීඨාධිපතිවරු | |
| • ශාස්ත්‍ර | මහාචාර්ය අතුල රණසිංහ (15/01/2018 **දක්වා**)<br>මහාචාර්ය ඩී.ඒ. ප්‍රේමකුමාර ද සිල්වා ( 16/01/2018 **සිට**) |
| • අධ්‍යාපන | මහාචාර්ය එම්.වී. විතානපතිරණ මිය |
| • පශ්චාත් උපාධි අධ්‍යයන | මහාචාර්ය නයනි මෙලගොඩ |
| • නීති | මහාචාර්ය ඩබ්. ඉන්දිරා නානායක්කාර |
| • කළමනාකරණ සහ මූල්‍ය | ආචාර්ය.එම්. පී.පී. ධර්මදාස |
| • වෛද්‍ය | මහාචාර්ය ජෙනිෆර් පෙරේරා |
| • **හෙද** | මහාචාර්ය දේවක වීරකෝන් |
| • විද්‍යා | මහාචාර්ය කේ. ආර්. ආර්. මහානාම |
| • **තාක්ෂණ** | මහාචාර්ය ජේ.කේ. ඩී.එස්. ජයනෙත්ති |
| **වෙනත්** | |
| **සනාතන සභාවෙන් තෝරා පත්කළ** | |
| • මහාචාර්ය කේ. පී. හේවාගමගේ ( 30.08.2017 සිට)<br>• ආචාර්ය තිලාන් යූ. හේවගේ (30.08.2017 සිට 02/12/2018 දක්වා)<br>• මහාචාර්ය වී.ටී. තමිල්මාරන් (03/12/2018 සිට ) | |
| **විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙන් පත්කළ** (19.04.2018) | |
| • පූජ්‍ය මහාචාර්ය අත්තංගනේ රතනපාල නායක හිමි<br>• ගරු අයිවන් පෙරේරා පියතුමා<br>• තිලක් කරුණාරත්න මහතා<br>• ආචාර්ය හර්ෂ කබ්රාල්, පීසී<br>• ආචාර්ය ජේ.එම්. ස්වාමිනාදන්<br>• සී.මුබාරක් මිය<br>• මහාචාර්ය ලක්ෂ්මන් රත්නායක<br>• මහාචාර්ය පී.ඒ.ජේ.පෙරේරා<br>• මහාචාර්ය ඒ. එන්. අයි. ඒකනායක<br>• මහින්ද මඩිහහේවා මහතා<br>• අනිල් රාජකරුණා මයා<br>• ආචාර්ය ගෝඨාභය රණසිංහ<br>• ආචාර්ය වී.පී. ගමගේ | |
| **ලේකම්:** ලේඛකාධිකාරී | |
| • කේ.ඒ. එස්. එඩ්වර්ඩ් මහතා | |

## 1.2 සනාතන සභාව

1978 ව්‍යවස්ථාවේ 46(2) වගන්තියේ 16 වෙනි කොටසේ සහ 1985 අංක 7 දරන (සංශෝධිත) විශ්වවිද්‍යාල පනතින් විශ්වවිද්‍යාල සනාතන සභාව පිහිටුවා ඇත. 2018 වර්ෂයේ එය පහත සාමාජිකයන්ගෙන් සමන්විත විය.

| | |
|---|---|
| **නිලබලයෙන්** | |
| **සභාපති:** උපකුලපති | මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක |
| මණ්ඩපාධිපති ශ්‍රීපාලි මණ්ඩපය | ආචාර්ය ආර්.සී.කේ. හෙට්ටිආරච්චි |
| **පීඨාධිපතිවරුන්** | |
| • ශාස්ත්‍ර | මහාචාර්ය ඩී.ඒ.පී. ද සිල්වා |
| • අධ්‍යාපන | මහාචාර්ය එම්.වී. විතානපතිරණ මිය |
| • නීති | මහාචාර්ය ඩබ්. ඉන්දිරා නානායක්කාර |
| • කළමනාකරණ සහ මූල්‍ය | ආචාර්ය.එම්. පී.පී. ධර්මදාස |
| • වෛද්‍ය | මහාචාර්ය ජෙනිෆර් පෙරේරා මිය |
| • විද්‍යා | මහාචාර්ය කේ.ආර්.ආර්. මහානාම |
| • පශ්චාත් උපාධි අධ්‍යයන | මහාචාර්ය නයනි මෙලගොඩ |
| • හෙද | මහාචාර්ය එච්.ඩී.කේ.ජී.ඒ. වීරකෝන් |
| • තාක්ෂණ | මහාචාර්ය ජේ.කේ.ඩී.එස්. ජයනෙත්ති |
| **ආයතන සහ පරිගණක පාසලේ අධ්‍යක්ෂවරු** | |
| • කෘෂි තාක්ෂණ සහ ග්‍රාමීය විද්‍යා ආයතනය | මහාචාර්ය එස්. සුබසිංහ |
| • ජීවරසායන විද්‍යා, අනුකජීවවිද්‍යා ජීවතාක්ෂණවේද ආයතනය | ආචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති මිය |
| • මානව සම්පත් අභිවර්ධන ආයතනය | මහාචාර්ය ජේ.ඒ. එස්.කේ. ජයකොඩි |
| • දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය | ආචාර්ය එස්.ඩී. හපුආරච්චි මිය ( 09.02.2018 දක්වා)<br>මහාචාර්ය ප්‍රියානි පරණගම ( 10.02.2018 සිට) |
| • ජාතික පුස්තකාල සහ තොරතුරු විඥාපන ආයතනය | ආර්.පී.ආර්. රණවීර මයා |
| • වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | මහාචාර්ය එච්. ජේ. ද සිල්වා |
| • කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල | මහාචාර්ය කේ. පී. හේවාගමගේ |
| **අධ්‍යයනාංශ ප්‍රධානීන්** | |
| • ගිණුම්කරණය | ආචාර්ය ටී.එන්. ගුණරත්න මිය |
| • කෘෂි තාක්ෂණය | ආචාර්ය ජී.ඒ.යූ.ජයසේකර |
| • කාය ව්‍යවච්ඡේදය | මහාචාර්ය වී. එච්. ඩබ්.දිසානායක |
| • සම සෞඛ්‍ය විද්‍යාව | මහාචාර්ය ඩී.ජේ. ඇන්තනි |
| • ආයුර්වේද | ආචාර්ය එල්. පී.ඒ. කරුණාතිලක |
| • හෙද සේවය සඳහා මූලික විද්‍යා හා සමාජවිද්‍යා | මහාචාර්ය එච්.ඩී.කේ.ජී.ඒ.වීරකෝන්(14.06. 2018 සිට 15.10.2018 දක්වා)<br>ආචාර්ය ජී.ඒ.එස්. ප්‍රේමකුමාර ( 16.10.2018 සිට) |
| • ජීවරසායන සහ අනුක ජීවවිද්‍යා | ආචාර්ය කේ. සිරිදේව මිය |
| • ව්‍යාපාර ආර්ථිකය | එම්.ආර්. රාජසූරිය මයා |
| • බෞද්ධ අධ්‍යයනය | මහාචාර්ය එම්. ධම්මජෝති හිමි |
| • රසායන විද්‍යාව | මහාචාර්ය ආර්. ඩී. විජේසේකර |
| • සායනික වෛද්‍ය විද්‍යාව | ආචාර්ය ජී.ආර්. කොන්ස්ටන්ටයින් |
| • වාණිජ්‍ය සහ මූල්‍ය | ආචාර්ය.එස්. බුවනේන්ද්‍ර |
| • සායනික හෙද කර්මය | එන්.ඒ.ආර්. නෙත්තසිංහ මිය (14.06.2018 සිට ) |

| | |
|---|---|
| • වාණිජ නිති | මහාචාර්ය එස්.සේගරාජසිංහම් |
| • ප්‍රජා වෛද්‍ය විද්‍යාව | ආචාර්ය එම්. සී. වීරසිංහ |
| • පරිගනක විද්‍යාව | ආචාර්ය ජී.ඩී.ඩී. කේ. ශ්‍රී රංජන් (08.08.2018 දක්වා)<br>ඩබ්.ඒ.එස්.බී. ෆොන්සේකා මයා(09.08.2018 සිට) |
| • පරිගනක හා තොරතුරු පද්ධති | ආචාර්ය ඩී.ඒ.එස්. අතුකෝරල |
| • සංනිවේදනය හා තොරතුරු තාක්ෂණය | ආචාර්ය ජී.ඩී.එස්.පී විමලරත්න |
| • ප්‍රජා විද්‍යාව | ආචාර්ය ඊ.එල්.එස්.ජේ. පෙරේරා |
| • ආර්ථික විද්‍යාව | මහාචාර්ය පූජ්‍ය ඩබ්ලිව්. විමලරතන හිමි |
| • අධ්‍යාපන මනෝවිද්‍යාව | වයි. ශක්තිවේල් මිය |
| • ඉංග්‍රිසි | මහාචාර්ය නෙලුෆර් ඩි මෙල් (15.07.2018 දක්වා)<br>ආචාර්ය ආර්. එස්. විජේවර්ධන (16.07.2018 සිට) |
| • ඉංග්‍රිසි භාෂා අධ්‍යයනය | එස්.වයි.ඩයස් මිය ( 09.05.2018 දක්වා)<br>ආචාර්ය එස්. එම්. තේනබදූ ( 10.05.2018 සිට) |
| • පාරිසරික තාක්ෂණය | ආචාර්ය රංජන පියදාස |
| • අධිකරණ වෛද්‍ය විද්‍යා සහ ධූලක විද්‍යා | ආචාර්ය එන්.ඩී. එන්.ඒ. මෙන්ඩිස් |
| • මූලික හෙද කර්මය | ආචාර්ය එස්. එස්.පී. වර්ණකුලසූරිය<br>(14.06.2018 සිට ) |
| • භූගෝල විද්‍යාව | මහාචාර්ය එල්. මානවඩු |
| • ඉතිහාසය | ආචාර්ය එන්. විජේගුණවර්ධන (28.09.2018 දක්වා)<br>ආචාර්ය ජේ.ඩී. ජයවර්ධන ( 29.09.2018 සිට) |
| • මානව සම්පත් කළමනාකරණය | ආචාර්ය පවිත්‍රා කෛලාසපති |
| • මානව විද්‍යා අධ්‍යාපනය | එස්.එස්. දහනායක මයා |
| • තොරතුරු තාක්ෂණය හා සංනිවේදනය | ආචාර්ය අජන්ත අතුකෝරල |
| • තොරතුරු පද්ධති ඉංජිනේරු විද්‍යාව | ආචාර්ය ජේ.එස්. ගුණතිලක |
| • මෙවලම් සහ<br>• ස්වයංක්‍රීය තාක්ෂණය | ආචාර්ය.එම්.කේ.ජයනන්ද (21.02.2018 දක්වා)<br>ආචාර්ය ජී.ඩී.එන්. පෙරේරා (22.02.2018 සිට) |
| • ජාත්‍යන්තර සම්බන්ධතා | ආචාර්ය එම්.එස්.ඩබ්. පැස්කුවල් |
| • ජාත්‍යන්තර වෙළඳාම | එස්.සසිදරන් මහතා |
| • භාෂා | ආචාර්ය. කේ.වී.ධනපාල |
| • කළමනාකරණ හා සංවිධාන අධ්‍යයනය | ආචාර්ය බී. නිශාන්ත ( 12.07.2018 දක්වා)<br>ආචාර්ය කේ.ඒ.එස්.පී කලුආරච්චි(13.07.2018 සිට) |
| • අලවිකරණය | ආචාර්ය කේ. කජේන්ද්‍ර (12.07.2018 දක්වා)<br>ආචාර්ය එම්.ජේ.එම්. ෆසීලා අසාන්<br>( 13.07.2018 සිට) |
| • ජනසංනිවේදනය | ආචාර්ය ජී.ඩී.ඩී. කේ. ශ්‍රී රංජන් |
| • ගණිතය | ආචාර්ය ටී.යූ. හේවගේ (22.11.2018 දක්වා)<br>ආචාර්ය එස්.එස්.එන්. පෙරේරා (23.11.2018 සිට) |
| • වෛද්‍ය අධ්‍යාපනය | මහාචාර්ය ඉන්දික කරුණාතිලක |
| • මානව වෛද්‍ය විද්‍යාව | මහාචාර්ය සරෝජ් ජයසිංහ |
| • ක්ෂුද්‍ර ජීවවිද්‍යාව | ආචාර්ය සී.පී. සේනානායක |
| • පරමාණු විද්‍යාව | ආචාර්ය එම්. ආර්. ලමාබදුසූරිය මිය |
| • ප්‍රසව සහ නාරිවේදය | මහාචාර්ය අතුල කලුආරච්චි |
| • ළමා රෝග | ආචාර්ය එන්. ලූකස් |
| • පිළිලවේදය | මහාචාර්ය දීපිකා ප්‍රනාන්දු |
| • ව්‍යාධිවේදය | ආචාර්ය එල්.වී.ගුණරත්න |
| • ප්‍රාසංගික කලා | කුමුදුනී මද්දුමගේ මිය |
| • භිෂග්වේදය | මහාචාර්ය එස්.ශ්‍රී රංගනාදන් |
| • භෞතික විද්‍යාව | මහාචාර්ය ඩී.යූ.ජේ. සොන්නාදර |
| • භෞතවේදය | ආචාර්ය ඒ.ඩී. ඒ. ප්‍රනාන්දු මිය (29.05.2018 දක්වා)<br>ආචාර්ය පී. එම්. අතපත්තු ( 30.05.2018 සිට) |
| • ශාක විද්‍යාව | ආචාර්ය සී.එම්. නානායක්කාර මිය |
| • දේශපාලන විද්‍යාව සහ රාජ්‍ය ප්‍රතිපත්ති | එම්. සේනානායක මයා (08.08.2018 දක්වා)<br>ජී.පී වී.ඩී.ආර්.සිල්වා මිය ( 09.08.2018 සිට) |

| | |
|---|---|
| • පෞද්ගලික සහ තුලනාත්මක නිති | ආචාර්ය එන්. ආර්. විජේසේකර |
| • මනෝචිකිත්සාව | මහාචාර්ය වරුණ ද සිල්වා ( 09.05.2018 දක්වා )<br>ආචාර්ය එල්.ආර්.එම්. දයාබණ්ඩාර මිය<br>( 10.05.2018 සිට) |
| • රාජ්‍ය සහ ජාත්‍යන්තර නීති | එස්.එස්.එම්.ඩබ්. සෙනවිරත්න මිය(19.11.2018 දක්වා)<br>මහාචාර්ය වී.ටී. තමිල්මාරන් (19.11.2018 දක්වා) |
| • විද්‍යා සහ තාක්ෂණ අධ්‍යාපනය | ආචාර්ය ඩබ්. එම්. ප්‍රඥාදර්ශන (11.05.2018 දක්වා)<br>පී.කේ.ජේ.ඊ. නෝනිස් මයා ( 12.05.2018 සිට) |
| • සිංහල | ආචාර්ය ලතා ගුරුසිංහ |
| • සමාජයීය විද්‍යා අධ්‍යාපනය | ආචාර්ය ඒ.ඒ. ජයවර්ධන ( 01.01.2018 දක්වා)<br>එච්.එම්.එල්. කුමාරි මිය<br>( 01.01.2018 සිට 19.01.2018 දක්වා)<br>ආචාර්ය ඩබ්. එම්. ප්‍රඥාදර්ශන (19.01.2018 සිට 01.04.2018 දක්වා)<br>ආචාර්ය එල්. එන්. පී. වෙඩිකන්දගේ<br>( 01.04.2018 සිට) |
| • සමාජ විද්‍යාව | මහාචාර්ය ඩී.ඒ. පී. ද සිල්වා ( 14.02.2018 දක්වා)<br>මහාචාර්ය පී. ආර්.එන්. ප්‍රනාන්දු ( 15.02.2018 සිට) |
| • සංඛ්‍යානය | ආචාර්ය එම්.ඩී.ටී. ආටිගල ( 01.03.2018 දක්වා)<br>මහාචාර්ය ඩබ්.එන්. වික්‍රමසිංහ ( 02.03.2018 සිට) |
| • ශෛල්‍ය වෛද්‍ය විද්‍යාව | මහාචාර්ය එස්.එම්.විජේරත්න |
| • UCIARS | එන්.පී.විදානපතිරණ මිය |
| • යුනානි | ආචාර්ය එම්. අයි. මනුහා |
| • සත්ත්වවිද්‍යාව | මහාචාර්ය ඩී.ඩී. වික්‍රමසිංහ |

**මහාචාර්යවරු : 1985 අංක 07 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතේ 26 (2) (h) වගන්තිය යටතේ**

- මහාචාර්ය ඒ. කළුආරච්චි
- මහාචාර්ය ඒ. ඩි.එම් .එස්. අබේරත්න
- මහාචාර්ය අමලා ද සිල්වා
- මහාචාර්ය ඒ. පී.ජී. අමරසිංහ
- මහාචාර්ය ඒ.පී. මළලසේකර
- මහාචාර්ය ඒ. යූ. අබේධීර
- මහාචාර්ය අජන්තා හපුආරච්චි ( 10.01.2018 සිට විශ්‍රාමික)
- මහාචාර්ය අතුල රණසිංහ
- මහාචාර්ය ඒ. පී.පී.ටී. වැන්ග්
- මහාචාර්ය සී. ඒ. ඥානදාසන්
- මහාචාර්ය සී. එන්. විජේරත්න
- මහාචාර්ය ඩී. මෙන්ඩිස්
- මහාචාර්ය ඩී. එන්. සමරසේකර
- මහාචාර්ය ඩි. පී. දිසානායක
- මහාචාර්ය ඩී.ටී.යූ. අබේතුංග
- මහාචාර්ය ඩී.ආර්.සී. හංවැල්ල
- මහාචාර්ය ඊ. ආර්. එච්. එස්.එස්. එදිරිවීර
- මහාචාර්ය ජී.එස්. ඒ. ගුණවර්ධන
- මහාචාර්ය එච්.ඩි. කරුණාරත්න
- මහාචාර්ය එච්.ජේ.එම්. පෙරේරා
- මහාචාර්ය එච්. එම්. සේනානායක
- මහාචාර්ය එච්. එම්. එස්. හේරත්
- මහාචාර්ය එච්.එන්.පී. ජයසිංහ
- මහාචාර්ය එච්.එස්. කෝපරහේවා
- මහාචාර්ය ජේ. කේ. ඩි.එස්. ජයනෙත්ති
- මහාචාර්ය ජේ. වනිගසිංහ
- මහාචාර්ය ජෙනිෆර් පෙරේරා

| |
|---|
| • මහාචාර්ය ෂෝන් පෙරේරා |
| • මහාචාර්ය කේ. අමිර්තලිංගම් |
| • මහාචාර්ය කේ.එම්.එන්. ද සිල්වා |
| • මහාචාර්ය කේ.පී.එස්.සී. ජයරත්න |
| • මහාචාර්ය කේ.එච්.තෙන්නකෝන් |
| • මහාචාර්ය කේ. එස්. එච්. ද සිල්වා |
| • මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම |
| • මහාචාර්ය එල්.ඒ.ඩී.ඒ. තිස්ස කුමාර |
| • මහාචාර්ය එම්. ඒ.ඩී.එස්. ජේ. එස්. නිරිඇල්ල |
| • මහාචාර්ය එම්. ඩී. පී. ද කොස්තා |
| • මහාචාර්ය එම්. ඩී. එස්. ලොකුහෙට්ටි |
| • මහාචාර්ය එම්.ට්. එස්. පෙරේරා |
| • මහාචාර්ය එම්. අයි. එම්. ද සොයිසා |
| • මහාචාර්ය එම්.ආර්. සූරියආරච්චි |
| • මහාචාර්ය එම්. වී. සී. ද සිල්වා |
| • මහාචාර්ය එම්. ඩබ්. ගුණතුංග |
| • මහාචාර්ය එන්.ඩී. කොඩිකාර |
| • මහාචාර්ය එන්. කමර්ඩීන් |
| • මහාචාර්ය නදීරා කරුණාවීර |
| • මහාචාර්ය එන්.එම්.සී.කේ. අරඹෙපොළ |
| • මහාචාර්ය නෙලුෆර් ද මෙල් |
| • මහාචාර්ය නෙළුකා ද  සිල්වා |
| • මහාචාර්ය එන්.ආර්. පෙරේරා |
| • මහාචාර්ය එස්. එස්.බී.ඩී. පී. මහවත්ත ( 10.01.2018 සිට විශ්‍රාමික) |
| • මහාචාර්ය පී.එස්.එම්. ගුණරත්න |
| • මහාචාර්ය පී.වී. උඩගම |
| • මහාචාර්ය ප්‍රීතිකා අඟුණවෙල |
| • මහාචාර්ය පී. ගලප්පත්ති |
| • මහාචාර්ය ප්‍රියංජලී ද සොයිසා |
| • මහාචාර්ය පී. ඒ. එන්. පුණ්‍යසිරි |
| • මහාචාර්ය ජී.ජී. පොන්නම්පෙරුම |
| • මහාචාර්ය රංජිත් බණ්ඩාර |
| • මහාචාර්ය ආර්. ඩී. විජේසේකර |
| • මහාචාර්ය ආර්. එල්. ජයකොඩි (05.03.2018 සිට විශ්‍රාමික) |
| • මහාචාර්ය ආර්. එල්. සී. විජේසුන්දර |
| • මහාචාර්ය ආර්. එස්. දසනායක |
| • මහාචාර්ය එස්. රාජපක්ෂ |
| • මහාචාර්ය එස්.ඒ.  නෝබර්ට් |
| • මහාචාර්ය එස්. එම්. කේ. හේරත් |
| • මහාචාර්ය එස්. එස්.ඩබ්. එම්. සෙනෙවිරත්න |
| • මහාචාර්ය එස්. උක්වත්ත |
| • මහාචාර්ය සරත් විජේසූරිය |
| • මහාචාර්ය ශාර්යා ස්කාරඑන්ග්වල් ( 10.01.2018 සිට විශ්‍රාමික) |
| • මහාචාර්ය ශ්‍යාම් ප්‍රනාන්දු |
| • මහාචාර්ය එස්. වාසලතන්ත්‍රි |
| • මහාචාර්ය ශ්‍රියන්ති ඒ. දැරණියගල |
| • මහාචාර්ය ටී.ඩී.කේ. වලේබොඩ |
| • මහාචාර්ය ටී.ඩී. සිල්වා |

| |
|---|
| • මහාචාර්ය ටී.එල්. එස්. තිරිමාන්න |
| • මහාචාර්ය යූ. සෙනරත් |
| • මහාචාර්ය වී. පී. වික්‍රමසිංහ |
| • මහාචාර්ය වී. ඒ. ද සිල්වා |
| • මහාචාර්ය ඩබ්ලිව්. බී. යාපා |
| • මහාචාර්ය ඩබ්. කේ. ද ආබෲ ( 24.11.2018 සිට විශ්‍රාමික) |
| • මහාචාර්ය ඩබ්. ආර්. එම්. ද සිල්වා |
| • මහාචාර්ය ඩබ්.එස්. ප්‍රේමවංස |
| • මහාචාර්ය ඩබ්.එස්.එස්. විජේසුන්දර |
| • මහාචාර්ය එස්.පී. ප්‍රේමරත්න |
| • මහාචාර්ය එම්.ආර්. විජේසිංහ |
| • මහාචාර්ය අයි. එම්. කේ. ප්‍රනාන්දු |
| • මහාචාර්ය පී. එන්. දයාවංශ |
| • මහාචාර්ය එම්.එස්. එස්. වීරසිංහ |
| • මහාචාර්ය සී. නිරිඇල්ල |
| • මහාචාර්ය ඒ. එස්. අදිකාරම් |
| • මහාචාර්ය පී. ලැනරෝල් |
| • මහාචාර්ය එස්. එස්. එස්. බී. ඩී. පී. සොයිසා |

| **1985 අංක 07 දරන 26(2) (J) (සංශෝධිත) විශ්වවිද්‍යාල පනත යටතේ තෝරා පත්කරගත් සාමාජිකයෝ** | |
|---|---|
| • ශාස්ත්‍ර | ආචාර්ය ඊ.එම්. එස්. රණසිංහ<br>ආචාර්ය චන්දන අලුත්ගේ |
| • අධ්‍යාපන | මහාචාර්ය ඒ. එම්. හෙට්ටිගේ ( 30.09.2018 දක්වා)<br>එච්. එම්. එල් කුමාරි මිය ( 01.10.2018 සිට) |
| • නීති | ආචාර්ය එච්.ඒ මේනක<br>ආචාර්ය කේ. කෝණසිංහ |
| • කළමනාකරණ සහ මූල්‍ය | ආචාර්ය ඒ.ඒ. අසීස්<br>ඩී.එම්.එස්. දසනායක |
| • වෛද්‍ය | ආචාර්ය එම්. ආර්. හනිෆා<br>ආචාර්ය පණ්ඩුක කරුණානායක. |
| • විද්‍යා | ආචාර්ය එස්. එස්.එන්. පෙරේරා<br>ආචාර්ය එරන්දතී ලොකුපිටිය |
| **වැඩබලන පුස්තකාලයාධිපති** | ඩී.සී. කුරුප්පු මිය |
| **ලේකම්: ලේඛකාධිකාරී** | කේ.ඒ. එස්. එඩ්වර්ඩ් මයා |

## 1.3 රැස්වීම්

අදාළ වර්ෂය තුළ විශ්වවිද්‍යාල පාලනාධිකාරි සහ අනෙකුත් පාලන කමිටු නොකඩවා රැස්වීම් පැවැත්විය. ඒ ඒ පාලනාධිකාරිය සහ අනෙකුත් පාලන මණ්ඩලවල රැස්වීම් සංඛ්‍යාව පහත දැක්වෙයි:

| | |
|---|---|
| පාලක සභාව | 12 |
| සනාතන සභාව | 10 |
| මූල්‍ය කමිටුව | 10 |
| කළමනාකරණ කමිටුව | 08 |
| පීඨාධිපති කමිටුව | 12 |
| නිවාඩු සහ ත්‍යාග කමිටුව | 11 |
| නීතිකාරක කමිටුව | 6 |
| සැලසුම් හා සංවර්ධන කමිටුව | 09 |
| පර්යේෂණ සහ සංවර්ධන කමිටුව | 10 |
| පීඨ මණ්ඩල | |
| • ශාස්ත්‍ර පීඨය | 12 |
| • අධ්‍යාපන පීඨය | 09 |
| • නීති පීඨය | 08 |
| • කළමනාකරණ සහ මූල්‍ය පීඨය | 10 |
| • වෛද්‍ය පීඨය | 14 |
| • විද්‍යා පීඨය | 10 |
| • පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය | 10 |
| • ශ්‍රී පාලි මණ්ඩපය | 10 |

## 1.4. විශ්වවිද්‍යාලය පිළිබඳ දළ විශ්ලේෂණය

ප්‍රථම උපාධි අපේක්ෂකයන් ඇතුළත් කරගැනීම.

| **පීඨය** | මාධ්‍යය | **2016** | **2017** | **2018** |
|---|---|---|---|---|
| ශාස්ත්‍ර | සි/දෙ/ඉ | 602 | 602 | 713 |
| අධ්‍යාපන | සි/දෙ/ඉ | - | - | 94 |
| නීති | සි/දෙ/ඉ | 250 | 250 | 250 |
| කළමනාකරණ | ඉ | 422 | 422 | 515 |
| වෛද්‍ය | ඉ | 197 | 191 | 218 |
| හෙද | ඉ | - | - | 88 |
| ජෛවීය විද්‍යා | ඉ | 110 | 414 | 114 |
| භෞතික විද්‍යා | ඉ | 197 | | 235 |
| අණුක ජීවවිද්‍යා සහ ජීවරසායන විද්‍යා | ඉ | 41 | | 58 |
| කාර්මික සංඛ්‍යාන සහ ගණිතමය මූල්‍ය | ඉ | 87 | | 95 |
| තාක්ෂණ | ඉ | - | - | 174 |
| එකතුව | | **1906** | **1879** | **2554** |

**ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි අපේක්ෂක ශිෂ්‍ය ගහණය- 2018**

| පීඨය | ප්‍රථම උපාධි ශිෂ්‍ය සංඛ්‍යාව | පශ්චාත් උපාධි අපේක්ෂක ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| ශාස්ත්‍ර පීඨය | 2144 | 1363 |
| අධ්‍යාපන පීඨය | 348 | 1461 |
| ප. උපාධි පීඨය | - | 2993 |
| නීති පීඨය | 1000 | 183 |
| වෛද්‍ය පීඨය | 1069 | 43 |
| කළමනාකරණ හා මූල්‍ය පීඨය | 1914 | 266 |
| හෙද පීඨය | 1611 | - |
| විද්‍යා පීඨය | 93 | 237 |
| තාක්ෂණ පීඨය | 175 | - |
| ශ්‍රීපාලි මණ්ඩපය | 632 | 87 |
| එකතුව | **8986** | **6633** |

**අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලය**

| වර්ග | 2016 | 2017 | 2018 |
|---|---|---|---|
| අධ්‍යයන | 551 | 577 | 603 |
| අධ්‍යයන සහායක | 40 | 41 | 46 |
| පරිපාලන සහ මූල්‍ය | 37 | 38 | 46 |
| පරිපාලන (වෙනත්) | 14 | 16 | 15 |
| එකතුව | **642** | **672** | **710** |

**ප්‍රථම හා පශ්චාත් උපාධි හදාරන විදේශීය සිසුන් සංඛ්‍යාව - 2018**

| පීඨය | ප්‍රථම උපාධි අපේක්ෂක විදේශික ශිෂ්‍ය සංඛ්‍යාව | පශ්චාත් උපාධි අපේක්ෂක විදේශික ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| ශාස්ත්‍ර | - | 23 |
| අධ්‍යාපන | - | 01 |
| ප.උ. අධ්‍යයන | - | 05 |
| නීති | 02 | - |
| කළ. හා මූල්‍ය | 04 | 07 |
| වෛද්‍ය | 61 | - |
| විද්‍යා | 01 | - |
| එකතුව | **68** | **36** |

## 1.5 සමස්ත කාර්ය දර්ශනය

2018 වර්ෂයේ දී ද විශ්වවිද්‍යාලය තම අධ්‍යයන කටයුතු පීඨ නවයක සහ අධ්‍යයනාංශ 56ක ක්‍රියාත්මක කළේය.

කොළඹ විශ්වවිද්‍යාලය 1556 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක සහයෝගයෙන් තම අරමුණු වෙත ගමන් කළ අතර එම පිරිසට 39% ක අධ්‍යයන කාර්ය මණ්ඩලයක්, 4% ක පරිපාලන කාර්ය මණ්ඩලයක් හා 57% ක අනධ්‍යයන කාර්ය මණ්ඩලයක් අයත් විය. (වගුව 01).




අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, මහාචාර්ය, සහකාර මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හා කථිකාචාර්යවරුන් අතර අනුපාතය පිළිවෙලින් 7%, 17% ,3%, 65% සහ 8% විය. (වගුව-02)



## අධ්‍යයන කාර්ය දර්ශනය

වසර 143කට වැඩි ප්‍රෞඪ ඉතිහාසයකට හිමිකම් කියන කොළඹ විශ්වවිද්‍යාලය ස්වරූපයෙන් සහ ස්වභාවයෙන් නවීන සහ ජාත්‍යන්තර මට්ටමේ පුරවර සරසවිය යන විරුද නාමය රැකගෙන තවදුරටත් තම මෙහෙවර ඉටුකිරීමෙහිලා පවතින බාධක ජයගැනීමේ නිරතව සිටියි. මෙම විශ්වවිද්‍යාලයෙහි භෞතික පිහිටීම "පුරවර සරසවියක්" ලෙස තම ශිෂ්‍යයන් වෙත ප්‍රදානය කළහැකි සියලු සම්පත් ලබාදීමෙහිලා ප්‍රමුඛ හේතුවක්ව පවතියි. පහසුවෙන් ළඟා විය හැකි ජාත්‍යන්තර තොරතුරු/සම්පත් මධ්‍යස්ථාන, පුස්තකාල, නෘත්‍යාගාර, ක්‍රීඩා සංකීර්ණ සහ වෙනත් පහසුකම් මෙම හේතුවලට අයත්ය. අගනගරය මධ්‍යයෙහි පිහිටීම නිසා විශාල පරාසයක සංස්කෘතික, රස වින්දනාත්මක සහ ව්‍යාපාරික පහසුකම් වෙත ළඟා වීමේ පහසුකම් ලැබී ඇත. විශ්වවිද්‍යාලය සතු ප්‍රෞඪ ඉතිහාසය සහ කාලාන්තරයක් තිස්සේ ස්ථාවරව පවතින එහි ශාස්ත්‍රීය සහ පරිපාලනමය යටිතල ව්‍යුහය සමග ඉගැන්වීම්, පර්යේෂණ සහ ප්‍රජා සේවාවල නූතන සහ නවෝත්පාදන ප්‍රවේශ භාවිත කරමින් "කාර්යදර්ශනය සංවර්ධන ක්‍රමෝපායට" (PISP) අනුගතව තම අරමුණු කරා ළඟා වීමට විශ්වවිද්‍යාලය සමත්වී ඇත. එසේම සමාජ සංහිඳියාව, සංස්කෘතික විවිධත්වය, සමාන අවස්ථා සහ එකමුතුකම වර්ධනය කරනසුළු බහු-සංස්කෘතික, බහු-වාර්ගික, බහු-ආගමික ගුරු ශිෂ්‍ය ප්‍රජාවකින් විශ්වවිද්‍යාලය සමන්විත වෙයි.ඉගෙනීම, ඉගැන්වීම සහ පර්යේෂණය සඳහා හිතකර පරිසරයක විශ්වවිද්‍යාලයේ සියලුම පීඨ, මණ්ඩප, ආයතන සහ පාසල් කිසිඳු බාධාවකින් තොරව සමාලෝචිත වසර තුළ ක්‍රියාත්මක විය.

## 2. පීඨ, මණ්ඩප, ආයතන සහ ඒකක

## 2.1 ශාස්ත්‍ර පීඨය

**හැඳින්වීම**

ශිෂ්‍ය සංඛ්‍යාව වශයෙන් ගත් කළ විශ්වවිද්‍යාලයෙහි විශාලතම පීඨය වන්නේ ශාස්ත්‍ර පීඨයයි. පීඨය සතු අධ්‍යයන අංශ එකොළහකි. බෞද්ධ අධ්‍යයනය, ප්‍රජා විද්‍යාව, ආර්ථික විද්‍යාව, ඉංග්‍රීසි, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම්, භූගෝල විද්‍යාව, ඉතිහාසය, ජාත්‍යන්තර සබඳතා, දේශපාලන හා රාජ්‍ය ප්‍රතිපත්ති, සිංහල හා සමාජ විද්‍යාවය. ඊට අමතරව පීඨය සතු ඒකක නම් අරාබි හා ඉස්ලාම් ශිෂ්ටාචාර ඒකකය, ශිෂ්‍ය පරිගනක ඒකකයෙන් හා පරිගනක අධ්‍යයන ඒකකයෙන් යුත් පරිගනක ඒකකය, ජනමාධ්‍ය ඒකකය,හා ගණිත ඒකකයයි. මෙම අධ්‍යයන අංශ හා ඒකක විද්‍යාර්ථීන්ට මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පාඨමාලා පිරිනමයි. ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධියට අමතරව බොහෝ අධ්‍යයන අංශ පශ්චාත් උපාධි හා ව්‍යාප්ත පාඨමාලා ඉදිරිපත් කරයි. මෙම වැඩ සටහන් පශ්චාත් උපාධි ඩිප්ලෝමා වල සිට දර්ශනසූරි උපාධි දක්වා විහිදී ඇත. බොහෝ සිසුහු සිය ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසුව අධ්‍යයන අංශ ඉදිරිපත් කරන පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා ලියාපදිංචි වෙති.

2018 වසරේ දී මහාචාර්ය අතුල රණසිංහ මහතා ශාස්ත්‍රපීඨයේ පීඨාධිපතිවරයා වශයෙන් සිය ධූර කාලය 15.01.2018 වනදා සම්පූර්ණ කරන ලද අතර 16.01.2018 දින සිට මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා මහතා ශාස්ත්‍රපීඨයේ පීඨාධිපතිවරයා වශයෙන් වැඩ බාර ගත්තේය. ශාස්ත්‍ර පීඨයේ නියෝජ්‍ය ලේඛකාධිකාරිවරයා ලෙස සමන් උයන්ගොඩ මහතා කටයුතු කළේය. මෙම වසර තුළ ශාස්ත්‍ර පීඨයේ අධ්‍යයනාංශ ප්‍රධානීන් ලෙස කටයුතු කළ ආචාර්ය මණ්ඩල සාමාජිකයන් මෙසේ ය; පූජ්‍ය එම්. ධම්මජෝති හිමි ( බෞද්ධ අධ්‍යයනාංශය) ආචාර්ය සුනේත්‍රා පෙරේරා (ප්‍රජාවිද්‍යා අධ්‍යයනාංශය) මහාචාර්ය පූජ්‍ය ඩබ්. විමලරතන හිමි (ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය) මහාචාර්ය නෙලුෆර් ද මෙල් (15.07.2018 දක්වා ) හා ආචාර්ය ශර්මාල් විජේවර්ධන (16.07.2018 සිට) (ඉංග්‍රීසි අධ්‍යයනාංශය); සාවිත්‍රි ඩයස් මිය (09.05.2018 දක්වා ) හා ආචාර්ය ශෂිනි එම්. තේනබදු (10.05.2018 සිට ) (ඉංග්‍රීසි භාෂා අධ්‍යයන), මහාචාර්ය ලසන්ත මානවඩු (භූගෝල විද්‍යා අධ්‍යයනාංශය) ආචාර්ය නිර්මලී විජේගුණවර්ධන (28.09.2018 දක්වා) හා ආචාර්ය ජානකී ජයවර්ධන (29.09.2018 ) (ඉතිහාසය අධ්‍යයනාංශය), ආචාර්ය මනීෂා වනසිංහ පැස්කුවල් (ජාත්‍යන්තර සබඳතා අධ්‍යයනාංශය) මහේෂ් සේනානායක මහතා (31.01.2018 දක්වා) , ආචාර්ය කේ.එස්. කේ. ආරියදාස මහතා (01.02.2018 සිට 30.04.2018 දක්වා), ජී.පී.වී.ආර්. ද සිල්වා මිය (01.05.2018 සිට) (දේශපාලන විද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය) ආචාර්ය ලතා ගුරුසිංහ (සිංහල අධ්‍යයනාංශය) සහ මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා 15.01.2018 දක්වා) හා ආචාර්ය නිශාර ප්‍රනාන්දු(16.01.2018 සිට) (සමාජවිද්‍යා අධ්‍යයනාංශය).

තවද, මතු නම් සඳහන් ආචාර්යවරු අධ්‍යයන ඒකක සම්බන්ධීකාරකවරුන් ලෙස කටයුතු කළහ. ආචාර්ය එන්. ගෆූර්දීන් (අරාබි හා ඉස්ලාමීය ශිෂ්ටාචාර ඒකකය), මහාචාර්ය සමන්ත හේරත් (ජනමාධ්‍ය ඒකකය), මහාචාර්ය එල්. මානවඩු (පරිගණක ඒකකය) සහ ආචාර්ය ඩී.ඩී.පී.එම්. දුනුසිංහ (ගණිත ඒකකය)

**පීඨයේ දැක්ම හා මෙහෙවර**

ගතික ලෝකය සමග සමාජ වගකීමක් හා ආචාර ධර්මීය කැපවීමක් සහිතව සම්බන්ධ වීම් හැකියාව ශිෂ්‍යයන් වෙත ලබාදීමට හැකිවන පරිදි ඔවුන් තුළ සුවිශේෂී නිපුණතා හා දක්ෂතා පමණක් නොව පුළුල් සමාජයීය හා මානවවාදී පදනමක් වගා කිරීම මින් අදහස් වේ.

**දැක්ම**

"නිර්මාණශීලී චින්තනය, අධ්‍යාපනය ලබා දීම, පර්යේෂණ හා ප්‍රජා සත්කාරය පිළිබඳ දකුණු ආසියානු කලාපයේ සුවිශිෂ්ට මධ්‍යස්ථානයක් වීම".

**මෙහෙවර**

"ඉගැන්වීම, පර්යේෂණය, පුහුණු කිරීම හා ඇගයීමේ ඉහළම ශාස්ත්‍රීය හා ආචාර ධර්මීය ප්‍රමිති අනුගමනය කරමින් සමාජ විද්‍යා හා මානව ශාස්ත්‍රවල ශාස්ත්‍රීයභාවය, විචාරශීලීත්වය, ශක්‍යතා හා නිපුණතා සාමූහිකව ප්‍රවර්ධනය කිරීම."

**ශාස්ත්‍ර පීඨයේ ප්‍රධාන ක්‍රියාකාරකම් -2018**

උසස් අධ්‍යාපන කටයුතු සඳහා තරහකාරී පදනම යටතේ රු.මි. 100 ක ආධාර ශාස්ත්‍ර පීඨයට ලෝක බැංකුව විසින් ශාස්ත්‍ර පීඨයට පිරිනමන ලදී. මෙම ව්‍යාපෘතිය **"**උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීම සඳහා වූ මෙහෙයුම " (AHEAD) ලෙස හැඳින්වේ. අධ්‍යයන, පර්යේෂණ, රැකියා අවස්ථා සහ සමාජ-චිත්තවේගීය කුසලතා වැඩිදියුණු කිරීම මෙහි අරමුණු වේ. 2019 වසරේ මුල සිට එහි ක්‍රියාකාරකම් ආරම්භ කරනු ඇත.

විද්‍යාර්ථීන්ගේ අධ්‍යයනය, පර්යේෂණ හා රැකියා කුසලතා අභිවර්ධනය කිරීම සඳහා යුනෙස්කෝ ආයතනය විසින් ප්‍රතිපාදන සපයන ලද සංකලිත ඉගෙනුම් ව්‍යාපෘතිය මගින් ශාස්ත්‍ර පීඨයට රු.මි. 4 කට ආසන්න මුදලක් පිරිනමන ලදී.

ශාස්ත්‍ර පීඨයේ පැවති සිවුවන අන්තර්ජාතික සමුළුව "ඩිජිටල් ලෝකය තුළ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන්හි ප්‍රගමනයට පවතින අවස්ථා හා අභියෝග**"** යන මැයෙන් 2018 නොවැම්බර් 08 - 09 දින වල පවත්වන ලදී. එය කොළඹ විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන්ට, ශාස්ත්‍ර පීඨයේ පශ්චාත් උපාධි අපේක්ෂකයන්ට හා බාහිර ප්‍රජාවටද විවෘත විය. මෙහිදී පර්යේෂණ පත්‍රිකා 36 ක් ඉදිරිපත් කරන ලදී. මෙහි ප්‍රධාන දේශනය**"ඉන්දියානු සාගර ආර්ථිකය නව ගෝලීය වර්ධන ධ්‍රැවයක්ද?"** යන මැයෙන් **ලක්ෂ්මන් කදිරගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා උපායමාර්ගික සැලසුම් අධ්‍යයන ආයතනයෙහි විධායක අධ්‍යක්ෂ ආචාර්ය ගනේෂන් විග්නරාජා** විසින් පවත්වන ලදී.

ශාස්ත්‍ර පීඨයේ වාර්ෂික සමාලෝචන වැඩමුලුව 2018 මැයි 25 හා 26 යන දිනවල වස්කඩුව සිට්‍රස් හෝටලයේදී පවත්වන ලදී. වැඩසටහන් කළමනාකරණය, මානව හා භෞතික සම්පත්, වැඩසටහන් සැලසුම්කරණය හා සංවර්ධනය , පාඨමාලා/ මොඩියුල සැලසුම්කරණය හා සංවර්ධනය, ඉගනුම් ඉගැන්වීම් ක්‍රමවේද, ඉගෙනුම් පරිසරය, ශිෂ්‍ය සහය හා ප්‍රගතිය, ශිෂ්‍ය ඇගයුම් හා ත්‍යාග, නවෝත්පාදක හා යහසෞඛ්‍ය පුරුදු යන තේමා ඔස්සේ මෙහිදී සාකච්ඡා පවත්වන ලදී.

ප්‍රජාවිද්‍යා අධ්‍යයන අංශය සිය පස්වන වාර්ෂික පර්යේෂණ සැසිවාරය 2018 නොවැම්බර් 23 දින පීඨයේදී පැවැත්විය. එහිදී ව්‍යාප්ත පර්යේෂණ පත්‍රිකා දහසයක් ඉදිරිපත් විය. මෙම පර්යේෂණ සැසිවාරයේ තේමාව වූයේ "ජනගහනය හා ධරණීය සංවර්ධනය" යන්නයි. එක්සත් ජාතීන්ගේ ජනගහණ අරමුදෙල් නියෝජිත රිට්සු නාකෙන් මෙනවිය මෙහි ප්‍රධාන අ◌ාරාධිතයා වූවාය. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහාචාර්ය වසන්ත ගුණතුංග මහතා විසින් ප්‍රධාන දේශනය පවත්වන ලදී.

කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ සංචාරක අධ්‍යයන වැඩසටහන් හදාරන සිසුන් සහ සංචාරක ආර්ථික විද්‍යාව හා ආගන්තුක කළමනාකරණය පිළිබඳ ආදි විද්‍යාර්ථීන්ගේ සමුළුව (AATHEM) එක්ව අඛණ්ඩව පස්වන වරට සංවිධානය කරන ලද සංචාරක නායකයන්ගේ සමුළුව (TLS) සහ ජාත්‍යන්තර සංචාරක පර්යේෂණ සැසිවාරය (ITRC) "තිරසර සංචාරක ක්ෂේත්‍රයේ සංවර්ධනය, සුවිශේෂීතාව, තරගකාරිත්වය සහ නවෝත්පාදනය සඳහා ගෝලීය වටිනාකම් දාම ඒකාබද්ධ කිරීම " යන තේමාවෙන් පවත්වන ලදී. මෙය එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය (UNWTO) විසින් ශ්‍රී ලංකාවේ සංවිධානය කරන ලද ලෝක සංචාරක දින නිල සැමරුම හා සමගාමීව ශ්‍රී ලංකා සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන්ගේ සහභාගිත්වයෙන් බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේදී 2018 ඔක්තෝබර් 4-5 දිනවල සංචාරක ප්‍රවර්ධන හා ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යාංශයේ සහයෙන් පවත්වන ලදී.

ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ "2018 කොළඹ තරුණ ආර්ථික විද්‍යාඥයන්ගේ සමුළුව" **2018** නොවැම්බර් **19** වනදා කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේදී පැවැත්විණි. උපකුලපතිතුමා නියෝජනය කරමින් ප. උපාධි පීඨයේ පීඨාධිපති මහාචාර්ය නයනි මෙලගොඩ මීට සහභාගි වූවාය. මහාචාර්ය සරත් රාජපතිරණ මහතා විසින් මෙහි ප්‍රධාන දේශනය පවත්වන ලදී. ආර්ථික විද්‍යා විෂයයෙන් මෑතදී උපාධිලත් අයටද, ආර්ථික විද්‍යා විශේෂවේදී උපාධිය හදාරන දෙවන, තෙවන හා සිවුවන වසර විද්‍යාර්ථීන්ටද විවෘත විය. සාරාංශ ග්‍රන්ථයේ සාරාංශ 32 ක් ඇතුළත් විය.

14 වන දකුණු ආසියානු ආර්ථික විද්‍යා සිසුන්ගේ හමුව ( SAESM) 2018 ජනවාරි 18 -21 දිනවල බංගලාදේශයේදී පවත්වන ලදී. ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ සිසුහු පිරිසක් මීට සහභාගි වූහ. මෙය ස්වාධීනව සංවිධානය කරන ලද්දකි. දකුණු ආසියාතික රටවලින් සරසවි උපාධි අපේක්ෂක ආර්ථික විද්‍යා ශිෂ්‍යයන් වාර්ෂිකව පවත්වන ලද ශාස්ත්‍රීය වැඩසටහනට ලෝක බැංකුව අනුග්‍රහය දැක්වීය.තේමාවට අදාළව අදහස් බෙදාහදා ගැනීමට දකුණු ආසියාවේ තරුණ ආර්ථික විද්‍යා උපාධි අපේක්ෂකයින්ට SAESM විසින් සුවිශේෂී වේදිකාවක් ලබා දුන්නේය.

ඉංග්‍රීසි අධ්‍යයනාංශය සහ ජර්මනියේ ජෙස්ටස් ලිබීග් විශ්ව විද්‍යාලයේ 2009 දී පිහිටවන ලද ෆර්ඇන්ග්ලිස්ටික් ආයතනය අතර ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල හුවමාරු වැඩසටහන 2018 වසරේද සාර්ථකව ක්‍රියාත්මක විය. 2018 පළමු සෙමෙස්තරය ඉංග්‍රීසි අධ්‍යයනාංශයේ සිසුහු තිදෙනෙක් ජර්මනියේ චාරිකාවක නිරත වූහ. ජර්මන් සිසුහු තිදෙනෙක් 2018 දෙවන සෙමෙස්තරය සඳහා ඉංග්‍රීසි අධ්‍යයනාංශයේ ලියාපදිංචි වූහ.

2018 දී ඉංග්‍රීසි අධ්‍යයන අංශය පර්යේෂණ ප්‍රතිපාදන දෙකක් (2019 දී භාවිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා) ලබා ගන්නා ලදී. 2018 සැප්තැම්බර් මාසයේදී අධ්‍යයන අංශය සූරිච් විශ්වවිද්‍යාලය විසින් පිරිනමන ලද සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘති ප්‍රතිපාදනයක් ලබා ගත්තේය. මෙය පිරිනැමුනේ කොළඹ විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයන අංශයේ හා සූරිච් විශ්වවිද්‍යාලයේ ආගමික අධ්‍යයන අංශයේ ආචාර්ය මණ්ඩලය අතර ක්‍රියාත්මක වන වැඩසටහනක් වෙනුවෙනි. "ඩිජිටල් මාධ්‍යය තුළින් සුහදත්වය" මෙහි තේමාව වේ. උසස් අධ්‍යාපන කටයුතු සඳහා තරහකාරී පදනම යටතේ ලෝක බැංකුව පිරිනමන රු.මි. 10 ක ආධාර අධ්‍යයන අංශයට හිමිවිය. මෙම සංවර්ධන දිශානතිගත පර්යේෂණ ප්‍රදානය (DOR) හිමිවූයේ ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි අධ්‍යයනයේ හරස්කඩක් හා ශ්‍රී ලංකාවේ ඩිජිටල් මානව ශාස්ත්‍ර අධ්‍යයනය

සඳහා වූ ව්‍යාපෘති යෝජනාව වෙනුවෙනි. මෙය උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධනය වේගවත් කිරීම සඳහා වූ මෙහෙයුම (AHEAD) යටතේ පිරිනමන ලදී.

| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | බඳවා ගැනීම් | | පළමු වසර සිසුන් | | දෙවන වසර සිසුන් | | තෙවන වසර සිසුන් | | සිවුවන වසර සිසුන් | | උපාධිලත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | **2017** | **2018** | **2017** | **2018** | **2017** | **2018** | **2017** | **2018** | **2017** | **2018** | **2017** | **2018** |
| නීති | LL.B | සිංහල | 252 | 250 | 173 | 123 | 188 | 170 | 154 | 173 | 192 | 182 | 192 | 250 |
| | | දෙමළ | | | 22 | 26 | 18 | 23 | 32 | 21 | 29 | 18 | 28 | |
| | | ඉංග්‍රීසි | | | 53 | 99 | 45 | 59 | 62 | 50 | 33 | 49 | 30 | |
| | | | | | | | | | | | | | | |
| එකතුව | | | **252** | **250** | **248** | **248** | **251** | **252** | **248** | **244** | **254** | **249** | **250** | **250** |

ආ) පශ්චාත් උපාධි

| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | බඳවා ගැනීම් (ශිෂ්‍ය සංඛ්‍යාව) | | සම්පූර්ණ කළ සිසුන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | | | **2017** | **2018** | **2017** | **2018** |
| නීති | LL.M | ඉංග්‍රීසි | 166 | - | | 121 |
| | දර්ශනපති | ඉංග්‍රීසි | | 11 | | 02 |
| | දර්ශනසූරි | ඉංග්‍රීසි | | 4 | | 03 |
| | | | | | | |
| එකතුව | | | | **15** | | **126** |

### 2.4.3. විදේශීය සිසුන් :

| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | පළමු වසර සිසුන් | | දෙවන වසර සිසුන් | | තෙවන වසර සිසුන් | | සිවුවන වසර සිසුන් | | උපාධිලත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 |
| නීති | එල් එල් බී | ඉංග්‍රීසි | | - | | - | | - | | 02 | | - |
| | | | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | **02** | | |

**2.4.4.** අධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු:

| පීඨය | විෂයය | මාධ්‍යය | ජෙ. මහා. | මහා. | ජෙ. කථිකා. | කථිකා. | සීමා. කථිකා. | බාහිර කථිකා. |
|---|---|---|---|---|---|---|---|---|
| පෞද්ගලික හා තුලනාත්මක නීති අධ්‍යයන අංශය | රෝම නීතිය | සි<br>දෙ<br>ඉ | | | <br><br>1 | | 1<br>1 | |
| | නීති පද්ධති | සි<br>දෙ<br>ඉ | | | 1 | | 1 *<br><br>1 | |
| | නීති විධික්‍රම | සි<br>දෙ<br>ඉ | | | 1<br><br>1 | | 1 *<br>2 | |
| | භූමි නීතිය | සි<br>දෙ<br>ඉ | | | <br><br>1 | | 1<br>1 | |
| | පවුල් නීතිය | සි<br>දෙ<br>ඉ | | | 1 | | 1 *<br>1<br>2 | |
| | කොන්ත්‍රාත් නීතිය | සි<br>දෙ<br>ඉ | | | | <br>1 | 1 | |
| | සාධාරණත්වය හා භාර නීතිය | සි<br>දෙ<br>ඉ | | | <br>1 | | 1<br><br>1 | |
| | දිලීක්ත නීතිය | සි *<br>දෙ<br>ඉ | | | 1 | | 1<br>1<br>1 | |
| | සාක්ෂි හා පටිපාටි නීතිය | සි<br>දෙ<br>ඉ | | <br>1 | 1<br><br>1 | | | |
| | ආඥා පණත් අර්ථ නිරූපණය | සි<br>දෙ<br>ඉ | | | | | 1<br>1<br>1 | |
| | විෂයය | මාධ්‍යය | ජෙ. මහා. | මහා. | ජෙ. කථිකා. | කථිකා. | සීමා. කථිකා. | බාහිර කථිකා. |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | කම්කරු නීතිය | සි<br>දෙ<br>ඉ | | | | 1<br>1<br>1 | | |
| වාණිජ නීති අධ්‍යයන අංශය | ව්‍යාපාර නීතිය | සි<br>දෙ*<br>ඉ | | <br>1<br> | | | <br>1<br>1 | 1<br><br> |
| | ආයෝජන නීතිය | සි<br>දෙ *<br>ඉ * | | <br>1<br>1 | | | 1<br>1<br>1 | |
| | සමාගම් නීතිය | සි<br>දෙ*<br>ඉ | | <br>1<br> | | | 1<br>1<br>1 | |
| | බුද්ධිමය දේපළ නීතිය | සි<br>දෙ<br>ඉ * | | <br><br>1 | 1<br><br>1 | | <br>1<br> | |
| | බදු නීතිය | සි<br>දෙ<br>ඉ | | | | | <br>1<br>1 | 1<br><br> |
| පොදු සහ ජාත්‍යන්තර නීති අධ්‍යයන අංශය | ව්‍යවස්ථාදායක නීතිය I | සි<br>දෙ<br>ඉ * | | | <br><br>1 | 2<br>1<br>1 | | |
| | අපරාධ නීතිය | සි*<br>දෙ<br>ඉ | | 1<br>1<br> | | | 1<br><br> | <br><br>1 |
| | ව්‍යවස්ථාදායක නීතිය II | සි*<br>දෙ<br>ඉ | | <br>1<br> | | 1<br><br>1 | 1<br><br> | |
| | පරිපාලන නීතිය | සි<br>දෙ<br>ඉ | | | <br><br>2 | | 1<br>1<br> | |
| | පොදු ජාත්‍යන්තර නීතිය | සි<br>දෙ<br>ඉ | | 1<br><br> | <br>1<br> | <br><br>1 | | |
| | මානවවාදී නීතිය | සි<br>දෙ<br>ඉ | | | | 1<br><br> | <br>1<br>1 | |
| | සාගර නීතිය | සි<br>ඉ | | | | 1<br>1 | | |
| | පාරිසරික නීතිය | සි<br>දෙ<br>ඉ * | | | 1<br>1<br>1 | | 1<br><br>1 | |
| | මානව හිමිකම් නීතිය | සි*<br>දෙ<br>* ඉ | | | 1<br>1<br>1 | 1<br><br> | | <br><br>1 |
| **එකතුව** | | | | **06** | **11** | **19** | **07** | **03** |

* සම- ඉගැන්වීම්

**2.4.5. අනධ්‍යයන කාර්ය මණ්ඩලය:**

| පීඨය/අංශය | ජ්‍යෙෂ්ඨතම | ජ්‍යෙෂ්ඨ | කණිෂ්ඨ | සුළු සේවක | කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|---|
| පීඨාධිපති කාර්යාලය | | 2 | 6 | 1 | 1 |
| පෞද්ගලික හා තුලනාත්මක නීති අධ්‍යයන අංශය | | | 1 | 1 | |
| වාණිජ නීති අධ්‍යයන අංශය | | 1 | | 1 | |
| පොදු සහ ජාත්‍යන්තර නීති අධ්‍යයන අංශය | | | 1 | 1 | |
| LL.M ඒකකය | | | | | 2 |
| | | | | | |
| **එකතුව** | | **3** | **8** | **4** | **3** |

**2.4.6. පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශණ පිළිබඳ විස්තර:**

| **විෂයය** | ප්‍රකාශිත | අලවි කළ | ඉදිරිපත් කළ |
|---|---|---|---|
| | **2018** | **2018** | **2018** |
| a. **පර්යේෂණ සංඛ්‍යාව** | | | |
| පෞද්ගලික හා තුලනාත්මක නීති අධ්‍යයන අංශය | 19 | | |
| පොදු හා ජාත්‍යන්තර නීති අධ්‍යයනය | 04 | | 12 |
| පොදු හා ජාත්‍යන්තර නීති අ.අ. | 05 | | 02 |
| f. වෙනත් – පරිච්ඡේද, වාර්තා | 02 | | |
| **එකතුව** | **30** | | **14** |

**2.4.7. පාඨමාලා, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර :**

| **විෂයය** | **සහභාගි වූ** | **සම්පූර්ණ කළ** | **ඉදිරිපත් කළ** |
|---|---|---|---|
| | **2018** | **2018** | **2018** |
| a. **පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව** | - | - | - |
| ආචාර්ය යූ.ඒ.ටී.උදයංගනී | - | 01 | 01 |
| ජී.අයි. එම්. ලියනගේ මයා | - | 01 | - |
| ව්‍යාපාර නීතිය පිළිබඳ සහතිකපත් පාඨමාලාව | - | - | - |
| b. වෙනත් | - | - | - |
| TRILA සමුළු ඉදිරිපත්කිරීම, සිංගප්පූරුව (එන්. මෙන්ඩිස් මිය) | 01 | - | - |
| **එකතුව** | **01** | **02** | **01** |

**2.4.8. ලැබූ සම්මාන පිළිබඳ විස්තර**

| **විෂයය** | ත්‍යාග සංඛ්‍යාව | |
|---|---|---|
| | **2017** | **2018** |
| a. දේශීය සම්මාන | 01 | |
| මහාචාර්ය වී. ටී. තමිල්මාරන් | | |
| b. ජාතික සම්මාන | | |
| c. ජාත්‍යන්තර සම්මාන | | |
| මහාචාර්ය වී. ටී. තමිල්මාරන් | | 01 |
| d. වෙනත් | | |
| **එකතුව** | **01** | **01** |

**2.4.9. අරඹන ලද නව පාඨමාලා**

| අංශය | පාඨමාලාව | මාධ්‍යය | සහතික | | ඩිප්ලෝමා | | ප.උ. ඩිප්ලෝමා | | ශාස්ත්‍රපති | | දර්ශනපති | | දර්ශනශූරි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | **2017** | **2018** | **2017** | **2018** | **2017** | **2018** | **2017** | **2018** | **2017** | **2018** | **2017** | **2018** |
| වාණිජ්‍ය නීති අධ්‍යයනාංශය | ව්‍යාපාර නීතිය පිළිබඳ සහතිකපත් (3 කණ්ඩායම) | සි දෙ ඉ | | 1 | | | | | | | | | | |
| **එකතුව** | | | | **1** | | | | | | | | | | |

## 2.5. කළමනාකරණ හා මූල්‍ය පීඨය

**දැක්ම**

දිවයිනේ ආදිතම විශ්ව විද්‍යාලයේ ඓතිහාසික බැඳීම් වලින් කුළුගැන්වමින් එයින් උරුම වූ බුද්ධිමය සම්ප්‍රදායන්ගෙන් පොහොසත්ව බහුක්ව සමාජයක් තුළ ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම් ඉහළ නංවමින් දැනුම, අධ්‍යාපනය, පර්යේෂණ නිර්මාණශීලිත්වය හා ව්‍යවසායකත්වය එක්තැන් කිරීම මගින් මානව සංවර්ධනයට උරදෙන ගෝලීය මට්ටමේ ආයතනයක් බවට පත් වීම

**මෙහෙවර**

ශ්‍රී ලංකාවේ කළමනාකරණ හා ව්‍යාපාර අධ්‍යයන ක්ෂේත්‍රයේ ඉහළ ගුණාත්මයක් සහිත අධ්‍යාපන හා විධායක වැඩසටහන් නිර්මාණශීලී හා සහයෝගිතා පරිසරයක් තුළ ක්‍රියාත්මක කරමින් සමාජ අභිවෘද්ධිය සඳහා කළමණාකරන ශක්‍යතාව වර්ධනය කරන ප්‍රමුඛතම පීඨය බවට පත්වීම.

**හැඳින්වීම**

1994 දී ස්ථාපනය කරන ලද කළමනාකරණ හා මූල්‍ය පීඨය විශ්ව විද්‍යාලයේ ශීඝ්‍රයෙන් දියුණුවන පීඨයක් වේ. පළමුව මෙය වාණිජ හා කළමණාකරණ අංශය නමින් ශාස්ත්‍ර පීඨයේ ස්ථාපිත විය. ශාස්ත්‍රපීඨ සිසුන් බොහෝ දෙනෙකුගේ ආකර්ෂණයට ලක්වූ මෙය පසුව ස්වාධීන අධ්‍යයන අංශයක් විය. මේ වේගවත් වර්ධනය නිසා 1980 දශකයේදී කළමනාකරණ හා මූල්‍ය සඳහා නව පීඨයක අවශ්‍යතාව මතුවිය. මේ අවශ්‍යතාව සපුරා ගැනීම පිළිබඳ විද්වතුන්, ආචාර්යවරුන් අතර පැවති සාකච්ඡා මල්පල ගැන්වී 1993 දී ශාස්ත්‍ර පීඨය යටතේ ක්‍රියාත්මක වූ වාණිජ හා කළමනාකරණ අංශ වලින් සමන්විත ස්වාධීන පීඨයක් පිහිටුවන ලදී.1994 දී මෙසේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ ස්ථාපනය සිදුවිය. පසුගිය දශක දෙක තුළ පීඨයේ ප්‍රථම උපාධි අපේක්ෂක හා පශ්චාත් උපාධි අපේක්ෂක විද්‍යාර්ථීන් සංඛ්‍යාව ඉතා ඉහළ වර්ධනයක් පෙන්වන අතර 2017 වසරේදී එම සංඛ්‍යාව 1900 විය. පීඨයේ මෙහෙවර ශ්‍රී ලංකාවේ කළමනාකරණ හා ව්‍යාපාර අධ්‍යයන ක්ෂේත්‍රයේ ඉහළ ගුණාත්මයක් සහිත අධ්‍යාපන හා විධායක වැඩසටහන් නිර්මාණශීලී හා සහයෝගිතා පරිසරයක් තුළ ක්‍රියාත්මක කරමින් සමාජ අභිවෘද්ධිය සඳහා කළමණාකරන ශක්‍යතාව වර්ධනය කරන ප්‍රමුඛතම පීඨය බවට පත්වීම වන අතර එයට ළඟා වීමට කැපවී කටයුතු කරයි.

ව්‍යාපාර ලෝකයේ මුහුණ දෙන අභියෝගයන්ට අනුකූලව කළමනාකරණ අධ්‍යාපනයේ උසස් ප්‍රමිතීන් සකස් කරමින් එහි වැඩසටහන් අඛණ්ඩව යාවත්කාලීන කරමින් පීඨය විසින් ඩිප්ලෝමා, උපාධි අපේක්ෂක හා පශ්චාත් උපාධි පාඨමාලාවලට විවිධාකාර වැඩසටහන් සපයනු ලබයි. මේ වනවිට පීඨය ගිණුම්කරණය , ව්‍යාපාර ආර්ථිකය , මූල්‍ය, මානව සම්පත් කළමනාකරණය, අලෙවිකරණය, කළමනාකරණ සංවිධාන අධ්‍යයනය, ජාත්‍යන්තර ව්‍යාපාර හා ආගන්තුක සත්කාර හා විවේකය කළමනාකාරණය යන අංශයන්හි විශේෂ ප්‍රාගුණ්‍යය සපයන අධ්‍යයන අංශ හතකින් සමන්විත වන අතර ව්‍යාපාර පරිපාලනවේදී (BBA) උපාධිය පිරිනමයි. පීඨය විසින් පිරිනමන ව්‍යාපාර පරිපාලනවේදී ශාස්ත්‍රපති (MBA) උපාධිය ලොව පුරා ඉහළ පිළිගැනීමක් ලැබුවකි. මෙසේ පිරිනමන උපාධි අතර ව්‍යාපාර පරිපාලනවේදී හා ගිණුම්කරණය හා තොරතුරු තාක්ෂණය, මූල්‍ය, මානව සම්පත් කළමනාකරණය, අලෙවිකරණය හා ජාත්‍යන්තර ව්‍යාපාර යන අංශයන්හි විශේෂ උපාධි පිරිනමයි.

එපමණක් නොව පීඨය දර්ශනපති/ දර්ශනසූරී විධායක ව්‍යාපාර පරිපාලනවේදී ශාස්ත්‍රපති (EMBA), ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක ඩිප්ලෝමාව(EDBA), බැංකු හා මූල්‍ය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා, ව්‍යවසායකත්වය හා සුළු ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා , මුද්‍රන තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා, සුළු ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා, මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා, පරිගනක ආශ්‍රිත ගිණුම්කරණය හා තොරතුරු පද්ධති පිළිබඳ ඩිප්ලෝමා ආදිය පිරිනමනු ලැබේ.

අධ්‍යයන අංශ වලට අමතරව, ශිෂ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීමට හා විශේෂයෙන් ව්‍යාපාර පරිපාලනවේදී I අදියරේ පාඨමාලා කෙරෙහි යොමු වීමට පීඨයෙහි අධ්‍යයන කටයුතු අංශය (AAU) කැපවෙයි. කර්මාන්ත අංශයේ සීමාවාසික පුහුණු අවස්ථා ලබා ගැනීමට සිසුන්ට උපකාර කිරීමට හා වෘත්තීය මාර්ගෝපදේශන ලබා දීමට වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය (CGU) පිහිටුවා ඇත. පශ්චාත් උපාධි හා මධ්‍ය වෘත්තිය සංවර්ධන ඒකකය (PGMCDU පශ්චාත් උපාධි හා ව්‍යාප්ති වැඩසටහන් සම්බන්ධීකරණය කරයි. 2005 දී පීඨය පාඨමාලා ඒකක ක්‍රමයට (CUS) අනුගත වූ අතර පවතින උසස් අධ්‍යාපන ජාතික රාමුවට සමගාමී වන පරිදි 2016 දී ව්‍යාපාර පරිපාලනවේදී වැඩ සටහන ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) අනුව සකසන ලදී.

**පීඨයේ ආයතනික ව්‍යුහය පහත සටහන මගින් දැක්වේ.**




වර්තමානයේ පීඨය සතුව අධ්‍යයන අංශ හතක් පවතී. ඒවා නම්:

**ගිණුම්කරණ අධ්‍යයන අංශය–** මෙම අංශය ගිණුම්කරණය පිළිබඳ විශේෂ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය හැදෑරීමට පහසුකම් සලසයි. ගිණුම්කරණ දෘෂ්ටියකින් ව්‍යාපාර හා ආයතනික ක්‍රියාකාරකම් විශ්ලේෂණය කිරීමට හා වාර්තා කිරීමට මින් ඉඩකඩ සපයන මෙම අංශය CIMA, ICASL හා ACCA වැනි වෘත්තීය ගිණුම්කරණ ආයතන හා සහයෝගීව කටයුතු කරයි.

**ව්‍යාපාර ආර්ථික අධ්‍යයන අංශය** – මෙම අංශය ව්‍යාපාර ආර්ථිකය පිළිබඳ විශේෂ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය හැදෑරීමට පහසුකම් සලසයි. ආර්ථික දෘෂ්ටියකින් ව්‍යාපාර හා ආයතනික සංසිද්ධීන් විශ්ලේෂණය කිරීමට මෙම අංශය ඉඩකඩ සපයන අතර විවිධ ආර්ථික විද්‍යා පාඨමාලා හැදෑරීම මගින් විෂය දැනුම පුළුල් කිරීම මෙන්ම ව්‍යාපාර හා කළමනාකරණ ගැටලු විශ්ලේෂණයට අවශ්‍ය කුසලතා ඔප් නැංවෙතැයි අපේක්ෂිතය.

**මූල්‍ය අධ්‍යයන අංශය** – මෙම අංශය මූල්‍ය පිළිබඳ විශේෂ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය හැදෑරීමට පහසුකම් සලසයි. මෙමගින් ආයතනික මූල්‍ය කටයුතු, ආයෝජන කළමනාකරණය, ජාත්‍යන්තර මූල්‍ය, මූල්‍ය ආයතන හා මූල්‍ය ආදර්ශනය යන අංශ හා සම්බන්ධ රැකියාවල ඉහළ යාමට සිසුන් දිරිගන්වයි. මෙම අංශය CFA, CISI, AMBA පර්යේෂණ , CMA, CIMA, හා ACCA වැනි වෘත්තීය ගිණුම්කරණ ආයතන හා සහයෝගීව කටයුතු කරයි.

**මානව සම්පත් කළමනාකරණ අධ්‍යයන අංශය** – මෙම අංශය මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විශේෂ ව්‍යාපාර කළමනාක පරිපාලනවේදී උපාධිය හැදෑරීමට පහසුකම් සලසයි. එය සංවිධානයක හෝ ව්‍යාපාරයක අංගයක් ලෙස මානව සම්පත් කළමනාකරණය කිරීම පිළිබඳ උගැන්වීම සිදුකරයි. තවද, එය මානව සම්පත් නිපුණතා අත්කර ගැනීමට සිසුන්ට අඩිතාලමක් වේ.

**ජාත්‍යන්තර ව්‍යාපාර අධ්‍යයන අංශය -** මෙම අංශය ජාත්‍යන්තර ව්‍යාපාර පිළිබඳ විශේෂ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය හැදෑරීමට පහසුකම් සලසයි. මෙමගින් අලෙවිකරණය, ගිණුම්කරණය, මූල්‍ය, මානව සම්පත් කළමනාකරණය, ආර්ථිකය හා නීතිය යන අංශයන්හි ගෝලීය දෘෂ්ටිකෝණයන් වටහා ගැනීම අපේක්ෂිතය.

**කළමනාකරණ හා සංවිධාන අධ්‍යයන අංශය -** මෙම අංශය කළමනාකරණ හා සංවිධාන අධ්‍යයනය පිළිබඳ විශේෂ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය හැදෑරීමට පහසුකම් සලසයි. මෙමගින් කළමනාකරණය හා සංවිධානවල විවිධ අංශ පිළිබඳ දැනුම, කුසලතා හා පුහුණුව ලබා දීමට අපේක්ෂිතය. එපමණක් නොව ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රමාණාත්මක න්‍යායාත්මක වැටහීමක් ලබා දීමටත් තත්කාලීන කළමනාකරණ ගැටලු විශ්ලේෂණ හැකියාව ලබා දීමටත් බලාපොරොත්තු වේ.

**අලවිකරණ අධ්‍යයන අංශය** – මෙම අංශය අලවිකරණය හා ආගන්තුක සත්කාර හා විවේකය කළමනාකාරණය පිළිබඳ විශේෂ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය හැදෑරීමට පහසුකම් සලසයි. අලවිකරණ අංශය වෙළඳපල අවස්ථා හඳුනා ගනිමින් ඊට ප්‍රාග්ධනය යෙදවීමට අවශ්‍ය කුසලතා වර්ධනය කර ගැනීමටද අරමුණු කරයි. කර්මාන්තයේ ඉදිරි ගමනට රුකුල් දෙන අධ්‍යාපන සුදුසුකම් ලත් වෘත්තිකයන් තැනීම ආගන්තුක සත්කාර හා විවේකය කළමනාකාරණ අංශයේ ඉලක්කය වේ.

වගුව 1 එක් එක් අධ්‍යයන අංශ පිහිටවූ වර්ෂය හා ඉන් පිරිනමන විශේෂ උපාධි දක්වයි.

**වගුව 1 – අධ්‍යයන අංශ හා විශේෂ උපාධි**

| විශේෂ උපාධි | | | |
|---|---|---|---|
| පිහිටවූ වර්ෂය | නම | පිරිනමන උපාධිය | හඳුන්වා දුන් වර්ෂය |
| 2007 | ගිණුම්කරණය | ගිණුම්කරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී | 2007 |
| | ව්‍යාපාර ආර්ථිකය | ව්‍යාපාර ආර්ථිකය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී | |
| | මූල්‍ය | මූල්‍ය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී | |
| | මානව සම්පත් කළමනාකරණය | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී | |
| | කළමනාකරණ හා සංවිධාන අධ්‍යයනය | කළමනාකරණ හා සංවිධාන අධ්‍යයනය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී | |
| | අලවිකරණය | අලවිකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී | |
| | | ආගන්තුක සත්කාර හා විවේකය කළමනාකාරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී | 2014 |
| 2013 | ජාත්‍යන්තර ව්‍යාපාර | ජාත්‍යන්තර ව්‍යාපාර පිළිබඳ ව්‍යාපාර පරිපාලනවේදී | 2009 |

**ඒකක**

**අධ්‍යයන කටයුතු අංශය –** සිසුන් ලියාපදිංචි කිරීම, සෙමෙස්තර හා විභාග කාල සටහන් සැකසීම, දේශන වල සිසුන්ගේ පැමිණීම් වාර්තා පවත්වා ගැනීම, විශේෂ උපාධි සඳහා සිසුන් තෝරා ගැනීම හා සිසුන්ගේ ඉල්ලීම් වලට අදාළව I - IV සෙමෙස්තර වල සම්බන්ධීකරණ කටයුතු මෙමගින් සිදුවේ.

**වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය -** වෘත්තීය මාර්ගෝපදේශනය හා වෘත්තීය උපදේශනය ලබාදීමෙන් ශ්‍රම වෙළඳපල තුළ තරඟකාරීවීමට විද්‍යාර්ථීන් සූදානම් කරවයි. පෞද්ගලික, රාජ්‍ය හා රාජ්‍ය නොවන අංශ අතර අන්‍යෝන්‍ය ප්‍රතිලාභ ලබාදෙන සහයෝගිතා මෙමගින් ගොඩනගයි. තවදුරටත් ඇගයුම් මධ්‍යස්ථාන, උපදේශන සේවා, වෘත්තීය මාර්ගෝපදේශන වැඩමුළු, නියාමන වැඩසටහන, ක්‍රීඩා සතිය, සංස්කෘතික සංදර්ශන, කථන යාන්ත්‍රණ වැඩසටහන, මෘදු කුසලතා සංවර්ධන වැඩමුළු, උපාධි රැකියා නියුක්ති සමීක්ෂණ, දැනුවත් කිරීමේ වැඩසටහන්, රැකියා පොළ, EBP, CDP, කර්මාන්ත චාරිකා සහ ස්වර්ණ කථන වැඩසටහන් සංවිධානය කරයි

**පරිගනක ඒකකය -** මෙම ඒකකයේ පර්යේෂණ කටයුතු සඳහා පහසුකම් සැපයීම, පාඨමාලා සඳහා පරිගනක යෙදවුම් සහ සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා අන්තර්ජාල ප්‍රවේශය සඳහා යොදා ගන්නා පූර්ණ පරිගණක තාක්ෂණයෙන් යුත් පරිගණක විද්‍යාගාර දෙකක් පවතී . තවද, එය පීඨ වෙබ් අඩවිය සංවර්ධනය කිරීම සහ LMS සහ SIS ක්‍රියාත්මක කරයි.

**පශ්චාත් උපාධි හා මධ්‍ය වෘත්තිය සංවර්ධන ඒකකය –** සමාජයේ අභිවෘද්ධිය සඳහා උපාධිධාරීන්ගේ කළමණාකරන හැකියාවන් වැඩිදියුණු කිරීමේ මූලික පරමාර්ථය සහිතව පීඨයේ පශ්චාත් උපාධි සහ මධ්‍ය වෘත්තීය සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, සංවිධානය කිරීම හා නිසි ලෙස ක්‍රියාත්මක කිරීම මින් සිදු කරයි. වර්තමානයේදී මෙමගින් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ව්‍යාපාර පරිපාලනවේදී( මූල්‍ය) පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය , මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය, ජාත්‍යන්තර ව්‍යාපාර පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය, ගිණුම්කරණය හා තොරතුරු පද්ධති පිළිබඳ ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය, EMBA හා ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විධායක ඩිප්ලෝමාව (EDBA) ආදිය පිරිනමනු ලැබේ. මෙහි ඒකක සමායෝජකවරයෙක්, වැඩසටහන් සමායෝජකවරු හා සහය කාර්යය මණ්ඩලයක් සිටින අතර එහි නායකත්වය ඒකක සමායෝජක සතුය. වැඩසටහන් සමායෝජකවරු තම අධීක්ෂණය යටතේ පවතින වැඩසටහන්වල සුමුදු ක්‍රියාකාරීත්වය පිළිබඳ වගකීම දරති.

**වාර සඟරා හා සම්මේලන**

**කොළඹ ව්‍යාපාර වාර සඟරාව**

පීඨය විසින් අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන කොළඹ ව්‍යාපාර වාර සඟරාව (The Colombo Business Journal ) මේ වන විට සිය නවවන කාණ්ඩයේ පසුවෙයි. වසර ගණනාවක් පුරා ශ්‍රී ලංකාව පමණක් නොව පකිස්තානය, ජපානය, බංගලාදේශය, භූතානය හා නයිජීරියාව වැනි රටවලද ජාත්‍යන්තර විද්වතුන් ව්‍යාපාර හා කළමනාකරණ ක්ෂේත්‍රයෙහි කළ පර්යේෂණ එමගින් ප්‍රකාශයට පත්කර ඇත.

මුද්‍රිත සංස්කරණයට අමතරව මෙම වාර සඟරාව විවෘත ප්‍රවේශ පදනමින් යුතුව වාර සඟරා වෙබ් අඩවියේ (https://mgmt.cmb.ac.lk/cbj/) ප්‍රකාශිතය. 2017 දෙසැම්බර් සිට මෙය විද්‍යාත්මක ප්‍රකාශන ලබා ගැනීම සඳහා වූ ජාත්‍යන්තර ජාලයේ (INASP) ජාත්‍යන්තර සහයෝගිතා වැඩසටහනක් මගින් අනුග්‍රහය ලබන ශ්‍රී ලංකා ජර්නල්ස් ඔන්ලයින් වෙබ් අඩවියෙන්ද (SLJOL: https://cbj.sljol.info/) ලබාගත හැකිය. වර්ෂ 2018 පෙබරවාරි මාසයේ දී, මෙම සඟරාව INASP විසින් දකුණුදිග වාර සඟරා සඳහා හඳුන්වා දුන් තක්සේරු රාමුවක් වන වාරසඟරා ප්‍රකාශන පරිචය සහ ප්‍රමිති (JPPS) රාමුවේ දර්ශක අනුව තරු තුනක උපරිමයකට යටත්ව තරු දෙකක ශ්‍රේණිගත කිරීමක් ලබා ගත්තේය.

SLJOL හි ඇතුළත් ශ්‍රී ලංකා වාර සඟරා 81 අතුරින් මෙම වාර සඟරාව සිට අද දක්වාම තරු දෙකක ශ්‍රේණිගත කිරීමකට හිමිකම් කියන සඟරා 19 අතරින් එකක් වන අතර එය තරු දෙකක ශ්‍රේණිගත කිරීමක් සහිත ව්‍යාපාර හා කළමනාකරණ ශික්ෂණයට අදාළ එකම ශ්‍රී ලාංකික සඟරාව වේ.

**කළමනාකරණය හා මූල්‍ය පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව (IRCMF - 2018)**

පීඨය වාර්ෂිකව කළමනාකරණ හා මූල්‍ය පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණයක් සංවිධානය කරයි. කළමනාකරණ හා මූල්‍ය කටයුතු පිළිබඳ 13 වන ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය (IRCMF - 2018) 2018 වසරේ නොවැම්බර් මස 16 වන දින කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේදී දේශීය හා විදේශීය ශාස්ත්‍රඥයින්, පර්යේෂකයින් හා සිසුන්ගේ සහභාගිත්වයෙන් සාර්ථකව පැවැත්විණි. ප්‍රධාන දේශනය හොංකොං හි හොංකොං බහු තාක්ෂණ කළමණාකරණ විශ්ව විද්‍යාලයේ නායකත්ව හා නවෝත්පාදන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ , කළමනාකරණ වාර සඟරා ඇකඩමියේ කර්තෘ මහාචාර්ය ජේසන් ඩී. ෂෝ විසින් **"ප්‍රකාශනය පිළිබඳ ප්‍රත්‍යවේක්ෂණයක්; සංස්කාරකවරුන්ගේ දෘෂ්ටිකෝණයෙන්."** යන මාතෘකාවෙන් පවත්වන ලදී. එක්සත් රාජධානියේ නෝදම්බ්‍රියා විශ්ව විද්‍යාලයේ නිව්කාසල් ව්‍යාපාර හා නීති විද්‍යාලයේ ඉගැනුම්, ඉගැන්වීම් හා කාර්ය මණ්ඩල සංවර්ධන අධ්‍යක්ෂ මහාචාර්ය ස්ටැන්ලි ඔලිවර් **""කර්මාන්ත හා විදේශ විශ්ව විද්‍යාල සමඟ සහයෝගිතා පර්යේෂණ"**යන මැයෙන් ආරාධිත දේශනය පැවැත්විය.

ගිණුම් හා කළමනාකරණ තොරතුරු පද්ධති, මානව සම්පත් කළමනාකරණය, කළමනාකරණය, ආයතනික අධ්‍යනය, තාක්ෂණ කළමනාකරණය, ව්‍යවසායකත්වය සහ කුඩා ව්‍යාපාර කළමනාකරණය සහ ජාත්‍යන්තර ව්‍යාපාර,අලෙවිකරණය, සංචාරක සහ ආගන්තුක සත්කාර කළමනාකරණය යන ක්ෂේත්‍රයන්ගෙන් දේශීය හා විදේශීය පර්යේෂණ පත්‍රිකා 38 ක් පමණ ලැබිණි. විස්තීර්ණ සමාලෝචන ක්‍රියාවලියකින් පසුව, සම්මන්ත්‍රණ කටයුතු සඳහා ඇතුළත් කිරීමට පර්යේෂණ 19 ක් පමණක් තෝරා ගන්නා ලදී. එම පර්යේෂණ පත්‍රිකාවල කතුවරු

i) ගණකාධිකරණ හා කළමනාකරණ තොරතුරු පද්ධති සහ ව්‍යාපාර ආර්ථික විද්‍යාව (ii) මානව සම්පත් කළමනාකරණය (iii) ජාත්‍යන්තර ව්‍යාපාර, අලෙවිකරණය, සංචාරක හා සත්කාරක කළමනාකරණය (iv) කළමනාකරණය, සංවිධාන අධ්‍යයන, තාක්ෂණ කළමනාකරණය, (v) ව්‍යවසායකත්ව සහ කුඩා ව්‍යාපාර කළමනාකරණය යන තේමා යටතේ සමුළුවට සිය පර්යේෂණ ඉදිරිපත් කළහ. විවිධ පාර්ශවයන් අතර සාකච්ඡා සහ අධ්‍යාපන හුවමාරු කිරීම් සඳහා මෙම පූර්ණ සැසිය ඉවහල් විය. තාක්ෂණික පත්‍රිකා ඉදිරිපත් කිරීමේ සැසිවාරයෙන් පසුව, කර්මාන්තය පිළිබඳ සංවාදය - 2018 ශ්‍රී ලාංකික ව්‍යාපාර ක්ෂේත්‍රයේ කීර්තිමත් පුද්ගලයන් රැසකගේ සහභාගිත්වයෙන් **"ආචාරධාර්මික සහ වෘත්තීයමය හැසිරීම් සඳහා ව්‍යාපාර ක්‍රමාංකනය කිරීම."** යන මාතෘකාවෙන් පවත්වන ලදී.

සමුළුවෙන් පසු පැවති ප්‍රශ්නෝත්තර සාකච්ඡාවටය ආචාර්ය උපාධි අපේක්ෂකයන්ට සිය පර්යේෂණ අදහස් ඉදිරිපත් කිරීමට හා කීර්තිමත් විද්වත් මණ්ඩලයක අදහස් ලබා ගැනීමට අවස්ථාව සලසා දුනි. මෙම වසරේ ගණකාධිකරණය, මූල්‍ය, මානව සම්පත් කළමනාකරණය, සාමාන්‍ය කළමනාකරණය හා අලවි කළමනාකරණය යන ක්ෂේත්‍රවලට අදාළව පැවැත්වූ ප්‍රශ්නෝත්තර සාකච්ඡාවටයෙහි වටමේස සාකච්ඡාව සඳහා 11 දෙනෙක්ද, පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරන්නන් 08 දෙනෙක්ද, කෙරෙමින් පවතින කටයුතු පිළිබඳ ඉදිරිපත්කිරීම් සඳහා 03 දෙනෙක්ද සහභාගි වූහ.

**කාර්ය මණ්ඩල තොරතුරු**

ආචාර්ය එම්.එම්.පී. ධර්මදාස මහතා පීඨාධිපති ලෙස තවදුරටත් කටයුතු කළේය. එස්.එස්. සමරතුංග මෙනෙවිය නියෝජ්‍ය ලේඛකාධිකාරි ලෙසද ඒ. ආර්.ඩබ්. එම්.යූ. එන්. සෙනෙවිරත්න මහතා පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරි ලෙසද කටයුතු කළහ.

ආචාර්ය ටී. එන්. ගුණරත්න, ආචාර්ය එස්. බුවේන්ද්‍ර හා රමේෂ් රාජසූරිය මහතා පිළිවෙලින් ගිණුම්, මූල්‍ය හා ව්‍යාපාර ආර්ථික යන අංශවල අංශ ප්‍රධාන ධූර දැරූහ. ආචාර්ය බී. නිශාන්ත 13.7.2018 දක්වා කළමනාකරණ හා සංවිධාන අධ්‍යයන අංශ ප්‍රධාන ධූරය දැරූ අතර ඉන්පසු ආචාර්ය කේ.එස්. පී. කලුආරච්චි අංශ ප්‍රධාන ධූරයට පත්විය. ආචාර්ය එම්.එම්.පී. ධර්මදාස මහතා ජාත්‍යන්තර ව්‍යාපාර අංශ ප්‍රධාන ධූරය 18.01.18 තෙක් දැරූ අතර ඉන්පසුව එස්. සසිදරන් මහතා අංශ ප්‍රධාන ධූරයට පත්විය. අලවිකරණ අධ්‍යයන අංශයේ අංශ ප්‍රධාන ධූරය 13.7.2018 දින දක්වා ආචාර්ය කේ. කජේන්ද්‍ර විසින් දරන ලද අතර ඉන්පසු ආචාර්ය ෆසීලා ආසාන් එම ධූරයට පත්වූවාය.

**කාර්ය මණ්ඩල උසස්වීම්**

වර්ෂය තුළ ආචාර්ය මණ්ඩල සාමාජිකයෝ පස් දෙනෙක් මහාචාර්ය/ සහකාර මහාචාර්ය ධූරයට උසස්වීම් ඉල්ලුම් කළහ. සාමාජිකයෝ දෙදෙනෙක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය -I තනතුරට උසස්වීම් ලදහ.ඊට අමතරව ආචාර්ය මණ්ඩල සාමාජිකයෙක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II තනතුරට උසස්වීම් ලැබීය. පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි 1.11.2018 දිනසිට ක්‍රියාත්මක වන පරිදි නියෝජ්‍ය ලේඛකාධිකාරි තනතුරට උසස් කරනු ලැබ ඇත.

**තොරතුරු තාක්ෂණ සංවර්ධනය**

ශිෂ්‍යයන්ට සහ ආචාර්ය මණ්ඩලයට අන්තර්ජාලය හරහා හමුවී තම අධ්‍යයන කටයුතු නිසි පරිදි ඉටු කිරීමට මං විවර කරමින් පීඨය විසින් 2017 වසරේදී ඉගනුම් කළමනාකරණ පද්ධති (LMS) හඳුන්වා දෙන ලදී. මෙම පද්ධතිය සිසුන් හා පාඨමාලා ලියාපදිංචිය, ඉගනුම් සම්පත් බෙදාහදා ගැනීම, අන්තර්ජාලය ඔස්සේ විභාගවලට අයදුම් කිරීමආදිය සුසාධ්‍යකරණය කරයි.

**යටිතල පහසුකම් සංවර්ධනය**

දේශන ශාලා 14 කින් සමන්විත සිවුමහල් නැගෙනහිර ගොඩනැගිලි පර්යන්තය 2017 වසරේදී විවෘත කරන ලදී. රු.මි. 290/= ක පිරිවැයකින් ඉදිවෙමින් පවතින සිවුමහල් බටහිර ගොඩනැගිලි පර්යන්තය 2018 දී නිම කිරීමට අපේක්ෂිතය. පීඨයේ ප්‍රවේශ මාර්ගය වර්ෂය තුළදී කාපට් කරන ලදී.

### 2.5.1. සම්පත් සහ ශිෂ්‍ය තොරතුරු

| පීඨය | පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව | | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|
| | | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 |
| කළමනාකරණ හා මූල්‍ය | බී.බී.ඒ | 1625 | 1740 | 79 | 80 | 55 | 59 |
| | එම්.බී.ඒ | 323 | | | | | |
| | ඊ.ඩී.බී.ඒ | 58 | 70 | | | | |
| | මානව සම්පත් කළමනාකරණ ඩිප්ලෝමා | 102 | 85 | | | | |
| | අලවිකරණ ඩිප්ලෝමා | - | 37 | | | | |
| | පී.ජී.ඩී.බී.එෆ් | 39 | 35 | | | | |
| | ඩී.එස්.බී. එම් | 83 | 39 | | | | |
| | එච්.ඩී.ඊ.එස්.බී. එම් | 24 | - | | | | |
| | දර්ශනපති/ දර්ශනසූරි | 30 | 27 | | | | |
| **එකතුව** | | **2284** | **2033** | **79** | **80** | **55** | **59** |

### 2.5.2 දේශීය ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු

**අ) ප්‍රථම උපාධි පාඨමාලා**

| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | බඳවා ගැනීම් | | පළමු වසර සිසුන් | | දෙවන වසර සිසුන් | | තෙවන වසර සිසුන් | | සිවුවන වසර සිසුන් | | උපාධිලත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 |
| කළමනාකරණ හා මූල්‍ය | බී.බී.ඒ | ඉංග්‍රීසි | 420 | 581 | 420 | 514 | 405 | 415 | 406 | 408 | 394 | 403 | 442 | 384 |
| | | | | | | | | | | | | | | |
| එකතුව | | | **420** | **581** | **420** | **514** | **405** | **415** | **406** | **408** | **394** | **403** | **442** | **384** |

**ආ) පශ්චාත් උපාධි**

| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | බඳවා ගැනීම් (ශිෂ්‍ය සංඛ්‍යාව) | | වත්මන් සිසුන් සංඛ්‍යාව | සම්පූර්ණ කළ සිසුන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | | 2017 | 2018 |
| කළමනාකරණ හා මූල්‍ය | ව්‍යාපාර පරිපාලනවේදී (ඩබ්.ඊ) | ඉංග්‍රීසි | 101 | 99 | 200 | 118 | 102 |
| | ව්‍යාපාර පරිපාලනවේදී (මූල්‍ය) | ඉංග්‍රීසි | 50 | 34 | 84 | 19 | 30 |
| | ව්‍යාපාර පරිපාලනවේදී (මානව සම්පත්) | ඉංග්‍රීසි | 19 | 17 | 36 | 07 | 14 |
| | ව්‍යාපාර පරිපාලනවේදී (අලවිකරණය) | ඉංග්‍රීසි | 30 | 18 | 48 | 12 | 18 |
| | ව්‍යාපාර පරිපාලනවේදී (ඒ.අයි.එම්.) | ඉංග්‍රීසි | 20 | 18 | 38 | - | - |
| | ව්‍යාපාර | ඉංග්‍රීසි | 28 | 24 | 52 | 04 | 27 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | පරිපාලනවේදී (ජාත. ව්‍යාපාර) | | | | | | |
| | ව්‍යාපාර පරිපාලනවේදී (ඩබ්. ඩී) | ඉංග්‍රීසි | 87 | 84 | 171 | 85 | 93 |
| | ඊ.එම්.බී.ඒ | ඉංග්‍රීසි | 16 | 20 | 36 | 17 | 17 |
| | දර්ශනපති/ දර්ශනසූරි | ඉංග්‍රීසි | - | - | 27 | 03 | - |
| | බැංකු හා මූල්‍ය ප.උ.ඩිප්. | ඉංග්‍රීසි | 39 | 35 | 74 | - | 10 |
| එකතුව | | | **390** | **349** | **766** | **265** | **311** |

**2.5.3. විදේශීය ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු**

| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | බඳවා ගැනීම් | | පළමු වසර සිසුන් | | දෙවන වසර සිසුන් | | තෙවන වසර සිසුන් | | සිවුවන වසර සිසුන් | | උපාධිලත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | **2017** | **2018** | **2017** | **2018** | **2017** | **2018** | **2017** | **2018** | **2017** | **2018** | **2017** | **2018** |
| කළමනාකරණ හා මූල්‍ය | ව්‍යාපාර පරිපාලනවේදී | ඉංග්‍රීසි | - | - | 01 | | 03 | 01 | 03 | 03 | | 03 | 06 | 06 |
| | ව්‍යාපාර පරිපාලනවේදී මූල්‍ය | ඉංග්‍රීසි | 01 | - | | | | | | | | | | |
| | ඊ එම් බී ඒ | ඉංග්‍රීසි | - | 05 | - | | 06 | | | | | | | |
| | ඊ එම් බී ඒ (ජා/ ව්‍යා) | ඉංග්‍රීසි | 01 | - | - | | | | | | | | | |
| | බැංකු හා මූල්‍ය ප.උ.ඩිප් | ඉංග්‍රීසි | - | 01 | - | | | | | | | | | |
| එකතුව | | | **02** | **06** | **01** | | **09** | **01** | **03** | **03** | | **03** | **06** | **06** |

**2.5.4. අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු**

| පීඨය | විෂයය | මාධ්‍යය | ජේ. මහා | මහාචාර්ය | ජේ.කථි. | කථිකා. | සහ. කථිකා. | උපදේශක |
|---|---|---|---|---|---|---|---|---|
| කළමනාකරණ හා මූල්‍ය | ගිණුම්කරණය | ඉංග්‍රීසි | | | 11 | 04 | | |
| | මූල්‍ය | ඉංග්‍රීසි | | 01 | 08 | 09 | 02 | |
| | කළමනාකරණ සහ සංවිධාන අධ්‍යයන | ඉංග්‍රීසි | | 02 | 08 | 04 | | |
| | මානව සම්පත් කළමනාකරණය | ඉංග්‍රීසි | | 01 | 06 | 03 | 01(තාව./සහ. කථි.) | |
| | අලෙවිකරණය | ඉංග්‍රීසි | | 01 | 09 | 05 | | |
| | ව්‍යාපාර ආර්ථික අ.අ | ඉංග්‍රීසි | | 02 | 07 | 03 | 01 | |
| | ජාත්‍යන්තර ව්‍යාපාර අ.අ. | ඉංග්‍රීසි | | | 01 | 01 | 01 | |
| | පීඨාධිපති කාර්යාලය | ඉංග්‍රීසි | | | | | | 03 |
| එකතුව | | | | **07** | **50** | **29** | **05** | **03** |

**2.5.5 අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු:**

| පීඨය/ අංශය | ජ්‍යෙෂ්ඨතම<br>පරිපාලන කා.ම.    අධ්‍යයන සහයක | ජ්‍යෙෂ්ඨ | කනිෂ්ඨ | සුළු සේවක | කොන්ත්‍රාත් |
|---|---|---|---|---|---|
| පීඨාධිපති කාර්යාලය | 2    4 | 03 | 08 | 03 | 05 (පැවරුම් පදනම මත) |
| මානව සම්පත් කළමනාකරණ අ.අ. | | 01 | | 01 | 01(පැවරුම් පදනම මත) |
| කළමනාකරණ සහ සංවිධාන අ.අ. | | | | 01 | 01(පැවරුම් පදනම මත |
| ගිණුම් අ.අ. | | | 01 | 01 | |
| අලෙවිකරණ අ.අ. | | | 01 | 01 | |
| ව්‍යාපාර ආර්ථික අ.අ | | 01 | | 01 | |
| ජාත්‍යන්තර ව්‍යාපාර අ.අ. | | | 01 | 01 | |
| මූල්‍ය අ.අ. | | | 01 | 01 | 01(පැවරුම් පදනම මත |
| MBA ඒකකය | | | | | 12 ( පැවරුම් පදනම මත) |
| **එකතුව** | **06** | **05** | **12** | **10** | **20(** පැවරුම් පදනම මත **)** |

## 2.5.6 පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

| විෂයය | ප්‍රකාශිත | | අලෙවි කළ | | ඉදිරිපත් කළ | |
|---|---|---|---|---|---|---|
| | **2017** | **2018** | **2017** | **2018** | **2017** | **2018** |
| a. පර්යේෂණ සංඛ්‍යාව | - | | | | | |
| (i) කළමනාකරණ හා සංවිධාන අ.අ | - | 0 5 | | | 04 | 03 |
| (ii) ගිණුම්කරණ අ.අ | | | | | 02 | 03 |
| (iii) මානව සම්පත් කළමනාකරණ අ.අ | 11 | | | | 09 | 01 |
| (iv) මූල්‍ය අ.අ | 08 | 07 | | | 04 | 07 |
| b. නවෝත්පාදන සංඛ්‍යාව | | | | | | |
| c. වාරසඟරා ප්‍රකාශන සංඛ්‍යාව<br>(i) කළමනාකරණ හා සංවිධාන අ.අ<br>(ii) අලෙවිකරණ අ.අ<br>(iii) ගිණුම්කරණ අ.අ<br>(iv) මානව සම්පත් කළමනාකරණ අ.අ | 01<br>01<br>05 | 04<br>01<br>05<br>11 | | | | |
| a. ග්‍රන්ථ සංඛ්‍යාව<br>(i) මානව සම්පත් කළමනාකරණ අ.අ<br>ගිණුම්කරණ අ.අ | | 01<br>01 | | | | |
| b. ප්‍රකාශන සංඛ්‍යාව<br>(i) කළමනාකරණ හා සංවිධාන අ.අ /ප්‍රශ්න පත්‍රය<br>(ii)පර්යේෂණ පත්‍රිකා/ අලෙවිකරණ අ.අ<br>(iii) මානව සම්පත් කළමනාකරණ අ.අ | 01<br>02<br>02 | 01<br>02 | | | | 06 |
| f. වෙනත්<br>(i)උපුටා ගැනීම්<br>(ii)සමුළු පැවැත්වීම්<br>(iii)සාරාංශ/ මානව සම්පත් කළමනාකරණ අ.අ | 10<br>01<br>04 | 05<br>02 | | | | 01 |
| **එකතුව** | **46** | **45** | | | **19** | **21** |

**2.5.7 වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුලු :**

| විෂයය | සහභාගි වූ | | සම්පූර්ණ කළ | | ඉදිරිපත්කිරීම් කළ | |
|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 |
| a. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව | | | | | | |
| (i) කළමනාකරණ හා සංවිධාන අ.අ | | | | 01 | | |
| (ii)දර්ශනසූරි / මූල්‍ය අ.අ | 01 | 02 | | | 02 | 04 |
| (iii)විද්‍යාපති(ගණිතය)/ මූල්‍ය අ.අ | 01 | | | 01 | | |
| b. පශ්චාත් උපාධි ඩිප්ලෝමා සංඛ්‍යාව | | | | | | |
| c. පශ්චාත් උපාධි පාඨමාලා සංඛ්‍යාව<br>(i)MBA/ මූල්‍ය | 02 | 02 | | | | |
| d. ඩිප්ලෝමා පාඨමාලා සංඛ්‍යාව | | | | | | |
| c. සහතිකපත්‍ර පාඨමාලා සංඛ්‍යාව<br>(i) කළමනාකරණ හා සංවිධාන අ.අ | | | | 02 | | |
| f. වෙනත්<br>(i)ව්‍යාපාර අදහස් තරඟය<br>(ii)MBA වැඩමුලුව/ මූල්‍ය අ.අ | | 01<br>01 | | | | |
| **එකතුව** | **04** | **06** | | **04** | **02** | **04** |

## 2.5.8 ලැබූ සම්මාන:

| විෂයය | සම්මාන සංඛ්‍යාව | | ආචාර්යවරුන් සංඛ්‍යාව | | ශිෂ්‍ය සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 |
| a. දේශීය සම්මාන<br>(i) කළමනාකරණ හා සංවිධාන අ.අ | | | | 01 | | |
| b. ජාතික සම්මාන<br>(i) ගිණුම්කරණ අ.අ /ACCA ත්‍යාගය-2018/ සිසුන් විසිනි. | | | | | - | 01 |
| c. ජාත්‍යන්තර ත්‍යාග<br>(i) ගිණුම්කරණ අ.අ /එමරල්ඩ් 2018/ආචාර්යවරුන් විසිනි.<br>(ii) කළමනාකරණ හා සංවිධාන අ.අ<br>(iii)AAF(2017)ඔස්ට්‍රේලියානු අධිසාමාජිකත්ව ප්‍රදානය<br>(iv)NCAS QUT දර්ශනසූරි ශිෂ්‍යත්වය | 01<br>01 | | - | 01 | | |
| d. වෙනත් | | | | | | |
| (i)වසරේ දිස්ත්‍රික් ටෝස්ට්මාස්ටර් ත්‍යාගය 2016/2017 | 01 | | | | | |
| | | | | | | |
| **එකතුව** | **03** | | | **02** | | **01** |

## 2.6 වෛද්‍ය පීඨය

**දැක්ම**

අදාළ කොටස්කරුවන් හා සහයෝගයෙන් යුතුව අධ්‍යාපනය, පර්යේෂණ හා සායනික සැලකිල්ල යන කරුණු අතර සබඳතා ගොඩනගමින් සෞඛ්‍ය සේවා වෘත්තිකයන්ගේ අධ්‍යාපනයේ උත්කෘෂ්ට මධ්‍යස්ථානයක් බවට පත්වීම

**මෙහෙවර**

සුවිශිෂ්ට ප්‍රථම උපාධි හා පශ්චාත් උපාධි අධ්‍යාපනය, පර්යේෂණ හා සායනික සැලකිල්ල යන කරුණු තුළින් වෘත්තීය නිපුණත්වයෙන් අනූන, සහකම්පනයෙන් යුත්, සැලකිලිමත් වෘත්තිකයන් බිහිකිරීම තුළින් පෞද්ගලික හා ප්‍රජා සෞඛ්‍යය ඉහළ නැංවීම හා වෛද්‍ය හා සෞඛ්‍ය විද්‍යාවන්හි ප්‍රගමනයට දායක වීම

**අපගේ වටිනාකම්**

- යාවජීව අධ්‍යාපනය හා විචාරශීලී චින්තනය: පීඨය විසින් කාර්ය මණ්ඩලය හා සිසුන් තුළ යාවජීව අධ්‍යාපනය හා විචාරශීලී චින්තනය වගා කරනු ලැබේ.

- ශාස්ත්‍රීය නිදහස: පීඨය විසින් සත්‍ය සහ අවබෝධය උදෙසා කෙරෙන ගවේෂණයන්හිදී කිසිදු දඬුවමකට ලක් නොවී ඉගැන්වීමට, පර්යේෂණ පැවැත්වීමට, කථා කිරීමට හා ප්‍රකාශනයට පත් කිරීමට පූර්ණ නිදහස සපයනු ලැබේ.

- නව්‍යකරණය හා නිර්මාණශීලීත්වය: පීඨය සැමවිටම නව දැනුම් පිපාසය සංසිඳවා ගැනීමට හා මානව හා සමාජීය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය ගවේෂණ හා පර්යේෂණවල නියැලී සිටියි.

- ඒකාග්‍රතාවය: පීඨය විසින් ළඟා කරගන්නා අරමුණු, එහි ක්‍රියාකාරකම්වල පාරදෘශ්‍යභාවය හා ක්‍රියාකාරීත්වයෙහි ඒකාග්‍රතාවය මත රැඳී පවතී.

- වෘත්තීයමයභාවය: සියලු සිසුන් හා කාර්ය මණ්ඩලය තම රාජකාරි හා වගකීම් ඉටු කිරීමේදී උපරිම සැලකිල්ලෙන්, අවංකභාවයෙන්, ඒකාග්‍රතාවයෙන්, පූර්ණ අවධානයෙන් හා යෝග්‍ය ස්වරූපයෙන් ක්‍රියාත්මක වනු ඇතැයි පීඨය අපේක්ෂා කරයි.

- වගකීම හා වගවීම: පීඨය වගකීම හා වගවීම පිළිබඳ හැඟීමකින් යුතුව ක්‍රියාත්මක වේ.

- විවිධත්වය, සර්වග්‍රාහීත්වය හා සමාන අවස්ථාව: තම ශක්තිය හා එකමුතුකම රැඳී පවතින්නේ කාර්ය මණ්ඩලය හා සිසුන් අතර පවතින නානාවිධ කණ්ඩායම් අතර සර්වග්‍රාහීව පැවතීම හා ඒවාට සම අවස්ථා ලබාදීම තුළ බව පීඨය වටහාගෙන ඇත.

- කණ්ඩායම් හැඟීම, නායකත්වය, කාර්යක්ෂමතාව හා කැපවීම : පීඨය තම අරමුණු ළඟා කර ගැනීමට සියලු සේවාදායකයන්ගේ උපරිම උද්‍යෝගය,කැපවීම, කණ්ඩායම් හැඟීම හා නායකත්ව ගුණාංග දිරිගන්වයි.

- ධනාත්මක පරිසරය: පීඨය රැකියාවේදී සෑහීමකට පත්වීමට, ජීවිතයේ සතුට සහ සමාජ අන්තර්ග්‍රහණයට තුඩු දෙන පරිසරයක් ප්‍රවර්ධනය කරයි.

- සාමාජීය සවිඥානිකත්වය : පීඨය මහා සමාජයෙහි අවශ්‍යතාවන් කෙරෙහි සංවේදී වේ.






*Medical students (April 1905). The women, from left to right are Sylvia Ebert, Claribel Van Dort, Helen Kiddle and Rachel Christoffelsz*

කොළඹ මහ රෝහල

අවසන් වසර චාරිකාව **(1966)**

1921 දී පිහිටවන ලද ලංකා වෛද්‍ය විද්‍යාලය හා ලංකා විශ්වවිද්‍යාල කොලීජිය ලංකා විශ්වවිද්‍යාලයෙහි මූලාරම්භය වූ අතර එය 1942 දී ක්‍රියාත්මක විය. පසුව ලංකා වෛද්‍ය විද්‍යාලය  ලංකා විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ලෙස උසස් කරනලද අතර  එතෙක් පිරිනමන ලද LMS ඩිප්ලෝමාව වෙනුවට MBBS උපාධිය ආදේශ විය. වෛද්‍ය පීඨය බවට පත්වන තෙක් වෛද්‍ය විද්‍යාලය  පරිපාලනය කරන ලද්දේ සිවිල් වෛද්‍ය දෙපාර්තමේන්තුව හා එහි අනුප්‍රාප්තිකයා වූ වෛද්‍ය හා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවයි. 1875 - 1897 කාලයේ ප්‍රධාන සිවිල් වෛද්‍ය නිලධාරී ලෙස සේවය කළ වෛද්‍ය ඩබ්. ආර්. කිංසි ආයතනයේ මුල් අවදියේ දියුණුවට විශාල දායකත්වයක් සැපයීය. ශ්‍රී ලංකා ජාතික රෝහල හා පීඨය අතරින් විහිදෙන කිංසි පාර ඔහුගේ නමින් නම් කරනු ලැබ ඇත.

1942 දී  වෛද්‍ය පීඨයේ අධ්‍යයන අංශ හයක් තිබිණි.  එනම් භෞතවේදය, කාය ව්‍යවච්ඡේද විද්‍යාව, ව්‍යාධිවේදය, සායනික විද්‍යා,ප්‍රසව හා නාරිවේදය හා ශල්‍ය වෛද්‍ය අංශය වේ. මහජන සෞඛ්‍ය (ප්‍රජා වෛද්‍ය විද්‍යාව) හා ව්‍යවහාරික වෛද්‍ය විද්‍යාව අධ්‍යයන අංශ පිළිවෙලින් 1949 හා 1951 වසරවල ඇරඹිනි. මේ වනවිට පීඨයේ අධ්‍යයන අංශ 17 ක් පවතී. භෞතවේද අධ්‍යයන අංශයෙන් ජෛවරසායන හා  භිෂග්වේදය අධ්‍යයන අංශයන්ද, ව්‍යාධිවේදය අධ්‍යයන අංශයෙන් පිළිලවේදය හා ක්ෂුද්‍රජීවවේදය අධ්‍යයන අංශයන්ද, සායනික විද්‍යා අධ්‍යයන අංශයෙන් ළමාරෝග හා මානසික වෛද්‍ය විද්‍යා අංශයන්ද විහිදී ගියේය.2016 දී වෛද්‍ය විද්‍යා අධ්‍යාපන හා  වෛද්‍ය විද්‍යා මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශයන්ද පීඨයට එක්විය.

1995 දී MBBS විෂය මාලාව වෙනස් වූ අතර වර්තමාන විෂය මාලාව ධාරා 5 කින් සමන්විතය. එනම්, මූලික විද්‍යා, ව්‍යවහාරික විද්‍යා, සායනික විද්‍යා, චර්යාවාදී විද්‍යා හා ප්‍රජාව යන ධාරාවන්ය. භෞතචිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී උපාධි පිරිනැමීම ඇරඹීමත් සමග 2006 දී සමසෞඛ්‍ය විද්‍යා ඒකකය පිහිටුවන ලද අතර 2016 දී සමසෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශය ක්‍රියාත්මක විය. 1870 දී 25 ක් වූ පීඨ ශිෂ්‍ය සංඛ්‍යාව '60 දශකයේදී 500 දක්වා වර්ධනය වූ අතර වර්තමානයේ 1400 ක් පමණ වේ. පීඨයේ කාර්ය මණ්ඩලයද ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය  140ක් හා ව්‍යාප්ත කාර්ය මණ්ඩලය ලෙස උපදේශක වෛද්‍යවරුන්  150 කට වැඩි සංඛ්‍යාවකින් සමන්විත වේ.

**පීඨයේ අධ්‍යයන අංශ**

1. සමසෞඛ්‍ය විද්‍යා
2. කාය ව්‍යවච්ඡේද විද්‍යාව
3. ජෛවරසායන හා අණුක ජීවවේදය
4. සායනික වෛද්‍ය විද්‍යාව
5. ප්‍රජා වෛද්‍ය විද්‍යාව
6. වෛද්‍ය විද්‍යා අධ්‍යාපන
7. වෛද්‍ය විද්‍යා මානව ශාස්ත්‍ර
8. ක්ෂුද්‍රජීවවේදය
9. ප්‍රසව හා නාරිවේදය
10. පිළිලවේදය
11. ව්‍යාධිවේදය
12. භිෂග්වේදය
13. භෞතවේදය
14. මනෝචිකිත්සාව
15. ශල්‍ය වෛද්‍ය විද්‍යාව හා නිර්වින්දන ශිල්පය
16. ළමාරෝග
17. වෝහාරික විද්‍යාව හා ධූලකවේදය

**පීඨයේ පවතින මධ්‍යස්ථාන හා ඒකක**

1. ශ්‍රව්‍ය දෘෂ්‍ය ඒකකය
2. සත්වාගාරය
3. මධ්‍යම රසායනාගාරය
4. දුම්කොළ වලට එරෙහිවීමේ මධ්‍යස්ථානය (CCT)
5. විෂයමාලා ක්‍රියාත්මක කිරීමේ ඒකකය
6. දුරස්ථ හා අතථ්‍ය ඉගනුම් මධ්‍යස්ථානය
7. පවුල් වෛද්‍ය ඒකකය
8. මානව ජාන ඒකකය
9. සෞඛ්‍යය හා යහජීවන ඒකකය
10. ජාත්‍යන්තර ඒකකය
11. තොරතුරු තාක්ෂණ ඒකකය
12. භාෂා ඒකකය
13. නඩත්තු ඒකකය
14. ප්‍රකාශන ඒකකය
15. තත්ව සහතික කුටිය
16. පර්යේෂණ ප්‍රවර්ධන හා සුසාධ්‍යකාරක මධ්‍යස්ථානය
17. ග්‍රාමීය සෞඛ්‍ය පර්යේෂණ මධ්‍යස්ථානය , කතරගම
18. ක්‍රීඩා හා ව්‍යායාම වෛද්‍ය ඒකකය
19. සර්පවිෂ ඒකකය
20. සමාකරණ මධ්‍යස්ථානය
21. ඖෂධාගාර ඒකකය
22. සෞඛ්‍ය පද්ධති පර්යේෂණ ඒකකය
23. වෘත්තීය සෞඛ්‍ය පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානය හා සහයෝගී පුහුණු හා පර්යේෂණ මධ්‍යස්ථානය
24. පරපෝෂී රෝග පර්යේෂණ ඒකකය
25. දියවැඩියා පර්යේෂණ ඒකකය
26. මැමෝග්‍රෆි ඒකකය
27. සනාල හා බද්ධකිරීම් විද්‍යාගාරය
28. ආමාශයාන්ත්‍රික විද්‍යාගාරය
29. සෞඛ්‍ය ප්‍රවර්ධන පර්යේෂණ ඒකකය
30. සර්මකලාපීය ඖෂධ පර්යේෂණ ඒකකය

**ප්‍රථම උපාධි පාඨමාලා.**

- වෛද්‍ය විද්‍යාවේදී හා ශල්‍ය වෛද්‍ය විද්‍යාවේදී
- භෞත චිකිත්සාව පිළිබඳ විද්‍යාවේදී

**ව්‍යාප්ති පාඨමාලා:**

විද්‍යුත් ඛන්තු රේඛක පාසලේද, භෞත චිකිත්සක පාසලේද , වෘත්තියික චිකිත්සක පාසලේද, හෘත් විද්‍යා පුහුණු පාසලේද, අක්ෂි වෛද්‍ය සහයකයන්ගේ පුහුණු වැඩසටහනෙහිද, හෙද පුහුණු පාසලේද, පශ්චාත් මූලික හෙද පුහුණු පාසලේද, පුහුණු වැඩසටහන් වලට දායකත්වය සැපයීම මගින් වෛද්‍ය විද්‍යා සහයක කාර්ය මණ්ඩල සාමාජිකයන් පුහුණු කිරීමද පීඨයේ වැදගත් භූමිකාවකි.

භිෂග්වේද අධ්‍යයන අංශය මගින් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් අභ්‍යන්තර ඖෂධාගාර පාඨමාලාව පවත්වනු ලබන අතර බාහිරව ඖෂධාගාර විභාග පැවැත්වීම මගින් ලංකා වෛද්‍ය විද්‍යාලයේ පීඨ සභාවට සහය වේ. විද්‍යා පීඨය විසින් කරගෙන යන BPharm පාඨමාලාවටද අගනා සහයක් ලබා දෙයි.

ප්‍රජා වෛද්‍ය විද්‍යා ඒකකය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා වෘත්තිය ස්වස්ථතාව හා ආරක්ෂාව පිළිබඳ සේවාස්ථ පුහුණුව ලබා දෙයි. එසේම වෘත්තිය ස්වස්ථතාව හා ආරක්ෂාව පිළිබඳ සහතික පත්‍ර, ඩිප්ලෝමා හා පශ්චාත් උපාධි ඩිප්ලෝමා සුදුසුකම් ලබා ගැනීමට අවශ්‍ය පාඨමාලා, මානව පෝෂණය හා භෝජන විද්‍යාව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව, වසංගතවේදය හා ජෛව සංඛ්‍යානය හා සෞඛ්‍ය වැඩ සටහන් කළමනාකරණය පිළිබඳ මාර්ගගත සහතිකපත්‍ර පාඨමාලාව ආදිය ක්‍රියාත්මක කරයි. සංස්ථා හා පෞද්ගලික අංශයේ ආයතනවල අදාළ පුද්ගලයන් සඳහා පුහුණු කටයුතුද සිදු කරනු ලැබේ.

ආපදා කළමනාකරණය හා අවම කිරීම පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් ආපදා කළමනාකරණය සඳහා වූ මූලික කණ්ඩායම වෙනුවෙන් ආපදා අවස්ථාවන්ට ප්‍රතිචාර දැක්වීමට සෞඛ්‍ය සේවකයන්ගේ හැකියාව ඉහළ නැංවීම අරමුණු කරගෙන 2006—2009 කාලයේ පවත්වන ලදී.2009 දී ඇරඹූ ආපදා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (මාර්ගගත) සෞඛ්‍ය සේවා වෘත්තිකයන් අතර ආපදා කළමනාකරණය සඳහා අවශ්‍ය නිපුණතා වර්ධනය කිරීම අරමුණු කරයි. මෙම පාඨමාලා වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයන අංශය විසින් හසුරවනු ලැබේ.

ක්ෂුද්‍රජීවවිද්‍යා අධ්‍යයන අංශය 2010 වසරේ සිට මේ දක්වා රෝග නිවාරණය හා පාලනය පිළිබඳ අන්තර්ජාලගත වාර්ෂික සමාසික ඩිප්ලෝමාවක් පිරිනමයි. ගුණාත්මක සෞඛ්‍යය හා රෝගී ආරක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්ද එම අංශය විසින් 2016 දී අරඹන ලද අතර එහි ප්‍රථම ශිෂ්‍ය කණ්ඩායම 2018 නොවැම්බර් මස පැවති උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධි ලබා ගත්හ.

ජෛව රසායන අධ්‍යයන අංශය විසින් අණුකජීව විද්‍යාව හා ජාන තාක්ෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය පිරිනමනු ලැබේ.

මානව ජාන ඒකකය විසින් අණුක ව්‍යාධිවේදය පිළිබඳව විද්‍යාපති උපාධිය පිරිනමනු ලැබේ.නවතම ජාන තාක්ෂණ රෝග නිර්ණය සේවා ලබාදීමට අවශ්‍ය දැනුම , කුසලතා හා ආකල්ප වෛද්‍ය හා විද්‍යා උපාධිධාරීන් තුළ වර්ධනය කිරීම මෙම පාඨමාලාවේ අරමුණ වේ. වෝහාරික විද්‍යා අධ්‍යයන අංශය විසින් වෝහාරික විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක් හා මරණ පරීක්ෂණ පිළිබඳ දුරස්ථ අධ්‍යාපන ඩිප්ලෝමාවක් පිරිනමනු ලබයි.

පීඨයේ සෞඛ්‍ය ප්‍රවර්ධන හා පර්යේෂණ ඒකකය විසින් සෞඛ්‍යය ප්‍රවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව කළමනාකරණය කෙරේ. මෙය ආර්ථික විද්‍යාව, නීතිය, සමාජ විද්‍යාව, සෞඛ්‍ය පද්ධතීන් සහ දේශපාලන විද්‍යාව වැනි වෙනත් විෂයානුගත දෘෂ්ටි කෝණයකින් සෞඛ්‍ය සංවර්ධනය අගය කිරීමට ශිෂ්‍යයා හුරු කරන සුවිශේෂ අන්තර්-ශික්ෂණමය පාඨමාලාවකි.

**පර්යේෂණ හා පශ්චාත් උපාධි අධ්‍යයන**

පර්යේෂණ සඳහා පීඨයෙහි දායකත්වය අනර්ඝය. 1950 සහ 60 දශකවල ප්‍රධාන පර්යේෂණ දායකත්වයන් ජෛව වෛද්‍ය පර්යේෂණ කෙරෙහි යොමු විය. පෝෂණය, ස්නායු භෞතවේදය, රයිනෝස්පෝරිඩියෝසිස් සහ සිමියන් මැලේරියාව යන ක්ෂේත්‍රවල මුල් දායකත්වය විශේෂ අවධානයට ලක්විය යුතු අතර විද්‍යාත්මක සාහිත්‍යයෙහි පුළුල් ලෙස උපුටා දක්වා ඇත. මීට අමතරව, ජාතික අවශ්‍යතා පිළිබඳ සායනික හා වසංගත රෝග පර්යේෂණ රටේ සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීමට දායක විය.

1970 දශකයේ සිට පුළුල් පරාසයක මාතෘකා පිළිබඳ මූලික හා ව්‍යවහාරික පර්යේෂණ ව්‍යාපෘති කිහිපයක් ඇතුළත් වන පරිදි පර්යේෂණ ක්ෂේත්‍ර පුළුල් විය. මින් සමහරක් ජාතික මට්ටමින් ප්‍රතිපත්තිය වෙනස් කිරීමට දායක විය, උදා. ළදරු පෝෂණය පිළිබඳ අධ්‍යයනයන් මාතෘ නිවාඩු සංශෝධනය සඳහා අවශ්‍ය පසුබිම් තොරතුරු සපයන ලදී.

1980 සහ 90 දශකවල පර්යේෂණ සායනික හා වසංගත රෝග පර්යේෂණ හා සෞඛ්‍ය සේවා පර්යේෂණ කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ අතර ඒවායින් සැලකිය යුතු සංඛ්‍යාවක් ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සමපද සමාලෝචිත සඟරාවල ප්‍රකාශනයට පත් විය. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ බොහෝ සාමාජිකයින් ඔවුන්ගේ සොයාගැනීම් දේශීය හා ජාත්‍යන්තර විද්‍යාත්මක රැස්වීම්වලදී ඉදිරිපත් කළහ. පාචන රෝග, මැලේරියාව, බරවා, වැඩිහිටියන්ගේ සෞඛ්‍ය තත්ත්වය, මත්ද්‍රව්‍ය භාවිතා කිරීමේ රටාවන්, වකුගඩු රෝග, සර්ප දෂ්ටන වලට ප්‍රතිකාර කිරීම, සෞඛ්‍ය සේවා පර්යේෂණ, පෝෂණය, පිළිකා ජනනය සහ මානසික සෞඛ්‍යය පර්යේෂණ මෙම මාතෘකා අතර වේ

පර්යේෂණ කටයුතු සඳහා විශ්වවිද්‍යාලය සහ ජාතික විද්‍යා පදනම (NSF) වැනි දේශීය ප්‍රභවයන්ගෙන් ලැබෙන අරමුදල් වලට අමතරව, එක්සත් ජාතීන්ගේ සංවිධාන වන WHO, UNICEF, UNFPA සහ IDRC වැනි ආයතන විසින් මෙම කටයුතු සඳහා අරමුදල් සපයා ඇත.

එමෙන්ම සංධාන වැඩසටහන් කිහිපයක්ද සංවර්ධනය කර ඇත. නිදසුනක් වශයෙන්, 1986 දී ස්වීඩනයේ උප්සලා විශ්ව විද්‍යාලය සමග ඒකාබද්ධ සහයෝගීතාවන් මගින් අණුක ජෛව විද්‍යා හා ජාන තාක්ෂණය පිළිබඳ රසායනාගාරයක් ජෛව රසායනික හා අණුක ජීව විද්‍යා දෙපාර්තමේන්තුවෙහි පිහිටුවන ලදී. පශ්චාත් උපාධිධාරීන් කිහිපදෙනෙකු මේ පාඨමාලාව තුළින් විද්‍යාපති හා ආචාර්ය උපාධි සඳහා ඉගෙනුම ලබා ඇත.

1988 දී පිහිටුවන ලද මැලේරියා පර්යේෂණ ඒකකය පශ්චාත් උපාධි පර්යේෂණ මධ්‍යස්ථානයක් ලෙස ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා ඇති අතර එඩින්බරෝ විශ්ව විද්‍යාලය හා පාස්චර් ආයතනය සමඟ සහයෝගී සම්බන්ධතා පැවැත්වීය. මැලේරියා පර්යේෂණ ඒකකය මීට වසර තුනකට පෙර පිළිලවේදය පර්යේෂණ ඒකකය බවට පරිවර්තනය කරන ලදී.

සායනික වෛද්‍ය අධ්‍යයන අංශය කාර්ය මණ්ඩලය සහ සිසුන් අතර සෞඛ්‍ය සම්පන්න පර්යේෂණ සංස්කෘතියක් පවත්වාගෙන යමින් ජාතික හා ජාත්‍යන්තර පර්යේෂණ ව්‍යාපෘති සහ සහයෝගීතාවන් කීපයක ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි, සායනික වෛද්‍ය අධ්‍යයන අංශය ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ නෆීල්ඩ් සායනික වෛද්‍ය අධ්‍යයන අංශය සහ ලිවර්පූල් විශ්ව විද්‍යාලය අතර ඇති ඔක්ස්-කෝල් ව්‍යාපෘතිය ඉතා සාර්ථකවී තිබේ. පවත්නා පර්යේෂණ විෂවීම පිළිබඳ අධ්‍යයනයන් වෙත හැරී ඇත. පර්යේෂණ අවස්ථා තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා සර්ප දෂ්ට පර්යේෂණ විද්‍යාගාරය සහ උරගාගාරය පිහිටුවා ඇත. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් දියවැඩියා පර්යේෂණ ඒකකයක් සහ නිවර්තන වෛද්‍ය පර්යේෂණ ඒකකයක් ද පිහිටුවා ඇත. විශ්ව විද්‍යාල වෛද්‍ය ඒකකය එම්.ඩී. (සාමාන්‍ය වෛද්‍ය විද්‍යාව), එම්.ඩී. ( වෘක්කවේදය), එම්.ඩී. ( අන්තරාසර්ග විද්‍යාව) සහ වැඩිහිටියන්ගේ ඖෂධ පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හදාරන පශ්චාත් උපාධි අපේක්ෂකයන් සඳහා නියමිත ඒකකයක් වේ.

දර්ශනසූරි, දර්ශනපති සහ ඩීඑම් යන පර්යේෂණ උපාධි සඳහා යොමු වන වෛද්‍ය සහ වෛද්‍ය නොවන උපාධිධාරීන්ට පීඨය විසින් පර්යේෂණ පුහුණුව ලබා දෙයි. පර්යේෂණ හා උසස් උපාධි කමිටුව ව්‍යාපෘති යෝජනා සමාලෝචනය කරන අතර වරින් වර ඒවායේ ප්‍රගතිය නිරීක්ෂණය කරයි. පර්යේෂණ ප්‍රවර්ධන හා පහසුකම් මධ්‍යස්ථානය (RPFC) විසින් වැඩමුළු, මාර්ගගත පාඨමාලා, ලේඛන සමාජ හා ජර්නල් සංගම් හරහා සහාය ලබා දෙයි.

සායනික වෛද්‍ය විද්‍යා අංශය හා ව්‍යාධිවේදය, ක්ෂුද්‍රජීවවේදය, පිළිලවේදය, වෝහාරික වෛද්‍ය විද්‍යාව හා ප්‍රජා වෛද්‍ය විද්‍යා යන අධ්‍යයන අංශ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි(PGIM) පශ්චාත් උපාධි පාඨමාලා සඳහා පුහුණු මධ්‍යස්ථාන ලෙස භාවිතා වේ. එසේම පර්යේෂණ විධික්‍රම පිළිබඳ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි අභ්‍යාසලාභීන් පුහුණු කිරීම හා පර්යේෂණ සංරචකයක් හා නිබන්ධන සංරචකයක් සහිත පාඨමාලාවල පර්යේෂණ ව්‍යාපෘතිවල නියාමන කටයුතුවලටද පීඨය ඉහළ මට්ටමේ දායකත්වයක් ලබාදෙයි.

**සායනික,ප්‍රජා , අධිකරණ, විමර්ශනාත්මක හා වෙනත් සේවා**

පීඨයේ ප්‍රධාන සායනික අංශ සියල්ලෙහිම කාර්ය මණ්ඩලය ගරු සේවයක් වශයෙන් ශ්‍රී ලංකා ජාතික රෝහල (NHSL), ද සොයිසා මාතෘ රෝහල (DMH) සහ රිජ්වේ ආර්යා ළමා රෝහල(LRH) යන රෝහල්වල විශේෂඥ වෛද්‍යවරු ලෙස සේවය කරති. මෙම රෝහල්වල මහාචාර්ය ඒකක පවත්වාගෙන යාමට අමතරව විශේෂඥ සායන පවත්වමින් රෝග නිර්ණය සේවා සපයති. මානව ජාන ඒකකය යනු ජානමය උපදේශනය සහ සෛලජනක රෝග විනිශ්චය සඳහා රෝගීන් යොමු කරවන මධ්‍යස්ථානයකි.

වෛද්‍ය පීඨයේ ශල්‍ය වෛද්‍ය හා සායනික වෛද්‍ය අධ්‍යයන අංශ විසින් ආරම්භ කරන ලද වකුගඩු බද්ධ කිරීමේ වැඩසටහන සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහයෝගයෙන් සිදු කරයි. ඔවුන් 1985 දී මෙරට ප්‍රථම වකුගඩු බද්ධ කිරීම සිදු කරන ලදී. සම්පූර්ණයෙන්ම සායනික වෛද්‍යවරුන්ගෙන් සමන්විත සායනික වෛද්‍ය අධ්‍යයන අංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය වසරකට රෝගීන් 9000 කට ආසන්න සංඛ්‍යාවක් මහාචාර්ය ඒකකයට යොමු කිරීම සඳහා

උපදේශක ආවරණයක් ලබා දේ. ශල්‍ය වෛද්‍ය දෙපාර්තමේන්තුව විසින් මෙරට ප්‍රථම සනාල ශල්‍ය ඒකකය සහ පළමු මැමෝග්‍රැෆි ඒකකය පිහිටුවන ලදී.

මනෝචිකිත්සක අධ්‍යයන අංශයේ සාමාජිකයන් විසින් ත්‍රිවිධ හමුදාවට සහ රාජ්‍ය නොවන සංවිධාන කිහිපයකට ගරු උපදේශන සේවාවක් සපයන අතර ඖෂධ තොරතුරු සේවාවක් සපයයි.

ව්‍යාධිවේදය, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, පිළිලවේදය, ඖෂධවේදය, ප්‍රසව හා නාරිවේදය, සායනික වෛද්‍ය අධ්‍යයන අංශයේ වකුගඩු පර්යේෂණාගාරය සහ මානව ජාන විද්‍යා ඒකකයේ සෛලජනක රෝග නිර්ණය රසායනාගාරය රජයේ හා පෞද්ගලික යන අංශ දෙකෙහිම රෝහල් සහ සායනික වෛද්‍යවරුන්ට රසායනාගාර සේවා සපයයි. මේවායින් සමහරක් ශ්‍රී ලංකාවේ මෙම විද්‍යාගාරවල පමණක් ලබා ගත හැකි විශේෂිත පරීක්ෂණ වේ. ප්‍රතිශක්තිකරණ රසායන විද්‍යාගාරයක් පිහිටුවීම තුළින් ව්‍යාධිවේද අධ්‍යයන අංශය ශ්‍රී ලංකාවේ පළමු වරට පියයුරු පිළිකා වල ප්‍රතිශක්තිකරණ පූර්ව සලකුණු හඳුනා ගැනීමට පහසුකම් සලසා දුන්නේය. භිෂග්වේද අධ්‍යයන අංශය ඖෂධ තොරතුරු සේවාවක් සපයන අතර රටේ අහිතකර ඖෂධ ප්‍රතික්‍රියා වාර්තා කිරීමේ කේන්ද්‍රස්ථානයකි. වෝහාරික වෛද්‍ය හා ධූලකවේද අධ්‍යයන අංශය විසින් කොළඹ ප්‍රදේශයේ නම් කරන ලද පොලිස් බලප්‍රදේශ හයක් (6) තුළ අධිකරණ කටයුතු සිදු කරනු ලැබේ

ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය සෞඛ්‍යාරක්ෂණ සේවා සැපයීම සඳහා කෝට්ටේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි බල ප්‍රදේශයේ ප්‍රජා සෞඛ්‍ය ව්‍යාපෘතියක් පවත්වාගෙන යයි. සෞඛ්‍ය අමාත්‍යාංශය සහ කම්කරු දෙපාර්තමේන්තුව හා එක්ව කරගෙන යන වෘත්තියික ස්වස්ථතා ව්‍යාපෘතිය යටතේ පුහුණු කිරීම්, සේවා සැපයීම් හා පර්යේෂණ ක්‍රියාත්මක කෙරේ.

පීඨයේ වඩාත්ම වැදගත් දායකත්වයක් වන්නේ ශ්‍රී ලංකාවේ නව වෛද්‍ය පීඨයන්ට අධ්‍යයන කාර්ය මණ්ඩලය සැපයීමයි. සියළුම අධ්‍යයන අංශවල කාර්ය මණ්ඩලය වරින් වර බාහිර කථිකාචාර්යවරුන් සහ බාහිර පරීක්ෂකවරුන් ලෙස මෙම සහෝදර වෛද්‍ය පීඨ හා එක්ව කටයුතු කරයි. සමහරුන්ට බාහිර පරීක්ෂකයින් ලෙස විදේශීය වෛද්‍ය විද්‍යාලවලට ආරාධනා කර ඇත.

**ජාතික හා ජාත්‍යන්තර සංවිධානවලට දක්වන දායකත්වයන්**

අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සාමාජිකයින් කිහිප දෙනෙක් ලෝක සෞඛ්‍ය සංවිධානයේ ජිනීවා සහ අග්නිදිග ආසියානු කලාපය, ජාතික විද්‍යා පදනම (NSF), සෞඛ්‍ය අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ විවිධ කමිටුවල සේවය කර ඇති අතර සමහරු දැනට ද සේවයේ නිරතව ඇත. ඖෂධ හා ආලේපන ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපදේශකයින් ලෙස භිෂග්වේදය අධ්‍යයන අංශයේ කාර්ය මණ්ඩලය කටයුතු කරයි. වෝහාරික වෛද්‍ය හා ධූලක විද්‍යා අධ්‍යයන අංශය ශ්‍රී ලංකාවේ ජාතික රෝහලේ ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය පවත්වාගෙන යයි.

පීඨ සාමාජිකයන් කීප දෙනෙකු සෞඛ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ ජනාධිපති කාර්ය සාධන බලකායේ, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කමිටුවේ හා ළමා අපචාර වැළැක්වීම හා මවුකිරි දීම පිළිබඳ ජනාධිපති කාර්ය සාධන බලකායේ කටයුතු කර ඇත.

පීඨ සාමාජිකයන් කීප දෙනෙකු ශ්‍රී ලංකා වෛද්‍ය සංගම් (SLMA) සභාවෙහි හා විශේෂඥ කමිටුවල, ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමයේ (SLAAS), ශ්‍රී ලංකා සෞඛ්‍ය තොරතුරු සංගමයේ (HISSL), ශ්‍රී ලංකා ක්‍රීඩා වෛද්‍ය සංගමයේ (SLSMA) සහ වෘත්තීය විද්‍යාලවල සභා වල සේවය කර ඇති අතර තවද, පීඨ සාමාජිකයින් කිහිප දෙනෙකු මෙම සංගම්වල සහ වෘත්තීය විද්‍යාලවල සභාපතිවරුන් ලෙස වසර ගණනාවක් සේවය කර ඇත.

වර්තමානයේ වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයන අංශය බවට පත්ව ඇති කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය අධ්‍යාපන සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථානය (MEDARC) රටේ සියලුම වෛද්‍ය පීඨවලට සහ පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනයට (PGIM) වෛද්‍ය අධ්‍යාපනයේ සම්පත් මධ්‍යස්ථානයක් ලෙස විශේෂඥ දැනුම හා සේවා සපයයි. එය වෛද්‍ය අධ්‍යාපනයේ විශිෂ්ටත්වය සඳහා ජාත්‍යන්තරව පිළිගත් මධ්‍යස්ථානයක් වන අතර මෑතකදී එය ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහයෝගිතා මධ්‍යස්ථානයක් ලෙස නම් කරන ලදී.

පීඨය ආසියා පැසිපික් කලාපීය මහජන සෞඛ්‍ය පාසල්වල විශාලතම හා වඩාත්ම බලපෑම් සහගත මහජන සෞඛ්‍ය පිළිබඳ ආසියා පැසිපික් කලාපීය අධ්‍යයන සමුළුවේ (APACPH) සාමාජිකයෙකි. APACPH එහි මූලික පරමාර්ථය ලෙස මහජන සෞඛ්‍ය සඳහා වෘත්තීය අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා කැපවී සිටී.

පීඨයේ ආචාර ධර්ම සමාලෝචන කමිටුව (ERC) ආසියානු සහ බටහිර පැසිෆික් කලාපයේ ආචාර ධර්ම සමාලෝචන කමිටුවේ (FERCAP) සාමාජිකයෙකි.

**අධ්‍යයන අංශ පිළිබඳ කෙටි හැඳින්වීමක්**

**කාය ව්‍යවච්ඡේද අධ්‍යයන අංශය**

කාය ව්‍යවච්ඡේද අධ්‍යයන අංශය විද්‍යාර්ථීන් පුහුණුව සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට කැපවී සිටී. පර්යේෂණයන්හි විශිෂ්ටත්වය සහ උසස් තත්ත්වයේ අධ්‍යාපනය සිසුන්ට ලබා දීම දෙපාර්තමේන්තුව අරමුණු කරයි. සායනික කාය ව්‍යවච්ඡේද විද්‍යාවෙහි විවිධ ක්ෂේත්‍රයන් හා අනු ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුම සහිත අධ්‍යයන කාර්ය මණ්ඩලයකින් මෙම අංශය සමන්විත වේ.ඔවුන්ගේ පර්යේෂණ අභිරුචීන් පුළුල් පරාසයක විහිදී ඇත. උත්කෘෂ්ට කැපවීමෙන් යුතු, වසර ගණනාවක පළපුරුද්දක් ඇති පරිපාලන, තාක්ෂණික හා සහායක කාර්ය මණ්ඩලයක් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් සඳහා සහාය වේ. මෙම දෙපාර්තමේන්තුව වෛද්‍ය විද්‍යාව හා සම සෞඛ්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාර්ථීන්ට ඉගෙනුම ලබාදෙන අතර පශ්චාත් උපාධි බොහොමයක් සඳහා පුහුණු පාඨමාලා ගණනාවක් පිරිනමයි.

**ජෛව රසායන විද්‍යා හා අණුක ජීව විද්‍යා අධ්‍යයන අංශය**

දේශන, කුඩා කණ්ඩායම් ක්‍රියාකාරකම්, ගැටළු පදනම් කරගත් ඉගෙනීම්, අන්තර් ශික්ෂණ කාර්ය මණ්ඩල සම්මන්ත්‍රණ සහ ප්‍රායෝගික රසායනාගාර පන්ති වැනි ඉගැන්වීම් සහිතව වෛද්‍යවිද්‍යා උපාධි අපේක්ෂක විෂය මාලාවේ ජෛව රසායන විද්‍යා හා අණුක ජීව විද්‍යා අධ්‍යයන අංශය ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරයි. ඊට අමතරව පශ්චාත් උපාධි සිසුන් සඳහා ජෛව රසායන විද්‍යාව හා අණුක ජීව විද්‍යාව විද්‍යාපති උපාධිය පිරිනමනු ලැබේ. දෙපාර්තමේන්තුවේ පර්යේෂණ අභිරුචීන් අතර පෝෂණය, අණුක ජීව විද්‍යාව, සෛල වගාව, ශාක පදනම් කරගත් ඖෂධ අධ්‍යයනය සහ එන්සයිම විද්‍යාව ඇතුළත් වේ.

**සායනික වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය**

වෛද්‍ය විෂය මාලාවේ සියලුම අංගයන් සඳහා සහ විශේෂයෙන් සායනික විද්‍යා විෂය ධාරාවට අධ්‍යයන අංශය දායක වේ. ඉගැන්වීමේ වැඩසටහනට වාට්ටු හා සායනවල ඉගැන්වීම මෙන්ම වෙනත් රෝහලක කලාතුරකින් දක්නට ලැබෙන සායනික ගැටලු රාශියක් සහිත , සායන සහ ශ්‍රී ලංකා ජාතික රෝහලේ (NHSL) තීව්‍ර ඇතුළත් කිරීම් ඒකකය (Acute Admission Unit) ද අයත් වේ. නවීන රෝහල් සංකීර්ණයක ඇඳන් 100 විශ්ව විද්‍යාල වෛද්‍ය ඒකකයේ (වාට්ටු 41 සහ 48 බී) අවසන් වසරේ සිසුන් සඳහා නව්‍ය ඉගැන්වීමේ වැඩසටහනක් ඇත. අධ්‍යයන අංශය සතුව නව ඉගැන්වීම් හා පර්යේෂණ පහසුකමක් (සායනික වෛද්‍ය හා පර්යේෂණ මධ්‍යස්ථානය - ClinMARC) ඇත. මෙය සායනික සිසුන් සහ පර්යේෂකයින් සඳහා අධ්‍යාපන පහසුකම් කිහිපයක් සපයයි. බෝ නොවන රෝග, සර්ප දෂ්ට කිරීම, වෘක්කවේදය, මී උණ, ඩෙංගු, ඔස්ටියෝ ආතරයිටිස් සහ එස්එල්ඊ ඇතුළු පර්යේෂණ අභිරුචීන් කිහිපයක් අධ්‍යයන අංශයට ඇත.

**ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය**

විෂයමාලාවේ වසර පහක කාලය තුළ උපාධි අපේක්ෂක ප්‍රජා ප්‍රවාහ ඉගැන්වීමේ වැඩසටහන සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රජා වෛද්‍ය අධ්‍යයන අංශය සැලකිය යුතු දායකත්වයක් සපයයි. එමෙන්ම අධ්‍යයන අංශය ප්‍රජා වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි සිසුන් සඳහා නියමිත ඒකකයක් ද වේ. විදේශීය උපාධි හා පශ්චාත් උපාධි අපේක්ෂකයින් සඳහා ක්ෂේත්‍ර මූලික පුහුණුව, ප්‍රාථමික සෞඛ්‍ය සේවා හා විවිධ පර්යේෂණ ක්ෂේත්‍ර පිළිබඳ වරණීය පාඨමාලා ඉදිරිපත් කර ඇත. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සේවා සම්පාදනය පිළිබඳව විද්‍යාර්ථීන්ට අත්දැකීම් ලබා ගැනීම හා පර්යේෂණ සිදු කිරීම කෝට්ටේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී බලප්‍රදේශයේ පිහිටි විශ්වවිද්‍යාල ප්‍රජා සෞඛ්‍ය ව්‍යාපෘතිය මඟින් සිදුවේ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය සමඟ විශ්වවිද්‍යාල ප්‍රජා සෞඛ්‍ය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශය තුළ සේවා සැපයීම අධ්‍යයන අංශයේ වගකීම වේ. සෞඛ්‍ය පද්ධති පර්යේෂණ ඒකකය (HSRU) සහ වෘත්තීය සෞඛ්‍ය ඒකකය ද අධ්‍යයන අංශය යටතේ ක්‍රියාත්මක වේ. 2013 වසරේදී වෘත්තීය සෞඛ්‍ය පිළිබඳ පුහුණු හා පර්යේෂණ පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහයෝගීතා මධ්‍යස්ථානය ලෙස මෙම අධ්‍යයන අංශය පත් කෙරිණි.

**ව්‍යවහාරික විද්‍යා සහ ධූලක විද්‍යා අධ්‍යයන අංශය**

මෙම අධ්‍යයන අංශය 1951 දී කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයෙහි වෙනම අධ්‍යයන අංශයක් ලෙස ආරම්භ කරන ලදී. මෙයට පෙර අධිකරණ වෛද්‍ය නිලධාරී විසින් පවත්වන ලද දේශන මඟින් අධ්‍යයන කටයුතු සඳහා සේවාවන් සපයනු ලැබීය. අධ්‍යයන අංශයේ සේවාවන් සාමාන්‍ය ජනතාවට මෙන්ම විවිධ ක්ෂේත්‍රවල වෘත්තිකයින්ට ද ව්‍යාප්ත කෙරේ. අධ්‍යයන අංශ කාර්ය මණ්ඩලය වෛද්‍ය උපාධි අපේක්ෂකයින් සහ පශ්චාත් උපාධි අපේක්ෂකයින් මෙන්ම ව්‍යවහාරික විද්‍යාවට සම්බන්ධ වෘත්තිකයන් නෛතික සහෝදරත්වය සහ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් පුහුණු කිරීම සඳහා කැපවී සිටී. තම සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ නිසි මංපෙත් විවර කරන බව විශ්වාස කරන එය බොහෝ පර්යේෂණ ව්‍යාපෘති සඳහා ද සම්බන්ධ වේ. කොළඹ නගරය අවට පොලිස් ස්ථාන කිහිපයකට ව්‍යවහාරික ව්‍යාධිවේද (පශ්චාත් මරණ පරීක්ෂණ) සහ සායනික ව්‍යවහාරික වෛද්‍ය සේවාවන් අධ්‍යයන අංශය විසින් සපයනු ලැබේ.

**ක්ෂුද්‍ර ජීවවිද්‍යා අධ්‍යයන අංශය**

බැක්ටීරියා විද්‍යාව මුලින්ම උගන්වන ලද්දේ ව්‍යාධිවේද අධ්‍යයන අංශය මගිනි. බැක්ටීරියා විද්‍යාව සඳහා වෙනම අධ්‍යයන අංශයක් 1956 දී පිහිටුවන ලදී. ඇතුළත් කර ඇති උප විශේෂතා සැලකිල්ලට ගනිමින් 1976 දී මෙහි නාමකරණය ක්ෂුද්‍රජීව විද්‍යා අධ්‍යයන අංශය ලෙස වෙනස් කරන ලදී. අධ්‍යයන අංශය විසින් උපාධි අපේක්ෂකයින්, පශ්චාත් උපාධිධාරීන්, වෛද්‍ය රසායනාගාර තාක්‍ෂණ ශිල්පීන් සහ පරිපූරක වෛද්‍ය නිලධාරීන් සඳහා ඉගැන්වීම් සිදුකරනු ලැබේ. එසේම අධ්‍යයන අංශය මහජනතාවට විශේෂඥ ක්ෂුද්‍රජීව රෝග නිර්ණය සේවා ලබා දෙන අතර ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ පර්යේෂණයන්හිද නිරත වේ.

### ප්‍රසව හා නාරිවේද අධ්‍යයන අංශය

උපාධි අපේක්ෂක වෛද්‍ය සිසුන්ට ප්‍රසව, නාරිවේදය සහ නවජ ළමා රෝග පිළිබඳ ඉගැන්වීම අධ්‍යයන අංශයේ වගකීම වේ. මීට අමතරව, අධ්‍යයන අංශය හරහා සිය පර්යේෂණ කටයුතු කරගෙන යන උපාධි අපේක්ෂකයින්, පශ්චාත් උපාධිධාරීන් සහ තෝරාගත් විදේශීය සිසුන් ගණනාවක් සිටිති. අධ්‍යයන අංශ ආචාර්ය මණ්ඩලය සාමාන්‍ය හා ඉහළ අවදානම් සහිත ගැබ්ගැනීම් සහිත කාන්තාවන්ට ප්‍රතිකාර හා සත්කාර ලබා දෙන අතර නාරිවේදය හා කාන්තාවන්ගේ සෞඛ්‍ය ගැටළු රාශියක් පිළිබඳව අවධානය යොමු කරයි. අධ්‍යයන අංශය සම්ප්‍රදායක් ලෙස ගර්භණී සමයේදී වෛද්‍ය ආබාධ සඳහා ප්‍රතිකාර කිරීමේ විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානය ලෙස කටයුතු කරයි. උපාර්ජිත සහ සංජානනීය හෘද රෝග, දියවැඩියාව සහ ගර්භණී සංකීර්ණතාවලට හේතුවන අන්තරාසර්ග සංකූලතා ආබාධ මෙයට ඇතුළත් ය. නාරිවේද විද්‍යාවේදී උනන්දුවක් දක්වන ප්‍රධාන අංශ වන්නේ එන්ඩොමෙට්‍රියෝසිස් සහ එන්ඩොස්කොපික් සැත්කම් ය. උපාධි අපේක්ෂකයින් සඳහා ඉගැන්වීම් ප්‍රධාන වශයෙන් ද සොයිසා මාතෘ රෝහලේ සහ කාසල් වීදියේ කාන්තා රෝහලේදී පවත්වනු ලැබේ.

### ළමා රෝග අධ්‍යයන අංශය

උපාධි අපේක්ෂක වෛද්‍ය සිසුන්ට ළමා රෝග ඉගැන්වීම අධ්‍යයන අංශයේ වගකීම වේ. පශ්චාත් උපාධි පුහුණු කටයුතු සඳහා ද අධ්‍යයන අංශය සම්බන්ධ වේ. සායනික ඒකකය පිහිටා තිබෙන්නේ ශ්‍රී ලංකාවේ එකම ළමා රෝහල වන කොළඹ රිජ්වේ ආර්යා රෝහලේ ඇඳන් 80 සහිත 1 වන වාට්ටුවේ ය. අධ්‍යයන අංශ ආචාර්ය මණ්ඩලයේ පර්යේෂණ අභිරුචීන් අතරට ආමාශ ආන්ත්‍ර විද්‍යාව, සංවර්ධන ළමා රෝග, ස්නායු විද්‍යාව, අන්තරාසර්ග විද්‍යාව, නවජ විද්‍යාව, දැඩි සත්කාර, පෝෂණය සහ වෘක්ක විද්‍යාව ඇතුළත් වේ. රිජ්වේ ආර්යා රෝහලේ විශේෂිත ළමා සංවර්ධන, වකුගඩු, අන්තරාසර්ග හා ස්ථුලතා සායන ද අංශය විසින් පවත්වනු ලැබේ. ආචාර්ය මණ්ඩලයට අමතරව, දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට සමාජ සේවකයෙකු, පර්යේෂණ සහායකයින්, තාක්ෂණික, පරිපාලන හා ලේකම් කාර්ය මණ්ඩලයක් ඇතුළත් වේ. ළමා සෞඛ්‍යයට අදාළ ළමා රෝග හා ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්ති වල ප්‍රගතිය වෙනුවෙන් කැප වූ ජාතික හා ජාත්‍යන්තර කමිටු ගණනාවක අධ්‍යයන සාමාජිකයෝ සේවය කරති.

### පිළිලවේදය අධ්‍යයන අංශය

වෛද්‍ය විද්‍යාත්මක පිළිලවේදය ඉගැන්වීම / ඉගෙනීම සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කරන විශේෂඥයින් හා සම්පත් මණ්ඩලයක් මෙම අධ්‍යයන අංශය සතුය . පරපෝෂිත ආසාදන සම්ප්‍රේෂණය කරන වාහකයන් ද ඇතුළුව මිනිසුන්ගේ ප්‍රෝටෝසෝවන් හා හෙල්මින්ත් රෝග වල ජීව විද්‍යාත්මක, ප්‍රතිශක්ති විද්‍යාත්මක, වසංගත හා පාරිසරික අංශ කෙරෙහි මෙම ඉගැන්වීම අවධානය යොමු කර ඇත. මීට අමතරව, පරපෝෂිත ආසාදන සඳහා රෝග විනිශ්චය කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස ද අධ්‍යයන අංශය කටයුතු කරන අතර එය ජාතික විමර්ශන විද්‍යාගාරයක් ලෙස සැලකේ. ඇමරිකා එක්සත් ජනපදයේ හාවඩ් විශ්ව විද්‍යාලය සහ එක්සත් රාජධානියේ ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය වැනි සුප්‍රසිද්ධ ආයතන සමඟ පවත්වාගෙන යනු ලබන ශක්තිමත් සහයෝගී සම්බන්ධතා සහිතව සිදු කරන ලද උසස් තත්ත්වයේ පර්යේෂණ සඳහා අධ්‍යයන අංශය ගෝලීය වශයෙන් පිළිගැනීමට ලක්ව ඇත. මැලේරියා පර්යේෂණ ඒකකය (මෑතකදී පරපෝෂිත රෝග පර්යේෂණ ඒකකය ලෙස නම් කරන ලදී) සහ අධ්‍යයන අංශයේ ක්ෂේත්‍ර පර්යේෂණ විෂය පථයට අයත් කතරගම පර්යේෂණ මධ්‍යස්ථානය, උපාධි හා පශ්චාත් උපාධි අභ්‍යාසලාභීන් සඳහා ශක්තිමත් පර්යේෂණ හා ඉගැන්වීම් සම්පත් ලෙස දිගටම පවත්වා ගෙන යන අතර එහි ප්‍රතිඵලයක් ලෙස දර්ශනපති / දර්ශනසූරී උපාධි 50 කට ආසන්න ප්‍රමාණයක් ප්‍රදානය කෙරේ.

2018 ඔක්. 09 වනදා පැවති 454 වන පීය මණ්ඩල රැස්වීමේදී පිළිලවේදය අධ්‍යයන අංශය "පිළිලවේදය හා කීටවිද්‍යා අධ්‍යයන අංශය" ලෙස නම් කිරීමට නිර්දේශ විය.

### ව්‍යාධිවේද අධ්‍යයන අංශය

ව්‍යාධිවේද අධ්‍යයන අංශය උපාධි හා පශ්චාත් උපාධි ඉගැන්වීම්, පර්යේෂණ සහ රෝග විනිශ්චය කටයුතු සඳහා සම්බන්ධ වන අතර එයට පටක විද්‍යාව, රක්තවේදය, සෛලවේදය ඇතුළත් වේ. රෝගයේ හේතුව හා බලපෑම් අතර සම්බන්ධය වටහාගත හැකි සහ සහ ප්‍රශස්ත රෝගී සත්කාර ලබා දීමේදී මෙම දැනුම යොදා ගැනීමට හැකි වෛද්‍ය උපාධිධාරීන් බිහිකිරීමට අංශය අරමුණු කරයි. මෙම අංශය විශේෂඥ වෛද්‍ය සේවා සපයන අංශ අතර පටක ප්‍රතිශක්ති රසායන විද්‍යාව, අභ්‍යන්තර පියයුරු පිළිකා හඳුනා ගැනීම, වෘක්ක ව්‍යාධිවේදය, චර්ම බද්ධ ව්‍යාධිවේදය, මෛත්‍ර ලිංගික ව්‍යාධිවේදය, මෘදු පටක හා අස්ථි පිළිකා ව්‍යාධිවේදය, පූර්ව ප්‍රසව ව්‍යාධිවේදය හා භ්‍රෑණ ව්‍යාධිවේදය ද වේ. ව්‍යාධිවේදය පිළිබඳ පර්යේෂණ, ප්‍රතිපත්ති සම්පාදනය සහ තත්ත්ව සහතික කිරීම සඳහා අධ්‍යයන අංශය නායකත්වය සපයයි

### භිෂග්වේද අධ්‍යයන අංශය

භිෂග්වේද අධ්‍යයන අංශය රෝග චිකිත්සාවෙහි ඖෂධවේදීය පදනම පිළිබඳ උපාධි අපේක්ෂකයින්ට දැනුම ලබා දීමට උත්සාහ කරයි. සිසුන්ගේ ඉගෙනීමට සහාය වීම සඳහා දේශන, නිබන්ධන, වාට්ටු පන්ති සහ ශිෂ්‍ය මාර්ගෝපදේශ භාවිතා කරනු ලැබේ. මෙම අධ්‍යයන අංශ අධ්‍යයන කාර්ය මණ්ඩලය සායනික අධ්‍යයන අංශය විසින් පවත්වනු ලබන ඒකාබද්ධ ඉගැන්වීම් කටයුතුවලට සහ චර්යාත්මක හා ප්‍රජා ප්‍රවාහයන් විසින් පවත්වනු ලබන කුඩා කණ්ඩායම් සාකච්ඡාවලට සහභාගී වේ. අධ්‍යයන අංශය විද්‍යා පීඨය හා එක්ව විද්‍යාවේදී විශේෂ (භිෂග්වේද) උපාධියක් පිරිනමයි. ක්ෂේත්‍ර කිහිපයක විශේෂඥයින් පුහුණු කිරීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලය පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනයට සහාය වේ. අධ්‍යයන අංශය සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සමීප සහයෝගීතාවයක් පවත්වා ගන්නා අතර, ඖෂධවේදීන්, භෞත චිකිත්සකයින්, අක්ෂි තාක්ෂණ විද්‍යාඥයින් සහ විද්‍යුත් හෘද රෝග විශේෂඥයින් පුහුණු කිරීම සඳහා අංශය සහභාගී වේ.

අධ්‍යයන අංශය විසින් සේරම් ලිතියම් ඇස්තමේන්තු සඳහා චිකිත්සක ඖෂධ නියාමන සේවාවක් හා ඖෂධ තොරතුරු සේවාවක් සපයන අතර අහිතකර ඖෂධ ප්‍රතික්‍රියා අධීක්ෂණයට සහභාගී වේ. අධ්‍යයන අංශය සතුව නවීන උපකරණ සහිත විද්‍යාගාර දෙකක් භිෂග්වේද අංශයේ සහ තවත් විද්‍යාගාරයක් ඖෂධ අධ්‍යයන අංශයේ පවතින අතර අධ්‍යයන අංශය සායනික හා භිෂග්වේද උපාධි හා පශ්චාත් උපාධි පර්යේෂණ සිදු කරයි. අධ්‍යයන අංශය විසින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සමඟ ඒකාබද්ධව ත්‍රෛමාසිකව ස්වාධීන ඖෂධ තොරතුරු සඟරාවක් ප්‍රකාශයට පත් කරනු ලැබේ

**භෞතවේද අධ්‍යයන අංශය**

භෞතවේද අධ්‍යයන අංශය වෛද්‍ය හා පරිපූරක විද්‍යා සිසුන්ටද පශ්චාත් උපාධිධාරීන්ටද මූලික භෞතික විද්‍යාත්මක ක්‍රියාවලීන් තුළින් මිනිස් සිරුර ක්‍රියා කරන ආකාරය අවබෝධ කර ගැනීමට සහ එම අවබෝධය සායනික පුහුණුව සඳහා පරිවර්තනය කිරීමට උපකාර කිරීමට කැපවී සිටී. මෙම අධ්‍යයන අංශය ඉගැන්වීමේ ක්‍රියාකාරකම් තුළ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන අතර සම සෞඛ්‍ය විද්‍යා ඒකකය සහ පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනය ඇතුළු බොහෝ අධ්‍යයන අංශ හා ඒකකවල ඉගැන්වීම් කටයුතු සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. දෙපාර්තමේන්තුවේ නව ප්‍රගමනයක් ලෙස කායික විද්‍යා කෞතුකාගාරයක් ගොඩනැගීම, වෛද්‍ය රසායනාගාර කාර්මිකයින් සඳහා සහතික පත්‍ර පාඨමාලාවක් පිරිනැමීම සහ ස්නායු භෞතීය විද්‍යාගාරයක් සංවර්ධනය කිරීම දැක්විය හැකිය. මූලික රසායනාගාර පරීක්ෂණ මෙන්ම පෙනහළු ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම වැනි විශේෂිත සේවාවන් මගින් රෝග නිර්ණය සේවා අංශය විසින් සපයනු ලැබේ.

**මනෝවිද්‍යා අධ්‍යයන අංශය**

ශ්‍රී ලංකාවේ උපාධි අපේක්ෂකයින් සඳහා මනෝචිකිත්සාව ඉගැන්වීම සඳහා මෙම අංශය පුරෝගාමී වී ඇත. **1995** දී ක්‍රියාත්මක වූ විෂය මාලා ප්‍රතිශෝධනය සමඟ වෙනම මානසික සෞඛ්‍ය මොඩියුලයක් සහ මාස දෙකක සායනික ඇමුණුම් හඳුන්වා දෙන ලදී. **1995** දී මෙම අංශය ශ්‍රී ලංකාවේ වෛද්‍ය විද්‍යාල අතර අවසන් වසර සඳහා මනෝ චිකිත්සාව වෙනමම ඇගයීමක් ලෙස හඳුන්වා දුන් පළමු වෛද්‍ය විද්‍යාලය බවට පත්විය. නැගී එන අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර වශයෙන් ශ්‍රී ලංකාවේ මානසික සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීම සඳහා වැඩි බලපෑමක් ඇති කිරීම සඳහා අධ්‍යයන අංශයේ විෂය පථය පුළුල් කරන ලදී. චර්යාත්මක විද්‍යා, ජෛව වෛද්‍ය ආචාර ධර්ම සහ ළමා හා ප්‍රජා මනෝචිකිත්සාව ඉගැන්වීමට අධ්‍යයන අංශය දායක වේ. අධ්‍යයන අංශය වැඩිහිටියන්, නව යොවුන් දරුවන් සහ ළමුන් සඳහා විශේෂිත නේවාසික හා බාහිර රෝගී මනෝචිකිත්සක සේවාවන් සපයන අතර විශ්ව විද්‍යාල මනෝචිකිත්සක ඒකකය, ශ්‍රී ලංකා ජාතික රෝහල සහ කොළඹ රිජ්වේ ආර්යා යන රෝහල්වල සායනික පුහුණුව සඳහා පහසුකම් සපයයි. අධ්‍යයන අංශය විශේෂිත ප්‍රජානන තක්සේරු සේවාවක් ද සපයයි.

**ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශය**

ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශය උපාධි අපේක්ෂකයින්ගේ පුහුණුවේ බොහෝ අවස්ථා වලදී, එනම් සායනික විද්‍යා ප්‍රවේශයෙහි සිට අවසාන වසර මහාචාර්ය ඒකකය දක්වා බොහෝ මොඩියුලවල ඉගැන්වීමට සම්බන්ධ වේ. සාමාන්‍ය ශල්‍යකර්ම පුහුණුවට අමතරව, පශ්චාත් උපාධි වෛද්‍යවරු ඉහළ ආමාශයික හා ආන්ත්‍රික, කොලරෙක්ටල්, ලැපරොස්කොපි ශල්‍යකර්ම, හෙපටෝබිලියරි-අග්න්‍යාශ සැත්කම්, වකුගඩු හා අක්මා බද්ධ කිරීමේ සැත්කම්, සනාල සැත්කම්, ඊආර්සීපී සහ ඉහළ / පහළ ආමාශයික හා ආන්ත්‍රික සැත්කම්, එන්ඩොස්කොපි පරීක්ෂාව සහ ළමා සැත්කම් පිළිබඳව මාස 6 සිට 12 දක්වා විශේෂඥ පුහුණුව ලබති. නිර්වින්දනය පිළිබඳ පශ්චාත් උපාධි අපේක්ෂකයින් සඳහා මාස **3** ක පුහුණුවක් ද අංශය විසින් පවත්වනු ලැබේ.

**වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයන අංශය**

**1995** දී සම්මත කරන ලද විෂයමාලා අනුවර්තනය සංවර්ධනය කිරීම හා සහයෝගය දැක්වීම සඳහා **1993** දී වෛද්‍ය අධ්‍යාපන සංවර්ධන හා පර්යේෂණ මධ්‍යස්ථානය (MEDARC) ලෙස මෙම අධ්‍යයන අංශය ආරම්භ කරන ලදී. මෙම අවස්ථාවෙහිදී මෙඩාර්ක් විසින් විෂයමාලා සංවර්ධනය සඳහා උපදේශනය, සම්බන්ධීකරණය හා පහසුකම් සැපයීම යන කාර්යයන් ඉටු කරන ලදී. මේ වන විට අධ්‍යයන අංශය වෛද්‍ය අධ්‍යාපනයේ සම්පත් මධ්‍යස්ථානයක් ලෙස රටේ සියලුම වෛද්‍ය පීඨ වලට සහ පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනයට **(PGIM)** විශේෂඥ දැනුම ලබා දෙයි. එය සිසුන්ට

සහායවීම, කාර්ය මණ්ඩල සාකච්ඡා සහ ජාත්‍යන්තර සහයෝගීතාවයේ කේන්ද්‍රීය මධ්‍යස්ථානයකි. විෂයමාලා ක්‍රියාකාරකම් පිළිබඳ පැහැදිලි කිරීම් සහ පර්යේෂණ සහ පිළිබඳ උපදෙස් සඳහා බොහෝ සිසුහු දිනපතා කාර්යාලයට පැමිණෙති. 2016 සැප්තැම්බර් වන විට මෙම අධ්‍යයන අංශය වෛද්‍ය අධ්‍යාපන සංවර්ධන, පුහුණු හා පර්යේෂණ සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහයෝගිතා මධ්‍යස්ථානයක් ලෙස නම් කර ඇත. 2023 දක්වා අධ්‍යයන අංශය ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහයෝගිතා මධ්‍යස්ථානය ලෙස නැවත පත් කරන ලදී.

**සම සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශය**

අංක 124/1, බාන්ස් පෙදෙස, කොළඹ 07 හි පිහිටා ඇති සම සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශය, භෞතවේදය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හා සම්බන්ධ සියලුම අධ්‍යයන හා පරිපාලනමය කටයුතු සිදු කරයි. භෞතවේදය පිළිබඳ විද්‍යාවේදී උපාධි පාඨමාලාව යනු 2005 උසස් පෙළ කාණ්ඩයේ සිසුන් ඇතුළත් කර ගැනීමත් සමඟ 2006 දී ආරම්භ කරන ලද සිව් අවුරුදු පාඨමාලාවකි. භෞතවේදය පිළිබඳ උපාධි අපේක්ෂකයින් පේශිකංකාල හා ස්නායුමය ආබාධ, හෘත් පුප්ඵුසීය පුනරුත්ථාපන අවශ්‍යතා, ආබාධ සහිත දරුවන්, වැඩිහිටි සත්කාර, කාන්තාවන්ගේ සෞඛ්‍ය සහ ක්‍රීඩා ආශ්‍රිත තුවාල සහිත රෝගීන් භාර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. භෞතවේදය උපාධි අපේක්ෂකයෝ සිය සායනික පුහුණුව ශ්‍රී ලංකා ජාතික රෝහල, රාගම පුනරුත්ථාපන රෝහල, වැලිසර ළය රෝහල, රිජ්වේ ආර්යා ළමා රෝහල සහ ප්‍රජා පුනරුත්ථාපන මධ්‍යස්ථානවලදී ලබා ගනිති. සම සෞඛ්‍ය විද්‍යා අධ්‍යයන අංශය ජාත්‍යන්තර විශ්ව විද්‍යාල සමඟ සම්බන්ධතා ඇති කර ගෙන ඇති අතර උපාධි අපේක්ෂකයින්ට වැඩි නිරාවරණයක් හා පළපුරුද්දක් ලබා දීම සඳහා බාහිර කථිකාචාර්යවරුන් යොදා ගනී.

**වෛද්‍ය මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය**

2016 දී පිහිටුවන ලද වෛද්‍ය මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය, පීඨයෙහි නවතම අධ්‍යයන අංශයකි. එය ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල අතර වෛද්‍ය මානව ශාස්ත්‍ර සඳහා වෙන්වූ පළමු අධ්‍යයන අංශය වන අතර මෙම ශික්ෂණය පිළිබඳ දකුණු ආසියානු කලාපයේ පුරෝගාමියෙකි.
වෛද්‍ය මානව ශාස්ත්‍ර ක්ෂේත්‍රය ආචාරධර්ම, මනෝ විද්‍යාව සහ සමාජ විද්‍යාව (සංස්කෘතික අධ්‍යයන, මානව විද්‍යාව සහ වෛද්‍ය සමාජ විද්‍යාව) වැනි පුළුල් පරාසයක විෂය ක්ෂේත්‍රයන්ගෙන් සමන්විත වන අතර සෞඛ්‍යය හා රෝග පිළිබඳ මානව අත්දැකීම් අවබෝධ කර ගැනීම සඳහා කලාත්මක හා සාහිත්‍ය කෘතිවල විවේචනාත්මක භාවිතය ද මීට ඇතුළත්ය. අධ්‍යයන අංශයේ මූලික පරමාර්ථය වන්නේ වෛද්‍ය හා සෞඛ්‍ය සේවා වෘත්තිකයින්ගේ සානුකම්පිත සත්කාරය, වෘත්තීයභාවය සහ ආචාරධර්ම පිළිබඳ ගුණාංග පෝෂණය කිරීම සඳහා වෛද්‍ය මානව ශාස්ත්‍ර ක්ෂේත්‍රය භාවිතා කිරීමයි. මෙයට අමතරව අධ්‍යයන අංශය ආයතනික හා පුද්ගල මට්ටමින් සෞඛ්‍ය සේවයට මානව ශාස්ත්‍ර ඇතුළත් කිරීම, ශික්ෂණය පිළිබඳ ශ්‍රී ලංකාවට අදාළ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ පැවැත්වීම සහ ශ්‍රී ලංකාවේ වෛද්‍ය මානව ශාස්ත්‍ර සංවර්ධනය සඳහා නායකත්ව කාර්යභාරයක් ඉටු කරයි.
අධ්‍යයන අංශය විසින් චර්යාත්මක විද්‍යා විෂය ධාරාව විසින් දැනට පවත්වන අධ්‍යාපන වැඩසටහනට සහයෝගය දක්වමින් මූලික කාර්යභාරයක් ඉටු කරයි. පහත දැක්වෙන තේමාවන් හය කෙරෙහි එහි අවධානය යොමු කරනු ඇත: මානුෂීයභාවය, පෞද්ගලික සංවර්ධනය, සෞඛ්‍යය හා චර්යාව, ඵලදායී සන්නිවේදනය, වෛද්‍ය ආචාර ධර්ම සහ වෘත්තීයභාවය.

**සමහර ඒකකවල ප්‍රධාන කෘත්‍යයන්**

**පවුල් වෛද්‍ය ඒකකය**

පවුල් වෛද්‍ය ඒකකය දෛනික ප්‍රජා පවුල් පුහුණු සායන හරහා ප්‍රජාවට ඉගැන්වීමේ ක්‍රියාකාරකම්, ප්‍රාථමික සත්කාර පර්යේෂණ සහ සායනික සේවාවන් සිදු කිරීමට සම්බන්ධ වේ. මෙම ඒකකයේ මෙහෙවර වනුයේ උපාධි (සහ පශ්චාත් උපාධි) අධ්‍යාපනය , පර්යේෂණ සහ ගුණාත්මක ප්‍රාථමික සත්කාර සායනික සේවා තුළින් ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් ප්‍රවර්ධනය කිරීමයි.

පවුල් පරිචය මධ්‍යස්ථානය සහ නොමිලේ සායන පවත්වා ගෙන යාමෙන් සහ ප්‍රජා පවුල් පුහුණු සායනයක දී ප්‍රාථමික රැකවරණය පිළිබඳ මූලික කරුණු සඳහා උපාධි අපේක්ෂකයින් නිරාවරණය කිරීමෙන් මෙම ඒකකය ප්‍රජාවට පළමු සම්බන්ධතා සත්කාර සපයයි.

**මානව ජාන ඒකකය**

1983 දී පිහිටුවන ලද කොළඹ විශ්ව විද්‍යාලයේ මානව ජාන විද්‍යාව පිළිබඳ ඒකකය (HGU) ශ්‍රී ලංකාවේ මානව ජාන විද්‍යාව පිළිබඳ ප්‍රමිතීන් ස්ථාපිත කරමින් මානව ජාන විද්‍යාව පිළිබඳ ජාතික යොමු මධ්‍යස්ථානය ලෙස සේවය කරයි. සෛලජනක හා අණුක ජාන පරීක්ෂණ සහ ජාන උපදේශනය ඇතුළු සායනික ජාන සේවා සැපයීම සඳහා මානව ජාන විද්‍යාව පිළිබඳ ඒකකය කැපවී සිටී.

මෙම ඒකකයේ කාර්ය මණ්ඩලය කොළඹ වෛද්‍ය පීඨයෙහි හා සහ පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනයෙහි උපාධි අපේක්ෂකයින් සඳහා මූලික වෛද්‍ය ජාන විද්‍යාව උගන්වයි. මීට අමතරව, මෙම ඒකකය සායනික ජාන විද්‍යාව පිළිබඳ

විද්‍යාපති, ජානමය රෝග නිර්ණය පිළිබඳ විද්‍යාපති, පුනර්ජනනීය වෛද්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාපති (ඉන්දියාවේ මනිපාල් පුනර්ජනනීය වෛද්‍ය විද්‍යාලය හා ඒකාබද්ධව) හා වෛද්‍ය ජාන විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය පිරිනමයි. මෙම ඒකකය මහජනයා අතර ජානවිද්‍යාව පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම අරමුණු කරගත් වැඩසටහන් ද පවත්වයි.

**දියවැඩියා පර්යේෂණ ඒකකය**

මූලික වශයෙන් දියවැඩියාව හා හෘද වාහිනී රෝග වැළැක්වීම සහ වඩා හොඳ සායනික ප්‍රතිකාර සඳහා උපාය මාර්ග සංවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ දියවැඩියාව, පරිවෘත්තීය රෝග සහ හෘද වාහිනී රෝග පිළිබඳ බහුශික්ෂණ පර්යේෂණ සිදු කිරීමේ අරමුණින් මෙම ඒකකය **2005** දී ආරම්භ කරන ලදී. මෙම ඒකකය අධ්‍යයන අංශය සහ එක්සත් රාජධානියේ දියවැඩියා අන්තරාසර්ග විද්‍යාව සහ පරිවෘත්තීය රෝග පිළිබඳ ඔක්ස්ෆර්ඩ් මධ්‍යස්ථානය අතර ඒකාබද්ධ සහයෝගී උත්සාහයකි. මෙම කෙටි කාලය තුළ ව්‍යාපෘති කිහිපයක් ඩී.ආර්.යූ විසින් සිදු කරන ලද අතර වැදගත් ලිපි රාශියක් නිෂ්පාදනය කරන ලදී. මෙම ඒකකය ශ්‍රී ලංකාවේ තරුණ දියවැඩියා අධ්‍යයනය (**SLYDS**) සම්බන්ධීකරණය කළ අතර එය ශ්‍රී ලංකාවේ තරුණ වැඩිහිටි ආරම්භක දියවැඩියාව පිළිබඳ හේතු විද්‍යාව සහ වසංගත විද්‍යාව අධ්‍යයනය කළේය. ශ්‍රී ලංකා දියවැඩියා සංගමය, ශ්‍රී ලංකා ජාතික රෝහලේ සහ කොළඹ දකුණු ශික්ෂණ රෝහලේ අන්තරාසර්ග විද්‍යා සහ දියවැඩියා ඒකක, වෛද්‍ය පීඨයේ ප්‍රජනන හා අන්තරාසර්ග විද්‍යාගාරය, ශ්‍රී ලංකාවේ ලෝක සෞඛ්‍ය සංවිධාන නිලධාරීන් සහ බොහෝ දේශීය වෛද්‍යවරුන් සහ පර්යේෂකයන් සමග ඒකකය සහයෝගයෙන් කටයුතු කරයි.

**ග්‍රාමීය සෞඛ්‍ය පර්යේෂණ මධ්‍යස්ථානය (RHRC)**

කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ග්‍රාමීය සෞඛ්‍ය පර්යේෂණ මධ්‍යස්ථානය **(RHRC) 2018** මැයි **30** වන දින කතරගම පිහිටි පැරණි මැලේරියා පර්යේෂණ මධ්‍යස්ථානයේ දී උත්සවාකාරයෙන් විවෘත කරන ලදී. මෙම මධ්‍යස්ථානය ග්‍රාමීය ප්‍රජාවන්ට අදාළ සෞඛ්‍ය පර්යේෂණ වැඩසටහනකට පහසුකම් සපයන අතර විවිධ ක්ෂේත්‍රවල සහයෝගී පර්යේෂණ ව්‍යාපෘති සහ තෝරා ගැනීමේ වැඩසටහන් සඳහා අවස්ථාව ලබා දෙනු ඇත. මෙම මධ්‍යස්ථානයේ පහසුකම් අතර **50** දෙනෙකු සඳහා පහසුකම් සහිත සම්මන්ත්‍රණ ශාලාවක්, ආගන්තුක කාමර හතරක් සහ මැණික් ගඟට මායිම්ව ඇති හරිත අවකාශය ඇතුළත් වේ.

**පරපෝෂිත රෝග පර්යේෂණ ඒකකය (PDRU)**

පිළිලවේදය අධ්‍යයන අංශයේ පරපෝෂිත රෝග පර්යේෂණ ඒකකය කලින් හැඳින්වූයේ මැලේරියා පර්යේෂණ ඒකකය (**MRU**) යනුවෙනි **(1988-2016)**. මහජන සෞඛ්‍ය සම්බන්ධව වැදගත්කමක් ඇති සියලුම පරපෝෂිත රෝග කෙරෙහි පිළිලවේදය අධ්‍යයන අංශයේ පුළුල් අවධානය යොමු වීමත් සමඟ මෙම නාම විපර්යාසය **2016** දී සිදු විය.

ශ්‍රී ලංකාවේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා දායක වෙමින් පරපෝෂිත රෝග පර්යේෂණ ඒකකයේ (**PDRU**) පර්යේෂණ ව්‍යාපෘති ගණනාවක් සිදු කරන ලදී. එසේම මෙමගින් විවිධ පරපෝෂිත රෝග සඳහා රෝග නිර්ණය සේවා සපයයි.

පිළිලවේදය අධ්‍යයන අංශයේ ස්ථිර කාර්ය මණ්ඩලය පරපෝෂිත රෝග පර්යේෂණ ඒකකයෙහි ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාකාරීව සම්බන්ධ වී සිටියහ. ඊට අමතරව පරපෝෂිත රෝග පර්යේෂණ ඒකකයෙහි විවිධ පර්යේෂණ ව්‍යාපෘති සිදුකරන පර්යේෂණ සහායකයින් ද සිටිති.

**සෞඛ්‍ය සංවර්ධන හා පර්යේෂණ ඒකකය**

ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයේ සෞඛ්‍ය සංවර්ධන හා පර්යේෂණ වැඩසටහන**(HDRP) 2004** දී ආරම්භ කරන ලදී. මෙහි අරමුණ වූයේ සෞඛ්‍යය පිළිබඳ පුළුල් දෘෂ්ටියක් සහිත බහුශික්ෂිත පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහ වැඩසටහන් වැඩසටහන් සංවර්ධනය කිරීමයි. සෞඛ්‍ය සංවර්ධනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ((PG Dipl HD) ආරම්භ කරන ලද්දේ නෝර්වේහි බර්ගන් විශ්ව විද්‍යාලයේ සහායෙනි. ආචාර්ය මණ්ඩලය ප්‍රජාවෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය, නීති පීඨය, සමාජ විද්‍යා අධ්‍යයන අංශය, ආර්ථිකවිද්‍යා අංශය,සායනික වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය (සියල්ලම කොළඹ විශ්ව විද්‍යාලයෙන්) සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ විශේෂඥයින් කිහිප දෙනෙකුගෙන් සමන්විත විය.

**සෞඛ්‍ය හා සුවතා ඒකකය**

සෞඛ්‍ය හා සුවතා ඒකකය සේවකයින්ගේ සෞඛ්‍යය හා සුවතාව වැඩි දියුණු කිරීම සඳහා සේවා ස්ථාන පදනම් කරගත් සෞඛ්‍ය වැඩසටහන් රාශියක් ඉදිරිපත් කරයි. සේවකයින්ගේ සෞඛ්‍යය නංවාලීම සහ කාර්ය මණ්ඩලයේ ඵලදායිතාව ඉහළ නැංවීම තුළින් සේවා පරිසරය තුළ සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මෙය සිදු කෙරේ. අපගේ කණ්ඩායම අන්තරාසර්ග විද්‍යාව, මනෝ විද්‍යාව, පෝෂණය සහ ව්‍යායාම ක්‍රීඩා වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛ පෙළේ වෛද්‍යවරුන්ගෙන් සමන්විත වේ. සාමාන්‍ය සෞඛ්‍යය, මානසික සෞඛ්‍යය, ආහාර හා පෝෂණය, යෝග්‍යතාවය සහ ව්‍යායාම වැනි පුළුල් පරාසයක සෞඛ්‍ය දේශන, වැඩමුළු සහ සෞඛ්‍ය පරීක්ෂාවන් අපි ඉදිරිපත් කරමු. සෞඛ්‍ය වැඩසටහන්වලට අමතරව මෙම ඒකකය පර්යේෂණ කටයුතුවල ද නිරත වේ. එය මෑතකදී "ශ්‍රී ලංකාවේ

බර අඩු කර ගැනීමේ අතිරේකවල සංයුතිය සහ උපයෝජ්‍යතාව " පිළිබඳ ලිපියක් පළ කර තිබේ. එය අනාගත පර්යේෂණ කටයුතු සඳහා ආයතනික අංශයෙන් සෞඛ්‍ය දත්ත එක්රැස් කිරීමෙහි නිරත වේ.

**WHO සහයෝගිතා මධ්‍යස්ථානය**

ප්‍රජා වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය 2012 දී වෘත්තීය සෞඛ්‍ය පිළිබඳ පුහුණුව හා පර්යේෂණ සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහයෝගිතා මධ්‍යස්ථානය (WHO-CC) ලෙස නම් කරන ලද අතර 2016 දී ප්‍රතිනාමකරණය කරන ලදී. (WHO-CC) සංවිධානයේ විෂය පථය වන්නේ ආයතනික ධාරිතාව ශක්තිමත් කරමින් ලෝක සෞඛ්‍ය සංවිධානයේ වර්තමාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහාය වීමයි. ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම. මධ්‍යස්ථානයේ විමර්ශන කොන්දේසි වනුයේ, (1) පුහුණුව හා ධාරිතා වර්ධන ක්‍රියාකාරකම් තුළින් සේවක සෞඛ්‍යය කරා යොමුවීම සඳහා මානව සම්පත් සංවර්ධනයට දායක වීම. (2) ප්‍රාථමික සෞඛ්‍ය සේවා වැඩසටහනේ වෘත්තීය සෞඛ්‍යය ඒකාබද්ධ කිරීම පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ බහු මධ්‍යස්ථාන ව්‍යාපෘතිවලට සහභාගී වීම සහ (3). සේවක සෞඛ්‍යය පිළිබඳ ගෝලීය ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී ලෝක සෞඛ්‍ය සංවිධානය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමයි.

**පියයුරු සෞඛ්‍ය මධ්‍යස්ථානය**

කොළඹ වෛද්‍ය පීඨයේ ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශයට අනුයුක්ත පියයුරු සෞඛ්‍ය මධ්‍යස්ථානය මැමෝග්‍රැෆි, අතිධ්වනිශිල්පය සහ රූප මඟ පෙන්වන ජෛවේක්ෂා සේවා ඇතුළු පියයුරු තත්වයන් සඳහා පරීක්ෂණ සහ රෝග නිර්ණය විකිරණ පරීක්ෂණ සපයයි. මෙම පහසුකම මගින් සියලුම රෝහල්ගත රෝගීන් සඳහා නොමිලේ සහ බාහිර රෝගීන් සඳහා සහනාධාර අනුපාතයකින් මෙම සේවාවන් සපයනු ලැබේ. මීට අමතරව, පියයුරු සෞඛ්‍යය හා පියයුරු රෝග පිළිබඳ පර්යේෂණ කටයුතු සහ රෝගීන්ගේ අධ්‍යාපන වැඩසටහන් මෙම මධ්‍යස්ථානය හරහා පවත්වනු ලැබේ.

**සෞඛ්‍ය පද්ධති පර්යේෂණ ඒකකය**

වසර 139 ක ඉතිහාසයක් ඇති වෛද්‍ය ආයතනයක් ලෙස, වෛද්‍ය පීඨය ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමුඛයා වී ඇත. එහි ප්‍රජා වෛද්‍ය අධ්‍යයන අංශය මහජන සෞඛ්‍යය පිළිබඳ උපාධි අපේක්ෂකයින් සහ පශ්චාත් උපාධිධාරීන් පුහුණු කිරීම මෙන්ම පර්යේෂණ පැවැත්වීමේ විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයකි. සෞඛ්‍ය පද්ධති පර්යේෂණ ඒකකය (HSR) දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ අංගයක් වන අතර එය ප්‍රධානියා සහ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් මෙහෙයවනු ලැබේ. රට තුළ මෙන්ම ජාත්‍යන්තර ප්‍රජාව තුළ සෞඛ්‍ය පර්යේෂණවල විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් බවට පත්වීම එහි අරමුණයි. රටේ සහ මානව වර්ගයාගේ සංවර්ධනයට දායක වීම සඳහා සම්පත් සේවකයින්ගේ පර්යේෂණ හා පුහුණුව සම්බන්ධ ගුණාත්මක සෞඛ්‍ය පද්ධතියක් පැවැත්වීම එහි අරමුණයි. එච්එස්ආර් ඒකකය ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරියක වන මහාචාර්ය දූලිකා ෆර්නැන්ඩෝගේ අදහසක ප්‍රතිඵලයකි.

**පෝෂණ, ක්‍රීඩා සහ ව්‍යායාම වෛද්‍ය ඒකකය**

පුනරුත්ථාපනය, ශාරීරික ක්‍රියාකාරකම් සහ ක්‍රීඩා පිළිබඳ සායනික පුහුණුව හා පර්යේෂණ සඳහා "විශිෂ්ටත්ව මධ්‍යස්ථානය" ලෙස ක්‍රීඩා, ව්‍යායාම සහ වැඩිහිටියන් සඳහා අභ්‍යාස හා පුනරුත්ථාපන ඒකකය සංවර්ධනය කිරීම පීඨ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. යෝජිත පශ්චාත් උපාධි ඩිප්ලෝමා / ක්‍රීඩා හා ව්‍යායාම විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි වැඩසටහන සහ දැනට පවත්නා විද්‍යාවේදී (භෞතවේදය) වැඩසටහන සඳහා සායනික පුහුණුව ද මෙමඟින් ලබා දෙනු ඇත. එය ධරනීයත්වය උදෙසා වැඩිහිටියන් හා සාමාන්‍ය ජනතාව සඳහා නාමික ගාස්තුවකට ව්‍යායාම හා පුනරුත්ථාපන සේවා සපයනු ඇත.

**ශිෂ්‍ය ලියාපදිංචිය - 2018**

- දේශීය සිසුන් 190
- භූතාන සිසුන් 05
- වි.වි.ප්‍ර.කො. විසින් නිර්දේශිත විදේශීය සිසුන් 10

**2018 වසරේ තෝරාගන්නා ලද විදේශීය සිසුන්**

| රට | විශ්වවිද්‍යාලය | මුළු සිසුන් සංඛ්‍යාව |
|---|---|---|
| ඔස්ට්‍රේලියාව | ග්‍රිෆිත් විශ්ව විද්‍යාලය | 2 |
| ඔස්ට්‍රේලියාව | ඔස්ට්‍රේලියානු ජාතික විශ්ව විද්‍යාලය | 2 |
| ඔස්ට්‍රේලියාව | මොනෑශ් විශ්ව විද්‍යාලය | 1 |
| ඔස්ට්‍රේලියාව | ඇඩිලේඩ් විශ්ව විද්‍යාලය | 4 |
| ඔස්ට්‍රේලියාව | ඩීකින් විශ්ව විද්‍යාලය | 1 |
| ඔස්ට්‍රේලියාව | නිව් සවුත් වේල්ස් විශ්ව විද්‍යාලය | 2 |
| ඔස්ට්‍රේලියාව | ක්වීන්ස්ලන්ඩ් විශ්ව විද්‍යාලය | 1 |
| එක්සත් රාජධානිය | කින්ග්ස් කොලේජ් | 1 |
| එක්සත් රාජධානිය | ලන්ඩන් යුනිවසිටි කොලේජ් | 5 |
| එක්සත් රාජධානිය | සවුතැම්ටන් විශ්ව විද්‍යාලය | 4 |
| එක්සත් රාජධානිය | ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය | 4 |
| එක්සත් රාජධානිය | වෝවික් විශ්ව විද්‍යාලය | 1 |
| එක්සත් රාජධානිය | බර්මින්හැම් විශ්ව විද්‍යාලය | 2 |
| එක්සත් රාජධානිය | කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලය | 1 |
| එක්සත් රාජධානිය | ලිවර්පූල් විශ්ව විද්‍යාලය | 2 |
| එක්සත් රාජධානිය | නිව්කාසල් විශ්ව විද්‍යාලය | 2 |
| එක්සත් රාජධානිය | මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලය | 2 |
| එක්සත් රාජධානිය | ඊස්ට් ලන්ඩන් විශ්ව විද්‍යාලය | 2 |
| එක්සත් රාජධානිය | ඊස්ට් ඇංග්ලියා විශ්ව විද්‍යාලය | 2 |
| ප්‍රංශය | බෝඩෙක්ස් විශ්ව විද්‍යාලය | 3 |
| ප්‍රංශය | ලියොන් එස් වෛද්‍ය පීඨය | 2 |
| ස්වීඩනය | ලූන්ඩ් විශ්ව විද්‍යාලය | 4 |
| ස්වීඩනය | උප්සලා විශ්ව විද්‍යාලය | 9 |
| හංගේරියාව | ඩෙබ්‍රිසීන් විශ්ව විද්‍යාලය | 1 |
| කැනඩාව | ඔටාවා විශ්ව විද්‍යාලය | 1 |
| ඇ.එ.ජ. | පෙන් ස්ටේට් වෛද්‍ය විද්‍යාලය | 2 |
| ඇ.එ.ජ. | පෙන්සිල්වේනියා රාජ්‍ය විශ්ව විද්‍යාලය | 1 |
| ඇ.එ.ජ. | නෙවාඩා ටෝරෝ විශ්ව විද්‍යාලය | 1 |
| සිංගප්පූරුව | ජාතික විශ්ව විද්‍යාලය | 5 |
| චීනය | හොංකොං චීන විශ්ව විද්‍යාලය | 5 |
| බෙල්ජියම | ඩි ලීග් විශ්ව විද්‍යාලය | 2 |
| කුවේට් | කුවේට් විශ්ව විද්‍යාලය | 1 |
| පෝලන්තය | වෝර්සෝ වෛද්‍ය විශ්ව විද්‍යාලය | 2 |
| **එකතුව** | | 80 |

**කාර්ය සාධනයන් සහ වැදගත් සිදුවීම්**

පීඨයේ කාර්ය සාධනයන් බොහොමයක් වාර්තාවෙහි 35 වන පිටුවේ සිට ඉදිරියට දැක්වෙන ආකෘතියෙහි දැක්වේ.

2018 වසර තුළ ලබාගත් සමහර කාර්ය සාධන/ පත්වීම් පහත දැක්වේ.

**පීඨාධිපති පත් කිරීම**

• මහාචාර්ය ජෙනිෆර් පෙරේරා මහත්මිය 2016.02.20 දින සිට බලපැවැත්වෙන පරිදි වසර තුනක කාලයක් සඳහා දෙවන ධූර කාලය සඳහා වෛද්‍ය පීඨයෙහි පීඨාධිපති ලෙස නැවත පත් කරන ලදී.

**පීඨ මණ්ඩලය සඳහා පත් කිරීම්**

- සින්තුජා පත්මනාදන් මහත්මිය සහ ආචාර්ය ප්‍රියංග රණසිංහ පීඨ මණ්ඩලය නියෝජනය කිරීම සඳහා අනුමත කරන ලදී.

- රිජ්වේ ආර්යා ළමා රෝහල වෙතින් ලැබුණු නාමයෝජනා අනුව රිජ්වේ ආර්යා ළමා රෝහලේ ළමා රෝග විශේෂඥ වෛද්‍ය යූ. එස්.ද එස් වෛද්‍යනාථ මහතා පීඨ මණ්ඩලයේ බාහිර නියෝජිතයෙකු ලෙස පත් කරන ලදී.

- සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ වැඩබලන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ආචාර්ය සුදත් සමරවීර මහතා පීඨ මණ්ඩලයේ බාහිර සාමාජිකයෙකු ලෙස පත් කර ඇත.

**පීඨය වෙත සපැමිණීම් –**

- බෙල්ජියම් - ශ්‍රී ලංකා පාර්ලිමේන්තු මිත්‍රත්ව කණ්ඩායමේ නියෝජිත පිරිසක් නාරිවේදය මහාචාර්ය (සෙනෙට් සභික ගෙන්ට් වි.වි.) පෙට්‍රා ඩි සූටර් මහත්මියගේ නායකත්වයෙන් 2018.07.24 දින පීඨයට පැමිණියේය.

- කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මනෝ චිකිත්සාව පිළිබඳ පළමු මහාචාර්යවරයා වූ මහාචාර්ය වන්න විජේසිංහ මහතා 2018 ජුනි 13 වනදා මනෝ චිකිත්සා අධ්‍යයන අංශයට පැමිණියේය.

- ඇන්ට්වර්ප් විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යාව පිළිබඳ සම්මානිත මහාචාර්ය, "Clinical Nephrotoxins – Renal Injury of Drugs and Chemicals," පාඨ ග්‍රන්ථයෙහි සම්බන්ධීකාරක මාක් ඩි බෝර් මහතා සායනික වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය විසින් සංවිධානය කළ ආරාධිත දේශනයක් සඳහා 2018 දෙසැම්බර් 07 වනදා පීඨයට පැමිණියේය.

- කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට භූතාන සිසුන් බඳවාගැනීම තවදුරටත් ව්‍යාප්ත කිරීම පිළිබඳ සාකච්ඡා කිරීමට භූතාන රජයෙහි උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිත පිරිසක් 2018 නොවැම්බර් 23 වනදා පීඨයට පැමිණියේය.

- තායිවානයේ තායිපේ වෛද්‍ය විශ්වවිද්‍යාලයේ නියෝජිත පිරිසක් මහාචාර්ය එච්.වයි. චෝයි හා මහාචාර්ය බෙට් චෝයි ගේ නායකත්වයෙන් 2018 මාර්තු 18-22 දින වෛද්‍ය පීඨයට පැමිණියේය. මෙම සංචාරය කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයන අංශය විසින් සම්බන්ධීකරණය කරනලදී. මෙම සංචාරය අතරතුර ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලය හා තායිවානයේ තායිපේ වෛද්‍ය විශ්වවිද්‍යාලය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් තැබිණි.

- වෛද්‍ය මානව ශාස්ත්‍ර පිළිබඳ විදේශ කථිකයන්ගේ පළමු ජාත්‍යන්තර සමුළුව " වඩාත් මානුෂීය වීමට ඉගෙනීමෙහි ලා වෛද්‍ය මානව ශාස්ත්‍රයේ කාර්යභාරය යන මැයින් **2018** ජුලි **12** සිට ජුලි **14** දක්වා පැවැත්විණි. පහත සඳහන් ආරාධිත කථිකයෝ දේශන පැවැත්වූහ.

| සම්පත්දායකයාගේ නම | දිනය | මාතෘකාව | රට |
|---|---|---|---|

| | | | |
|---|---|---|---|
| මහා. රෙයිඩර් ලී | 2018 ජුලි 12 - සැසිය 1<br>2018 ජුලි 12 - සැසිය 2<br>2018 ජුලි 13- සැසිය 4 | දර්ශනය පිළිබඳ ආවර්ජන<br>වෛද්‍ය දර්ශනය<br>වෛද්‍ය සිසුන් සඳහා විවේචනාත්මක චින්තනය ඉගැන්වීම | නෝර්වේ |
| මහා. සසංක පෙරේරා | 2018 ජුලි 12 - සැසිය 1<br>2018 ජුලි 12 - සැසිය 2 | අමානුෂික යුගයක මානුෂික වීම<br>ආචාරධර්ම, ආගම සහ දර්ශනය මානුෂීය වීම පිළිබඳ කතිකාවක | ඉන්දියාව |
| ආචා. ඩේවිඩ් වෙන්ඩ්ලර් | 2018 ජුලි 12 - සැසිය 2 | දර්ශනය හා පර්යේෂණ | ඇ.එ.ජ. |
| ආචා. ජෝසප් මිලුම් | 2018 ජුලි 12 - සැසිය 2 | දර්ශනය හා සායනික ආචාර ධර්ම | ඇ.එ.ජ. |
| ආචා.වසන්ත මුත්තුස්වාමි | 2018 ජුලි 13- සැසිය 4 | වෛද්‍යවරුන්ගේ චර්යාධර්ම පද්ධතිය සහ ධාරිතා වර්ධනය කිරීමේ අවශ්‍යතාවය | ඉන්දියාව |
| ආචා.නන්දනී කුමාර් | 2018 ජුලි 13- සැසිය 4 | ජෛව චර්යාධර්ම පිළිබඳ ප.උ. හා පීඨ පුහුණුව | ඉන්දියාව |
| ආචා.ෂීබා ඩී මානි | 2018 ජුලි 13- සැසිය 4<br>2018 ජුලි 14 | උපාධි පාඨමාලා වල මානව ශාස්ත්‍ර ඉගෙනීම ශක්තිමත් කිරීම - මැලේසියානු දෘෂ්ටි කෝණයක්<br>සාහිත්‍ය මොඩියුලයක් | මැලේසියාව |

**සම්මාන**

- “ළමා රෝග විශේෂඥයින්ගේ ශ්‍රී ලංකා විද්‍යාලය විසින් 2017 ස්ටෙලා ඩි සිල්වා අනුස්මරණ දේශනය පැවැත්වීමේ අවස්ථාව මහාචාර්ය පූජිත වික්‍රමසිංහ මහතාට හිමිවිය . “ළමා තරබාරුකම: සමාජ-සංස්කෘතික නිර්ණායකයන්” පිළිබඳ වූ මෙම දේශනය 2017 දෙසැම්බර් 15 වන දින ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ මහාචාර්ය එන් ඩී ඩබ්ලිව් ලයනල් ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

- 2017 දී පැවති ශ්‍රී ලංකාව නවජ ප්‍රසව සමිතියේ 16 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරයේ හොඳම පෝස්ටරය සඳහා සම්මානය “සංජානනීය අක්‍රමිකතා සහිත ළමුන් සමූහයක සෛලජනක හා රූපාණුදර්ශී වර්ණාවලිය” යන මාතෘකාව යටතේ පිරිනමන ලදි. ලිපියෙහි කතුවරුන්: පත්තිනිගේ සී එස්, කාරියවසම් යූජීඅයි, පෙරේරා ජ්ඩීඑස්, අමල්කා, සෞම්‍යා ඩබ්ජ්කේඑස්, සිරිසේන යූඑන්ඩී, දිසානායක වීඑච්ඩබ්ලිව්.

- “ලෝක ස්නායු විද්‍යාව” පිළිබඳ කරගෙන යන සායනික අත්හදා බැලීමේ කටයුතු නිසා වෛද්‍ය ජීතංගි වනිගසිංහ කණ්ඩායම ප්‍රවෘත්ති අයිතමයකදී කොළඹ විශ්ව විද්‍යාලයේ පර්යේෂකයන් ලෙස විස්තර කරන ලදී.

- 2017 වාර්ෂික වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ වාචික ඉදිරිපත් කිරීම් සම්මාන කාණ්ඩයේ හොඳම වාචික ඉදිරිපත් කිරීම ලෙස ජ්ජේඅයිඑස් රත්නායක, එන්.එෆ්. නෙත්තිකුමාර, මේජර් ඩබ්ලිව්.එම්.එම්.එස්. බණ්ඩාර, වී.එච්.ඩබ්ලිව්. දිසානායක හා ආචාර්ය එච්.ඩබ්. ඩබ්. ගුණසේකර කළ ඉදිරිපත් කිරීම තෝරා ගැනුනි. 2017 කොළඹ විශ්ව විද්‍යාලයේ වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ වාචික ඉදිරිපත් කිරීම් සම්මාන කාණ්ඩයේ වාචික ඉදිරිපත් කිරීම සඳහා දෙවන ස්ථානය - “ශ්‍රී ලාංකික මීලොස්ඩිස්ප්ලාස්ටික් සින්ඩ්‍රෝම් රෝගීන් සමූහයක මෙසෙන්චිමල් ප්‍රාථමික සෛල පිළිබඳ ඊළඟ පරම්පරාවේ අනුක්‍රමික විශ්ලේෂණය” යන මැයෙන් කළ ඉදිරිපත් කිරීම උදෙසා ශ්‍රී ලංකා රක්තවේද විද්‍යාලයට හිමිවිය.

- 2018 සිංගප්පූරුවේ පැවති වර්තමාන සාම්ප්‍රදායික ශාකසාර වෛද්‍ය විද්‍යාවේ ප්‍රවණතා පිළිබඳ අන්තර්ජාතික

සමුළුවේදී (ICTTHM) රටවල් 40 ක් අතර හොඳම වාචික ඉදිරිපත් කිරීමේ සම්මානය ජෛව රසායන විද්‍යාව හා අණුක ජීව විද්‍යා අධ්‍යයනාංශයේ ආචාර්ය චාමින්ද්‍රි විතාරණ මහතා විසින් අධීක්ෂණය කරනු ලබන ආචාර්ය උපාධි අපේක්ෂිකාවක වන උදේෂිකා බණ්ඩාර මහත්මිය විසින් දිනා ගන්නා ලදී.

- මනෝචිකිත්සක අධ්‍යයනාංශයේ කාර්ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මනෝචිකිත්සක විද්‍යාලයේ වාර්ෂික අධ්‍යයන වාරයේදී පර්යේෂණ සම්මාන කිහිපයක් දිනා ගන්නා ලදී.
  හොඳම වාචික ඉදිරිපත් කිරීම සඳහා පීටර් සහ මේබල් කුරේ රන් පදක්කම දිනා ගත්තේ,"ශ්‍රී ලංකා ජනගහනයක ප්‍රති-සයිකෝටික් - ප්‍රේරිත බර වැඩිවීම සහ තනි නියුක්ලියෝටයිඩ බහුමාපක **16** ක් අතර ජාන සම්බන්ධතා අධ්‍යයනය" පිළිබඳ ප්‍රකාශිත ලිපිය මගිනි. කතුවරුන් වන්නේ කජන් එම්, දයාබණ්ඩාර එම්, හන්වැල්ල ආර්, චන්ද්‍රසේකරන් එන්වී, ද සිල්වා වීජ්

- ශ්‍රී ලංකා ශල්‍ය වෛද්‍ය විද්‍යාලයේ වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ සහ එඩින්බර්ග් රාජකීය ශල්‍ය වෛද්‍ය විද්‍යාලය හා ඒකාබද්ධව පැවැත්වූ ජාත්‍යන්තර සමුළුවේදී හොඳම පෝස්ටරය ලෙස ආචාර්ය යූ.එම්.ජේ. ඊ. සමරනායක (පර්යේෂණ සහකාර/ කාය ව්‍යවච්ඡේද විද්‍යාව) හා වෛද්‍ය යසිත් මතහසිංහ (සහකාර කථිකා./ කාය ව්‍යවච්ඡේද විද්‍යාව) සිදු කළ ඉදිරිපත් කිරීම හොඳම පෝස්ටරය ලෙස තෝරා ගන්නා ලදී.
  ඉදිරිපත් කිරීමේ මාතෘකාව - "ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පිළිකා වර්ග හා සම්බන්ධ ආහාරමය සාධක: හරස් අංශ අධ්‍යයනයක්" කතුවරුන් වන්නේ: යූඑම්ජේඊ සමරනායක, ඩී. අයි. ජේ. සමරසේකර, ආර්.සී. සිගේරා, කේ. කොඩිතුවක්කු, මතහසිංහ

- ප්‍රජා වෛද්‍ය අධ්‍යයනාංශයේ මහාචාර්ය උපුල් සෙනරත් **2017** දී SUSRED (පර්යේෂණ උපාධි අධීක්ෂණය සඳහා ආධාරක යෝජනා ක්‍රමය) ලබන්නන්ගෙන් එක් අයෙකු ලෙස තෝරාගෙන ඇති අතර HETC විසින් අරමුදල් සපයන ලද ආචාර්ය එස්. සුජේන්ද්‍රන් මහතාගේ ආචාර්ය උපාධියෙහි ප්‍රධාන සුපරීක්ෂක ලෙස කටයුතු කිරීම වෙනුවෙන් ජාතික විද්‍යා පදනම විසින් මෙය පිරිනමන ලදී.

- ලංකා වෛද්‍ය විද්‍යාලයේ **51** වන වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ අන්තරාසර්ග විද්‍යාව, දියවැඩියාව සහ පරිවෘත්තීය ක්‍රියා පිළිබඳ හොඳම නිදහස් පත්‍රිකාව සඳහා වන ආචාර්ය හෙන්රි රාජරත්නම් සම්මානය ප්‍රජාවිද්‍යා අධ්‍යයන අංශයේ ප්‍රජා ප්‍රවාහ පර්යේෂණ ව්‍යාපෘති යටතේ 2013 උසස්පෙළ කණ්ඩායමේ ශිෂ්‍ය පර්යේෂණ ව්‍යාපෘතියක් පදනම් කරගත් ලිපියකට පිරිනමන ලදී. පත්‍රිකාවේ මාතෘකාව: "ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් අතර ක්‍රීඩා පෝෂණය, ශරීර සංයුතිය සහ ඊට සම්බන්ධ සාධක පිළිබඳ පරිචයන්"කතෘවරුන්: කේ.ඩබ්ලිව්.එස්.එම්. විජයවර්ධන, කේ.එම්.පී.පී. විජරත්න, එච්.එම්.ඩබ්.ඒ.බී. විජරත්න සහ අසේල ඔලුපැලියාව

- 2018 ඔක්තෝම්බර් මාසයේ පැවති MD (මනෝ චිකිත්සාව) II කොටස විභාගයේ හොඳම දස්කම් දැක්වීම සඳහා ආචාර්ය මනීෂ්කා අමරසූරියට "ඇන්ඩෲ සිම්ස් රන් පදක්කම" පිරිනමන ලදී.

- ජාත්‍යන්තර වෛද්‍ය සමුළුවේ 131 වන සංවත්සරය වෙනුවෙන් පැවති ලංකා වෛද්‍ය සංගමයේ සම්මේලනයේදී "ලාංකික වැඩිහිටියන් සඳහා මේද ප්‍රතිශතය මත පදනම් වූ ශරීර ස්කන්ධ දර්ශක සීමාකරණය" යන ප්‍රකාශනය සඳහා ආචාර්ය රනිල් ජයවර්ධන මහතාට "විල්සන් පීරිස් සම්මානය" පිරිනමන ලදී. සම කර්තෘවරුන්: එස්.එන්. තෙන්නකෝන්, දියවැඩියා පර්යේෂණ ඒකකය, ඒපී හිල්ස්, ටස්මේනියා විශ්ව විද්‍යාලය

- ජාත්‍යන්තර වෛද්‍ය සමුළුවේ සංවත්සරය වෙනුවෙන් පැවති ලංකා වෛද්‍ය සංගමයේ සම්මේලනයේදී පිළිකා පිළිබඳ හොඳම පත්‍රිකාව සඳහා (වාචික ඉදිරිපත් කිරීම) මහාචාර්ය නන්දදේව සමරසේකරට "ඩැෆ්නි ආටිගල් සම්මානය" පිරිනමන ලදී .
  සම කර්තෘවරුන්: යූ ජයලත්, ඒආර් ප්‍රනාන්දු, ඊජ් ප්‍රනාන්දු, එස්ජ් සෙනෙවිරත්න
  පත්‍රිකාව: "2000 සිට 2010 දක්වා ශ්‍රී ලංකාවේ අක්මා පිළිකා ඇතිවීමේ පතන හා රටාවන්: ජාතික පිළිකා ලේඛණ දත්ත විශ්ලේෂණය."

- ජාත්‍යන්තර වෛද්‍ය සමුළුවේ 131 වන සංවත්සරය වෙනුවෙන් පැවති ලංකා වෛද්‍ය සංගමයේ සම්මේලනයේදී 2018 හොඳම වාචික ඉදිරිපත් කිරීම සඳහා ආචාර්ය සී. රණසිංහ, ආචාර්ය ජී.ආර් කොන්ස්ටන්ටයින්, ආචාර්ය පී. කටුලන්ද, ඒ.පී.හිල්ස්, එන්.ඒ. කින්ග් යන ආචාර්යවරු හොඳම වාචික ඉදිරිපත් කිරීම සඳහා වන ශ්‍රීමත් නිකලස් ආටිගල අනුස්මරණ ත්‍යාගය දිනා ගත්හ.
  මාතෘකාව: දෙවන වර්ගයේ දියවැඩියා රෝගී ලාංකිකයන්ගේ ශරීර සංයුතිය කෙරෙහි ශාරීරික අභ්‍යාසයන්හි බලපෑම "

- "දෙළුම්, පළතුරු නිස්සාරකවල බලපෑමෙන් පිළිකා ප්‍රතිදේහජනක ක්‍රියාකාරිත්වයේ සංඥා මාර්ගවල ප්‍රෝටීන වල වෙනස්කම් නිර්ණය කිරීම" යන ව්‍යාපෘතිය සඳහා ජෛව රසායන විද්‍යා අංශයේ ආචාර්ය චාමින්ද්‍රි විතරණට ජාත්‍යන්තර විද්‍යා පදනම (IFS) ඩොලර් 12,000 ප්‍රදානය කරන ලදී.

- මහාචාර්ය දීපිකා ප්‍රනාන්දු 2017 වසරේ පර්යේෂණ විශිෂ්ටත්වය උදෙසා පිරිනැමෙන " උපකුලපති සම්මානය" දිනා ගත්තාය .

- ව්‍යාධි විද්‍යාවේද අධ්‍යයන අංශය විසින් ශ්‍රී ලංකා ව්‍යාධි විද්‍යාඥයින්ගේ 2018 වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේදී හොඳම පෝස්ටර් ඉදිරිපත් කිරීම සඳහා වන සම්මානය දිනා ගන්නා ලදී. අධ්‍යයනයේ මාතෘකාව - "පැපිලරි වැනි න්‍යෂ්ටික ලක්ෂණ සහිත ආක්‍රමණශීලී නොවන ෆෝලික් තයිරොයිඩ් නියෝප්ලාස්මය (NIFTP):" සංවෘත තයිරොයිඩ් නියෝප්ලාස්ම් හා පැපිලරි වැනි න්‍යෂ්ටික ලක්ෂණ. කතුවරුන්: ඒ.එම්. ෂාෆික්, (වෛද්‍ය විද්‍යා අංශය,ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය. ඩී. ඩී. රණවීර, එම්.ඩී.එස්. ලොකුහෙට්ටි, ඒ.ඒ.එච්. ප්‍රියානි, එන්.ආර්. පෙරේරා, එම් වී සී ද සිල්වා (ව්‍යාධි විද්‍යාවේද අධ්‍යයන අංශය)

- මහාචාර්ය ඩිලානි ලොකුහෙට්ටි මහත්මිය ශ්‍රී ලංකා ව්‍යාධි විද්‍යාඥයින්ගේ ජාතික සම සම්බන්ධීකාරක ලෙස ජාතික ගැබ්ගෙල පිළිකා පරීක්ෂණ වැඩසටහන නඟා සිටුවීම සඳහා ඉටු කළ වටිනා දායකත්වය අගය කරමින් 2017 දෙසැම්බර් මාසයේදී පවුල් සෞඛ්‍ය කාර්යාංශයෙන් සහ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ඇයට 'යාවජීව සම්මානය' පිරිනැමීය.

- ශ්‍රී ලංකාවේ ඩිජිටල් සෞඛ්‍යය නංවාලීම සඳහා පහසුකම් සැලසීම සඳහා පසුගිය වසර **21** ක කාලය තුළ ලබා දුන් විශිෂ්ට දායකත්වය අගයමින් ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී විසින් ඉහත සම්මානය මහාචාර්ය එච්.ඩබ්ලිව් වජිර දිසානායක වෙත පිරිනමන ලදී .

- **2018 ඔක්තෝම්බර්** 09-10 දින සිට පැවැත්වූ ශ්‍රී ලංකා මෛත්‍ර ලිංගික ශල්‍ය වෛද්‍යවරුන්ගේ සංගමයේ **13** වන වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේදී හොඳම වාචික ඉදිරිපත් කිරීම සඳහා වන සම්මානය " ශ්‍රී ලංකාවේ රෝගීන් සමූහයක මුත්‍රාශ පිළිකා පැවැත්ම සහ ප්‍රතිඵල " මැයෙන් කළ ඉදිරිපත් කිරීමට හිමිවිය. ඉදිරිපත් කිරීම: මලලසේකර ඒපී, මතංගසිංහ වයි, ලොකුහෙට්ටි එම්ඩීඑස්**,** ගුණවර්ධන එස්ඒඑස්**,** පෙරේරා එන්ඩී**,** අබේගුනසේකර ඒඑම්**,** ජයසේකර ආර්ඩබ්ලිව්**,** එඩිරිවීර ඩී**,** දිසානායක වීඑච්ඩබ්ලිව්.

- 2018 **ඔක්තෝබර්** 28 **සිට නොවැම්බර්** 02 දක්වා සිංගප්පූරුවේ පැවති ආසියා පැසිෆික් මානව ජාන විද්‍යාව පිළිබඳ සංගමයේ 2018 සරත් පාසලේදී හොඳම වාචික ඉදිරිපත් කිරීම සඳහා වන සම්මානය "මොළයේ යකඩ සමුච්චනය සමඟ ස්නායු විකිරණය පිළිබඳ නොවිසඳුණු සිද්ධියක්" යන මාතෘකාවට ප්‍රදානය කරන ලදි. ඉදිරිපත් කිරීම: හෙට්ටිආරච්චි ඩී**,** නෙත්තිකුමාර එන්**,** ගුණරත්න පීඑස්**,** දිසානායක වී.එච්.ඩබ්ලිව්.

- ආචාර්ය රනිල් ජයවර්ධන 2018 වසරේ තරුණ විද්‍යාඥයා ලෙස ලෝක විද්‍යා ඇකඩමි (**TWAS) / NSF** ත්‍යාගය දිනා ගත්තේය. මෙම සම්මානය වෛද්‍ය පීඨයේ ආචාර්යවරයකු විසින් ලබා ගන්නා ලද්දේ වසර 10 කට පසුවය.
- මහාචාර්ය පුජිත වික්‍රමසිංහ මහතා 2018 වසරේ කැපීපෙනෙන ජ්‍යෙෂ්ඨ පර්යේෂකයා ලෙස උපකුලපතිවරුන්ගේ සංගමයේ විශිෂ්ටතා සම්මානයට ලත්විය.

- ආචාර්ය රනිල් ජයවර්ධන 2018 වසරේ කැපීපෙනෙන නවක පර්යේෂකයා ලෙස උපකුලපතිවරුන්ගේ සංගමයේ විශිෂ්ටතා සම්මානයට ලත්විය.

- කඩිනම් උසස් අධ්‍යාපන ව්‍යාප්තිය හා සංවර්ධන මෙහෙයුම (**AHEAD)** යටතේ සංවර්ධන දිශානත පර්යේෂණ (**DOR) STEM + HEMS** ව්‍යාපෘති ප්‍රදානය කිරීම.
- ආචාර්ය දිල්ෂානි දිසානායකගේ ප්‍රධානත්වයෙන් යුත් පර්යේෂණ කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද

"භාවනා, චිත්ත ඒකාග්‍රතාවය හා සෞඛ්‍යය පිළිබඳ පර්යේෂණ වැඩසටහන" යන යෝජනාවේ මාතෘකාව **AHEAD** මෙහෙයුමේ **DOR / STEM + HEMS** ව්‍යාපෘතිය යටතේ අරමුදල් ලබා ගැනීමට සුදුසුකම් ලබා ඇත.

- ළමා රෝග පිළිබඳ සම්මානිත මහාචාර්ය පදවිය සඳහා මහාචාර්ය මනෝරි පී. සේනානායක මහත්මිය නම් කිරීම.

- කොළඹ විශ්ව විද්‍යාලයේ සම්මානිත මහාචාර්ය පදවිය සඳහා ආචාර්ය කාමිනි නිර්මලා මෙන්ඩිස් නම් කිරීම.

- කොළඹ විශ්ව විද්‍යාලයේ සම්මානිත මහාචාර්ය පදවිය සඳහා මහාචාර්ය ආර්. එල්. ජයකොඩි මහතා නම් කිරීම

- කායික විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය මංගලා ගුණතිලක මහත්මියට පහත සඳහන් සම්මාන හා ශිෂ්‍යත්ව පිරිනමන ලදී.

  I. එක්සත් රාජධානියේ නිව්කාසල් විශ්ව විද්‍යාලයේ සංසන්දනාත්මක ජීව විද්‍යා මධ්‍යස්ථානය සමඟ එක්ව රසායනාගාර සතුන් සඳහා වේදනාව පිළිබඳ ව්‍යවහාරික කායික විද්‍යාව, වේදනා, නිර්වේදනය හා සුබ මරණය පිළිබඳ පළමු සහතිකය ලබා ගැනීම සඳහා 2017 දී ලද 'ජාත්‍යන්තර වැඩසටහන් අවස්ථා සම්මානය'.
  II. 3R හි නවෝත්පාදන සඳහා TurnKey 2018 සම්මානලාභියෙකු ලෙස තෝරාගෙන ඇත.
  III. රසායනාගාර සත්ව වෛද්‍ය විද්‍යාව පිළිබඳ අත්‍යා කෙටිකාලීන පාඨමාලාව හැදෑරීමට චාල්ස් රිවර් විසින් පිරිනමන ලද වරලත් වැඩසටහන් පශු වෛද්‍ය ශිෂ්‍යත්වලාභී

- ශ්‍රී ලංකාවේ ඩිජිටල් සෞඛ්‍යය නංවාලීම සඳහා පහසුකම් සැලසීම සඳහා පසුගිය වසර 21 ක කාලය තුළ ලබා දුන් විශිෂ්ට දායකත්වය අගයමින් ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී විසින් ඉහත සම්මානය මහාචාර්ය එච්.ඩබ්ලිව් වජිර දිසානායක වෙත පිරිනමන ලදී

  - **සමාකරණ විද්‍යාගාර ව්‍යාපෘතිය**

  AHEAD ප්‍රදානය යටතේ වෛද්‍ය පීඨයට අනුකරණ විද්‍යාගාර ව්‍යාපෘතිය ප්‍රදානය කර ඇත. මිලියන 30 ක පරිත්‍යාගය උපකරණ මිලදී ගැනීම සඳහා යොදා ගැනේ. මහාචාර්ය ජෙනිෆර් පෙරේරා, මහාචාර්ය සරෝජ් ජයසිංහ සහ ආචාර්ය ප්‍රවීන් වීරතුංග සිංගප්පූරු සමාකරණ රසායනාගාරයට පැමිණියහ.

  - "ගුරු විශිෂ්ටතා සම්මානය" ප්‍රදානය කිරීමේ යෝජනාව පීඨ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

  - 2018 ජූලි මාසයේ පැවති මූලික විද්‍යා විෂය ධාරාවේ විභාගයේ ප්‍රතිඵල පදනම් කරගෙන " කායික විද්‍යාව පිළිබඳ මහාචාර්ය කේ.එන්. සෙනෙවිරත්න අනුස්මරණ සම්මානය " පිරිනැමීමට කේ. ඒ.එච්. පියතිස්ස මෙනවිය (MFC / AL / 2015/0723) තෝරාගනු ලබා ඇත.
  - **කථන / දේශන**

- "ශ්‍රී ලංකාවේ වෛද්‍ය ප්‍රතිකාර සුරක්ෂිතතාවයේ වෙනස්වීම්වලට විසඳුම් සෙවීම" යන මාතෘකාව යටතේ 2018 අප්‍රේල් මාසයේ ජපානයේ ටෝකියෝ නුවර පැවති රෝගී සුරක්ෂාව පිළිබඳ 03 වන ගෝලීය අමාත්‍ය සමුළුව ඇමතීමට ලෝක සෞඛ්‍ය සංවිධානය හා ජපානයේ සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් භිෂග්වේදය පිළිබඳ මහාචාර්ය ප්‍රියදර්ශනි ගලප්පත්ති ඇරයුම් ලැබුවාය. ඇය විසින් "රෝගීන්ගේ ආරක්ෂාව සඳහා අන්තර් වෘත්තීය අධ්‍යාපනය" යන මැයෙන් රෝගී සුරක්ෂාව පිළිබඳ විශේෂඥ සමුළුව

අමතන ලද ජපානයේ ගුන්මා හි අන්තර් වෘත්තීය අධ්‍යාපනය සඳහා වන ලෝක සෞඛ්‍ය සංවිධානය සහයෝගීතා මධ්‍යස්ථානය විසින් එය සංවිධානය කරන ලදී. තවද, ජපානයේ ගුන්මා විශ්ව විද්‍යාලයේ "රෝගී සුරක්ෂාව සඳහා අන්තර් වෘත්තීය අධ්‍යාපනය, පහළ හා මධ්‍යම ආදායම් ලබන රටවල අභියෝග" යන මාතෘකාව යටතේ ඇය දේශනයක් පැවැත්වූවාය.

- 2018 පෙබරවාරි 04 වන දින පැවති වෙස්ට් සින්ඩ්‍රෝමය පිළිබඳ ඉන්දියානු අපස්මාර රෝග සංගමයේ 19 වන වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේදී "ප්‍රතිකාර විකල්පයන් සඳහා වූ ගවේෂණය" යන මැයෙන් එච්.සී. බජෝරියා අනුස්මරණ දේශනය ආචාර්ය එච්. ජිතංගි වනිගසිංහ විසින් පවත්වන ලදී.

- ආචාර්ය ඉනෝකා කොරයා සහ ආචාර්ය පණ්ඩුක කරුණානායක යන ආචාර්යවරු "බෙල්ට් ඇන්ඩ් රෝඩ් නිවර්තන වෛද්‍ය සන්ධානය" (බී.ආර්.ටී.එම්.ඒ) සහ ඔක්තෝම්බර් 19 වන දින පැවති චීනයේ නිවර්තන වෛද්‍ය විද්‍යාව පිළිබඳ 01 වන සමුළුවේ පීඨය නියෝජනය කළහ. ආචාර්ය ඉනෝකා කොරයා "ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය තත්වය සහ අභියෝග" පිළිබඳව අදහස් දැක්වූ අතර එම පත්‍රිකාව නිවර්තන වෛද්‍ය විද්‍යාව පිළිබඳ ආසියානු පැසිෆික් ජර්නලයේ සාරාංශයක් ලෙස පළ විය.

- මහාචාර්ය පූජිත වික්‍රමසිංහ විසින් සියලුම ශ්‍රී ලාංකිකයන්ට ඉතා වැදගත් වන ගැටලුවක් පිළිබඳව අවධානය යොමු කරන ලදී. එනම් ඩෙංගු ආසාදනයයි. මෙම පර්යේෂණය ඩෙංගු රෝගයෙන් පෙළෙන ළමුන් තුළ සිදුවන රුධිරයේ වෙනස්වීම් වැනි අංශ ආවරණය වන පරිදි රිජ්වේ ආර්යා රෝහලේ ළමා රෝග මහාචාර්ය ඒකකයේ දී සිදු කරන ලදී. ඩෙංගු ආසාදනය, සංකූලතා අවම කර ගැනීමේ ක්‍රම සහ ඩෙංගු ආසාදනය සඳහා නව ආධාරක ප්‍රතිකාර ක්‍රම වැනි ක්ෂේත්‍ර මෙමගින් ආවරණය විය.මෙම පර්යේෂණවල ප්‍රතිඵල බොහෝ මධ්‍යස්ථානවල ඩෙංගු රෝගීන් කළමනාකරණය කිරීමේදී වෛද්‍යවරුන් විසින් දැනට ක්‍රියාත්මක කරනු ලැබේ.

  - ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ වත්මන් සභාපති මහාචාර්ය චන්ද්‍රිකා විජයරත්න මහජනයාට බලපාන සෞඛ්‍යයට අදාළ ගැටළු වල සුවිශේෂ අවශ්‍යතා සහ හිඩැස් පිළිබඳව විදේශීය ස්වේච්ඡා විශේෂඥ කමිටු 12 කින් සමන්විත නිර්පාක්ෂික වෘත්තීය සමිති ආයතනය අමතන ලදී.

  - මහනුවර වෛද්‍ය සංගමයේ 40 වන වාර්ෂික අධ්‍යයන සැසිය 2018 පෙබරවාරි 15 සිට 17 දක්වා පැවැත්විණි. 2018 කේඑස්එම් දේශනය මහාචාර්ය වජිර එච්. ඩබ්ලිව්. දිසානායක විසින් "ශ්‍රී ලංකාවේ ඊ හෙල්ත් හි ධාරිතා වර්ධනය හා නව්‍යකරණය" යන මාතෘකාව යටතේ පවත්වන ලදී.

**ප්‍රශස්ථ භාවිතාවන්**

- මනෝ චිකිත්සක අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රවීන් හන්වැල්ල විශ්ව විද්‍යාල ක්ෂේත්‍රයේ අත්දකින ලද ප්‍රධාන අර්බුද හතරක් පිළිබඳව දේශනයක් පැවැත්විය. ඔහුට අනුව මෙම අත්දැකීම් තුළින් ජනතාව ශක්තිමත් විය. ඉන්පසු ඔහු ජනතාව විසින් භාවිතා කරන ඉහළ සන්නිවේදන ක්‍රම පිළිබඳව අදහස් දැක්වූ අතර ඉහළ කාර්යක්ෂම සන්නිවේදන ක්‍රමවේදයන් තිබුණද, අන්තර් පුද්ගල සබඳතා පුද්ගල පෞරුෂයන්හි බලපෑමට ලක්විය හැකිබව ඔහුගේ අදහසය.



| | නම | අධ්‍ය.අංශය | තනතුර | සේවා කාලය |
|---|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| 01 | මහාචාර්ය එම්.ඩබ්. ගුණතුංග | ප්‍රජා වෛද්‍ය විද්‍යා | මහාචාර්ය | 25 |
| 02 | මහාචාර්ය එස්. විජේරත්න | ප්‍රසව හා නාරිවේද | මහාචාර්ය | 25 |
| 03 | ආචා. එන්.එම්.ජේ.ආර්. ඩයස් | ශල්‍ය වෛද්‍ය | ජෙ.කථි. | 25 |
| 04 | මහාචාර්ය එච්.ජේ.එම්. පෙරේරා | වෝහාරික වෛද්‍ය විද්‍යා | මහාචාර්ය | 25 |
| 04 | එස්.ජී.අලුත්ගේ මයා | ක්ෂුද්‍රජීවවේදය | විද්‍යාගාර සහායක | 25 |
| 05 | එස්.සී. හිග්ගොඩ මිය | සායනික වෛද්‍ය වි. | තාක්ෂණික නිලධාරී | 25 |
| 06 | ජී.කේ.ඩී. | ක්ෂුද්‍රජීවවේදය | කම්කරු | 25 |
| 07 | මහාචාර්ය එම්.පී සේනානායක | ළමාරෝග | මහාචාර්ය | 30 |
| 08 | මහාචාර්ය එම්.වී.සී.ද සිල්වා | ව්‍යාධිවේදය | මහාචාර්ය | 30 |
| 09 | සී.එස්.වී.පතිරණ මිය | මනෝ චිකිත්සාව | සමාජවැඩ උපදේශක | 30 |
| 10 | එච්. පී.සී තිසේරා මයා | කායික විද්‍යා | තාක්ෂණික නිලධාරී | 30 |
| 11 | ඩී.ජේ.එස්.ජේ. වීරසිංහ මයා | ජෛව රසායනය | තාක්ෂණික නිලධාරී | 30 |
| 12 | කේ.බී.එස්. මානෙල් මිය | ජෛව රසායනය | ජෙ. මාණ්ඩලික සහකාර | 30 |
| 13 | එම්. ප්‍රේමචන්ද්‍ර මයා | පීඨාධිපති කාර්යාලය | සෞඛ්‍ය සේවා කම්කරු | 30 |
| 14 | මහාචාර්ය කේ.එස්.ඒ. ජයසිංහ | සායනික වෛද්‍ය වි. | මහාචාර්ය | 35 |
| 15 | පී. ජේ. ගුණවර්ධන මයා | භිෂග්වේදය | විද්‍යාගාර සහායක | 35 |

- අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්ය ෂෝන් පෙරේරා, "විෂ විද්‍යාව" පිළිබඳ පීඨ මණ්ඩලය වෙත "අධිකරණ වෛද්‍ය විද්‍යාව ඉගැන්වීමේදී අනුකරණයන් භාවිතා කිරීම" යන මාතෘකාව යටතේ කෙටි කතාවක් ඉදිරිපත් කරන ලදී.

මහාචාර්ය රවීන් මුහුණු පොතෙහි සහා වාර්තාවෙන් ලබා ගත හැකි දේශන පැවැත්වීම සඳහා විශිෂ්ටතම යොදාගැනීම් ඉදිරිපත් කළේය. එය මුහුණු පොතෙහි සහා වාර්තාවෙන් ලබාගත හැකිය.

**දීර්ඝ සේවා සම්මාන**

දීර්ඝ සේවා සම්මාන උළෙල කොළඹ විශ්ව විද්‍යාලය විසින් 2018 පෙබරවාරි 01 වන දින පවත්වන ලද අතර පහත සඳහන් වෛද්‍ය පීඨ සාමාජිකයින් සඳහා සම්මාන ප්‍රදානය කරන ලදී.

**ශිෂ්‍යත්ව**

ජර්මනියේ ආචෙන් විශ්ව විද්‍යාලයේ අනිවාර්ය පැමිණීමේ වාර කෙටි කාලයක් සහිතව රසායනාගාර සත්ව විද්‍යාව පිළිබඳ වසර දෙකක මාර්ගගත විද්‍යාපති උපාධි පාඨමාලාවක් හැදෑරීමට ශිෂ්‍යත්ව 3ක් පිරිනමන ලදී. (2018 සැප්තැම්බර් - 2020 සැප්තැම්බර්)

- රසායනාගාර සත්ව විද්‍යා සඳහා ජාත්‍යන්තර කවුන්සිල අධ්‍යාපන ශිෂ්‍යත්වය
- එක්සත් රාජධානියේ රසායනාගාර සත්ව සමාගමෙන් ශිෂ්‍යාධාර
- උපකාරක ගාස්තුවෙන් 50% ක් ආවරණය කිරීම සඳහා ආචෙන් විශ්ව විද්‍යාලයෙන් දීමනාව

**ගෞරව පත්කිරීම්**

- මහාචාර්ය වජිර එච්.ඩබ්ලිව්. දිසානායක මහතා නේපාලයේ ජාතික විද්‍යා ඇකඩමියේ (NAMS) (නේපාලයේ පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනය) ගෞරව බාහිර මහාචාර්ය ලෙස පත් කරනු ලැබුවේ NAMSආයතනයට සහ නේපාලයට ඔහු කළ සේවය අගයමින් ය.

- මහාචාර්ය පණ්ඩුක කරුණානායක මහතා 2018. 01. 05 දින සිට ලංකා වෛද්‍ය විද්‍යාලයේ සභාපති ලෙස පත් කරන ලදී.

- ඕස්ට්‍රේලියානු රජයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වෛද්‍ය සේවා උපදේශන කමිටුවේ ජානමය පුරෝකථන පරීක්ෂණ ක්‍රියාකාරී කණ්ඩායමේ ජාත්‍යන්තර උපදේශකවරයකු ලෙස මහාචාර්ය වජිර දිසානායක මහතා පත් කර තිබේ.

- මහාචාර්ය සරෝජ් ජයසිංහ මහතා නිව්යෝක් වෛද්‍ය ඇකඩමිය විසින් නාගරික සෞඛ්‍ය සභාවේ කර්තෘ මණ්ඩලයට පත් කරන ලදී.

- පොදුරාජ්‍ය මණ්ඩලීය වෛද්‍ය සංගමය, පොදුරාජ්‍ය මණ්ඩලීය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ ආයතනය සහ ගෝලීය සෞඛ්‍ය 2030 නවෝත්පාදන කාර්ය සාධක බලකාය විසින් පිහිටුවන ලද ඩිජිටල් සෞඛ්‍ය පිළිබඳ පොදුරාජ්‍ය මණ්ඩලීය මධ්‍යස්ථානයේ සභාපති ලෙස මහාචාර්ය වජිර දිසානායක මහතා පත් කරන ලදී.

- එඩින්බරෝ රාජකීය වෛද්‍ය විද්‍යාලයේ සාමාජිකයෙකු ලෙස වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයන අංශයේ වෛද්‍ය ඉන්දික කරුණාතිලක මහතා තේරී පත් විය.

- මහාචාර්ය ඉන්දික කරුණාතිලක මහතා 2019 සඳහා ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ සභාපති ලෙස තේරී පත් විය.

**වෙනත් අධ්‍යයන ක්‍රියාකාරකම් හා සිදුවීම්**

**සම්මන්ත්‍රණ/ වැඩමුළු හා පුහුණු සැසි**

- විශ්වවිද්‍යාලයට අලුතින් බඳවාගත් සීමාවාසික කථිකාචාර්යවරුන් සඳහා දිශානති වැඩසටහන 2018 පෙබරවාරි 15 වන දින පවත්වන ලදී. මෙම වැඩසටහන සඳහා නවක කථිකාචාර්යවරුන් සහභාගී වූ අතර ප්‍රතිපෝෂණය ඉතා ධනාත්මක විය.

  - 2018 මාර්තු 7 සිට 9 දක්වා දකුණු අප්‍රිකාවේ කේප් ටවුන් හි පැවති දුම්කොළ හෝ සෞඛ්‍ය පිළිබඳ ලෝක සමුළුවේදී සීසීටී කාර්ය මණ්ඩලයේ සහභාගිකයන්ට සඳහා දුම්කොළ මර්දන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ වෛද්‍ය මහේෂ් රාජසූරිය විසින් "දුම්කොළ රහිත පරම්පරාව සඳහා ලෝකය එක්සත් කිරීම." වාර්තාව ඉදිරිපත් කරන ලදී. රටවල් 100 කට වඩා වැඩි සංඛ්‍යාවක් මීට සහභාගී විය.

  - තයිරොයිඩ් නියෝප්ලාස්ම පිළිබඳ රෝග විනිශ්චය සහ කළමනාකරණය යාවත්කාලීන කිරීම ඉහත වැඩමුළුව 2018 මැයි 26 වන දින කොළඹ ටාජ් සමුද්‍රා හෝටලයේදී කොළඹ වෛද්‍ය පීඨයේ ව්‍යාධි විද්‍යා අධ්‍යයන අංශය හා ශ්‍රී ලංකා ව්‍යාධි විද්‍යාඥ විද්‍යාලය විසින් සාර්ථකව පවත්වන ලදී. ව්‍යාධිවේදය, පිළිකාවේදය හා ශල්‍යකර්ම යන ශික්ෂණයන්හි විශේෂඥයන් හා අභ්‍යාසලාභීහු **120** කට අධික සංඛ්‍යාවක් මීට සහභාගි වූහ.

  - වෛද්‍ය පීඨයේ 2018 වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය 2018 නොවැම්බර් 09 වන දින සාර්ථකව අවසන් කරන ලදී. දළ වශයෙන් 100 පමණ සහභාගිතයන් සීට සම්බන්ධ වූහ.

- ළමා රෝග විද්‍යා අධ්‍යයන අංශයේ කථිකාචාර්ය වෛද්‍ය සුමුදු සෙනෙවිරත්න "බස් නැවතුමේ කථාව" යන මාතෘකාව යටතේ පශ්චාත් උපාධි පර්යේෂණ දින සන්නිවේදනය සඳහා ඉදිරිපත් කිරීමක් ඉදිරිපත් කරන ලදී පශ්චාත් උපාධි පර්යේෂණ දින සමාරම්භක උත්සවය 2018 ඔක්තෝබර් 26 දින පැවැත්විණි.

- තෙවන වාර්ෂික විෂයමාලා සමාලෝචනය 2018 ජුනි 23-24 දිනවල කළුතර ටැංජරීන් බීච් හෝටලයේදී "විෂයමාලාව පිළිබඳ සමස්ත දෘෂ්ටිය කරා" යන තේමාව යටතේ පැවැත්විණි.

- වෛද්‍ය මානව ශාස්ත්‍ර පිළිබඳ විදේශ කථිකයන්ගේ පළමු ජාත්‍යන්තර සමුළුව “ වඩාත් මානුෂීය වීමට ඉගෙනීමෙහි ලා වෛද්‍ය මානව ශාස්ත්‍රයේ කාර්යභාරය යන මැයින් 2018 ජූලි 12 සිට ජූලි 14 දක්වා පැවැත්විණි.

- පීඨ මණ්ඩලය ලද වාර්තා – ඖෂධවේදීන් හා ඖෂධවේදී අභ්‍යාසලාභීන් සඳහා භිෂග්වේදයේ සහ ඖෂධවේදයේ මූලිකාංග - භිෂග්වේද අධ්‍යයන අංශය විසින් පවත්වන ලදී.

- 2018 අගෝස්තු 18 දින 19 දිනවල භිෂග්වේද අධ්‍යයන අංශය විසින් ඖෂධවේදීන් හා ඖෂධවේදී අභ්‍යාසලාභීන් සඳහා ඉහත දෙදින වැඩමුළුව පවත්වන ලදී. භිෂග්වේද අධ්‍යයන අංශ ප්‍රධානී මහාචාර්ය ශලිනි ශ්‍රී රංගනාදන් වැඩමුළුව පිළිබඳ වාර්තාව ඉදිරිපත් කළ අතර වැඩමුළුව සාර්ථකව නිම කිරීම සඳහා දක්වන සහයෝගය සඳහා පීඨාධිපතිට සහ කාර්ය මණ්ඩලයට ස්තුතිය පුද කළාය.

- URKUND නම් වූ බුද්ධි චෞරත්ව පරීක්ෂක මෘදුකාංගය පිළිබඳ කෙටි පුහුණුවක් 2018 නොවැම්බර් 30 වන දින CAL විද්‍යාගාරයේදී පවත්වන ලදී. URKUND හි තම ගිණුම් නිර්මාණය නොකළ අධ්‍යයන කාර්ය මණ්ඩලය පුස්තකාලයට ඉල්ලීමක් කළ අතර සක්‍රීය කිරීමේ විද්‍යුත් තැපැල ලබා ගත්හ.

- ඔක්ස්ෆර්ඩ් මෙඩිසින් ඔන්ලයින් පිළිබඳ වැඩමුළුවක් 2018 ජූලි 23 වන දින පෙ.ව. 11.30 සිට ප.ව. 12.30 දක්වා CAL විද්‍යාගාරයේ දී පැවැත්විණි. ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාල මුද්‍රණාලයේ දකුණු හා අග්නිදිග ආසියාවේ සහකාර කළමනාකාර (පුහුණු) සුමිතා සෙන් මහත්මිය වැඩසටහනේ සම්පත්දායකයා විය.

**වෙනත් තොරතුරු**

- වෛද්‍ය පීඨයෙහි රොට්‍රැක්ට් සංගම් ආරම්භ කිරීම:
රොටරැක්ට් යනු වයස අවුරුදු 18 ත් 30 ත් අතර තරුණ තරුණියන් සඳහා වන සේවා සමාජයකි. එහි අරමුණ වූයේ ප්‍රජාව තුළ ධනාත්මක වෙනසක් ඇති කිරීම, තරුණ වැඩිහිටියන් ප්‍රජාව හා ගෝලීය නායකයින් ලෙස සංවර්ධනය කිරීම, දේශීය හා ගෝලීය වශයෙන් මිතුරන් ඇති කර ගැනීමයි. විශ්ව විද්‍යාල පදනම් කරගත් රොටරැක්ට් සමාජයක් ලෙස ප්‍රධාන අවධානය යොමු වූයේ පීඨ සිසු සිසුවියන්ගේ වෘත්තීය සංවර්ධනය, පොදු ජනතාව හා සම්බන්ධ සෞඛ්‍ය ගැටලු ආමන්ත්‍රණය කරන ප්‍රජා සේවා සහ සමාජ සේවා සැපයීමයි. වෛද්‍ය පීඨය තුළ මෙම සමාජය ආරම්භ කිරීම වෛද්‍ය පීඨ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

- වෛද්‍ය පීඨයේ 150 වන සංවත්සරය 2020 ජනවාරි සිට 2020 සැප්තැම්බර් දක්වා සමරනු ලැබේ.

- උග්‍ර කිරීටක සහලක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මකවූ පළමු විගණනය වන භිෂග්වේද අධ්‍යයන අංශය විසින් සම්බන්ධීකරණය කරන ලද ශ්‍රී ලංකා උග්‍ර කිරීටක සහලක්ෂණ විගණන ව්‍යාපෘතිය (ACSSLAP) 2018 පෙබරවාරි මාසයේ දී බ්‍රිතාන්‍ය වෛද්‍ය විද්‍යා වාර සඟරාවක් වන බ්‍රිතාන්‍ය හෘද රෝග සමාජයේ HEART වාර සඟරාවෙහි පළ කරන ලදී. මාතෘකාව: ශ්‍රී ලංකාවේ උග්‍ර කිරීටක සහලක්ෂණ රෝගීන් කළමනාකරණය, ලක්ෂණ සහ ප්‍රතිඵල. (හදවත 2018; 0: 1-8. දෝයි: 10.1136 / heartjnl-2017-312404).

- කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ග්‍රාමීය සෞඛ්‍ය පර්යේෂණ මධ්‍යස්ථානය (ආර්එච්ආර්සී) 2018 මැයි 30 වන දින කතරගම පැරණි මැලේරියා පර්යේෂණ මධ්‍යස්ථානයේ දී විවෘත කරන ලදී.

- වෛද්‍ය හා සම සෞඛ්‍ය සේවා ශික්ෂණයන්හි උපාධි අපේක්ෂකයින් සඳහා වන පළමු සූත්‍ර සංග්‍රහය (Formulary ) වන ශ්‍රී ලංකා සූත්‍ර සංග්‍රහය (එස්එල්එස්එෆ්) ජූලි 31 වන දින දියත් කරන ලදී. ශ්‍රී ලංකා සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහයෝගයෙන් ප්‍රකාශයට පත්වූ මෙම සූත්‍ර සංග්‍රහය භිෂග්වේද අධ්‍යයන අංශයේ වසර 7 ක කැපවීමේ අවසාන ප්‍රතිඵලය විය.

- උපාධි අපේක්ෂකයින්ගේ සායනික ඉගැන්වීම් තවදුරටත් වැඩිදියුණු කිරීම සහ ඔවුන්ගේ ප්‍රතිපෝෂණ ලබා ගැනීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා දීර්ඝකාලීන සාමාජිකයින් සහ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් 2018 දෙසැම්බර් 21 වන දින විවෘත පීඨ දිනය පැවැත්විණි.

- පීඨයෙහි නව ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (එල්එම්එස්) සංවර්ධනය කරන ලද්දේ අතථ්‍ය හා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ කථිකාචාර්ය දෞපදී කිරිඇල්ල මහත්මිය විසිනි.කිරිඇල්ල මහත්මිය විසින් පීඨයේ ධාරාවන් 5 ක කථිකාචාර්යවරුන්ගෙන් මේ පිළිබඳ අදහස් විමසන ලදී.එල්එම්එස් වෙබ් අඩවිය පිහිටුවා ඉගෙනුම් ද්‍රව්‍ය නව ඉගෙනුම්

කළමනාකරණ පද්ධතිය වෙත මාරු කිරීම අවසන් කරන ලදී. උසස් කරන ලද සේවාව තුළින් සිසුන්ට උපරිම ප්‍රතිලාභ ලබා දිය හැකිය.

- පර්යේෂණ ප්‍රවර්ධන හා පහසුකම් මධ්‍යස්ථානය විසින් කරන ලද සමීක්ෂණයෙන් වෛද්‍ය අසේල ඔලුපැලියාව කළ සොයාගැනීම් පහත දැක්වේ.

සමීක්ෂණය සිදු කරනු ලැබුවේ පීඨයෙහි පර්යේෂණ පාලනය සහ පර්යේෂණ සහාය අවශ්‍යතා පිළිබඳව වන අතර එය පර්යේෂණ ප්‍රවර්ධන හා පහසුකම් මධ්‍යස්ථානය (ආර්පීඑෆ්සී) විසින් පවත්වන ලදී. 50 කට අධික අධ්‍යයන කාර්ය මණ්ඩලයක් සමීක්ෂණයට ලක් විය. සොයාගැනීම් මගින් පශ්චාත් උපාධි පර්යේෂණ සහාය වැඩිදියුණු කිරීමේ අංශ කිහිපයක් යෝජනා කරන අතර වඩාත් විධිමත් RHDC ලියාපදිංචිය සහ සමාලෝචන ක්‍රියාවලීන් සහ තවත් පුස්තකාල / මාර්ගගත සම්පත් ප්‍රවේශ පහසුකම් ඒ අතර වේ. වඩාත් නම්‍යශීලී මූල්‍ය ක්‍රියා පටිපාටි, කැපවූ කාලය වෙන් කිරීම සහ පුහුණුව ලත් අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහාය ඇතුළුව තමන්ගේම පර්යේෂණ සඳහා සහාය වීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලය යෝජනා කිහිපයක් ඉදිරිපත් කළහ. දැනට පවතින පහසුකම් ශක්තිමත් කිරීම සහ අනාගතයේ දී බොහෝ කාර්ය මණ්ඩලය ප්‍රිය කරන පරිදි සේවාවන්හි මධ්‍යම සම්බන්ධීකරණය කරා ගමන් කිරීම මෙහි අරමුණයි.

- 2018 වර්ෂය සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා වන පෝෂණ වැඩසටහනට අනුව පෝෂණ සායනය වෛද්‍ය පීඨයෙහි දී පැවැත්විණි**.**

- දුම්කොළ මර්දන මධ්‍යස්ථානය ආරම්භයේ සිටම වෛද්‍ය පීඨයේ සෞඛ්‍ය හා සුවතා ඒකකයේ කොටසකි. මෑතකදී, සීසීටී විසින් මූල්‍ය ගනුදෙනු ද ඇතුළුව ස්වාධීන ක්‍රියාකාරීත්වය ඉල්ලා සිටියේය. මෙම ආයතන දෙකේ වියුක්ත ක්‍රියාකාරිත්වය පීඨ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. මූල්‍ය කටයුතුවලදී සීසීටීයේ ස්වාධීන ක්‍රියාකාරීත්වය සඳහා මූල්‍ය කමිටුවේ අනුමැතිය ලබා ගන්නා ලදී. ක්ෂය රෝගයට එරෙහි ජාත්‍යන්තර සංගමය සහ පීඨයේ දුම්කොළ මර්දනය කිරීමේ මධ්‍යස්ථානය (සීසීටී) අතර වෛද්‍ය විද්‍යාව පිළිබඳ ප්‍රදාන ගිවිසුමට පීඨ මණ්ඩලයේ නිර්දේශය හිමිවිය**.**

- ආබාධිත පුද්ගලයින් සඳහා වන පණතෙහි ආබාධිත පුද්ගලයින් සඳහා ඇති ප්‍රවේශ අයිතිය ආරක්ෂා කිරීම යටතේ පීඨයෙහි ආබාධිත පුද්ගලයින් සඳහා පවතින බැවුම්මගට අමතරව විදුලි සෝපාන දෙකක් ස්ථාපිත කිරීම මගින් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා වෛද්‍ය පීඨයෙහි විභාගවලට සහභාගී වන ආබාධිත සිසුන් සඳහා විභාගවලදී සාධාරණ ඉඩ පහසුකම් සැපයීම

- යෝජිත කෞතුකාගාරය

යෝජිත කෞතුකාගාරය සඳහා පැරණි රසායනාගාර භාණ්ඩ කිහිපයක් හඳුනාගෙන ඇති බව මූලාසනය විසින් දැනුම් දුන් අතර, කෞතුකාගාරයේ සංරක්ෂණය කිරීම සඳහා තම අධ්‍යයන අංශවල ඇති පැරණි භාණ්ඩ පරිත්‍යාග කරන ලෙස ඉල්ලා සිටියේය. මෙම අධ්‍යයන අංශවලින් ලැබෙන පරිත්‍යාග ලෙස මෙම භාණ්ඩ සලකනු ලැබේ.

.

- ශ්‍රී ලංකා තරුණ විද්‍යාඥයන්ගේ ඇකඩමියේ වාර්ෂික සංසදය පිළිබඳ වාර්තාව

ශ්‍රී ලංකාවේ තරුණ විද්‍යාඥයින්ගේ ඇකඩමිය (SLAYS) සහ ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම එක්ව විද්‍යා, තාක්ෂණ හා නවෝත්පාදන සඳහාවන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයේ (COSTI) සහයෝගයෙන් 2016 ශ්‍රී ලංකා එස්ටීඑස් සංසදයේ පසු විපරමක් ලෙස "බලපෑම සඳහා පර්යේෂණ: ශ්‍රී ලාංකික තරුණ විද්‍යාඥයින්ගේ ගමන" යන මැයෙන් සංවිධානය කරන ලද 2 වන SLAYS විවෘත සංසදය පිළිබඳ වාර්තාව SLAYS හි සභාපති ආචාර්ය චාමින්ද්‍රි විතරණ විසින් ඉදිරිපත් කරන ලදී.මෙම උත්සවය 2018 ඔක්තෝබර් 4 හා 5 දිනවල ගාලුමුවදොර හෝටලයේදී පැවැත්විණි.

කුරුප්පු, ඩී.සී., විජයරත්න, සී. එන්., ගුණවර්ධන, එන්., අමරසිංහ. I. (2018). වැඩිහිටියන් අතර පියයුරු පිළිකා පිළිබඳ තොරතුරු අවශ්‍යතාවයේ වැදගත්කම: ශ්‍රී ලංකාවේ කොළඹ දිස්ත්‍රික්කයේ ජනගහනය පදනම් කරගත් සමීක්ෂණයක්. පිළිකා වැළැක්වීමේ ආසියානු පැසිෆික් සඟරාව. 19 (8), 2247-2253. DOI: 10.22034 / APJCP.2018.19.8.

ටී. ශ්‍රීධරන්, (2018). ඉලෙක්ට්‍රොනික තොරතුරු සම්පත් හා සේවාවන් පිළිබඳ භාවිතය සහ පරිශීලක තෘප්තිය ඇගයීම: කොළඹ විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනයේ අධ්‍යයනයක්. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල පුස්තකාලයාධිපතිවරුන්ගේ සංගමයේ ජර්නලය, වෙළුම 21 (2). පි. 73-88 අයිඑස්එස්එන්: 2579-2253

**සම්මන්ත්‍රණ සාරාංශ**

1. කුරුප්පු, ඩී.සී. (2018). ඩිජිටල් වේදිකාවේ ජෛව වෛද්‍ය සාහිත්‍යය පිළිබඳ තොරතුරු සැපයීම: තොරතුරු බෙදා හැරීමේ සේවාව තක්සේරු කිරීම. කොළඹ විශ්ව විද්‍යාලයේ වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ ක්‍රියා පටිපාටි 2018, 2018 නොවැම්බර් 8, කොළඹ, පි .287

2. ලංකාතිලක, එම්. (2018). කොළඹ විශ්ව විද්‍යාලයේ දෘශ්‍යාබාධිත උපාධි අපේක්ෂකයින් සඳහා උපකාරක තාක්ෂණයන්. කොළඹ විශ්ව විද්‍යාලයේ 2018 වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ ක්‍රියා පටිපාටි, 2018 නොවැම්බර් 8, පි 288

3. මනතුංග, පී.කේ.එස්. (2018). විද්‍යුත් තොරතුරු සම්පත් භාවිතා කිරීමේදී නීති උපාධි අපේක්ෂකයින්ගේ ඥානවිභාගී විශ්වාස ව්‍යුහය: කොළඹ විශ්ව විද්‍යාලයේ සිද්ධි අධ්‍යයනය. කොළඹ විශ්ව විද්‍යාලයේ 2018 වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ ක්‍රියා පටිපාටි, 2018 නොවැම්බර් 8, පි .289,

4. මිල්ටන්, එම්.ඒ., ලංකාතිලක, එම්. ඒ සහ කුරුප්පු, ඩී.සී. (2018). මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාවන්හි පර්යේෂණ පුනරාවර්තනයන් වළක්වා ගැනීම සඳහා ඩිජිටල් මෙවලමක් සංවර්ධනය කිරීම. කොළඹ විශ්ව විද්‍යාලයේ 2018 වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ ක්‍රියා පටිපාටි, 2018 නොවැම්බර් 8, පි .290

5. පෙරේරා, කේ. කේ. එන්. එල් (2018). ස්කෝපස් සහ පබ්මෙඩ් දත්ත සමුදායන් භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ ඇදුම පර්යේෂණ පිළිබඳ විද්‍යාත්මක විශ්ලේෂණයක්. කොළඹ විශ්ව විද්‍යාලයේ 2018 වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ ක්‍රියා පටිපාටි, 8 නොවැම්බර් 2018, පි .291

6. පෙරේරා, ඩබ්ලිව්.පී.ජී.එල්. සහ ප්‍රේමරත්න, එස්. (2018) විවෘත මූලාශ්‍ර පුස්තකාල මෘදුකාංග පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්. කොළඹ විශ්ව විද්‍යාලයේ 2018 වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ ක්‍රියා පටිපාටි, 2018 නොවැම්බර් 8, පිටුව 292

7. එම්.එන්.එෆ්. සකීනා, එස්. එස්. ජොහෝරන් (2018). ශ්‍රී ලංකාවේ අධ්‍යයන පුස්තකාලවල ඩිජිටල්කරණය කළ ඓතිහාසික සිතියම් එකතුවක් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම හා අභියෝග. 2018 කොළඹ විශ්ව විද්‍යාලයේ වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ ක්‍රියා පටිපාටි, 2018 නොවැම්බර් 8, කොළඹ, පි .293

8. සිල්වා, එම්.ඒ.එල්. (2018). කොළඹ විශ්ව විද්‍යාලයේ පුස්තකාලයට වෙබ් අඩවි පැමිණීම: 2013-2018. කොළඹ විශ්ව විද්‍යාලයේ 2018 වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ ක්‍රියා පටිපාටි, 2018 නොවැම්බර් 8, කොළඹ, පි .294

9. සෝමරත්න, එස්.ඩී. (2018). ශාස්ත්‍රීය පුස්තකාලවලින් සේවා ගුණාත්මකභාවය පිළිබඳ සහශ්‍රක අපේක්ෂාවන්. කොළඹ විශ්ව විද්‍යාලයේ 2018 වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ ක්‍රියා පටිපාටි, 2018 නොවැම්බර් 8, පි .295

10. ශ්‍රීතරන්, ටී. (2018). කොළඹ විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනයේ වෛද්‍ය පුහුණුවන්නන් විසින් විද්‍යුත් සම්පත් වෙත ප්‍රවේශ වීම: ගැටළු සහ අවධානය යොමුකලයුතු කරුණු. 2018 කොළඹ විශ්ව විද්‍යාලයේ වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ ක්‍රියා පටිපාටි, 2018 නොවැම්බර් 8, පි .296

11. විජේසුන්දර, සී සහ සුගිමොටෝ, එස්. (2018). වෙබයේ සංස්කෘතික උරුම තොරතුරු සම්බන්ධ කිරීම: දකුණු හා අග්නිදිග ආසියානු සංස්කෘතික උරුමයන් තුළ තොරතුරු එක්රැස් කිරීම සඳහා පාර-දත්ත ආකෘති පදනම් කරගත් ප්‍රවේශයකි. කොළඹ විශ්ව විද්‍යාලයේ 2018 වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ ක්‍රියා පටිපාටි, 2018 නොවැම්බර් 8, පි .297

12. විජේතුංග, පී. (2018). කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව හා මානව ශාස්ත්‍ර උපාධි අපේක්ෂකයින්ගේ තොරතුරු සෙවීම් චර්යා. කොළඹ විශ්ව විද්‍යාලයේ 2018 වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණයේ ක්‍රියා පටිපාටි, 2018 නොවැම්බර් 8, කොළඹ, පි .298

**වෘත්තිය දායකත්වයන්**

| සම්පත්දායකයන් | තේමාව | ඉලක්ක කණ්ඩායම | මාසය |
|---|---|---|---|
| කේ.කේ.එන්.එල්. පෙරේරා මිය | ඔක්ස්ෆර්ඩ් මෙඩිසින් ඔන්ලයින් එකතුව පිළිබඳ වැඩමුළුව | | ජූලි |
| | මැන්ඩලේ විමර්ශන කළමනාකරණ මෘදුකාංගය පිළිබඳ පුහුණු සැසියක්<br><br>තොරතුරු සෙවීම<br><br>තොරතුරු සාක්ෂරතාවය හඳුන්වාදීම සහ වෛද්‍ය තොරතුරු සෙවීම<br><br>තොරතුරු සෙවීමේ ක්‍රම | වෛද්‍ය පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් සහ සිසුන් පශ්චාත් උපාධි පර්යේෂකයින්<br><br>වෛද්‍ය පීඨයේ පළමු වසර BSS<br><br>සම සෞඛ්‍ය පීඨයේ පළමු වසර සිසුන් | අගෝ.<br><br>ඔක්.<br><br>අගෝ.<br><br>ඔක්. |
| **ටී. ශ්‍රීධරන් මිය ජ්. සහ. පුස්.** | **පුස්තකාල තොරතුරු සහායකයින් බඳවා ගැනීම සඳහා සහකාර පරීක්ෂක** | **විභාග පරීක්ෂක** | |

**ආචාර්ය මණ්ඩලය සහභාගීවූ වැඩමුළු සහ සම්මන්ත්‍රණ**

| අවස්ථාව | සහභාගි වූවන් | භූමිකාව | මාසය |
|---|---|---|---|
| **බුද්ධිමය දේපල නීතිය පිළිබඳ කණ්ඩායම් පාඨමාලා** | **එම්.ඒ.එල් සිල්වා,./ ජ්. සහ. පුස්.** | සහභාගිතයන් | ඔක්තෝබර් |
| **තොරතුරු වෘත්තිකයින් සඳහා සයිබර් ආරක්ෂාව, ඊ-රජය සහ සමාජ මාධ්‍ය** | කේ.කේ.එන්.එල්. පෙරේරා මිය | සහභාගිතයන් | ඔක්තෝබර් |
| URKUND **බුද්ධි චෞරත්වය පරීක්ෂා කිරීමේ මෘදුකාංගය** | කේ.කේ.එන්.එල්. පෙරේරා මිය | සහභාගිතයන් | අගෝ. |

**අධ්‍යයන/පරිපාලන කාර්ය මණ්ඩලයේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු**

| නම | උපාධිය | ස්ථානය | තත්වය |
|---|---|---|---|
| සී . ජේ.විජේසුන්දර | දර්ශනසූරි | ජපානය | කර ගෙන යමින් පවතී |
| එන්.එම්. කරන්නාගොඩ මයා | දර්ශනසූරි | NILIS | කර ගෙන යමින් පවතී |
| ඩබ්.පී.ජී. එල්. පෙරේරා මිය | විද්‍යාපති | එ.රා. | කර ගෙන යමින් පවතී |
| ඒ. සිවසන්දිරම් මෙය | විද්‍යාපති | NILIS | කර ගෙන යමින් පවතී |
| ජී.සී. කුමාර මයා | විද්‍යාපති | කැ.වි.වි. | පර්යේෂණ |
| කේ.ඒ.සී.පී. අබේගුණවර්ධන මයා | විද්‍යාපති | කැ.වි.වි. | පර්යේෂණ |

**පරිපාලන කාර්ය මණ්ඩලය සහභාගි වූ පුහුණු වැඩසටහන්**

| අවස්ථාව | සහභාගිතයන් | ස්ථානය | මාසය |
|---|---|---|---|
| පුස්තකාල හා තොරතුරු තාක්ෂණ විද්‍යා ජාතික සමුළුව | ජී.සී. කුමාර මයා | ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය | ජුනි |
| පුස්තකාල හා තොරතුරු තාක්ෂණ විද්‍යා ජාතික සමුළුව | කේ.ඒ.සී.පී. අබේගුණවර්ධන මයා | ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය | ජුනි |
| විවෘත මූලාශ්‍ර ඩිජිටල් පුස්තකාල මෘදුකාංගය 0- JAVA CDS/ISIS | ඩබ්ලිව් ඩී ටී රත්නායක මෙනවිය | NSF | නොවැම්බර් |

**අනධ්‍යයන කාර්ය මණ්ඩලය සහභාගි වූ පුහුණු වැඩසටහන්**

| අවස්ථාව | සහභාගිතයන් | ස්ථානය | මාසය |
|---|---|---|---|
| තොරතුරු තාක්ෂණ වෘත්තිකයින් සඳහා තාක්ෂණික ඉගෙනුම් අවස්ථාව | **ආර්.එම්.ආර්.එන්. කරුණාරත්න /ප.ස.** | UITUSL | **සැප්තැම්බර්** |
| විවෘත මූලාශ්‍ර ඩිජිටල් පුස්තකාල මෘදුකාංගය 0- JAVA CDS/ISIS | **ආර්.එම්.ආර්.එන්. කරුණාරත්න /ප.ස.** | NSF | **නොවැම්බර්** |
| විවෘත මූලාශ්‍ර ඩිජිටල් පුස්තකාල මෘදුකාංගය 0- JAVA CDS/ISIS | **වයි ඩබ්ලිව් අයි උදේෂානි මිය** | NSF | **නොවැම්බර්** |

## 2.21 අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකය (IQAU)

**දැක්ම**

දැනුම, අධ්‍යාපනය, පර්යේෂණ සහ ව්‍යවසායකත්වය අතර සහයෝගීතාවයන් ගොඩනභා ගනිමින් කලාපීය හා ජාත්‍යන්තර කීර්තියේ විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් වීමට උත්සාහ කිරීම.

**මෙහෙවර**

පරිවර්තනීය අධ්‍යාපනය සඳහා විනිවිදභාවය, වගවීම සහ ප්‍රත්‍යාවර්තකතාවයෙන් විශ්ව විද්‍යාල ඉගැන්වීම්, ඉගෙනුම්, තක්සේරු කිරීම් සහ අධ්‍යයන පාලනයේ ගුණාත්මකභාවය සහතික කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා මිණුම් දණ්ඩක් වීම.

**හැඳින්වීම**

කොළඹ විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර තත්ත්ව සහතික ඒකකය (IQAU) 2015 අප්‍රේල් මාසයේ දී ආරම්භ කරන ලද්දේ 4/2015 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් චක්‍රලේඛය අනුව ය. එහි ප්‍රධාන වගකීම් වනුයේ:

i. විශ්ව විද්‍යාලයේ සියලුම තත්ත්ව සහතික (QA) ආශ්‍රිත ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.
ii. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තත්ත්ව සහතික කිරීමේ කවුන්සිලය (QAC) හරහා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සමඟ සම්බන්ධ වීම.
iii. පීඨ සහ ආයතනවල තත්ව සහතික ක්‍රියාකාරකම් අධීක්ෂණය හා මඟ පෙන්වීම
iv. තත්ව සහතික සමාලෝචන / විගණන ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම් ක්‍රියාමාර්ග.
v. QAAC විසින් පවත්වනු ලබන බාහිර සමාලෝචන සඳහා විශ්වවිද්‍යාලය සූදානම් කිරීම සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.
vi. සියලුම පීඨ, දෙපාර්තමේන්තු, ආයතන, ඒකක සහ මධ්‍යස්ථාන මෙන්ම පරිපාලන කාර්ය මණ්ඩලයට තත්ව සහතික ආශ්‍රිත කරුණු පිළිබඳ උපදෙස් ලබා දීම.
vii. කළමනාකරණ කමිටුවේ නිර්දේශ මත තත්ත්ව සහතික ආශ්‍රිත මාර්ගෝපදේශ හා අත්පොත් සැකසීම

viii. තත්ව සහතික කුටි පිහිටුවීම, ඔවුන්ගේ යුතුකම් හා වගකීම් නිර්වචනය කිරීම සහ ඒවායේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම.

ix. අවශ්‍ය ඕනෑම අවස්ථාවක තත්ත්ව සහතික සම්බන්ධ කරුණුවලදී විශ්වවිද්‍යාලය නියෝජනය කිරීම

x. අධ්‍යයන වැඩසටහන් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ ඇගයීම සඳහා ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) හි නිශ්චිතව දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුකූලව කටයුතු කිරීමට විශ්වවිද්‍යාල පීඨ / ආයතනවලට සහාය වීම.

IQAU සෘජුවම උපකුලපතිගේ විෂය පථයට යටත් වන අතර එය කළමනාකරණය කරනු ලබන්නේ අධ්‍යක්ෂවරයෙකු විසිනි. කළමනාකරණ කමිටුවක් හරහා IQAU හි මූල්‍ය හා පරිපාලන කටයුතු කළමනාකරණය කළ යුතුය.
චක්‍රලේඛයට අනුව කළමනාකරණ කමිටුව පහත සඳහන් අවම සංයුතියෙන් සමන්විත විය යුතුය.

I. අධ්‍යක්ෂක
II. සියලුම පීඨවල පීඨාධිපතිවරු (සහ / හෝ නම් කරන ලද)
III. ආයතනවල අධ්‍යක්ෂවරුන් (සහ / හෝ නම් කරන ලද)
IV. ලේඛකාධිකාරී (සහ / හෝ නම් කරන ලද)
V. මූල්‍යාධිකාරී (සහ / හෝ නම් කරන ලද)
VI. පුස්තකාලයාධිපති (සහ / හෝ නම් කරන ලද)
VII. අධ්‍යක්ෂ - මාණ්ඩලික සංවර්ධන මධ්‍යස්ථානය
VIII. කොළඹ විශ්ව විද්‍යාලයේ තත්ව සහතික කුටිවල සභාපතිවරු
IX. කැඳවුම්කරු (පරිපාලන නිලධාරී - ස.ලේ / ජ. ස.ලේ)

**ජයග්‍රහණ:**

i. IQAU කාර්යාලය ස්ථාපිත කිරීම
IQAU හි කාර්යාලය විද්‍යාල මන්දිරයේදී ස්ථාපිත කරන ලදී. ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කරන ලද අතර දැන් අවශ්‍ය සියලු උපකරණ හා ගෘහ භාණ්ඩ සමඟ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වේ.

ii. කළමනාකරණ කමිටුව පත් කිරීම:
IQAU හි පරිපාලන හා මූල්‍ය කටයුතු අධීක්ෂණය කිරීම සඳහා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2015 අනුව කළමනාකරණ කමිටුවක් පත් කරන ලදී. සියළුම පීඨ / ආයතන නොවරදවාම නියෝජනය වන බව සහතික කිරීම සඳහා කළමනාකරණ කමිටුවට අතිරේක සාමාජිකයෙකු (පීඨාධිපති / අධ්‍යක්ෂ හැර) පත් කරන ලදී. දෙවන නියෝජිතයා පීඨයේ / ආයතනයේ තත්ව සහතික කුටියේ සාමාජිකයෙකි.

iii. අතුරු ව්‍යවස්ථා
IQAU සඳහා නීති මාලාවක් සකස් කරන ලද අතර එය සෙනෙට් සභාව විසින් අනුමත කරන ලදී.

iv. උපායමාර්ගික සැලසුම:
IQAU සඳහා උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම සඳහා උප කමිටුවක් පත් කරන ලදී. කෙටුම්පත් උපායමාර්ගික සැලැස්ම කළමනාකරණ කමිටුව සහ සෙනෙට් සභාව විසින් අනුමත කළ යුතුව පවතී.

v. තත්ව සහතික කුටි (QACs):

තත්ව සහතික කුටි සියළුම පීඨ සහ ආයතනවල ස්ථාපිත කරන ලදී. සෑම තත්ව සහතික කුටියකම සුමට ක්‍රියාකාරිත්වය සඳහා යොමු කිරීමේ කොන්දේසි (ToR) සකස් කර ඇත. තත්ව සහතික කුටි රැස්වීම් නිතිපතා පවත්වනු ලබන අතර ප්‍රගතිය අදාළ මණ්ඩල සහ IQAU කළමනාකරණ කමිටුව වෙත වාර්තා කරනු ලැබේ.

**vi. බාහිර සමාලෝචන**

වැඩසටහන් සමාලෝචන

2018 දී පහත වැඩසටහන් සමාලෝචන පවත්වා ඇත.
- ශාස්ත්‍ර පීඨය (සාමාන්‍ය හා විශේෂ උපාධි පාඨමාලා)
- ශ්‍රීපාලි මණ්ඩලය (ජනමාධ්‍ය, ප්‍රාසංගික කලා)
- කළමනාකරණ හා මූල්‍ය පීඨය
- නීති පීඨය
- අධ්‍යාපන පීඨය

අනාගත සැලසුම්:

1. එක් එක් පීඨයේ / ආයතනයේ තත්ත්ව සහතික ක්‍රියාකාරකම්වල ප්‍රගතිය වරින් වර ඇගයීම.
2. සමාලෝචකයින් විසින් කරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කිරීම. (වැඩසටහන් සහ ආයතනික යන දෙකම)
3. 2020 දී පැවැත්වීමට නියමිත ආයතනික සමාලෝචනයට සූදානම් වීම.
4. කළමනාකරණ කමිටුව විසින් නියම කර ඇති පරිදි ක්‍රියා පටිපාටි අත්පොත සංවර්ධනය කිරීම.
5. සියලුම පීඨ සඳහා කළමනාකරණ තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම.
6. තත්ව සහතික ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු පැවැත්වීම.

# 3 කොළඹ විශ්වවිද්‍යාලය පිළිබඳ දළ විශ්ලේෂණය

## 3.1 සම්පත් හා ශිෂ්‍යයන් පිළිබඳ විස්තර

| පීඨය | පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය | |
|---|---|---|---|---|---|---|---|
| | | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 |
| ශාස්ත්‍ර | කලා | 2181 | 2144 | 146 | 161 | 56 | 58 |
| අධ්‍යාපන | අධ්‍යාපන | 314 | 348 | - | 36 | - | 18 |
| නීති | නීති | 998 | 1000 | - | 42 | - | 18 |
| කළමනාකරණ හා මූල්‍ය | කළමනාකරණ | 1647 | 1914 | 79 | 80 | 55 | 59 |
| වෛද්‍ය | වෛද්‍ය | 1183 | 1373 | 149 | 161 | 238 | 250 |
| | භෞතවේදය | 149 | 184 | 08 | 08 | 06 | 06 |
| විද්‍යා | 1 වන වසර එකතුව | 414 | 501 | - | 190 | - | 107 |
| | 2 වන වසර එකතුව | 468 | 420 | | | | |
| | 3 වන වසර සාමාන්‍ය | 247 | 254 | | | | |
| | 3 වන වසර විශේෂ | 190 | 182 | | | | |
| | 4 වන වසර සාමාන්‍ය | 84 | 59 | | | | |
| | 4 වන වසර විශේෂ | 199 | 190 | | | | |
| | IT ප්‍රධාන | 14 | 17 | | | | |
| | ඉලෙක්ට්‍රොනික හා IT | 10 | 18 | | | | |
| තාක්ෂණ | ඉංජිනේරු තාක්. | - | 75 | 04 | 21 | 03 | 02 |
| | ජෛව පද්ධති තාක්. | - | 100 | | | | |
| හෙද | | - | 93 | - | 09 | - | 07 |
| **එකතුව** | | **8098** | **8872** | **386** | **708** | **358** | **525** |

## 3.2 දේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර

### (a) ප්‍රථම උපාධි

| පීඨය | පාඨමාලාව | මාධ්‍ය | බඳවා ගැනීම | | පළමු වසර සිසුන් | | දෙවන වසර සිසුන් | | තෙවන වසර සිසුන් | | සිවුවන වසර සිසුන් | | උපාධිලත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | **2017** | **2018** | **2017** | **2018** | **2017** | **2018** | **2017** | **2018** | **2017** | **2018** | **2017** | **2018** |
| ශාස්ත්‍ර | ශාස්ත්‍ර | සි/දෙ/ඉ | 602 | 713 | 602 | 713 | 620 | 484 | 575 | 606 | 384 | 341 | 589 | 596 |
| අධ්‍යාපන | අධ්‍යාපන | සි/දෙ/ඉ | - | 94 | - | - | 118 | 127 | 103 | 117 | 93 | 104 | 137 | 137 |
| නීති | නීති | සි/දෙ/ඉ | 250 | 250 | 250 | 250 | 248 | 250 | 252 | 248 | 248 | 252 | 247 | 250 |
| කළමනාකරණ හා මූල්‍ය | කළමනාකරණය | ඉ | 422 | 515 | 422 | 515 | 419 | 456 | 408 | 408 | 398 | 535 | 399 | 384 |
| වෛද්‍ය | වෛද්‍ය | ඉ | 191 | 190 | 189 | 191 | 190 | 189 | 195 | 190 | 205 | 195 | 185 | 10 |
| | භෞත. | ඉ | 29 | 28 | 29 | 29 | 28 | 29 | 30 | 28 | | | 02 | 35 |
| විද්‍යා | සාමාන්‍ය | ඉ | 414 | 502 | 414 | 501 | 468 | 420 | 247 | 217 | 84 | 59 | 197 | 209 |
| | විශේෂ | ඉ | | | - | - | - | - | 190 | 182 | 199 | 190 | 197 | 196 |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | උපාධි | | | | | | | | | | | | | |
| | IT ප්‍රධාන (වසර 4 සාමාන්‍ය ) | ඉ | | | - | - | - | - | - | 20 | 14 | 17 | 15 | 13 |
| | ඉලෙක්ට්‍රොනික හා IT | ඉ | | | - | - | - | - | - | 17 | 10 | 18 | - | 04 |
| තාක්ෂණ | ඉංජිනේරු | ඉ | - | - | - | 75 | - | - | - | - | - | - | - | - |
| | ජෛව පද්ධති | ඉ | | | - | 100 | - | - | - | - | - | - | - | - |
| වෛද | වෛද | ඉ | - | - | - | 93 | - | - | - | - | - | - | - | - |
| | | | 1688 | 1980 | 1688 | 2247 | 1873 | 1737 | 1775 | 1815 | 1430 | 1516 | 1781 | 1789 |

*** සාමාන්‍ය උපාධි ප්‍රදානෝත්සවය 2017 (2016 උපාධි පිරිනැමීම්)**
**** සාමාන්‍ය උපාධි ප්‍රදානෝත්සවය 2018 (2017 උපාධි පිරිනැමීම්)**

**(b) පශ්චාත් උපාධි**

| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | බඳවා ගැනීම් (ශිෂ්‍ය සංඛ්‍යාව) | | සම්පූර්ණ කළ සිසුන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | | | **2017** | **2018** | **2017 *** | **2018 **** |
| ශාස්ත්‍ර | ප.උ. ඩිප් | ඉ | 100 | 169 | 30 | 16 |
| | ශාස්ත්‍රපති | ඉ | 479 | 987 | 263 | 230 |
| | දර්ශනපති | ඉ | 95 | 166 | 01 | - |
| | දර්ශනසූරි | ඉ | 05 | 07 | 09 | 02 |
| | | | | | | |
| අධ්‍යාපන | ප.උ. ඩිප්. | ඉ | 2172 | 1183 | 143 | 217 |
| | ශාස්ත්‍රපති | ඉ | 87 | 150 | 38 | 34 |
| | දර්ශනපති | ඉ | 108 | 91 | 07 | 05 |
| | දර්ශනසූරි | ඉ | 13 | 33 | - | 05 |
| | | | | | | |
| නීති | ප.උ. ඩිප් | ඉ | - | - | - | - |
| | ශාස්ත්‍රපති | ඉ | 166 | 166 | 18 | 138 |
| | දර්ශනපති | ඉ | - | 08 | - | 02 |
| | දර්ශනසූරි | ඉ | - | 09 | - | 02 |
| | | | | | | |
| කළ.හා මූල්‍ය | ප.උ. ඩිප් | ඉ | 39 | 36 | - | 10 |
| | ශාස්ත්‍රපති | ඉ | 333 | 251 | 270 | 303 |
| | දර්ශනපති | ඉ | 44 | 27 | 03 | - |
| | දර්ශනසූරි | ඉ | - | - | - | - |
| | | | | | | |
| වෛද්‍ය | ප.උ. ඩිප් | ඉ | 63 | 103 | 27 | 51 |
| | ශාස්ත්‍රපති | ඉ | 30 | 132 | 10 | 05 |
| | දර්ශනපති | ඉ | 08 | 09 | 02 | - |
| | දර්ශනසූරි | ඉ | 17 | 02 | 03 | 07 |
| | | | | | | |
| විද්‍යා | ප.උ. ඩිප් | ඉ | 13 | 36 | 66 | 37 |
| | ශාස්ත්‍රපති | ඉ | 518 | 499 | 145 | 89 |
| | දර්ශනපති | ඉ | 123 | 14 | 03 | 05 |
| | දර්ශනසූරි | ඉ | 51 | 08 | 09 | 11 |
| | | | | | | |
| පශ්.උ.අ. | ප.උ. ඩිප් | ඉ | 890 | 697 | 266 | 176 |
| | ශාස්ත්‍රපති | ඉ | 1042 | 1697 | 277 | 380 |
| | දර්ශනපති | ඉ | - | 14 | 04 | 10 |
| | දර්ශනසූරි | ඉ | 255 | 216 | 11 | 17 |

* 2017 පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවය (උපාධි පිරිනැමීම් -2016)

** 2018 පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවය (උපාධි පිරිනැමීම් -2017)

### 3.3 විදේශ ශිෂ්‍යයන් පිළිබඳ විස්තර:

| පීඨය | පාඨමාලාව | මාධ්‍යය | බඳවා ගැනීම් | | පළමු වසර සිසුන් | | දෙවන වසර සිසුන් | | තෙවන වසර සිසුන් | | සිවුවන වසර සිසුන් | | උපාධිලත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 |
| කළමනාකරණ හා මූල්‍ය | ව්‍යා. පරිපාලනවේදී | ඉ | | | - | - | 04 | - | 02 | - | - | - | - | - |
| වෛද්‍ය | වෛද්‍ය | I | 10 | 15 | 09 | 10 | 08 | 09 | 07 | 09 | 09 | 07 | 10 | 01 |
| විද්‍යා | ජෛවීය විද්‍යා | ඉ | | | 01 | - | 01 | - | 01 | - | - | - | - | - |
| | අණුක ජීව විද්‍යාව හා ජෛව රසායන විද්‍යාව | ඉ | | | - | - | - | - | 01* | - | - | - | - | - |
| | භෞතික වි. | ඉ | | | - | 01 | - | 01 | 01 | - | 01* | - | - | - |
| නීති (විදේශ වර්ගය යටතේ ශ්‍රී ලාංකික ශිෂ්‍යයෙකි) | | | | | - | - | - | - | 02 | - | - | 02 | - | - |
| | | | | | | | | | | | | | | |
| **එකතුව** | | | **10** | **15** | **10** | **11** | **13** | **10** | **14** | **08** | **10** | **09** | **-** | **-** |

*තාවකාලිකව අක්‍රියව පවතී.

### 3.4 පත්වීම් සහ කාර්ය මණ්ඩල තොරතුරු

පත්වීම්

2018 වසර තුළ අධ්‍යයන, අධ්‍යයන සහායක, පරිපාලන මූල්‍ය සහ වෙනත් පරිපාලන ශ්‍රේණිවල නව පත්වීම් 77 ක් ලබා දෙන ලදී.

| | |
|---|---|
| අධ්‍යයන | - 62 |
| අධ්‍යයන සහායක | - 09 |
| පරිපාලන හා මූල්‍ය | - 06 |
| වෙනත් පරිපාලන | - 00 |

**කාර්ය මණ්ඩල වෙනස්වීම්**

2018 වසරේදී සිදුකරන ලද මුළු පත්වීම්, ස්ථිර කිරීම්, උසස් කිරීම් ස්ථානමාරු හා අනෙකුත් කාර්ය මණ්ඩල වෙනස් කිරීම් පහත උපලේඛනයෙහි දැක්වේ.

**කාර්ය මණ්ඩල වෙනස්වීම්**

| සිදුවීම | අධ්‍යයන | අධ්‍යයන සහායක | පරිපාලන සහ මූල්‍යය | පරිපාලන වෙනත් |
|---|---|---|---|---|
| නව පත්වීම් | 62 | 09 | 06 | |
| ස්ථිරවීම් | 26 | - | - | |
| උසස්වීම් | 59 | - | 04 | |
| ස්ථානමාරු | 00 | - | 03 | |
| සේවා දිගු | 03 | - | - | |
| නිදහස්කිරීම් | 01 | 01 | - | |
| විශ්‍රාමයාම් | 15 | 01 | - | |
| ඉල්ලා අස්වීම් | 05 | 01 | - | |
| තනතුරු හිස්වීම් | 01 | - | - | |
| සේවා අවසන්කිරීම් | 01 | - | - | |
| නෙරපීම් | 00 | - | - | |
| සප්තවර්ෂික නිවාඩු | 39 | - | 03 | |
| අධ්‍යයන නිවාඩු | 25 | - | - | |
| අධ්‍යයන නිවාඩු දිගු | 52 | - | - | |
| සම්මන්ත්‍රණ /පුහුණු වැඩසටහන් | 377 | - | - | |
| විවේක නිවාඩු | 229 | 06 | 17 | 01 |
| වෛද්‍ය නිවාඩු | 14 | 04 | - | |
| අඩ වැටුප් නිවාඩු | 00 | - | - | |
| වැටුප් රහිත නිවාඩු | 15 | - | - | |
| සප්තවර්ෂික නිවාඩුවලින් පසු පැමිණීම් | 16 | - | - | |
| අධ්‍යයන නිවාඩුවලින් පසු පැමිණීම් | 32 | 01 | - | |
| විශේෂ නිවාඩු | 00 | - | - | |
| සේවයෙන් නිදහස්කිරීම් | 01 | - | - | |
| මරණ | 00 | - | - | |
| එකතුව | 973 | 23 | 33 | 01 |

**II-01:**වගුව

**II-02** වගුව **: විශ්වවිද්‍යාලයේ ස්ථිර අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය.** (පීඨය සහ ශ්‍රේණිය අනුව වර්ග කර ඇත)

| සේවා ස්ථානය / පදවිය | සාමාන්‍ය පරිපාලනය | | ශාස්ත්‍ර | | අධ්‍යාපන | | නීති | | කළ. හා මූල්‍ය | | වෛද්‍ය | | විද්‍යා | | තාක්ෂණ | | ගෙද | | පුස්තකාලය | | ශාරීරික අධ්‍යාපන | | ශිෂ්‍ය හා සේවක සුබසාධන | | කා.ම.සං.ම. | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ස් | ඵ | ස් | ඵ | ස් | ඵ | ස් | ඵ | ස් | ඵ | ස් | ඵ | ස් | ඵ | ස් | ඵ | ස් | ඵ | ස් | ඵ | ස් | ඵ | ස් | ඵ | ස් | ඵ | ස් | ඵ |
| අධ්‍යක්ෂ | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | | | 2 | 7 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 6 | 8 | 7 | 14 | 0 | 1 | | | | | | | | | | | **16** | **31** |
| මහාචාර්ය | | | 5 | 17 | 0 | 0 | 5 | 6 | 1 | 5 | 16 | 34 | 4 | 12 | 0 | 0 | | | | | | | | | | | **31** | **74** |
| සහාය මහාචාර්ය | | | 1 | 2 | 1 | 2 | 0 | 0 | 0 | 2 | 2 | 5 | 1 | 3 | 0 | 0 | | | | | | | | | | | **05** | **14** |
| ජ්‍යෙ. කථිකාචාර්ය (I ශ්‍රේණිය සහ II ශ්‍රේණිය | | | 35 | 70 | 6 | 14 | 5 | 11 | 22 | 46 | 34 | 62 | 29 | 60 | 4 | 9 | 4 | 6 | | | | | | | | | **139** | **278** |
| ජ්‍යෙ. කථිකාචාර්ය (ස්ථිර නොවූ) /කථිකා. (ස්ථිර නොවූ ) | | | - | - | - | - | 2 | 2 | 6 | 08 | - | - | - | - | - | - | 0 | 1 | | | | | | | | | **08** | **11** |
| කථිකාචාර්ය | | | 9 | 16 | 4 | 4 | 4 | 5 | 1 | 1 | 2 | 4 | 2 | 4 | | | | | | | | | | | | | **22** | **34** |
| පරිවාස කථිකාචාර්ය | | | 24 | 36 | 7 | 14 | 18 | 19 | 12 | 17 | 29 | 44 | 13 | 16 | 3 | 4 | 1 | 1 | | | | | 1 | 1 | | | **108** | **152** |
| පර්යේෂණ නිලධාරි | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| ඉංග්‍රීසි උපදේශක | | | 2 | 4 | | | | | | | | | | | | | | | | | | | | | | | **02** | **04** |
| විශ්ලේෂණ රසායනඥ | | | | | | | | | | | | | 0 | 2 | | | | | | | | | | | | | **00** | **02** |
| විද්‍යාත්මක සහායක | | | | | | | | | | | 0 | 2 | 1 | 2 | | | | | | | | | | | 1 | 1 | **02** | **05** |
| ඉංජිනේරු ඉගෙනුම් සහායක | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| පුස්තකාලයාධිපති | | | | | | | | | | | | | | | | | | | 1 | 1 | | | | | | | **1** | **1** |
| නියෝජ්‍ය පුස්තාකාලයාධිපති | | | | | | | | | | | | | | | | | | | 1 | 1 | | | | | | | **1** | **1** |
| ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති ( Iශ්‍රේණිය සහ II ශ්‍රේණිය) | | | | | | | | | | | | | | | | | | | 6 | 7 | | | | | | | **6** | **7** |
| සහකාර පුස්තකාලයාධිපති | | | | | | | | | | | | | | | | | | | 5 | 7 | | | | | | | **5** | **7** |
| සමාජ වැඩ උපදේශක | | | | | | | | | | | 5 | 6 | | | | | | | | | | | | | | | **5** | **6** |
| පරිගණක තාක්ෂණ උපදේශක. | | | 1 | 2 | 1 | 1 | 1 | 1 | 2 | 3 | | | | | | | | | | | | | | | | | **5** | **7** |
| වැඩසටහන්කරු /පද්ධති විශ්ලේෂක | 1 | 2 | 1 | 1 | | | | | | | 2 | 2 | 1 | 1 | | | | | | | | | | | **0** | **1** | **5** | **7** |
| පරිගනක වැඩසටහන්කරු | | | | | | | | | | | | | | | | | | | 1 | 1 | | | | | | | **1** | **1** |
| ශාරීරික අධ්‍යාපන පිළිබඳ උපදේශක | | | | | | | | | | | | | | | | | | | | | 5 | 7 | | | | | **5** | **7** |
| වෘත්තීය මාර්ගෝපදේශක | | | | | | | | | | | | | | | | | | | | | | | 1 | 2 | | | **1** | **2** |
| සහකාර ශිෂ්‍ය උපදේශක | | | | | | | | | | | | | | | | | | | | | | | 1 | 1 | | | **1** | **1** |
| සහකාර ජාල කළමණාකරු | 0 | 1 | | | | | | | 0 | 1 | | | 0 | 1 | | | | | | | | | | | | | **0** | **3** |
| සහකාර සංඛ්‍යානඥ | 1 | 1 | | | | | | | | | | | | | | | | | | | | | | | | | **1** | **1** |
| එකතුව | **2** | **4** | **80** | **155** | **20** | **36** | **35** | **44** | **42** | **83** | **96** | **167** | **58** | **115** | **7** | **14** | **5** | **8** | **14** | **17** | **5** | **7** | **2** | **3** | **2** | **3** | **370** | **656** |

**විශ්වවිද්‍යාලයේ ස්ථිර පරිපාලන කාර්ය මණ්ඩලය.**

(පදවිය හා සේවා ස්ථානය අනුව වර්ග කර ඇත.)

| සේවා ස්ථානය / පදවිය | විද්‍යාල මන්දිරය | | ශාස්ත්‍ර | | අධ්‍යාපන | | නීති | | කළ. හා ශිල්ප | | වෛද්‍ය | | විද්‍යා | | ස.උ.අ. | | තාක්ෂණ | | ගෙද | | අතථ්‍ය ඩ.ඩ | | පුස්තකාලය | | වෛද්‍ය මොයස්. | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ස් | එ | ස් | එ | ස් | එ | ස් | එ | ස් | එ | ස් | එ | ස් | එ | ස් | එ | ස් | එ | ස් | එ | ස් | එ | ස් | එ | ස් | එ | ස් | එ |
| **පරිපාලන – සාමාන්‍ය** | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| ලේඛකාධිකාරී | 0 | 1 | | | | | | | | | | | | | | | | | | | | | | | | | **0** | **1** |
| නි. ලේඛකාධිකාරී | 0 | 2 | 0 | 1 | | | | | 1 | 1 | 0 | 1 | 1 | 1 | 0 | 1 | | | | | | | | | | | **2** | **7** |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | 4 | 6 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 1 | | | | | | | | | | | **7** | **10** |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (නීති) | 1 | 1 | | | | | | | | | | | | | | | | | | | | | | | | | **1** | **1** |
| සහකාර ලේඛකාධිකාරී | 4 | 5 | | | | | | | | | 1 | 2 | | | | | 1 | 1 | 1 | 1 | 0 | 1 | | | | | **7** | **10** |
| සහකාර ලේඛකාධිකාරී (නීති හා ප්‍රලේඛන) | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | **0** | **0** |
| සහකාර ලේඛකාධිකාරී (පුස්තකාල සේවා) | | | | | | | | | | | | | | | | | | | | | | | 0 | 1 | | | **0** | **1** |
| **පරිපාලන - මූල්‍ය හා විගණන** | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| මූල්‍යාධිකාරී | 1 | 1 | | | | | | | | | | | | | | | | | | | | | | | | | **1** | **1** |
| නියෝජ්‍යය මූල්‍යාධිකාරී | 0 | 2 | | | | | | | | | | | | | | | | | | | | | | | | | **0** | **2** |
| ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී | 5 | 8 | | | | | | | | | | | | | | | | | | | | | | | | | **5** | **8** |
| සහකාර මූල්‍යාධිකාරී | 3 | 3 | | | | | | | | | | | | | | | | | | | | | | | | | **3** | **3** |
| නියෝජ්‍ය අභ්‍යන්තර විගණක | 1 | 1 | | | | | | | | | | | | | | | | | | | | | | | | | **1** | **1** |
| ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක | 0 | 1 | | | | | | | | | | | | | | | | | | | | | | | | | **0** | **1** |

| | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සහකාර අභ්‍යන්තර විගණක | 0 | 0 | | | | | | | | | | | | | | | | | | | | | | | | | **0** | **0** |
| **පරිපාලන - වෙනත්** | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| ප්‍රධාන වෛද්‍ය නිලධාරී | | | | | | | | | | | | | | | | | | | | | | | | | 0 | 1 | **0** | **1** |
| විශ්වවිද්‍යාලයීය වෛද්‍ය නිලධාරී | | | | | | | | | | | | | | | | | | | | | | | | | | | **0** | **0** |
| වැඩ ඉංජිනේරු | 0 | 1 | | | | | | | | | | | | | | | | | | | | | | | | | **0** | **1** |
| උද්‍යාන භාරකරු (භූමි අලංකරණ /කෞතුකාගාර ) | 0 | 1 | | | | | | | | | | | 0 | 1 | | | | | | | | | | | | | **0** | **2** |
| ප්‍රධාන කාර්මික නිලධාරී | | | | | | | | | | | | | 1 | 1 | | | | | | | | | | | | | **1** | **1** |
| ජ්‍යෂ්ඨ කාර්මික නිලධාරී - කාර්යමණ්ඩල | | | | | | | | | | | 6 | 7 | 1 | 2 | | | | | | | | | | | | | **7** | **9** |
| උපකුලපති පෞද්ගලික ලේකම් | 1 | 1 | | | | | | | | | | | | | | | | | | | | | | | | | **1** | **1** |
| එකතුව | **20** | **34** | **0** | **1** | **1** | **1** | **1** | **1** | **1** | **1** | **8** | **11** | **3** | **5** | **0** | **2** | **1** | **1** | **1** | **1** | **0** | **1** | **0** | **1** | **0** | **1** | **36** | **61** |

**II- 03** වගුව

**3.5 අනධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු**

| **පීඨය/ අංශය** | **ජ්‍යෙෂ්ඨතම** | **ජ්‍යෙෂ්ඨ** | **කණිෂ්ඨ** | **සුළු සේවක** | **එකතුව** |
|---|---|---|---|---|---|
| වෛද්‍ය පීඨය | 30 | 7 | 96 | 107 | **240** |
| නීති පීඨය | 2 | - | 8 | 7 | **17** |
| විද්‍යා පීඨය | 14 | 10 | 23 | 61 | **108** |
| ප.උ.අ. පීඨය | - | - | 5 | 3 | **8** |
| ශාස්ත්‍ර පීඨය | 6 | 4 | 25 | 27 | **62** |
| අධ්‍යාපන පීඨය | 2 | 1 | 6 | 7 | **16** |
| හෙද පීඨය | - | - | 4 | 4 | **8** |
| තාක්ෂණ පීඨය | 1 | - | 4 | 2 | **7** |
| කළමනාකරණ හා මූල්‍ය පීඨය | 0 | 1 | 17 | 10 | **28** |
| විද්‍යාල මන්දිරය | 11 | 6 | 120 | 89 | **226** |
| වෙනත් | 10 | 8 | 46 | 84 | **148** |
| නේවාසිකාගාර | 7 | 4 | 0 | 6 | **17** |
| **එකතුව** | **83** | **41** | **354** | **407** | **885** |

# 4 පර්යේෂණ හා ප්‍රකාශන පිළිබඳ තොරතුරු

නව පර්යේෂණ රැසක් කිරීම තුළින් පර්යේෂණ ක්ෂේත්‍රයේ සිය විශිෂ්ටත්වය රැක ගැනීමට කොළඹ විශ්වවිද්‍යාලය සමත් විය.

ප්‍රකාශන විශාල ප්‍රමාණයක් ප්‍රකාශනයට පත්කර ඇත. මේ අතර සංශෝධිත සඟරා, දේශීය සහ විදේශීය සඟරා, සාරසංක්ෂේප, තීසිස සහ නිබන්ධන, ඉදිරිපත් කිරීම් සහ සංනිවේදන වේ. ඒ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| පීඨය | **2016** | **2017** | **2018** |
|---|---|---|---|
| ශාස්ත්‍ර | 277 | 370 | 298 |
| අධ්‍යාපන | 48 | 35 | 25 |
| ප.උ.අ. | 56 | 41 | 51 |
| නීති | 43 | 26 | 30 |
| කළමනාකරණ | 79 | 60 | 45 |
| වෛද්‍ය | 236 | 123 | 446 |
| හෙද | - | 04 | 09 |
| විද්‍යා | 143 | 67 | 195 |
| තාක්ෂණ | - | 87 | 101 |
| **එකතුව** | **882** | **813** | **1200** |

දේශීය හා ජාත්‍යන්තර මට්ටමින් අරමුදල් නව පර්යේෂකයන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන්කර ඇති අතර එය ඉතා තරගකාරී බවකින් යුක්ත ඉල්ලුම් පත්‍ර සලකා බැලීමෙන් පමණක් ලබාගැනීමේ හැකියාව ඇත.

කොළඹ විශ්වවිද්‍යාලයට රජය මගින්ද ඒ සඳහා පර්යේෂණ දීමනාවක් වශයෙන් මිලියන 45ක මුදලක් වෙන්කර ඇත. එම අරමුදල මගින් පශ්චාත් උපාධි පර්යේෂණ ශිෂ්‍යත්ව, සහයෝගී පර්යේෂණ දීමනා, යටිතල පහසුකම් සංවර්ධන දීමනා, සුළු පරිමාණ දීමනා, අධ්‍යයන සංචාර දීමනා ( Travel Grants) හා විදේශීය දර්ශනසූරි උපාධි ප්‍රදානය කරන අතර, එමගින් තවදුරටත් විශ්වවිද්‍යාලයෙහි හා පීඨයෙහි පර්යේෂණ ක්‍රියාකාරකම් උසස් තත්ත්වයකට ළඟා කරගැනීමට අවශ්‍ය අවස්ථා උදාවනු ඇත.

උසස් අධ්‍යාපනයේ ඩිජිටල් ලෝකය සමඟ සම්බන්ධ වීම' යන තේමාව යටතේ කොළඹ විශ්ව විද්‍යාලයේ වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණය 2018 නොවැම්බර් 8 වන දින කොළඹ විශ්ව විද්‍යාලයේ දී පැවැත්විණි.

පීඨ ඔවුන්ගේ පර්යේෂණ සම්මන්ත්‍රණය / සම්මන්ත්‍රණ විශ්ව විද්‍යාල පර්යේෂණ සම්මන්ත්‍රණයට සමගාමීව පැවැත්වූ අතර සාරාංශ 205 ක් සම්මන්ත්‍රණ ක්‍රියාවලියට ඇතුළත් කරන ලදී.

"ඩිජිටල් ලෝකයේ මානව ශාස්ත්‍ර හා සමාජීය දියුණුව සඳහා ඇති අභියෝග සහ අවස්ථාවන්" යන තේමාවෙන් ශාස්ත්‍ර පීඨයේ ජාත්‍යන්තර සමුළුව 2018 නොවැම්බර් 8 සිට 9 දක්වා පැවැත්විණි.

කළමනාකරණ හා මූල්‍ය පීඨයෙහි 13 වන ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව (IRCMF) 2018 නොවැම්බර් 16 දින සාර්ථකව පවත්වන ලදී. අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වාතාවරණයක් තුළ ඔවුන්ගේ පර්යේෂණ පත්‍රිකා ගැන විවාද කිරීමට දේශීය කතුවරුන්ට ඔවුන්ගේ ජාත්‍යන්තර සගයින් හමුවීමට මෙම සමුළුව සුවිශේෂී වේදිකාවක් නිර්මාණය කළේය.

කොළඹ විශ්ව විද්‍යාලය විසින් සංවිධානය කරන ලද 2018 ජාත්‍යන්තර නීති පර්යේෂණ සමුළුව (අයිඑල්ආර්සී) 2018 නොවැම්බර් 16 සහ 17 යන දිනවල පැවැත්විණි. මෙම සමුළුව පීඨයෙහි 70 වන සංවත්සරයට සමගාමීව නීතිය පුනරාවර්ජනය : අභිමිවීමද නොදැනුවත්කමද නැත්නම් අහිංසකකමද? තේමාවෙන් පැවැත්විය.

2018 වසරෙහි පැවති 2017 පශ්චාත් උපාධි උළෙලෙහිදී පහත ආචාර්යවරු පර්යේෂණ විශිෂ්ටත්වය සඳහා වන උපකුලපති සම්මාන දිනා ගත්හ.

| | |
|---|---|
| ශාස්ත්‍ර පීඨය | මහාචාර්ය චන්ද්‍රසිරි නිරිඇල්ල |
| කළමනාකරණ හා මූල්‍ය පීඨය | ආචාර්ය පවිත්‍රා කෛලාසපති |
| වෛද්‍ය පීඨය | මහාචාර්ය දීපිකා ප්‍රනාන්දු |
| විද්‍යා පීඨය | මහාචාර්ය කේ එම් එන් ද සිල්වා |
| තාක්ෂණ පීඨය | ආචාර්ය ආර්.යූ.කේ. පියදාස |
| අයිබීඑම්බීබී | ආචාර්ය එස්. ආර්. සමරකෝන් |
| පීජීඅයිඑම් | ආචාර්ය ඒ. යූ. ජයතිලක |

## 5 ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල කටයුතු

මූල්‍යාධාර

මහපොළ ශිෂ්‍යයත්වය හා ශිෂ්‍යාධාර දීමනා යටතේ මූල්‍යමය ආධාර ශිෂ්‍යයන් සඳහා ලබා දුන් අතර, සියලුම පීඨ නියෝජනය වන පරිදි ඒ.ටී.එම්. යන්ත්‍ර මගින් මුදල් ලබාගැනීමේ පහසුවද සලසා තිබුණි.

**අ) මහපොළ ශිෂ්‍යත්වය**

මෙහි මාසික කප්පාදුව (සියලුම ශිෂ්‍යයන් සඳහා වූ මාසික විශ්වවිද්‍යාල ආධාරය රු.2450 බැගිනි) නවක ශිෂ්‍යයන් හා ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් සඳහා ප්‍රදානය කළ අතර 2018 වර්ෂයෙහි එහි තත්ත්වය පහත පරිදි වේ:

**මහපොළ ශිෂ්‍යත්වලාභීන් – 2018**

| මහපොළ ලාභීන්ට විශ්වවිද්‍යාල දායකත්වය ලෙස (රු.2450/-) ගෙවූ මුළු මුදල | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **2018** | ශිෂ්‍ය සංඛ්‍යා | ශාස්ත්‍ර | කළ. හා මූල්‍ය | නීති | වෛද්‍ය | විද්‍යා | භෞතවෛද්‍ය | භෙද | තාක්ෂණ | එකතුව |
| ජන. | 1949 | 3,226,650 | - | 1,085,350 | - | 374,850 | 88,200 | | | 4,775,050 |
| පෙබ. | 4086 | 9,741,200 | 7,621,950 | 8,364,300 | 3,934,700 | 6,147,050 | 4,091,500 | | | 39,900,700 |
| මාර්තු | 2307 | 1,259,300 | 1,180,900 | 1,075,550 | 5,982,900 | 362,600 | 61,250 | | | 9,922,500 |
| අප්‍රේල් | Vacation | | | | | | | | | |
| මැයි | 3311 | 7,717,500 | 3,630,900 | 4,806,900 | 1,827,700 | 2,962,050 | 196,000 | | | 21,141,050 |
| ජුනි. | 3478 | 2,168,250 | 1,594,950 | 1,653,750 | 8,496,600 | 930,100 | 78,400 | | | 14,922,050 |
| ජුලි | 3904 | 4,603,550 | 1,678,250 | 3,270,750 | 2,273,600 | 931,000 | 78,400 | | | 12,835,550 |
| අගෝ. | 6373 | 7,614,600 | 7,751,800 | 8,092,350 | 6,835,500 | 6,629,700 | 4,358,550 | 4,314,450 | 4,953,900 | 50,550,850 |
| සැප්. | 5125 | 4,223,800 | 2,467,150 | 1,719,900 | 2,770,950 | 1,359,750 | 129,850 | 61,250 | 262,150 | 12,994,800 |
| ඔක්. | 4954 | 4,179,700 | 3,523,100 | 1,663,550 | 2,329,950 | 1,315,650 | 115,150 | 51,450 | 259,700 | 13,438,250 |
| නොවැ. | | | | | | | | | | |
| දෙසැ. | - | - | - | - | - | - | - | - | | |
| **එකතුව** | **35,487** | **44,734,550** | **29,449,000** | **31,732,400** | **34,451,900** | **21,012,750** | **9,197,300** | **4,427,150** | **5,475,750** | **180,480,800** |

**III – 01** වගුව

සාමාන්‍යය හෝ කුසලතා පදනම් කරගෙන එක් ශිෂ්‍යයෙකු මාසිකව රු.2600/- හෝ රු.2550/- ලබාගත් අතර මාසිකව විශ්වවිද්‍යාලය මගින්ද රු.2450ක මුදලක් ප්‍රදානය කරන ලදි. එම නිසා, ඉහත සඳහන් කළ කාලයේදී එක් ශිෂ්‍යයෙකු මාසිකව සාමාන්‍යය හෝ කුසලතා පදනම් කරගෙන සම්පූර්ණයෙන් රු.5000/- හෝ 5050/- මුදලක් පිළිවෙලින් ලබාගන්නට විය.

**ආ) ශිෂ්‍යාධාර**

2018 වර්ෂයෙහි සම්පූර්ණ හෝ අර්ධ ශිෂ්‍යාධාර වශයෙන් එක් ශිෂ්‍යයෙකු රු.4000/- සිට 3900/- මුදලක් පිළිවෙලින් ලබාගත්හ. අදාල සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

**III – 02 වගුව – 2018 ශිෂ්‍යාධාරලාභීන්**

| ශිෂ්‍යාධාර ලෙස ගෙවූ මුලු මුදල රු | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **2018** | ශිෂ්‍ය සංඛ්‍යාව | ශාස්ත්‍ර | නීති | කළ. හා මූල්‍ය | විද්‍යා | වෛද්‍ය | භෞතවේද ය | භෙද | තාක්ෂණ | එකතුව |
| ජක. | 49 | - | 3,900 | - | 169,200 | - | 19,900 | - | - | 193,000 |
| පෙබ. | 182 | - | 1,042,800 | 165,900 | 239,600 | - | 19,900 | - | - | 1,468,200 |
| මාර්. | - | - | - | - | - | - | - | - | - | - |
| අප්‍රේල් | නිවාඩු | | | | | | | | | |
| මැයි | 203 | 353,100 | 3,900 | 237,500 | 302,500 | - | **19,900** | - | - | 916,900 |
| ජුනි | 203 | 353,100 | 3,900 | 201,700 | 224,100 | - | 19,900 | - | - | 802,700 |
| ජුලි | 207 | 401,100 | 19,500 | 237,400 | 283,100 | - | 19,900 | - | - | 961,000 |
| අගෝ. | 241 | 469,200 | - | 229,700 | 274,900 | - | 23,900 | 396,800 | 16,000 | 1,410,500 |
| සැප්. | 240 | 385,200 | - | 229,700 | 232,000 | - | 19,900 | 99,200 | 4,000 | 970,000 |
| ඔක්. | 245 | 385,200 | 3,900 | 459,200 | 296,000 | - | 19,900 | 123,200 | 4,000 | 1,291,400 |
| නො. | 246 | 1,660,400 | 3,900 | 506,600 | 480,000 | - | 39,800 | 396,800 | 16,000 | 3,103,500 |
| දෙසැ. | - | - | - | - | - | - | - | | - | |
| එකතු ව | **1816** | **4,007,300** | **1,081,800** | **2,267,700** | **2,501,400** | **-** | **203,000** | **1,016,000** | **40,000** | **11,117,200** |

**පීඨවල ශිෂ්‍ය සභා**

ශාස්ත්‍ර, අධ්‍යාපන, නීති, කළමනාකරණ හා මූල්‍ය, වෛද්‍ය හා විද්‍යා තම ශිෂ්‍ය සභාවල නිලවරණ පවත්වා ඇත.

**ශිෂ්‍ය සංගම්**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 115 හා 116 යන වගන්ති ප්‍රකාරව පාලක සභාවේ සම්මුතිය සමග ශිෂ්‍ය සංගම් හා වෙනත් සමිති පිළිගැනීම සිදු වනු ඇත. සමාලෝචිත වසර තුළ විශ්වවිද්‍යාලයෙහි ශිෂ්‍ය සංගම් හා වෙනත් සමිති තිස් පහක් (35) ක් ක්‍රියාත්මක විය.

**ප්‍රථම උපාධි අපේක්ෂක සිසුන් සඳහා නේවාසිකාගාර ලබා දීම**

දැනට විශ්වවිද්‍යාලය සතුව ස්ථිර නේවාසිකාගාර නවය (9) ක් පවතින අතර ඉන් 3ක් තාවකාලික පෞද්ගලික අයිතිය ඇති නිවාස වේ. වසර තුළ දී විශ්වවිද්‍යාලය විසින් ඒවායේ නේවාසිකාගාර පහසුකම් ලබා දී ඇති ශිෂ්‍ය සංඛ්‍යාවල වගුව **iii** 03 සහ **iii** 04 හි දැක්වෙයි.

**විශ්වවිද්‍යාල නේවාසිකාගාරවල සිටින සිසුන් – 2018**

| පීඨය / නේවාසිකාගාරය | ශාස්ත්‍ර | නීති | කළ. හා මූල්‍ය | වෛද්‍ය | විද්‍යා | එකතුව |
|---|---|---|---|---|---|---|
| බ්ලොම්ෆොන්ටේන් පිරිමි | - | - | - | 388 | - | 388 |
| බුලර්ස් කාන්තා | 277 | 41 | 63 | - | 15 | 396 |
| ද සේරම් කාන්තා | - | - | - | 249 | - | 249 |
| ද සේරම් කාන්තා (නව) | 141 | 74 | 54 | - | 25 | 294 |
| හැව්ලොක් කාන්තා | 234 | 28 | 34 | 21 | 05 | 322 ** |
| කිත්‍යාකර පිරිමි | 140 | 18 | 97 | - | 40 | 295 * |
| මුත්තයියා කාන්තා | 250 | 87 | 86 | 13 | 25 | 461 |
| තෙලවල කාන්තා | 305 | 51 | - | - | 35 | 391 |
| හේවා මාවත | 08 | - | - | - | 14 | 22 *** |
| **එකතුව** | **1355** | **299** | **334** | **671** | **159** | **2818** |

**III – 03 වගුව**

* සිදුවන අලුත්වැඩියා කටයුතු නිසා කිත්‍යාකර නේවාසිකාගාරයේ සිසුන් 190 දෙනෙකුට නේවාසික පහසුකම් ලබාදීමට නොහැකි වී ඇත. පවත්නා සම්පූර්ණ ඇඳන් සංඛ්‍යාව 394 කි.

** සිදුවන අලුත්වැඩියා කටයුතු නිසා හැවුලොක් නේවාසිකාගාරයේ සිසුන් 148 දෙනෙකුට නේවාසික පහසුකම් ලබාදීමට නොහැකි වී ඇත. පවත්නා සම්පූර්ණ ඇඳන් සංඛ්‍යාව 478 කි.

*** සිදුවන අලුත්වැඩියා කටයුතු නිසා හේවා මාවත නේවාසිකාගාරයේ සිසුන් 10 දෙනෙකුට නේවාසික පහසුකම් ලබාදීමට නොහැකි වී ඇත. පවත්නා සම්පූර්ණ ඇඳන් සංඛ්‍යාව 50 කි.

**කුලී පදනම මත ලබාගෙන ඇති ගොඩනැගිලිවල සිසුන් සඳහා නේවාසික පහසුකම් - 2018**

| පීඨය / නේවාසිකාගාරය | ශාස්ත්‍ර | නීති | කළ. හා මූල්‍ය | භෞතවේදය | විද්‍යා | එකතුව |
|---|---|---|---|---|---|---|
| ග්‍රීන් පාත් කොළඹ 07 ( භික්ෂු) | 20 | - | - | - | - | **20** |
| බොරලැස්ගමුව නිවාස (පිරිමි) | - | 6 | - | 16 | - | **22** |
| රාජගිරිය නිවාස (පිරිමි) | 45 | - | - | - | - | **45** |
| **එකතුව** | **65** | **6** | **-** | **16** | **-** | **87** |

**III – 04** වගුව

විශ්වවිද්‍යාල නේවාසිකාගාරවල ප්‍රථම උපාධි අපේක්ෂකයින් 2818 ක් සඳහාද කුලියට ගත් නිවාස වල ප්‍රථම උපාධි අපේක්ෂකයින් 87 ක් සඳහා ද නේවාසිකාගාර පහසුකම් ලබා දී ඇත. මේ අනුව දැන් 2905 දෙනෙකු සඳහා විශ්වවිද්‍යාලය මගින් නේවාසිකාගාර පහසුකම් සපයා තිබේ.

**නේවාසිකාගාර ශිෂ්‍යාධාර**
**නේවාසිකාගාර ශිෂ්‍යාධාරලාභීන් – 2018**

| 2018 | සිසුන් ගණන | ශාස්ත්‍ර | කළ. හා මූල්‍ය | විද්‍යා | භෙද | තාක්ෂණ | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| ජන. | - | - | - | - | - | - | - |
| පෙබ. | - | - | - | - | - | - | - |
| මාර්තු | - | - | - | - | - | - | - |
| අප්‍රේල් | - | - | - | - | - | - | - |
| මැයි | - | - | - | - | - | - | - |
| ජුනි | 176 | 432,000 | 100,000 | 380,000 | 120,000 | 664,000 | 1,696,000 |
| ජුලි | 176 | 216,000 | 20,000 | 76,000 | 60,000 | 332,000 | 704,000 |
| අගෝ. | 185 | 220,000 | 48,000 | 80,000 | 60,000 | 332,000 | 740,000 |
| සැප්. | 185 | 220,000 | 48,000 | 80,000 | 60,000 | 332,000 | 740,000 |
| ඔක්. | 185 | 220,000 | 48,000 | 80,000 | 60,000 | 332,000 | 740,000 |
| නොවැ. | 185 | 220,000 | 48,000 | 80,000 | 60,000 | 332,000 | 740,000 |
| දෙසැ. | 98 | - | - | - | 60,000 | 332,000 | 392,000 |
| එකතුව | **1190** | **1,528,000** | **312,000** | **776,000** | **480,000** | **2,656,000** | **5,752,000** |

**III – 05** වගුව

- නේවාසිකාගාර පහසුකම් නොමැතිකම හේතුවෙන් විශ්ව විද්‍යාලය නේවාසිකාගාරවල නවාතැන් නොගත් සුදුසුකම් ලත් සිසුන්ට නේවාසිකාගාර ශිෂ්‍යාධාර ලබා දෙයි. විශ්වවිද්‍යාලයෙන් නේවාසිකාගාර පහසුකම් ලබා දෙන තුරු එම සිසුන්ට රු. 4000 / - ක් ගෙවීම පාලක සභාව විසින් අනුමත කරන ලදී.
- ශාස්ත්‍ර, කළමනාකරණ හා විද්‍යා පීඨවල ඉහත සිසුන්ට නේවාසිකාගාර පහසුකම් සැලසූ අතර 01.12.2018 දින සිට නේවාසිකාගාර ශිෂ්‍යාධාර අත්හිටුවන ලදී.

**ශිෂ්‍යයන්ගේ නේවාසිකාගාර සහ නිවාසවල පරිභෝජන වියදම්**

**ශිෂ්‍යයන්ගේ නේවාසිකාගාර සහ නිවාසවල පරිභෝජන වියදම් / නිවාස – 2018**

| නේවාසිකාගාරය | නේවාසික සිසුන් ගණන | විදුලිය (රු.) | ජලය (රු.) | දූරකතන (රු.) | පුවත්පත් (රු.) |
|---|---|---|---|---|---|
| හැව්ලොක් කාන්තා | 322 | 1,492,638.00 | 1,539,942.06 | 24,116.94 | 53,990.00 |
| බුලර්ස් කාන්තා | 396 | 1,068,770.67 | 1,054,533.90 | 23,516.59 | 40,405.00 |
| මුත්තයියා කාන්තා | 461 | 1,461,530.00 | 1,123,176.41 | 28,778.91 | 233,140.00 |
| ද සේරම් කාන්තා - 215 | 249 | 1,229,004.00 | 1,101,131.47 | 31,992.92 | 44,920.00 |
| ද සේරම් කාන්තා (නව) - 220 | 294 | 814,028.20 | 832,471.20 | 25,699.58 | 31,350.00 |
| තෙලවල කාන්තා | 391 | 912,205.84 | 1,849,717.27 | 29,157.83 | 37,790.00 |
| කිත්යාකර පිරිමි | 295 | 1,137,942.30 | 1,082,138.62 | 26,341.80 | 114,750.00 |
| බ්ලොම්ෆොන්ටියම් පිරිමි | 388 | 2,362,076.60 | 1,494,881.10 | 21,058.37 | 49,430.00 |
| හේවා මාවත | 22 | 335,162.25 | 185,797.46 | 17,765.23 | 27,180.00 |
| 71/3 හා 71/4 ග්‍රීන් පාත් ( භික්ෂු) | 20 | 221,311.95 | 270,719.86 | 4,131.04 | 37,110.00 |
| බොරලැස්ගමුව නිවාස | 22 | 122,053.33 | 273,382.88 | 4,647.42 | 39,440.00 |
| රාජගිරිය නිවාස | 45 | 149,028.40 | 298,949.51 | - | 47,970.00 |
| **එකතුව** | **2905** | **11,305,751.54** | **11,106,841.74** | **237,206.63** | **757,475.00** |

**III – 06** වගුව

**ශිෂ්‍ය නිවාස සඳහා වාර්ෂික කුලිය – 2018**

| නේවාසිකාගාරය | වාර්ෂික කුලිය (රු.) |
|---|---|
| 71/3, ග්‍රීන් පාත්, කොළඹ 07 (භික්ෂු) | 3,900,000/- |
| බොරලැස්ගමුව නිවාස (පිරිමි) | 1,500,000/- |
| රාජගිරිය නිවාස | 3,900,000/- |
| **එකතුව** | **9,300,000/-** |

**III – 07** වගුව

**වෛද්‍ය රක්ෂණ ක්‍රමය**

2018 වසර සඳහා සෞඛ්‍ය සුබසාධන ක්‍රමය 01.03.2018 දින සිට ක්‍රියාත්මක වන පරිදි වසරක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී . එහි රක්ෂණ ක්‍රම 03ක් (ක්‍රමය I, II සහ III) වශයෙන් හා තවත් බොහෝ ප්‍රතිලාභ සහිත විය. මෙම රක්ෂණ ක්‍රමයට සම්බන්ධ වූ සාමාජිකයන්ගෙන් පළමු ක්‍රමය යටතේ රු. 150 ද දෙවැනි ක්‍රමය යටතේ රු. 400 ක් ද තෙවැනි ක්‍රමය යටතේ රු. 650 ක් ද මාසිකව අයකර ගැනේ.

ප්‍රතිලාභ පහත පරිදිය.:

| | I සැලසුම | II සැලසුම | III සැලසුම |
|---|---|---|---|
| බාහිර | 9,000/- | 18,000/- | 30,000/- |
| ශෛල්‍ය සහ රෝහල් ගාස්තු | 90,000/- | 180,000/- | 225,000/- |
| ඇස් කණ්නාඩි | 3,500/- | 5,500/- | 8,000/- |

**පූර්ව ළමාවිය සංවර්ධන/ දිවා සුරකුම් මධ්‍යස්ථානය**

2006.05.18 දින කොළඹ විශ්වවිද්‍යාලයේ සේවකයින්ගේ වයස අවුරුදු 2 1/2 ත් 12ත් අතර දරුවන් සඳහා විශ්වවිද්‍යාලය විසින් දිවා සුරකුම් මධ්‍යස්ථානයක් ස්ථාපනය කෙරිණි. එය බාහිර දරුවන් වෙනුවෙන් ද 2007 සිට විවෘත ව ඇත. 2018 වසර අවසාන වන විට පූර්ව ළමාවිය මධ්‍යස්ථානයේ ළමුන් 05 ක් සහ දිවාසුරකුම් මධ්‍යස්ථානයේ ළමුන් 48 ක් සිටිති. 2018 වනවිට මෙම මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය පෙර පාසල් ගුරුවරියකගෙන්, අභ්‍යාසලාභී ගුරුවරියකගෙන් හා දිවා සුරකුම් උපස්ථායකයකුගෙන් සමන්විතය.

**වාර ප්‍රවේශ පත්‍ර**

ප්‍රථම උපාධි අපේක්ෂකයන් සඳහා සහන මිලට විශ්වවිද්‍යාලය විසින් බස් සහ දුම්රිය වාර ප්‍රවේශ පත්‍ර ලබා දෙයි.(නේවාසික පහසුකම් නොලැබූ ශිෂ්‍යයන්ට දුම්රිය වාරප්‍රවේශ පත්‍ර ලබා ගැනීමට විශ්වවිද්‍යාලය අවසර ලබා දෙයි.)

**ශිෂ්‍යත්ව**

2018 වසර තුළ ශිෂ්‍ය හා කාර්ය මණ්ඩල අංශය විසින් පහත ශිෂ්‍යත්ව පිරිනමන ලදී.

1. අධ්‍යාපන වෘත්තිකයන්ගේ සකසුරුවම් හා ණයදෙන සමිතිය - සිසුන් 134
2. මිට්සුබිෂි කෝපරේෂන් ඉන්ටනැෂනල් - සිසුන් 15
3. මිට්සුබිෂි UFJ පදනම (ජා.අ.අ. ඒකකය) - සිසුන් 17
4. රජයේ නිලධාරීන්ගේ ප්‍රතිලාභ සංගමය - සිසුන් 06

**ලැප්ටොප් පරිගනක ණය**

අමාත්‍යංශය විසින් විශ්වවිද්‍යාල සිසුන්ට ලැප්ටොප් පරිගනක මිලදී ගැනීමට ලබාදුන් පොළී රහිත ණය පහසුකම (රු. 75,000/-) 2018 වසරේද සියලුම පීඨ සඳහා ලබා දුනි.

**ආපන ශාලා**

විශ්වවිද්‍යාලයෙහි ආපන ශාලා 13 ක් සහ කිරි අලෙවිහල් 03 ක් ඇත. ඉන් හයිලන්ඩ් කිරි අලවිහල සී/ස මිල්කෝ පෞද්. ආයතනයට අයත්වේ. විශ්වවිද්‍යාලය විසින් සී/ස මිල්කෝ පෞද්. ආයතනයෙන් මාසික කුලී වශයෙන් හා පරිභෝජනය කරන විදුලිය වෙනුවෙන් 01.09.2016 දින සිට මුදල් අය කර ගනී.

සෑම **ආපන ශාලාවකින්ම** මාසික කුලිය ලෙස රු. 1000/- ක් හා විදුලි ගාස්තු ලෙස රු.5000/- ක් මාසිකව අයකර ගැනේ.

**ඡායා පිටපත් සේවය**

එක් එක් පීඨවල සහ ප්‍රධාන පුස්තකාලය ද ඇතුළත්ව ඡායා පිටපත් සේවා ස්ථාන 09 ක් පවතී. එක් එක් කොන්ත්‍රාත් කරුගෙන් මාසික කුලිය වශයන් රු.8000, විදුලි බලය වෙනුවෙන් රු. 5000 ක් සහ අතිරේක ඡායා පිටපත් යන්ත්‍රයක් සඳහා රු.1500 වශයෙන් ගාස්තු අය කෙරේ.

## 6 ප්‍රාග්ධන කාර්ය හා සැලසුම්

**හැඳින්වීම**

2018 වර්ෂයේදී ප්‍රාග්ධන කාර්යයන් හා ක්‍රම සම්පාදන පිළිබඳ ශාඛාව විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන් පහත පරිදි වර්ග කෙරේ.

I. 2016 වර්ෂයේදී ආරම්භ වී ඉදිරියට ක්‍රියාත්මක වෙමින් පවතින ගොඩනැගිලි සම්බන්ධ ව්‍යාපෘති
II. 2017 වර්ෂයේදී ආරම්භ වී ඉදිරියට ක්‍රියාත්මක වෙමින් පවතින ගොඩනැගිලි සම්බන්ධ ව්‍යාපෘති
III. 2018 වර්ෂයේදී ආරම්භ වී ඉදිරියට ක්‍රියාත්මක වෙමින් පවතින ගොඩනැගිලි සම්බන්ධ ව්‍යාපෘති
IV. 2019 වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිත ව්‍යාපෘති
V. කැබිනට් අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂිත ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂය නව හා කෙරෙමින් පවතින ගොඩනැගිලි ව්‍යාපෘතීන් දහයක් ක්‍රියාත්මක වෙමින් පවතී.

I. 2016 වර්ෂයේදී ආරම්භ වී ඉදිරියට ක්‍රියාත්මක වෙමින් පවතින ගොඩනැගිලි සම්බන්ධ ව්‍යාපෘති

a) කොළඹ විශ්වවිද්‍යාලයෙහි පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයෙහි මහල් හතකින් යුක්ත යෝජිත ඉදිකිරීමේ ගොඩනැගිල්ල - තෙවන අදියර

මූල්‍යමය අයෝජනය රු. මිලියන.262.9 (ලබාදුන් මුදල – VAT හැර )

II. 2017 වර්ෂයේදී ආරම්භ වී ඉදිරියට ක්‍රියාත්මක වෙමින් පවතින ගොඩනැගිලි සම්බන්ධ ව්‍යාපෘති.

a. කොළඹ 08 කින්සි පාරේ අංක 25 ලිපිනයේ පිහිටි කොළඹ විශ්වවිද්‍යාලීය වෛද්‍ය පීඨයේ පූර්ව සායනික අධ්‍යයන අංශය, පුස්තකාලය, ආපන ශාලාව සහ ඉගැන්වීම් පහසුකම් සඳහා වන යෝජිත ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් නිමා කිරීම - ඉතිරි අදියර

මූල්‍යමය අයෝජනය රු. මිලියන 4707.6 (අනුමත මුදල- VAT හැර)

b. කළමනාකරණ සහ මූල්‍ය පීඨයේ බටහිර දිශා පරිශ්‍රයෙහි විශාලනය

මූල්‍යමය අයෝජනය රු. මිලියන 237 (අනුමත මුදල- VAT හැර).

c. විද්‍යා පීඨයෙහි සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන අංශය (DST) සඳහා යෝජිත සයමහල් ගොඩනැගිල්ල

මූල්‍යමය අයෝජනය රු. මිලියන 364.7(අනුමත මුදල- VAT හැර).

d. විද්‍යා පීඨ පරිශ්‍රයේ තොරතුරු හා අධ්‍යයන මධ්‍යස්ථානය

මූල්‍යමය අයෝජනය රු. මිලියන 516.5 (අනුමත මුදල- VAT හැර)

III. 2018 වර්ෂයේදී ආරම්භ වී ඉදිරියට ක්‍රියාත්මක වෙමින් පවතින ගොඩනැගිලි සම්බන්ධ ව්‍යාපෘති

a) කොළඹ විශ්වවිද්‍යාලීය තාක්ෂණ පීඨය පිහිටුවීම (අදියර-I).

ල්‍යමය අයෝජනය රු. මිලියන.1801.9 (අනුමත මුදල- VAT හැර)

b) කොළඹ විශ්වවිද්‍යාලීය විද්‍යා පීඨ පරිශ්‍රයේ යෝජිත ශිෂ්‍ය සේවා මධ්‍යස්ථානය

මූල්‍යමය අයෝජනය රු. මිලියන.381.5 (ලබාදුන් මුදල – VAT හැර).

IV. 2019 වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිත ව්‍යාපෘති

a) කොළඹ විශ්වවිද්‍යාලීය යෝජිත සුසාධ්‍යකාරක කලාපය සැලසුම් කිරීම හා ගොඩනැගීම (යෝජිත බහුකාර්ය පහසුකම් )

මූල්‍යමය අයෝජනය රු. මිලියන.530 (Original TCE)

b) ශාස්ත්‍ර පීඨයේ යෝජිත සත්මහල් ගොඩනැගිල්ල (යෝජිත නව කලා ගොඩනැගිලි පර්යන්තය -අදියර I)

මූල්‍යමය අයෝජනය රු. මිලියන 581 (Original TCE)

c) කොළඹ විශ්වවිද්‍යාලීය ශ්‍රීපාලි මණ්ඩපයේ ඉදිකිරීමට යෝජිත පරිපාලන ගොඩනැගිල්ල

මූල්‍යමය අයෝජනය රු. මිලියන 150 (Original TCE)

V. කැබිනට් අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂිත ව්‍යාපෘති

a) යෝජිත කොළඹ විශ්වවිද්‍යාලීය මහල් අටක නිවාස ගොඩනැගිලි සංකීර්ණය
   මූල්‍යමය අයෝජනය රු. මිලියන 530 (Original TCE)

b) කොළඹ විශ්වවිද්‍යාලීය තාක්ෂණ පීඨය පිහිටුවීම (අදියර II) – පියවර I
   මූල්‍යමය අයෝජනය රු. මිලියන 1150 (Original TCE)

c) කොළඹ විශ්වවිද්‍යාලීය විද්‍යා පීඨයේ ශාක විද්‍යා අධ්‍යයනාංශ ගොඩනැගිල්ලේ යෝජිත දිගුව (සත්මහල් ගොඩනැගිල්ල )
   මූල්‍යමය අයෝජනය රු. මිලියන. 416 (Original TCE)

d) නීති පීඨයේ ඉදිකිරීමට යෝජිත දස මහල් කලා ගොඩනැගිල්ල
   මූල්‍යමය අයෝජනය රු. මිලියන. 1633(Original TCE)

e) කොළඹ විශ්වවිද්‍යාලීය වෛද්‍ය පීඨයේ තනිමහල් මනෝවිද්‍යා ඒකක ගොඩනැගිල්ල දස මහල් සායනික විද්‍යා ගොඩනැගිල්ලක් බවට පත් කිරීම
   මූල්‍යමය අයෝජනය රු. මිලියන. 969 (Original TCE).

සියලුම ගොඩනැගිලි ව්‍යාපෘති සැලසුම්කරණ සහ සංවර්ධන කමිටුව විසින් නිරන්තරයෙන් අධීක්ෂණයට ලක්කරන ලදී.

**ප්‍රධාන ගොඩනැගිලි ව්‍යාපෘති සහ ඒවාහි නූතන තත්ත්වය**

කොළඹ විශ්වවිද්‍යාලයෙහි පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයෙහි මහල් හතකින් යුක්ත යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීම 2016 සැප්තැම්බර් මස ඇරඹුන අතර එය 2018 නොවැම්බර් අග භාගයේදී 98% ක් අවසන්ව තිබිණි.

කොළඹ විශ්වවිද්‍යාලීය වෛද්‍ය පීඨයේ පූර්ව සායනික අධ්‍යයන අංශයේ ඉතිරි අදියර (ශ්‍රවනාගාරය හැර පළමු මහලේ ගොඩනැගිලි කොන්ක්‍රීට් තට්ටුව දක්වා ගොඩනැගීම) 2017 ජූනි මස ඇරඹුන අතර එය 2020 මැද භාගයේදී අවසන් වීමට නියමිතය. නොවැම්බර් අග භාගය වනවිට මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 24% විය.

කළමනාකරණ සහ මූල්‍ය පීඨයේ බටහිර දිශා පරිශ්‍රයෙහි විශාලනය 2017 අගෝස්තු මස ඇරඹුන අතර 2019 අගෝස්තු මස අවසන් වීමට නියමිතය.නොවැම්බර් අග භාගය වනවිට මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 69.4% විය.

විද්‍යා පීඨයෙහි සංඛ්‍යාන විද්‍යා දෙපාර්තමේන්තුව සඳහා යෝජිත මහල් හයකින් යුක්ත ගොඩනැගිල්ල 2017 අගෝස්තු මස ඇරඹුන අතර 2019 අගෝස්තු මස අවසන් වීමට නියමිතය . නොවැම්බර් අග භාගය වනවිට මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 8% විය.

විද්‍යා පීඨ පරිශ්‍රයේ තොරතුරු හා අධ්‍යයන මධ්‍යස්ථානය 2017 නොවැම්බර් මස ඇරඹුන අතර 2019 නොවැම්බර් මස අවසන් වීමට නියමිතය. නොවැම්බර් අග භාගය වනවිට මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 10% විය.

කොළඹ විශ්වවිද්‍යාලීය තාක්ෂණ පීඨය පිහිටුවීම (අදියර 1) 2018 ජනවාරි මස අරඹන ලද අතර 2020 ඔක්තෝබර් වනවිට අවසන් වීමට නියමිතය. නොවැම්බර් අග භාගය වනවිට මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 2.5% විය.

කොළඹ විශ්වවිද්‍යාලීය විද්‍යා පීඨයේ ශිෂ්‍ය සේවා මධ්‍යස්ථානය 2018 අප්‍රේල් මස අරඹන ලද අතර 2020 අප්‍රේල් වනවිට අවසන් වීමට නියමිතය.

කොළඹ විශ්වවිද්‍යාලීය යෝජිත බහුකාර්ය සුසාධ්‍යකාරක කලාපය (Help Zone) සැලසුම් කිරීම හා ඉදිකිරීම සඳහා වන ලංසු ලේඛනයට කැබිනට් මණ්ඩලය විසින් පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවේ (SCAPC) අනුමැතිය 2018 ජුලි මස හිමිවිය. ඒ අනුව, 30.10.2018 වනදා ලංසු විවෘත කරන ලද අතර ලංසු ඇගයුම ක්‍රියාත්මක වෙමින් පවතියි.

කොළඹ විශ්වවිද්‍යාලීය ශ්‍රීපාලි මණ්ඩපයේ ඉදිකිරීමට යෝජිත පරිපාලන ගොඩනැගිල්ල " සඳහා වන ලංසු ලේඛනයට අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC) අනුමැතිය 2018 දෙසැම්බර් මස හිමිවූ අතර ලංසු නිකුත් කරන ලදී.

ශාස්ත්‍ර පීඨයේ යෝජිත සත්මහල් ගොඩනැගිල්ල (යෝජිත නව කලා ගොඩනැගිලි පර්යන්තය -අදියර I)"සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය 2018 සැප්තැම්බර් මස හිමිවූ අතර ප්‍රසම්පාදන කටයුතු අරඹන ලදී. ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත ආයෝජනය රු.මි.581 කි.

"යෝජිත කොළඹ විශ්වවිද්‍යාලීය මහල් අටක නිවාස ගොඩනැගිලි සංකීර්ණය" සඳහා වන ව්‍යාපෘති යෝජනාව 2017 මාර්තු මස දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම හරහා ජාතික සැලසුම්කරණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර විශ්වවිද්‍යාලය කැබිනට් අනුමැතිය අපේක්ෂාවෙන් පසුවේ. ඒ සඳහා ඇස්තමේන්තුගත ආයෝජනය රු.මි 530 කි.

කොළඹ විශ්වවිද්‍යාලීය තාක්ෂණ පීඨය පිහිටුවීම (අදියර II) – පියවර I සඳහා වන නවීකරණ ව්‍යාපෘති යෝජනාව 2018 ඔක්තෝබර් මස දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම හරහා ජාතික සැලසුම්කරණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර විශ්වවිද්‍යාලය කැබිනට් අනුමැතිය අපේක්ෂාවෙන් පසුවේ. ඒ සඳහා ඇස්තමේන්තුගත ආයෝජනය රු.මි. 1150 කි.

කොළඹ විශ්වවිද්‍යාලීය විද්‍යා පීඨ පරිශ්‍රයේ පවතින ශාක විද්‍යා අධ්‍යයනාංශ ගොඩනැගිල්ලේ යෝජිත දිගුව (සත්මහල් ගොඩනැගිල්ල ) ව්‍යාපෘති යෝජනාව 2018 ඔක්තෝබර් මස දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම හරහා ජාතික සැලසුම්කරණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර විශ්වවිද්‍යාලය කැබිනට් අනුමැතිය අපේක්ෂාවෙන් පසුවේ. ඒ සඳහා ඇස්තමේන්තුගත ආයෝජනය රු.මි. 416 කි.

"නීති පීඨයේ ඉදිකිරීමට යෝජිත දස මහල් කලා ගොඩනැගිල්ල" ව්‍යාපෘති යෝජනාව 2018 දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම හරහා ජාතික සැලසුම්කරණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර විශ්වවිද්‍යාලය කැබිනට් අනුමැතිය අපේක්ෂාවෙන් පසුවේ. ඒ සඳහා ඇස්තමේන්තුගත ආයෝජනය රු.මි 1633 කි.

කොළඹ විශ්වවිද්‍යාලීය වෛද්‍ය පීඨයේ තනිමහල් මනෝ චිකිත්සක ඒකකය දසමහල් සායනික විද්‍යා ගොඩනැගිල්ලක් බවට පත් කිරීම ව්‍යාපෘති යෝජනාව 2017 දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම හරහා ජාතික සැලසුම්කරණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර විශ්වවිද්‍යාලය කැබිනට් අනුමැතිය අපේක්ෂාවෙන් පසුවේ. ඒ සඳහා ඇස්තමේන්තුගත ආයෝජනය රු.මි. 969 කි.

## 7 අභ්‍යන්තර විගණනය

2018 වර්ෂය තුළ අභ්‍යන්තර විගණනය සාමාජිකයන් 07 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් සමන්විත විය. නියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරයෙක්, ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරයෙක්, කළමනාකාර සහකාරවරුන් සිව් දෙනෙක් සහ එක් කාර්යාල සහායකයෙක් ඊට ඇතුළත් වූහ.

2018 වසරේ දී , කොළඹ විශ්වවිද්‍යාලයේ විගණන කමිටුව සිව් වතාවක් රැස්වූ අතර අභ්‍යන්තර විගණන වාර්තාවලින් ඉස්මතු වූ කරුණු සහ රජයේ විගණන විමර්ශන පිළිබඳ කරුණු සාකච්ඡා කෙරිණි.

කොළඹ විශ්වවිද්‍යාලයේ අනෙකුත් ආයතනවල පැවති විගණන කමිටු රැස්වීම් පහත දැක්වේ.

| **ආයතනවල විගණන කමිටු රැස්වීම්** | **පැවැත්වූ රැස්වීම් ගණන** |
|---|---|
| දේශීය වෛද්‍ය ආයතනය | 4 |
| මානව සම්පත් අභිවර්ධන ආයතනය | 4 |
| වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 4 |
| ජීව රසායන, අණුක ජීවවිද්‍යා සහ ජීවතාක්ෂණවේද ආයතනය | 4 |
| ජාතික පුස්තකාල සහ තොරතුරු තාක්ෂණ ආයතනය | 4 |
| කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක පාසල | 4 |
| කෘෂි තාක්ෂණ සහ ග්‍රාමීය විද්‍යා ආයතනය | 3 |

**පහත සඳහන් කටයුතු සම්බන්ධව පූර්ව විගණන කටයුතු සිදුකරන ලදී.**

- ✓ විශ්වවිද්‍යාලයීය අර්ථ සාධක අරමුදල ආපසුගෙවීම
- ✓ විශ්‍රාම පාරිතෝෂික ගෙවීම
- ✓ වාර්ෂික වැටුප් වර්ධක ලබාදීම
- ✓ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ඉල්ලුම්පත්
- ✓ හිඟ වැටුප් ගෙවීම

**විගණන වාර්තා**

වර්ෂය තුළ විගණකාධිපති හා විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අභ්‍යන්තර විගණක වෙත පිටපත් සහිතව පහත විගණන වාර්තා භාරදෙන ලදී.

1. 2017 වසරේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ (IHRA) ප්‍රසම්පාදන කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
2. කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨ හා අධ්‍යයන ඒකකවල සිසුන්ට මහපොළ හා ශිෂ්‍යාධාර ලබාදීම පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
3. කොළඹ විශ්වවිද්‍යාලයේ අංක. KR 2293 දරන වාහනයට සිදුවූ හානිය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
4. කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයෙහි වහල අලුත්වැඩියා කරද්දී කුලියට ගත් යකඩ බටවලට ගාස්තු නොගෙවීම පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
5. කොළඹ විශ්වවිද්‍යාලයේ අකාර්යක්ෂම තත්වයන් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
6. කොළඹ විශ්වවිද්‍යාලයේ අතිකාල ගෙවීම් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
7. කොළඹ විශ්වවිද්‍යාලයේ පෞද්ගලික ලිපිගොනු පරීක්ෂාව පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
8. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIM) විශ්‍රාමික සේවකයන්ගේ වි.වි. අර්ථසාධක අරමුදල නිදහස් කිරීම පමාවීම පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
9. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIM) සුළු මුදල් අග්‍රිමය භෞතික සත්‍යාපනය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
10. දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ (IIM) වැටුප් නිරවද්‍යතාව පිළිබඳ පරීක්ෂාව
11. දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ (IIM) ජෙ.කථිකාචාර්ය ( I ශ්‍රේණිය) එන් වී පී රෝහිණී මහත්මියගේ වැටුප් නිරවද්‍යතාව පිළිබඳ පරීක්ෂාව
12. දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ (IIM) ජෙ.කථිකාචාර්ය ( I ශ්‍රේණිය) ආචාර්ය එම් අයි මනුදාගේ වැටුප් නිරවද්‍යතාව පිළිබඳ පරීක්ෂාව

13. 2017 වසරේ මුල් කාර්තුවෙහි ජීවරසායන විද්‍යා, අණුක ජීවවිද්‍යා සහ ජෛව තාක්ෂණවේද ආයතනයේ (IBMBB) විවිධ ගෙවීම් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
14. 2017 වසරෙහි ජීවරසායන විද්‍යා, අණුක ජීවවිද්‍යා සහ ජෛව තාක්ෂණවේද ආයතනයේ (IBMBB) හි මුදල් පොත හා බැංකු සැසඳුම් ප්‍රකාශය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
15. කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ ගිණුම් අංශයේ හා නේවාසිකාගාරවල තත්වය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
16. කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රීපාලි මණ්ඩපයේ සුළු මුදල් අග්‍රිමය භෞතික සත්‍යාපනය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
17. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ (IHRA) වාහන පරිහරණය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
18. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ (IHRA) පෞද්ගලික ලිපිගොනු පරීක්ෂාව පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
19. මානව සම්පත් අභිවර්ධන ආයතනයේ (IHRA) අත්තිකාරම් හා උපයෝගිතා පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
20. කොළඹ විශ්වවිද්‍යාලයේ පෞද්ගලික ලිපිගොනු පරීක්ෂාව පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
21. හැව්ලොක් නේවාසිකාගාරය පරීක්ෂාව පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
22. බ්ලොම්ෆොන්ටේන් නේවාසිකාගාරය පරීක්ෂාව පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
23. කොළඹ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සංගම් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
24. කොළඹ විශ්වවිද්‍යාලයේ උපයෝගිතා පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
25. කොළඹ විශ්වවිද්‍යාලයේ ගිවිසුම් කඩකිරීම් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
26. කොළඹ විශ්වවිද්‍යාලයේ ණය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
27. කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ ප්‍රසම්පාදන පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව (IARS)
28. කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ වවුචර් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව (IARS)
29. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIM) සුළු මුදල් අග්‍රිමය භෞතික සත්‍යාපනය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
30. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIM) වාහන පරිහරණය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
31. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIM) ප්‍රසම්පාදන පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
32. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIM) අත්තිකාරම් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
33. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ (PGIM) උපයෝගිතා පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
34. දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ (IIM) මොරගස්මුල්ල කාන්තා නේවාසිකාගාරය පරීක්ෂාව පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
35. දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ (IIM) ප්‍රසම්පාදන පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
36. ජාතික පුස්තකාල හා විඥාපන සේවා ආයතනයේ (NILIS) පෞද්ගලික ලිපිගොනු පරීක්ෂාව පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
37. ජාතික පුස්තකාල හා විඥාපන සේවා ආයතනයේ (NILIS) ප්‍රසම්පාදන පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
38. ජාතික පුස්තකාල හා විඥාපන සේවා ආයතනයේ (NILIS) ගෙවීම් වවුචර පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
39. ජාතික පුස්තකාල හා විඥාපන සේවා ආයතනයේ (NILIS) ණය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
40. ජාතික පුස්තකාල හා විඥාපන සේවා ආයතනයේ (NILIS) සුළු මුදල් අග්‍රිමය භෞතික සත්‍යාපනය පිළිබඳ විගණන වාර්තාව
41. ජෛවරසායන විද්‍යා, අණුක ජීවවිද්‍යා සහ ජෛව තාක්ෂණවේද ආයතනයේ (IBMBB) පෞද්ගලික ලිපිගොනු පරීක්ෂාව පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
42. ශ්‍රීපාලි මණ්ඩපයේ 2017 වවුචර් පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව
43. ශ්‍රීපාලි මණ්ඩපයේ 2017 ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ අභ්‍යන්තර විගණන වාර්තාව

**ගොඩනැගීම් ලිපිගොනු පිළිබඳ විගණන**

1. කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ නැගෙනහිර පර්යන්තයේ සිව්මහල් ගොඩනැගිලි දිගුවක් ඉදිකිරීම. (CWP/04/2015/Mgt/ Pts/01)
2. දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ (IIM) නඩත්තු වැඩපල වැඩි දියුණු කිරීම. (AAI/3/2017/03)
3. කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයට විශාල ගේට්ටු 2 ක් හා කුඩා ගේට්ටු 5ක් සැපයීම (MD/MR/C/94/2017)
4. අරුන්දතී ශාලාවේ ආලෝකකරණ පද්ධතිය වැඩිදියුණු කිරීම. (MD/MR/C/72/2015)
5. වෛද්‍ය පීඨයේ ව්‍යාධිවේද ගොඩනැගිල්ලේ ජලය එකතුවන පැත්ත ප්‍රතිසංස්කරණය කිරීම . (MD/MR/C/44/2016)
6. කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රධාන විදුලි පුවරුව (main electrical panel board) වැඩිදියුණු කිරීම. (MD/MR/C/54/2017)
7. කොළඹ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් අභිවර්ධන ආයතනයේ (IHRA) කාණු පද්ධතිය සම්බන්ධ කිරීම.(IHRA/AD/04/2017/Drainage)
8. කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ ඉහළ මහලේ සහ බිම් මහලේ වැසිකිළි ඒකක ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම (MD/MR/C/46/2015)
9. වෛද්‍ය පීඨයේ විභාග ඒකකයට යෝජිත වැඩිදියුණු කිරීම (MD/MR/C/08/2017)
10. කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ හා මූල්‍ය පීඨයේ ස්ථාන කීපයක් අලුත්වැඩියා කිරීම. (MD/MR/C/47/2017)
11. මරදාන පාරේ ඉදිකිරීමට යෝජිත ගොඩනැගිල්ලේ පයිලින් වැඩ කොන්ත්‍රාත්තුව පිරිනැමීම M/S සී/ස නවලෝක පයිලින් (පෞද්.) සමාගම (CWP/1/9/1-P-1)
12. දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ (IIM) රියදුරු විවේක කාමරය වැඩිදියුණු කිරීම (AAI/3/2017/09) ලීනස් ඉලෙක්ට්‍රිකල්ස්
13. බුලර්ස් මාවතේ පිහිටි සුජාතා ජයවර්ධන නේවාසිකාගාරයේ වැසිකිළි ඒකක ප්‍රතිසංස්කරණය ( වැසිකිළි 50ක් හා නාන කාමර 30 ) (UOC/MD/MR/B/71/2013)
14. දැනට පවතින නෙට් හවුස් (පටක රෝපිත පැළ තවාන) ව්‍යාප්ත කිරීම (IARS/AR/01/11/11/2017)
15. කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ පළමු මහලේ පරිගනක විද්‍යාගාරයට යෝජිත වැඩිදියුණු කිරීම (MD/MR/C/92//2017)
16. සත්ව විද්‍යා අධ්‍යයන අංශ ගොඩනැගිල්ලට යෝජිත නවීකරණය (MD/MR/C/10/2016)
17. සීමා තාප්පය දිගේ විහිදෙන කුණාටු දිය කාණුව(storm water drain) වැඩිදියුණු කිරීම (AA1/3/2017/04)
18. කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ දේශන ශාලා අංක 1, 2, 3 හා 4 හි සිවිලිම සැපයීම හා සවි කිරීම.
19. කාන්තා නේවාසිකාගාරය වැඩිදියුණු කිරීම (AA1/3/2017/06)
20. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ “D” ගොඩනැගිල්ලේ සෝපාන පතුවලක් සෑදීම හා යන්ත්‍ර කාමර රහිත මගී නිරීක්ෂණ විදුලි සෝපානයක් (electronic traction elevator) සැපයීම, ස්ථාපිත කිරීම, පරීක්ෂණයට ලක් කිරීම හා ක්‍රියාත්මක කිරීම ( (MD/MR/B/41/2016)
21. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ “B”ගොඩනැගිල්ලේ සෝපාන පතුවලක් සෑදීම හා යන්ත්‍ර කාමර රහිත මගී නිරීක්ෂණ විදුලි සෝපානයක් (electronic traction evaluator) සැපයීම, ස්ථාපිත කිරීම, පරීක්ෂණයට ලක් කිරීම හා ක්‍රියාත්මක කිරීම (MD/MR/C/42/2016)
22. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට ( A, B, C and D ගොඩනැගිලි) අකුණු සන්නායක පද්ධතියක් සැපයීම, ස්ථාපිත කිරීම හා නඩත්තුව (MD/MR/B/71/2016)

පහත සඳහන් කොළඹ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සංගම් පිළිබඳව මූල්‍ය විගණන අභ්‍යන්තර විගණනය විසින් සිදු කෙරිණි.

1. නීති පීඨ ශිෂ්‍ය සංගමය
2. බෞද්ධ සහෝදර සංගමය
3. මුස්ලිම් මද්ලිස් ශිෂ්‍ය සංගමය
4. වෛද්‍ය ශිෂ්‍ය හින්දු සංගමය
5. වෛද්‍ය පීඨ ශිෂ්‍ය සංගමය
6. කළමනාකරණ හා මූල්‍ය පීඨ ශිෂ්‍ය සංගමය
7. සමාජවිද්‍යා ශිෂ්‍ය සංගමය
8. වෛද්‍ය පීඨ හින්දු සංගමය
9. භෞතික විද්‍යා සංගමය- විද්‍යා පීඨය
10. රොටරැක්ට් ක්ලබ්- විද්‍යා පීඨය
11. බෞද්ධ ශිෂ්‍ය එකමුතුව
12. විද්‍යා පීඨ ශිෂ්‍ය සංගමය

13. සත්ව විද්‍යා හා පාරිසරික විද්‍යා ශිෂ්‍ය සංගමය
14. සංඛ්‍යාන කව ශිෂ්‍ය සංගමය
15. පීඨ සංගමය (Faculty Club)
16. වෛද්‍ය ශිෂ්‍ය බෞද්ධ සංගමය
17. ශාස්ත්‍ර පීඨ ශිෂ්‍ය සංගමය
18. එප්සිලන් ඩෙල්ටා විද්‍යා පීඨ ශිෂ්‍ය සංගමය
19. විද්‍යා සංගමය
20. උද්භිද විද්‍යා සංගමය
21. ගැවල් ක්ලබ් අවසන් ගිණුම්

**08. කොළඹ විශ්ව විද්‍යාලය විසින් විශ්ව විද්‍යාලයේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගවල සාරාංශය.**

**01 අරමුණ - ඉගැන්වීමේ හා ඉගෙනීමේ විශිෂ්ටත්වය ළඟා කර ගැනීම**

- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ අන්තර් ක්‍රියාකාරී ක්‍රම ප්‍රවර්ධනය කිරීම
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්පත් සඳහා පුළුල් ප්‍රවේශයක් ලබා දීම
- නවීන තාක්‍ෂණය තුළින් තොරතුරු සම්පත් වෙත ප්‍රවේශය ප්‍රවර්ධනය කිරීම
- පුස්තකාල සේවා සමඟ තොරතුරු තාක්ෂණය ඒකාබද්ධ කිරීම
- උපාධිධාරී ගුණාංග වැඩි දියුණු කිරීම සඳහා විශ්ව විද්‍යාල-කර්මාන්ත සහයෝගීතාව ඉහළ නැංවීම
- ප්‍රජා පාදක සේවා ඉගෙනුම් ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම
- පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා වරින් වර විෂයමාලා සමාලෝචනය කිරීම
- SLQF සමග සිතියම් වැඩසටහන්
- ජාතික හා ජාත්‍යන්තර ගැටළු පිළිබඳ පර්යේෂණ දිරිමත් කිරීම
- පීඨයේ පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධිධාරීන්ගේ සංඛ්‍යාව වැඩි කිරීම

**02 අරමුණ - පර්යේෂණ හා නවෝත්පාදනයන්හි විශිෂ්ටත්වය ළඟා කර ගැනීම**

- දිරිගැන්වීම් ලබා දෙමින් පර්යේෂණ දිරිමත් කිරීම
- ප්‍රථම උපාධි පාඨමාලා සමග පර්යේෂණ ඒකාබද්ධ කිරීම
- පශ්චාත් උපාධි පාඨමාලා සමග පර්යේෂණ ඒකාබද්ධ කිරීම
- පර්යේෂණ නිමැවුම් පුළුල් ලෙස ව්‍යාප්ත කිරීම සහතික කිරීම
- ජාතික හා ජාත්‍යන්තර ගැටළු පිළිබඳ පර්යේෂණ දිරිමත් කිරීම
- ජාතික හා ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණ / වැඩමුළු / සම්මන්ත්‍රණ සංවිධානය කිරීම
- පර්යේෂණ සංවර්ධනය සඳහා මධ්‍යස්ථානයක් සංවර්ධනය කිරීම
- ජාතික පර්යේෂණ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම

**03 අරමුණ - වැඩිදියුණු කළ යටිතල පහසුකම් සැපයීම**

- දේශන ශාලා / විද්‍යාගාර වැඩි දියුණු කිරීම හා නවීකරණය කිරීම
- පුස්තකාල අවකාශය නැවත අර්ථ දැක්වීම
- සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම
- ආබාධිත පුද්ගලයින් සඳහා පහසුකම් සැපයීම
- සෞඛ්‍ය මධ්‍යස්ථානයේ පහසුකම් වැඩි දියුණු කිරීම
- ආකර්ශනීය පීඨ පරිශ්‍රයන් සහිත භූමි අලංකරණය
- නවීන කාර්යාලීය ගෘහ භාණ්ඩ හා උපකරණ සමඟ කාර්යාලය වැඩි දියුණු කිරීම
- සිසුන් සඳහා නවාතැන් වැඩි දියුණු කිරීම
- ආපනශාලා පහසුකම් වැඩි දියුණු කිරීම (අවකාශය, සෞඛ්‍ය සම්පන්න ආහාර ආදිය)
- ශාරීරික හා මානසික යෝග්‍යතාව සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම
- බහු සංස්කෘතික, සමාජීය සහ බහු ආගමික සැමරුම් ප්‍රවර්ධනය කිරීම හා දිරිගැන්වීම
- කාර්ය මණ්ඩලය සහ සිසුන් / අධ්‍යයන හා අනධ්‍යයන අතර ක්‍රීඩා ඉසව් ප්‍රවර්ධනය කිරීම හා දිරිමත් කිරීම
- හරිත හා තිරසාර මුල පිරීම් ප්‍රවර්ධනය කිරීම

**04 අරමුණ - මානව ප්‍රාග්ධනය කළමනාකරණය කිරීම**

- නිපුණතා පූර්ණ අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම
- ශාස්ත්‍රීය විශිෂ්ටතා ඇති විශේෂඥයින්ගේ සංචිතයක් සෑදීම
- දැඩි තෝරා ගැනීමේ ක්‍රියාවලියක් තුළින් දක්ෂ අනධ්‍යයන කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීම
- වත්මන් සහ අනාගත කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම
- කාර්ය මණ්ඩල හඳුනාගැනීම්
- ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්ති පත්‍රිකා සකස් කිරීම

**05 අරමුණ - යහපාලනය සහතික කිරීම**

- ස්ථාපිත ක්‍රියා පටිපාටි හා රීති අනුව සාධාරණ හා විනිවිදභාවයකින් යුතුව සියලුම කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා පරිපාලන තනතුරු සඳහා පත් කිරීම සිදු කෙරේ.
- කාර්ය මණ්ඩලයේ උසස්වීම් ලබාදීම කාලෝචිත, විනිවිද පෙනෙන හා වගකිවයුතු ආකාරයකින් සිදු කෙරේ
- වැඩ සම්මතයන් සහතික කිරීම
- සිසුන් හා කාර්ය මණ්ඩලය සම්බන්ධ විනය කටයුතු වලදී සැලකිය යුතු හා කාර්ය පටිපාටික සාධාරණත්වය සහතික කෙරේ.
- විවිධ මට්ටම්වල මූල්‍ය හා මූල්‍ය නොවන තොරතුරු සැපයීමේ පවත්නා වාර්තාකරණ පද්ධතිය සංශෝධනය කිරීම
- මූල්‍ය මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීම
- පවත්නා දත්ත සමුදාය භාවිතයෙන් හැකි සෑම තැනකම කඩදාසි රහිත මූල්‍ය හා පරිපාලන පාලන ක්‍රමවේදයන් හඳුන්වා දීම

**06 අරමුණ - සමාජ වගකීම ඉටු කිරීම**

- ප්‍රජා සේවා වැඩසටහන් පැවැත්වීම
- පාසල් සිසුන් සඳහා අධ්‍යාපන වැඩසටහන් හඳුන්වා දීම
- රාජ්‍ය සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සමාජ සංවිධාන සමඟ කාර්ය මණ්ඩලයේ සහයෝගය
- රාජ්‍ය සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සමාජ සංවිධාන සමඟ සහයෝගයෙන් / හවුල්කාරිත්වයෙන් සමාජයට දායක වීම
- ජාතික වෘත්තීය සංවිධානවල කාර්ය මණ්ඩලය සම්බන්ධවීම
- ජාතික ප්‍රතිපත්ති සංවර්ධනය සඳහා පොත් සහ ප්‍රකාශන ලිවීම
- ජාතික ප්‍රතිපත්තිය පිළිබඳ උපදේශක මණ්ඩලවලට සහභාගී වීම

**07 අරමුණ - ගෝලීය දෘශ්‍යතාව සහතික කිරීම**

- ජාත්‍යන්තර හවුල්කරු සංවිධාන සොයා ගැනීම
- විදේශීය විශ්ව විද්‍යාල සමඟ කාර්ය මණ්ඩල හුවමාරුව
- විදේශීය විශ්ව විද්‍යාල සමඟ සිසුන් හුවමාරුව
- විදේශීය විශ්ව විද්‍යාල වලින් පශ්චාත් උපාධි ලබා ගැනීම
- කාර්ය මණ්ඩලයට ලැබෙන විදේශීය කෙටිකාලීන පුහුණුව
- ජාත්‍යන්තර සිසුන් ලබා ගැනීම
- ජාත්‍යන්තර ක්‍රීඩා සහ වෙනත් තරඟ සඳහා සහභාගී වීම
- ජාත්‍යන්තර සම්මන්ත්‍රණ / වැඩමුළු / පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමට අරමුදල් සැපයීම
- ජාත්‍යන්තර මධ්‍යස්ථාන පිහිටුවීම
- විදේශීය විශ්වවිද්‍යාලවල ස්ථානගත කිරීම් ලබා ගැනීමට විශ්ව විද්‍යාල උපාධිධාරීන් දිරිමත් කිරීම
- අධ්‍යයන / වෘත්තීය සංගම්වල ආයතනික සාමාජිකත්වය ලබා ගැනීමට දිරිමත් කිරීම
- ජාත්‍යන්තර අධ්‍යයන / වෘත්තීය සංගම්වල ආයතනික සාමාජිකත්වය ලබා ගැනීමට දිරිමත් කිරීම
- සම-සමාලෝචනය කරන ලද සුචිගත කරන ලද සඟරා සහ ජාත්‍යන්තරව පිළිගත් පොත් පරිච්ඡේද / පොත් වල ප්‍රකාශන ප්‍රවර්ධනය කිරීම
- පිළිගත් ජාත්‍යන්තර සඟරාවල කර්තෘ මණ්ඩලවල සේවය කිරීමට කාර්ය මණ්ඩලය දිරිමත් කිරීම
- ජාත්‍යන්තර සම්මන්ත්‍රණවල කථිකයන් වීමට ශාස්ත්‍රාලිකයින් දිරිමත් කිරීම
- විදේශීය විශ්වවිද්‍යාලවල සජ්ත වාර්ෂික තනතුරු දැරීමට දිරිගැන්වීම

## 9. සුදුසු සංවර්ධනය මත පදනම් වූ අනාගත ප්‍රක්ෂේපන වාර්තාවක්

පරිසරය ආරක්ෂා කිරීම සහ පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කිරීමට කොළඹ විශ්ව විද්‍යාලය සැලසුම් කරයි.

පාරිසරික ආරක්ෂාව සහ තිරසාර හරිත සංවර්ධනය ළඟා කර ගැනීමේ ඉලක්කය ඇතිව කොළඹ විශ්ව විද්‍යාලය, කොළඹ විශ්ව විද්‍යාලයේ පාරිසරික මුල පිරීම් මධ්‍යස්ථානය) CEI) පිහිටුවන ලදී .පාරිසරික මුල පිරීම් මධ්‍යස්ථානයේ අරමුණු පහත පරිදි වේ:

- 2020 වන විට හරිත මුල පිරීම් වලට අනුවර්තනය වූ හරිත විශ්ව විද්‍යාලයක් බවට පත්වීම
- විශ්ව විද්‍යාලය සඳහා නිසි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතියක් ඇති කිරීම
- විශ්වවිද්‍යාල පරිසරය ආරක්ෂා කිරීම සහ විශ්වවිද්‍යාල පරිශ්‍රය වඩාත් පරිසර හිතකාමී බවට පත් කිරීම
- විශ්ව විද්‍යාල ප්‍රජාව සහ විශ්ව විද්‍යාලයෙන් පිටත) පාසල් (පාරිසරික දැනුවත්භාවය ඇති කිරීම සහ හරිත ක්‍රියාකාරකම් සඳහා අන්‍යයන්ට සහාය වීම

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රජාව අතර පාරිසරික දැනුවත්භාවය ඇති කිරීම සඳහා බොහෝ රාජ්‍ය හා පෞද්ගලික බලධාරීන්ගේ / සංවිධානවල සහාය ඇතිව වැඩසටහන් ගණනාවක් සංවිධානය කිරීමට විශ්වවිද්‍යාලය සැලසුම් කරයි.

තවද, විශ්ව විද්‍යාල ආචාර්යවරුන් තිරසාර සංවර්ධනය හා පරිසරය හා ආපදා බලපෑම් තක්සේරු විශ්ලේෂණය සම්බන්ධයෙන් විවිධ පර්යේෂණ සිදු කර ඇති අතර මෙම පර්යේෂණවල ප්‍රතිඵල වාර්ෂික පර්යේෂණ සම්මන්ත්‍රණ සැසිවාරයට ඉදිරිපත් කෙරෙනු ඇත.

පාරිසරික තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම කොළඹ විශ්ව විද්‍යාලයේ ක්‍රමෝපායික සැලැස්ම 2019-2023 හි එක් පරමාර්ථයක් වන අතර එම අරමුණු යටතේ තිරසාර පාරිසරික මුලපිරීම් හඳුන්වා දීමට හා ක්‍රියාත්මක කිරීමට විශ්වවිද්‍යාලය කටයුතු කරනු ඇත .හරිත තිරසාර මුලපිරීම් ප්‍රවර්ධනය කිරීම සහ ජලය හා බලශක්තිය සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට ද විශ්වවිද්‍යාලය සැලසුම් කරයි.

2019 මාර්තු 13

විගණකාධිපති වෙත

**මූල්‍යමය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණ නියෝජනය**

94, කුමාරතුංග මුනිදාස මාවත, කොළඹ 03 ලිපිනයේ පිහිටි කොළඹ විශ්ව විද්‍යාලයේ 2018-12-31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන විගණනයට සහ 2018- 01-01 දින සිට 2018-12-31 දක්වා කාලයට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන, අදාළ සියලු අංශවලින්, මූල්‍ය තත්ත්වය, මෙහෙයුම්වල ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහයන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇත්ද යන්න පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා අපි මෙම ලිපිය සපයන්නෙමු. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්වය, මෙහෙයුම්වල ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහයන් පිළිබඳ සාධාරණ ඉදිරිපත් කිරීමකට අප වගකිව යුතු බව අපි තහවුරු කරමු.

මෙම ලිපියේ සමහර නිරූපණයන් සැලකියයුතු කරුණු වලට සීමා වේ. පවතින තත්වය යටතේ, මෙහි තොරතුරු මත යැපෙන සාධාරණ පුද්ගලයෙකුගේ විනිශ්චය වෙනස් කිරීමට හෝ මඟ හැරීම මගින් බලපෑම් කිරීමට ඉඩ ඇති ගිණුම් තොරතුරු මඟ හැරීමක් හෝ වැරදි ලෙස අර්ථ දැක්වීමක් සිදුවුවහොත් එම අයිතමයන්හි ප්‍රමාණය නොසලකා ඒවා සැලකිය යුතු කරුණු ලෙස සැලකේ.

විගණනයේදී ඔබට ඉදිරිපත් කරන ලද පහත දැක්වෙන නිරූපණයන් (විගණකාධිපති වාර්තාවේ දිනය අනුව) අපගේ දැනුම සහ විශ්වාසය අනුව උපරිම ලෙස අපි තහවුරු කරමු..

1. ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇති අතර පෙර වර්ෂයට අනුකූලව සකස් කර ඇත.

2. අප විසින් විගණකාධිපති වෙත සියලුම
   a) විගණකාධිපති විසින් ඉල්ලා සිටින ලද මූල්‍ය සටහන් හා වෙනත් තොරතුරු
   b) අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් හා අධ්‍යක්ෂ කමිටු රැස්වීම් වාර්තා සහ මෙතෙක් වාර්තා සකසනු නොලැබූ මෑතකාලීන රැස්වීම්වල සාරාංශ
   
   ලබා දී ඇත.

3. මූල්‍ය හෝ වෙනත් වාර්තාකරණ පිළිවෙත් වලට අනුකූල නොවීම හෝ අඩුපාඩු පිළිබඳව නියාමන ආයතනවලින් කිසිදු සන්නිවේදනයක් ලැබී නොමැත.

4. මූල්‍ය ප්‍රකාශනවල අඩස්ත ගිණුම් වාර්තා වල නිසි ලෙස සටහන් වී නොමැති ද්‍රව්‍යමය ගනුදෙනු නොමැත.

5. පහත සඳහන් අන්දමේ කිසිවක් සිදුව නැත:

   a) කළමනාකරණය හෝ අභ්‍යන්තර පාලනයෙහි සැලකිය යුතු භූමිකාවක් ඇති සේවකයින් සම්බන්ධ වංචාවක් හෝ
   b) මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇති කළ හැකි වෙනත් වංචාවක්

6. වත්කම් හා වගකීම්වල ධාරක වටිනාකමට හෝ වර්ගීකරණයට සැලකියයුතු තරම් බලපාන සැලසුම් හෝ අභිප්‍රායන් සමාගමට නොමැත.

7. ආයතනය හා ඍජු හෝ වක්‍ර ලෙස අභිලාෂී අධ්‍යක්ෂ මණ්ඩලයේ ඕනෑම සාමාජිකයෙකු අතර ඇති සියලුම ගිවිසුම් ඇමුණුම 1 හි දක්වා ඇත.

8. පහත කරුණු මූල්‍ය ප්‍රකාශනවල නිසි ලෙස සටහන් කර හෝ අනාවරණය කර ඇත:
   a) විකුණුම්, මිලදී ගැනීම්, ණය, මාරුවීම්, කල්බදු විධිවිධාන සහ ඇපකර ඇතුළුව අදාළ පාර්ශවීය ගනුදෙනු සහ අදාළ පාර්ශවයන්ගෙන් ලැබිය යුතු හෝ ගෙවිය යුතු මුදල්.
   b) සමාගම අවිනිශ්චිත වගකීමක් වන ලිඛිත හෝ වාචික ඇපකර

9. පහත සඳහන් අන්දමේ කිසිවක් සිදුව නැත:
   a) මූල්‍ය ප්‍රකාශනවල අවිනිශ්චිතතාවයක් ලෙස හෙළිදරව් කිරීම සඳහා සලකා බැලිය යුතු නීති හෝ රෙගුලාසි උල්ලංඝනය කිරීම් හෝ විය හැකි උල්ලංඝනයන්.
   b) අපගේ නීතිඥයා අපට උපදෙස් දී ඇති ප්‍රකාශ නොකළ හිමිකම් හෝ ලැබීමට ඉඩ ඇති හිමිකම් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය වීමක්
   c) උපචිත හෝ අනාවරණය කිරීමට අවශ්‍ය වන වගකීම් හෝ ලාභ හෝ අලාභ අවිනිශ්චිතතාවයන්.
   d) සංස්ථාවේ / මණ්ඩලයේ / අධිකාරියේ / සමාගමේ (අදාළ වන පරිදි) අඛණ්ඩ පැවැත්මෙහි හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇතිවිය හැකි සිදුවීම් හෝ කොන්දේසි වලට අදාළ සැලකියයුතු අවිනිශ්චිතතාවයක්

10. අනුකූල නොවීමකදී මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකියයුතු බලපෑමක් ඇති කළ හැකි කොන්ත්‍රාත් ගිවිසුම්වල සියලු අංශවලට ආයතනය අනුකූල වී ඇත.

අපගේ උපරිම දැනුම සහ විශ්වාසය අනුව, ශේෂ පත්‍රයේ දිනට පසුව මෙම ලිපියේ දැක්වෙන දිනය තෙක් ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශයේ ගැලපීම් හෝ අනාවරණය කිරීම් අවශ්‍ය වන කිසිදු සිදුවීමක් සිදුවී නොමැත.

.................................................. ..................................................

.............................. ..............................................

| | | |
|---|---|---|
| මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක | කේ.එස්.ටී. එස්. ජයසූරිය | කේ.ඒ. එස්. එඩිවඩ් |
| උපකුලපති | මූල්‍යාධිකාරී | ලේඛකාධිකාරී |

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්

1. ..............................................
   තිලක් කරුණාරත්න මහතා

2. ..............................................
   මහින්ද මඩිහහේවා මහතා

**කොළඹ විශ්වවිද්‍යාලය**

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| 2018 දෙසැම්බර් 31 දිනට | සටහන | 2018 (රු.) | 2017 (රු.) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා ඊට සමාන දෑ | 3 | 104,118,357 | 164,519,224 |
| සැපයුම් හා සේවා සඳහා අත්තිකාරම් | 4 | 624,583,147 | 619,231,238 |
| විවිධ අත්තිකාරම් | 5 | 16,113,245 | 10,047,844 |
| බඩු තොග හා කොටස් | | 62,222,017 | 45,120,281 |
| සුළු ණයකරුවන් | 6 | 1,239,881,941 | 1,062,844,394 |
| **සමස්ත ජංගම වත්කම්** | | **2,046,918,708** | **1,901,762,981** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| කාර්ය මණ්ඩලය සඳහා ණය සහ අත්තිකාරම් | 7 | 312,530,991 | 291,340,862 |
| සැපයුම් හා සේවා සඳහා අත්තිකාරම් | 4 | 528,151,119 | 37,841,015 |
| විවිධ අත්තිකාරම් | 5 | 602,763 | 2,356,180 |
| සුළු ණයකරුවන් | 6 | 458,456,665 | 18,437,347 |
| ආයෝජන | 8 | 2,196,490,465 | 2,239,759,942 |
| අස්පෘශ්‍ය වත්කම් | 9 | 52,811,277 | 42,557,764 |
| දේපළ, පිරියත හා උපකරණ | 10 | 41,218,075,994 | 40,868,904,588 |
| සිදුවෙමින් පවතින වැඩ | 11 | 2,245,312,664 | 1,641,038,942 |
| **සමස්ත ජංගම නොවන වත්කම්** | | **47,012,431,939** | **45,142,236,640** |
| **සමස්ත වත්කම්** | | **49,059,350,646** | **47,043,999,621** |
| **බැරකම්** | | | |
| **ජංගම බැරකම්** | | | |
| ගෙවිය යුතු ගිණුම් | 12 | 375,147,623 | 354,233,809 |
| නැවත ගෙවන තැන්පතු | 13 | 8,293,713 | 15,655,259 |
| ව්‍යාප්ත පාඨමාලාවලින් විලම්බිත ආදායම් | | 1,133,124,874 | 945,243,087 |
| පර්. ප්‍රදාන හා මධ්‍යස්ථානවලින් විලම්බිත ආදායම් | | 213,165,616 | 142,132,705 |

| | | | |
|---|---|---|---|
| **සමස්ත ජංගම බැරකම්** | | **1,729,731,826** | **1,457,264,859** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| ගෙවිය යුතු ගිණුම් | 12 | 199,726,438 | 71,011,293 |
| නැවත ගෙවන තැන්පතු | 13 | 10,861,697 | 20,429,650 |
| විශ්‍රාම ප්‍රතිලාභ ප්‍රතිපාදන | 14 | 562,244,959 | 588,053,735 |
| **සමස්ත ජංගම නොවන බැරකම්** | | **772,833,094** | **679,494,678** |
| **සමස්ත බැරකම්** | | **2,502,564,920** | **2,136,759,537** |
| **ශුද්ධ වත්කම්** | | **46,556,785,727** | **44,907,240,084** |
| **කොටස් / ශුද්ධ වත්කම්** | | | |
| **ප්‍රාග්ධනය** | | | |
| ප්‍රාග්ධන ප්‍රදාන වැය | | 5,514,832,600 | 4,463,452,011 |
| වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන | | 1,269,231,871 | 698,213,632 |
| තෑගි සහ ආධාර | 15 | 331,170,125 | 329,205,368 |
| | | **7,115,234,595** | **5,490,871,011** |
| **සමුච්චිත අරමුදල** | | | |
| පොදු සංචිත | | 19,004,980 | 19,004,980 |
| සමුච්චිත අතිරික්ත/ (හිඟ) | | (1,057,486,520) | (980,368,324) |
| වත්කම් ප්‍රත්‍යාගණන සංචිත | | 38,417,185,295 | 38,446,097,190 |
| **සමස්ත සමුච්චිත අරමුදල්** | | **37,378,703,755** | **37,484,733,846** |
| **සංචිත සහ සීමිත අරමුදල්** | | | |
| නම්කළ අරමුදල් | 16 | 1,706,460,042 | 1,616,999,050 |
| සීමිත අරමුදල් සහ ප්‍රදාන | 17 | 214,060,907 | 188,696,860 |
| පරිත්‍යාග අරමුදල් | 18 | 142,326,428 | 125,939,316 |
| **සමස්ත සංචිත සහ සීමිත අරමුදල්** | | **2,062,847,377** | **1,931,635,225** |
| **සම්පූර්ණ කොටස් / ශුද්ධ වත්කම්** | | **46,556,785,727** | **44,907,240,083** |

සැකසුම :......... ..............
..............................
ජී. එච්. ගාමිණී
නි. මූල්‍යාධිකාරී

සහතික කිරීම :............

කේ.එස්.ටී. එස් ජයසූරිය

මූල්‍යාධිකාරී

.................. ..........................

කේ.ඒ. එස්. එඩ්වඩ්

ලේඛකාධිකාරී

මෙම මූල්‍යමය ප්‍රකාශනය සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් වගකීම කොළඹ විශ්වවිද්‍යාලයේ පාලක සභා සාමාජිකයන් සතුවේ.

මෙම මූල්‍යමය ප්‍රකාශ පාලක සභා මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඒ වෙනුවන් අත්සන් තබන ලදි.

............ ..............................
මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක
උපකුලපති.

.................. ..........................
තිලක් කරුණාරත්න මහතා
පාලක සභා සමාජික

.....................
මහින්ද මඩිහහේවා මහතා
පාලක සභා සමාජික

**කොළඹ විශ්ව විද්‍යාලය**

**මූල්‍ය කාර්ය දර්ශන ප්‍රකාශය**

| 2018 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා | සටහන | 2018 (රු.) | 2017 (රු.) |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන | | 3,272,468,000 | 2,533,300,000 |
| ප්‍රතිසංස්කරණ පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන | | 105,993,603 | 72,637,239 |
| මහපොළ, ශිෂ්‍යාධාර සහ ශිෂ්‍යත්ව | | 324,751,700 | 291,872,673 |
| වෙනත් ආදායම් | 19 | 558,830,458 | 491,824,817 |
| උත්පන්න ආදායම් | 20 | 1,222,002,719 | 1,240,417,130 |
| **සමස්ත ආදායම** | | **5,484,046,479** | **4,630,051,859** |
| **වියදම්** | | | |
| පෞද්ගලික වැටුප් හා වේතන | 21 | 3,107,133,178 | 2,599,312,430 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 21 | 1,053,153,565 | 952,596,158 |
| මහපොළ, ශිෂ්‍යාධාර සහ ශිෂ්‍යත්ව වියදම | 21 | 324,751,700 | 291,872,673 |
| ක්ෂය හා ක්‍රමක්ෂය | | 571,037,545 | 484,860,817 |
| පාරිතෝෂික වියදම් | | 34,423,995 | 125,457,955 |
| ප්‍රතිසංස්කරණ පුනරාවර්තන වියදම් | 21 | 105,993,603 | 72,649,278 |
| ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් පාඩු | | 4,175,980 | 2,923,267 |
| **සමස්ත වියදම** | | **5,200,669,566** | **4,529,672,578** |
| **කාලසීමාව සඳහා වන අතිරික්තය/(හිඟ)** | | **283,376,912** | **100,379,281** |

**කොළඹ විශ්වවිද්‍යාලය**

**මූල්‍ය සංසරණ ප්‍රකාශය**

| **2018.12.31 න් අවසන් වූ වසර සඳහා** | **2018**<br>(රු.) | **2017**<br>(රු.) |
|---|---|---|
| **ක්‍රියාත්මක ක්‍රියාකාරකම්වලින් ජනිත/(වැයවූ) මූල්‍ය ප්‍රවාහ** | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් අතිරික්ත | 283,376,912 | 100,339,281 |
| **ගැලපුම්** | | |
| ක්ෂය | 571,037,545 | 484,860,817 |
| | (522,392,976) | (428,029,307) |
| පාරිතෝෂිත දීමනා වෙන්කිරීම | 34,423,995 | 125,457,955 |
| පොලී අදායම | (231,152,983) | (290,224,399) |
| උපලබ්දී නොවූ විදේශ විනිමය ලාභය | (5,813,119) | (363,760) |
| කල්බදු පොලී ගෙවීම් | 1,210,685 | 2,865,907 |
| වත්කම් බැහැර කිරීම්වලින් පාඩු | 4,175,980 | 2,923,267 |
| රජයේ ප්‍රදාන - පුනරාවර්තන ස්වරූපය | - | (140,222,792) |
| ප්‍රත්‍යාගණන වත්කම් | | (56,188,775) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර ක්‍රියාත්මක අතිරික්තය** | 134,866,040 | (198,581,806) |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | |
| ගබඩා සහ භාණ්ඩ තොගවල වැඩිවීම | (17,101,737) | (22,903,231) |
| වෙනත් ලැබිය යුතු ලැබීම්වල අඩුවීම/ වැඩිවීම | (63,093,819) | (667,028,694) |
| පෙර ගෙවුම්වල අඩුවීම/ වැඩිවීම | - | 390,753 |
| අත්තිකාරම්වල අඩුවීම/ වැඩිවීම | (40,492) | (675,430,567) |
| විලම්බිත ආදායම වැඩිවීම/අඩුවීම | 258,914,698 | 120,573,826 |
| උපචිත වියදම් අඩුවීම/ වැඩිවීම | - | (43,753,479) |
| ගෙවියයුතු තැන්පතු අඩුවීම/ වැඩිවීම | (16,929,499) | (478,529) |
| ගෙවියයුතු අඩුවීම/ වැඩිවීම | 142,304,798 | 129,836,926 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වල භාවිත මුදල් ප්‍රවාහ** | 438,919,989 | (1,357,374,801) |
| පාරිතෝෂික ගෙවීම් | (48,107,944) | (42,386,233) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වල භාවිත ශුද්ධ මුදල් ප්‍රවාහ** | 390,812,045 | (1,399,761,034) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වෙතින්/(භාවිත) මුදල් ප්‍රවාහ** | | |

| | | |
|---|---|---|
| ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම් | (391,482,771) | (437,991,068) |

| | | |
|---|---|---|
| කෙරෙමින් පවතින වැඩ | (739,142,455) | (452,013,492) |
| ආයෝජන වැඩිවීම් | (205,537,229) | (293,574,885) |
| ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ශේෂය | 4,446,814 | 3,545,261 |
| ආයෝජන වෙතින් පොලී | 45,188,718 | 74,823,475 |
| රැස්කිරීම් අත්තිකාරම් | (632,549,962) | - |
| අභ්‍යාන්තර අරමුදලේ ශුද්ධ වැඩිවීම | (129,182,475) | (14,673,331) |
| බදුකුලී ගෙවීම් | (17,172,595) | (21,714,306) |
| සීමිත හා සංචිත අරමුදල් | - | 363,760 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වෙතින්/(භාවිත) ශුද්ධ මුදල් ප්‍රවාහ** | (2,065,431,954) | (1,141,234,586) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින්/(භාවිත) මුදල් ප්‍රවාහ** | | |
| ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන | 423,179,478 | 765,000,000 |
| ප්‍රාග්ධන වියදම් සඳහා විවිප්‍රකො ප්‍රදාන | 737,529,050 | 89,400,000 |
| ආයෝජන අඩුවීම් | 451,545,758 | 725,483,080 |
| පරිත්‍යාග | 1,964,757 | - |
| සංචිත සහ සීමිත අරමුදල් / වැය නොවූ ප්‍රදාන | | 833,911,082 |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වල භාවිත මුදල් ප්‍රවාහ** | 1,614,219,042 | 2,413,794,162 |
| **වර්ෂය තුළ මුදල් සහ මූල්‍ය පර්යායයෙහි ශුද්ධ වැඩිවීම්** | (60,400,867) | (127,201,458) |
| කාල පරිච්ඡේදය ආරම්භයේදී මූල්‍ය හා මූල්‍ය පර්යාය | 164,519,224 | 291,720,682 |
| කාල පරිච්ඡේදය අවසානයේදී මූල්‍ය හා මූල්‍ය පර්යාය | 104,118,357 | 164,519,224 |
| **මූල්‍ය හා මූල්‍ය පර්යායයන්හි ශුද්ධ අඩු/ වැඩිවීම** | **(60,400,867)** | **(127,201,458)** |

කොළඹ විශ්වවිද්‍යාලය

ශුද්ධ වත්කම් වෙනස්වීම් ප්‍රකාශය

(රු.)

| | වැය කළ ප්‍රාග්ධන අරමුදල් | වැය නොකළ ප්‍රාග්ධන අරමුදල් | සංචිත සහ සීමිත අරමුදල් | ත්‍යාග සහ ආධාර | වත්කම් ප්‍රතිතක්සේරු සංචිත | ආදායම් සහ වියදම් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| **2018 ජනවාරි 01 වන දිනට ශේෂය** | **4,463,452,011** | **698,213,632** | **1,931,635,225** | **329,205,368** | **38,446,097,190** | **(961,363,344)** | **44,907,240,082** |
| වර්ෂය තුළ වැය කළ සහ වැය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන | 1,051,380,589 | 571,018,239 | | | | | 1,622,398,827 |
| පරිත්‍යාග ශුද්ධ සංචලනය | | | | 1,964,757 | | | 1,964,757 |
| වත්කම් ප්‍රතිතක්සේරු සංචිත ශුද්ධ සංචලනය | | | | | (28,911,895) | | (28,911,895) |
| කාලසීමාව සඳහා අතිරික්ත/ හිඟ | | | | | | 283,376,912 | 283,376,912 |
| අරමුදල් මාරුකර යැවීම් | | | | | | (267,480,895) | (267,480,895) |
| අරමුදල්වල ශුද්ධ සංචලනය | | | 38,197,939 | | | | 38,197,939 |
| ලෝගු කුලියට ගැනීමේ ගාස්තු ගිණුමට මාරුකිරීම | | | 2,011,300 | | | (2,011,300) | - |
| කොන්ත්‍රාත්තු කඩකිරීම් අරමුදලට මාරුකිරීම | | | 9,676,794 | | | (9,676,794) | - |
| පොලී ආදායමට මාරු කිරීම- උපකුලපති අරමුදල | | | 11,699,592 | | | (11,699,592) | - |
| පොලී ආදායමට මාරු කිරීම -UCDF අරමුදල | | | 29,879,801 | | | (29,879,801) | - |
| පොලී ආදායමට මාරු කිරීම - සීමිත අරමුදල් | | | 39,746,727 | | | (39,746,727) | - |
| **2018 දෙසැම්බර් 31 වනවිට ශේෂය** | **5,514,832,600** | **1,269,231,871** | **2,062,847,377** | **331,170,125** | **38,417,185,295** | **(1,038,481,540)** | **46,556,785,727** |

## මූදල් ප්‍රකාශන ගිණුම් ප්‍රතිපත්ති සාරාංශ සටහන්

### 1. ආයතනික තොරතුරු

### 1.1 නෛතික හා ප්‍රභවාත්මක ස්වරූපය

කොළඹ විශ්වවිද්‍යාලය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතින් ස්ථාපිත කර ඇත. එහි ප්‍රධාන පරිපාලනය කොළඹ 3, කුමාරතුංග මුණිදාස මාවතෙහි අංක 94 යන ලිපිනයෙහි පිහිටි විද්‍යාල මන්දිරයෙහි සිදු වෙයි.

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය තත්ව ප්‍රකාශය, මූල්‍ය කාර්ය දර්ශන ප්‍රකාශය, හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශ හා මූල්‍ය සංසරණ ප්‍රකාශය විශ්වවිද්‍යාල පාලක සභාව විසින් සම්මත කරන ලද්දේ 2019 මාර්තු 13 වනදාය.

2007 අංක 7 දරණ සමාගම් පනතේ පළමු උපලේඛනයට අනුකූලව සීමිත වගකීම් සමාගමක් (ඇපකාර) ලෙස කොළඹ විද්‍යා හා තාක්ෂණ කුටිය ස්ථාපිත විය.

### 1.2 ගිණුම් කාලපරිච්ඡේදය

විශ්වවිද්‍යාලයේ ගිණුම් කාලපරිච්ඡේදය 2018 ජනවාරි 01 වනදා සිට දෙසැම්බර් 31 වනදා දක්වා වේ.

### 1.3 නිකුතුව සඳහා අධිකාරිලත් දිනය

මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා පාලක සභාව වෙතින් අධිකාරිලත් දිනය 2019 මාර්තු 13 වේ.

භාවිතා කර ඇති සියලු මූල්‍ය ප්‍රතිපත්ති පසුගිය වසරෙහිදී භාවිත මූල්‍ය ප්‍රතිපත්ති හා සැසඳෙන අතර අවශ්‍ය තන්හිදී සන්සන්දනය සඳහා අවශ්‍ය අගයන් මෙම වසරෙහි ඉදිරිපත් කිරීම හා සැසඳීමේදී එකී වෙනස් වීම හා අනුකූලවීම සඳහා ගළපා ඇත.

### 1.4 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

(a) අනුමත කරන ලද ඉගෙනුම් අංශයකින් සිසුන් ඇතුළත් කර ගැනීම සහ උපදෙස් ලබා දීම;

(b) විවිධ ඉගෙනුම් අංශයන්හි ප්‍රවීණතාවය ලබා ඇති පුද්ගලයින් පිළිබඳ තහවුරු කර ගැනීම සඳහා විභාග පැවැත්වීම;

(c) ගුරුවරුන්, සිසුන් සහ විද්වතුන් හුවමාරු කර ගැනීමෙන් හෝ වෙනත් ආකාරයකින්, විශ්ව විද්‍යාලයට සමාන හෝ සැලකිය යුතු ලෙස සමාන අරමුණු ඇති ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි වෙනත් විශ්ව විද්‍යාල හෝ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම;

(d) පශ්චාත් උපාධි පාඨමාලා සැපයීම සහ මේ සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි වෙනත් විශ්ව විද්‍යාල හෝ බලධාරීන් සමඟ විශ්ව විද්‍යාලය විසින් තීරණය කරනු ලබන අරමුණු සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම;

(e) විශ්ව විද්‍යාලයේ හෝ පිළිගත් ආයතනයක අනුමත අධ්‍යයන පාඨමාලා හැදෑරූ සහ අතුරු ව්‍යවස්ථා මගින් නියම කර ඇති විශ්ව විද්‍යාලයේ විභාග සමත් වූ පුද්ගලයින්ට සහ උපාධි, ඩිප්ලෝමා සහ වෙනත් අධ්‍යයන සාමාර්ථයන් ලබා දීම.;

### 1.5 අඛණ්ඩ පැවැත්ම පිළිබඳ මූලධර්මය

විශ්වවිද්‍යාලය සිය අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ස්වයං ඇගයීමක යෙදී ඇති අතර දෘශ්‍ය අනාගතයේදී සිය අඛණ්ඩ පැවැත්ම නොපිරිහෙලා පවත්වා ගැනීමට ඇති හැකියාව පිළිබඳ සෑහීමකට පත්වේ. එසේම සිය අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සුවිශේෂී සැක මතුකළහැකි ද්‍රව්‍යමය අස්ථිරතාවයක් පිළිබඳ සනාතන සභාව දැනුම්වත් නොවේ. එබැවින් කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම පිළිබඳ මූලධර්මය මත පදනම්ව සකසා ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම

#### 1.6.1 අනුකූලතාවය පිළිබඳ ප්‍රකාශනය

කොළඹ විශ්වවිද්‍යාලයීය මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කළ රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්තිවලට අනුකූල වන ලෙස ඓතිහාසික පිරිවැය යටතේ උපචිත පදනම මත පිළියෙල කර ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන මූල්‍ය තත්ව ප්‍රකාශය, මූල්‍ය කාර්යදර්ශන ප්‍රකාශය, මූල්‍ය සංසරණ ප්‍රකාශනය, හිමිකම් විචලනය පිළිබඳ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්වලින් සමන්විත වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාළ වන ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේදයන් සඳහා මෙම ප්‍රතිපත්ති නිරන්තරයෙන් අදාළ වේ.

විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය සංගම්වල සහ කොළඹ විද්‍යා සහ තාක්ෂණ කවුළුවේ මූල්‍ය ප්‍රකාශයන් මෙම මූල්‍ය ප්‍රකාශයන් තුළ අඩංගුකර නොමැත.

#### 1.6.2 මිනුම් පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් සුදුසු අනාවරණය කිරීම් සිදු කරනු ලැබුවහොත් හැර, උපචිත පදනම මත සහ ඓතිහාසික පිරිවැය පදනම යටතේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

#### 1.6.3 තුලනාත්මක තොරතුරු

වර්තමාන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම සහ තුලනාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල වාර්තා වී ඇති සියලු මුදල් සඳහා පෙර කාල පරිච්ඡේදයට සාපේක්ෂව ප්‍රමාණාත්මක, ආඛ්‍යානමය හා විස්තරාත්මක තොරතුරු ඇතුළු තුලනාත්මක තොරතුරු අනාවරණය වේ.

**1.6.4 ද්‍රව්‍යවාදය හා සමූහනය**

සමාන අයිතම සහිත ද්‍රව්‍ය එක්ව වර්ගීකරණය කර ඇති අතර නොසැලකිය යුතු තරම් කුඩා අසමානතා ඇති අවස්ථාවල හැර ස්වභාවයෙන් හෝ කාර්ය වශයෙන් අසමාන අයිතම වෙන්වෙන්ව දක්වා ඇත.

**1.6.5 අනුලම්බගත කිරීම**

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් ප්‍රතිපත්තිවලින් ඉල්ලා සිටින විට හෝ අවසර දෙන අවස්ථාවල හැර වෙනත් කිසිම විටක වත්කම් හා බැරකම්, අය සහ වැය අනුලම්බගත කර නැත.

**1.6.6 මූල්‍ය තත්ත්වයන් පිළිබඳ ප්‍රකාශන දිනයෙන් පසු සිදු වූ සිදුවීම්**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනයෙන් පසු සිදුවූ සියලු සැලකිය යුතු අවස්ථා සැලකිල්ලට භාජනය කර ඇති අතර මූල්‍ය ප්‍රකාශනයන්හි අවශ්‍ය තන්හිදී සුදුසු ගැළපීම් හා එළිදරව් කිරීම් සිදු කර ඇත.

**1.6.7 කෘත්‍යාත්මක සහ ව්‍යවහාරික මුදල් ඒකකය**

කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන වල අයිතම විශ්වවිද්‍යාලය ක්‍රියාත්මක වූ ප්‍රාථමික ආර්ථික පසුබිම මත ( කෘත්‍යාත්මක මුදල් ඒකකය) ගණනය කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කර ඉදිරිපත් කර ඇත්තේ විශ්වවිද්‍යාලයේ කෘත්‍යාත්මක සහ ව්‍යවහාරික මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

**1.6.8 විදේශ මුදල් ගණුදෙනු**

සියලු විදේශ මුදල් ගණුදෙනු අදාළ ගණුදෙනු සිදුවනවිට පැවති විනිමය අනුපාතය අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කර ඇත.

**1.6.9 වැටයීම**

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලින් වෙනත් අයුරකින් අවසර දී ඇත්නම් මිස මූල්‍ය ප්‍රකාශන වල සඳහන් මුදල් ප්‍රමාණ ආසන්න රුපියලට වටයා ඇත.

**1.6.10 සුවිශේෂ ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීමේදී, කළමණාකරනය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති උපයෝගි කර ගැනීමෙහි සහ වාර්තා කරන ලද වත්කම්, වගකීම්, ආදායම සහ වියදම් සඳහා බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනවලට එළඹීම අවශ්‍ය වේ. තථ්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු හා භාවිතා කරන විනිශ්චයන්ගෙන් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ අඩස්ථ උපකල්පන අඛණ්ඩ පදනමින් සමාලෝචනය කරනු ලැබේ. සංශෝධනය එම කාල පරිච්ඡේදයට පමණක් බලපාන්නේ නම් ඇස්තමේන්තුව සංශෝධනය කරන ලද කාලසීමාව තුළ හෝ සංශෝධනය වර්තමාන හා අනාගත කාල පරිච්ඡේද දෙකටම බලපාන්නේ නම්, ඇස්තමේන්තුව සංශෝධනය කරන ලද කාල සීමාව හා අනාගත කාලසීමාවේදී ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන සංශෝධන හඳුනා ගැනේ.

මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති ප්‍රමාණයන්ට වඩාත්ම වැදගත් බලපෑමක් ඇති කරන, ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු ඇස්තමේන්තු, අවිනිශ්චිතතාව සහ තීරණාත්මක විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ:

**(a)** නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්ම

සේවකයින්ගේ විශ්‍රාම ප්‍රතිලාභ සැලසුමේ පිරිවැය තීරණය කරනු ලබන්නේ ප්‍රක්ෂේපිත ඒකක හර (PUC) ක්‍රමයෙනි. එවැනි ක්‍රමයකට පොලී අනුපාතය, වැටුප් වැඩිවීමේ අනුපාතය සහ විශ්‍රාම යන වයස පිළිබඳ උපකල්පන භාවිතා කිරීම ඇතුළත් වේ. සැලැස්මේ දිගුකාලීන ස්වභාවය නිසා එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත් වේ.

**(b) ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්හි වෙනස්කම්**

ගිණුම්කරණ ඇස්තමේන්තු වල යම් වෙනසක් සහ විවේචනාත්මක විනිශ්චයන් මූල්‍ය ප්‍රකාශනවල අදාළ සටහන් වල අනාවරණය වේ.

**2. විශේෂිත ගිණුම් ප්‍රතිපත්ති සාරාංශය**

**2.1 ජංගම වත්කම්**

මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත්තේ මූල්‍ය තත්ව ප්‍රකාශයේ දිනයෙන් වර්ෂයක කාලයක් තුළ නැවත ලබාගනු ලබන දේය.

**2.1.1 මුදල් හා මූල්‍ය පර්යාය**

මුදල් හා මූල්‍ය පර්යාය අත ඇති මුදල්, බැංකු ශේෂය හා කෙටිකාලීන ආයෝජනවලින් සමන්විත වේ.

**2.1.2 බඩුතොග හා කොටස්**

පිරිවැය හා ශුද්ධ උපලබ්ධි වටිනාකම අතර වඩා අඩු අගය මත බඩු තොග පෙන්වාදී ඇත. සමස්ත වශයෙන් පිරිවැය පෙර පිවිසි පෙර නිකුත් පදනමක් මත ගණනය කරනු ලබන අතර එහිදී අදාළ තොග අත්පත් කර ගැනීමටත්, ඒවා පවත්නා තත්ත්වයට පත්කරලීමට හා පවත්නා ස්ථානයට ගෙන ඒමටත් වැයවූ වියදම ඊට ඇතුළත් වෙයි.

විශ්වවිද්‍යාලයෙහි බඩු තොගවලට ලිපිද්‍රව්‍ය, රසායනික, පරිභෝජන ද්‍රව්‍යය හා නඩත්තු අයිතම ඇතුළත් වෙයි.

### 2.1.3 ලැබියයුතු

2018.12.31 වනවිට ගිවිසුම් හා බැඳුම්කර කඩ කිරීම් වෙනුවෙන් කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙතින් රු. 39,569,739 ක මුදලක් අයවීමට නියමිතව තිබිණි.

## 2.2 ජංගම නොවන වත්කම්

### 2.2.1 දේපල, පිරියත හා උපකරණ

භූමි, ගොඩනැගිලි, විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ, ගෘහ භාණ්ඩ හා වැද්දුම, පුස්තකාල පොත් හා වාර සඟරා, මෝටර් වාහන, උපාධි ලෝගු, සහ රජයේ ප්‍රදාන, පර්යේෂණ ප්‍රදාන, අභ්‍යන්තරිකව ජනිත අරමුදල් සහ පරිත්‍යාග මගින් ලබා ගත් වෙනත් වත්කම්

තාක්ෂණ පීඨය පිහිටුවීම සඳහා රජය විසින් ලබාදුන් හෝමාගම, පිටිපන, මහහේනවත්ත පිහිටි ඉඩමේ අයිතිය ලබා ගැනීමට විශ්වවිද්‍යාලය නා.සං. අධිකාරියට රු.මි. 731ක් ගෙවියයුතුය.

#### (a) හඳුනාගැනීමේ හා මිනුම් පදනම

දේපළ, පිරියත හා උපකරණ හඳුනාගෙන ඇත්තේ ආයතනය වෙත ඒවායෙන් යථා කාලයේදී බොහෝ කොට මූල්‍යමය වාසිදායි තත්ත්වයන් ගලා ඒමේ හැකියාවක් ඇත්නම් පමණක් හා එකී අයිතමයේ පිරිවැය විශ්වසනීය ලෙස ගිණිය හැකි නම් පමණි.
සියළුම දේපල, පැලැටි සහ උපකරණ මුලින් පිරිවැය මත ප්‍රකාශ කර ඇති අතර පසුව අඩු වශයෙන් සමුච්චිත ක්ෂයවීම් සහ යම් හානියක් සිදුවුවහොත් එය මනිනු ලැබේ. අළුත්වැඩියා සහ නඩත්තු පිරිවැය විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දී හඳුනාගෙන ඇත. සිදුවීම් හෝ තත්වයන්හි වෙනස්වීම් මගින් දේපල, පැලැටි සහ උපකරණවල ධාරක වටිනාකම නැවත ලබා ගත නොහැකි බව පෙන්නුම් කරන විට ඒවා ධාරක හානි වටිනාකම සඳහා සමාලෝචනය කෙරේ.

#### (b) සමාරම්භක හඳුනා ගැනීම

උපකරණ ප්‍රාග්ධනිතකර ඇත්තේ ඒවායේ ස්වභාවය පදනම් කර ගෙනයි. උපකරණ ස්පෘශ්‍ය වත්කම් නම් වසරකට වැඩි ආයු කාලයකින් හෙබි රු. 2,500.00කට වඩා වැඩි මිල පිරිවැයක් ඇත් නම් ඒවා ප්‍රාග්ධන වත්කම් ලෙස හඳුනා ගෙන ඇත. වත්කමක ආයුකාලයේ තීරකය එහි වර්ගීකරන 8ක් මත තෝරා ගැනෙන අතර එය වසර 4 සිට 20 දක්වා දිවෙයි.

#### (c) පවත්නා ස්ථාවර වත්කම් මත පසුව ඇති වූ වියදම්

පහත දැක්වෙන ගනයන්ට අයත් නොවන විටදී යම් ස්පෘශ්‍ය වත්කම් මත සිදුකරන ලද වියදම් එකී වියදම සිදුකරන ලද කාලපරිච්ඡේදය තුළ මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුළත්කර දක්වා ඇති අතර එහිදී එය ප්‍රාග්ධනිත කර අදාල පදනම් මත පිහිටා ක්‍ෂය ගණනයට ලක් කර ඇත.

1. ස්ථාවර වත්කම්වල වෙළඳපොළ වටිනාකම යථාකාලයන්හිදී ඉහළ යන ලද අවස්ථාවන්හි
2. වත්කම් පරාසයේ වැඩි විමකදී
3. ප්‍රතිදානයෙහි තත්ත්වයේ තිරසාර වර්ධනයක් හෝ ක්‍රියාකාරී පිරිවැයෙහි අඩු වීමක්
4. අලුත්වැඩියාවෙන් හා නඩත්තුවෙන් ස්ථිරවන ප්‍රමාණයටද වඩා සැලකිය යුතු අන්දමේ වත්කම් ආයු වර්ධනයක්

#### (d) ප්‍රත්‍යාගණන ආකෘතිය

මූලික හඳුනාගැනීමෙන් පසු පහත සඳහන් විශ්වසනීය ලෙස ගිණිය හැකි සමතුලිත මිලක් සහිත සහ ප්‍රත්‍යාගනන දිනය වනවිට සමුච්චිත ක්ෂයකින් හෝ සමුච්චිත පලුදුවීමකින් තොර වූ දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගනනයට ලක් කර ඇත. භූමිය හා ගොඩනැගිලි, මෝටර් රථවාහන, කාර්යාල උපකරණ, විද්‍යාගාර හා ඉගනුම් උපකරණ, ගෘහ භාණ්ඩ හා පිරිවැද්දුම්, ක්‍රීඩා භාණ්ඩ

#### (e) ක්ෂයවීම්

මූල්‍ය ක්‍රියාකාරීත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපල, පිරියත හා උපකරණ සඳහා ඒවා භාවිතය සඳහා ගන්නා ලද දිනයේ පටන් ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය මත සරල මාර්ග ක්‍රමය යටතේ ගණනය කර ක්‍ෂය හඳුනා ගෙන ඇත. ඉඩම් සඳහා ක්‍ෂය ගණනයක් කර නොමැත. ඇස්තමේන්තුගත ඵලදායී ආයුකාලයන් මෙසේය.

| විස්තරය | ඇස්. ඵලදායී ආයුකාලය |
|---|---|
| 1. ගොඩනැගිලි | වසර 20 |
| 2. ගෘහභාණ්ඩ සහ උපකරණ | වසර 10 |
| 3. විද්‍යාගාර හා ඉගැන්වීම් උපකරණ | වසර 5 |
| 4. සවිකිරීම් හා ඇඳුම් | වසර 10 |
| 5. පුස්තකාල පොත්, වාර සඟරා හා ලෝගු | වසර 5 |
| 6. මෝටර් වාහන | වසර 5 |
| 7. මෘදුකාංග පැකේජ | වසර 5 |
| 8. ක්‍රීඩා භාණ්ඩ | වසර 4 |

ක්‍ෂය වෙන් කිරීම් අදාළ වත්කම මිලයට ගත් වර්ෂයේ සිට එය භාවිතා කළ කාල සීමාව මත පදනම් ව එය විකුණා දමන ලද වර්ෂය දක්වා ගණනය කිරීමේ දී එය අත්පත් කර ගත් මස හා එය විකුණනු ලබන මාසය සඳහා සම්පූර්ණ ක්‍ෂය වෙන් කරමින් ගණනය කර ඇත.

**(f) කල්බදු හා මූල්‍ය කල්බදු**

විශ්වවිද්‍යාලයේ හිමිකමට අදාළ සැලකියයුතු සියලුම අවදානම් සහ ප්‍රතිලාභ කල්බදු යන්නෙන් මෙහිදී අදහස් වේ. මූලික හඳුනා ගැනීම මත දේපල, පිරියත හා උපකරණ ඒවායේ සාධාරණ මිල හෝ අවම කල්බදු මිල යන දෙකෙන් අවම මිලට ගණනය කරනු ලබයි.මූලික හඳුනාගැනීමෙන් පසු එම වත්කමට අදාළ ගිණුම් ප්‍රතිපත්තිය මත එම වත්කම ගණනය කරනු ලැබේ. මූල්‍ය කල්බදු යටතේ එන අවම ගෙවීම් මූල්‍ය වියදම් සහ උපචිත වගකීම් අතර බෙදීයයි. කල්බදු කාලය තුළ වගකීමේ ශේෂය සඳහා ස්ථාවර පොලී වාරික අනුපාතයක් පවත්වා ගතහැකි පරිදි මූල්‍ය වියදම කාල වකවානු අතර බෙදනු ලැබේ

**(g) පරිශ්‍ර නඩත්තුව**

විශ්වවිද්‍යාලය සතුව වරින්වර සමාලෝචනයට ලක්වන නඩත්තු සැලසුමක් පවතින අතර දැනට සිදු වෙමින් පවතින නඩත්තු කටයුතු සිදුවන්නේ ඒ අනුවය. නඩත්තු වියදම ආදායම් හා වියදම් ගිණුමට යොමුකෙරේ.

## 2.2.කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන්

ප්‍රාග්ධන වැඩ කිරීමේ ප්‍රගතිය හානි හැර පිරිවැය මත ප්‍රකාශ කර ඇත. මේවා ප්‍රාග්ධනීකරණය සඳහා බලාපොරොත්තු වන දේපල, පිරියත සහ උපකරණ ඉදිකිරීම සඳහා ඍජුවම දරනු ලබන ප්‍රාග්ධන ස්වභාවයක වියදම් වේ. කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් භාවිත කළ හැකි තත්වයට පත්වූ විට දේපල, පිරියත සහ උපකරණවල අදාළ වත්කම් කාණ්ඩයට මාරු කරනු ලැබේ. එනම් එය විශ්ව විද්‍යාලය විසින් අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක වීමට උචිත පිහිටීමක සහ අනෙකුත් තත්වයන් යටතේ පවතින විටදීය.

### 2.2.3 අස්පෘශ්‍ය වත්කම්

**පරිගනක මෘදුකාංග**

අත්පත් කරගත් පරිගණක මෘදුකාංග බලපත්‍ර ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ අත්පත් කර ගැනීමට සහ භාවිතයට ගෙන ඒමට දරන පිරිවැයේ පදනම මත ය. මෙම පිරිවැය ඔවුන්ගේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය වන අවුරුදු 5 තුළ ක්‍රමක්ෂය කර ඇත.

පරිගණක මෘදුකාංග වැඩසටහන් නඩත්තු කිරීම හා සම්බන්ධ පිරිවැය වියදමක් ලෙස හඳුනා ගැනේ. පහත සඳහන් නිර්ණායක සපුරා ඇති විට විශ්ව විද්‍යාලය විසින් පාලනය කරනු ලබන හඳුනාගත හැකි සහ අද්විතීය මෘදුකාංග නිෂ්පාදන නිෂ්පාදනය සමඟ ඍජුවම සම්බන්ධ වන පිරිවැය අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනා ගැනේ:

1. භාවිතයට ගත හැකි වන පරිදි මෘදුකාංග නිෂ්පාදනය සම්පූර්ණ කිරීම තාක්‍ෂණිකව කළ හැකි ය;
2. කළමනාකරණය මෘදුකාංගය නිෂ්පාදනය සම්පූර්ණ කර එය භාවිතා කිරීමට අදහස් කරයි;
3. මෘදුකාංග නිෂ්පාදනය භාවිතා කිරීමේ හැකියාවක් ඇත;
4. මෘදුකාංග නිෂ්පාදිතය අනාගත ආර්ථික ප්‍රතිලාභ ජනනය කරන්නේ කෙසේද යන්න නිරූපණය කළ හැකිය;
5. මෘදුකාංග නිෂ්පාදනය සංවර්ධනය සම්පූර්ණ කිරීම සහ භාවිතා කිරීම සඳහා ප්‍රමාණවත් තාක්ෂණික, මූල්‍ය හා වෙනත් සම්පත් පැවතීම; සහ
6. 6. මෘදුකාංග නිෂ්පාදනයේ සංවර්ධනයේදී ආරෝපණය කළ වියදම විශ්වසනීයව මැනිය හැකිය.

මෘදුකාංග සංවර්ධන සේවක පිරිවැය සහ අදාළ පොදු කාර්යයන්හි සුදුසු කොටසක් මෘදුකාංග නිෂ්පාදනයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කර ඇති ඍජුවම ආරෝපණය කළ හැකි පිරිවැය අතර ඇතුළත් වේ.

අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගෙන ඇති පිරිවැය වසර 5 නොඉක්මවන ඔවුන්ගේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ ක්‍රමක්ෂය කර ඇත. මෘදුකාංග සංවර්ධනයට අදාළ පිරිවැය මෘදුකාංගය භාවිතයට සූදානම් වන තෙක් කෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් ලෙස ඉදිරියට ගෙනයනු ලැබේ.

### 2.3 බැරකම් හා සැපයුම්

#### 2.3.1 ජංගම බැරකම්

ශේෂ පත්‍රයෙහි වර්ගීකරණය කරන ලද ජංගම බැරකම් ශේෂ පත්‍ර දිනෙන් පසු වසරක් ඇතුළත පියවා ගනු ලබන වත්කම් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී සියලුම ගම්‍ය වත්කම් සැලකිල්ලට ගෙන ඇත.

#### 2.3.2 ණයගැතියන් සහ වියදම්

ණයගැතියන් සහ වියදම් ගණනය කිරීම සාධාරණ වටිනාකම මත සිදුකරනු ලබන අතර ඵලදායී පොලී අනුපාතය මත ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලැබිණි.

#### 2.3.3 විලම්බිත ආදායම

මාස කිහිපයක කාල සීමාවක් පුරා ක්‍රියාත්මක වන පාඨමාලා හා අධ්‍යයන වැඩසටහන්වලට අදාළ ඉන්වොයිසි පාඨමාලාව මුලදී අයකරගත්විට විලම්බිත ආදායම් ජනනය වේ. විලම්බිත ආදායම පාඨමාලාව ක්‍රියාත්මක වූ ප්‍රමාණය දක්වා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගැනෙන අතර ආදායම හඳුනා ගන්නා තෙක් ඉතිරිව ඇති කාල සීමාව සඳහා ආරෝපණය කළ යුතු ශේෂය මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ වගකීමක් ලෙස හඳුනා ගැනේ.

#### 2.3.4 විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම

**සේවක ප්‍රතිලාභ**

**(a) සේවක නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය**

නිර්වාචිත ප්‍රතිලාභ සැලැස්ම යනු නිර්වචනය කරන ලද දායක සැලැස්මක් හැර පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. නිර්වාචිත ප්‍රතිලාභ ගණනය කරනු ලබන්නේ ප්‍රක්ෂේපිත ඒකක ණය (PUC) ක්‍රමය භාවිතා කරමින් ස්වාධීන ආයුගණකඥවරයකු විසිනි. නිර්වාචිත ප්‍රතිලාභ වගකීම්වල වර්තමාන වටිනාකම තීරණය කරනු ලබන්නේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලා ඒම වට්ටම් කිරීමෙනි, ප්‍රතිලාභ ගෙවනු ලබන මුදලින් නියම කර ඇති පොලී අනුපාත භාවිතා කරමින් සහ අදාළ වගකීම්වල නියමයන්ට ආසන්න වශයෙන් පරිණතභාවයට කොන්දේසි ඇත. නිර්වාචිත ප්‍රතිලාභ බැදීම්වල වර්තමාන වටිනාකම රඳා පවතින්නේ වට්ටම් අනුපාතය, අනාගත වැටුප් වර්ධක සහ මරණ අනුපාත පිළිබඳ උපකල්පන ගණනාවක් භාවිතා කරමින් ක්‍රියාකාරී පදනමක් මත තීරණය වන සාධක ගණනාවක් මත ය. මෙම සැලසුම් වල දිගුකාලීන ස්වභාවය නිසා, එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට පත්වේ. සෑම උපකල්පනයක්ම වාර්තා කරන දිනයකදී සමාලෝචනය කෙරේ. ඒ අනුව, සේවක ප්‍රතිලාභ වගකීම පදනම් වී ඇත්තේ 2018 දෙසැම්බර් 31 දින වන විට ආයුගණක තක්සේරුව මත ය. පාරිතෝෂිකය සඳහා වන විශ්ව විද්‍යාල ගිණුම්කරණ ප්‍රතිපත්තිය නම්, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දී ඒවා සම්පූර්ණයෙන්ම සිදුවන කාල පරිච්ඡේදය තුළ ක්‍රියාකාරී වාසි සහ අලාභ හඳුනා ගැනීමයි.

**විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ වගකීම**

සීමාසහිත Actuarial and Management Consultant (Pvt) Ltd, අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය මත 31-12-2018 දිනට තක්සේරු කර ඇත. විශ්‍රාමික ප්‍රතිලාභ සඳහා පිරිවැය තීරණය කිරීම සඳහා භාවිතා කරන උපකල්පන පහත පරිදි වේ.

| | |
|---|---|
| වට්ටම් අනුපාතය | 11% p.a. |
| වැටුප් වැඩි වීමේ අනුපාතය | |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | 10% p.a. |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 8% p.a. |
| විශ්‍රාම යන වයස | |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය | වසර 65 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | වසර 60 |

## නිර්වාචිත බැදීම්

**වට්ටම් අනුපාතයට සංවේදීතා විශ්ලේෂණය –**
සියයට එකක වැඩිවීම රු.518,091,000
සියයට එකක අඩුවීම රු.613,260,000

**වැටුප් වැඩිකිරීමේ අනුපාතයට සංවේදීතා විශ්ලේෂණය –**
සියයට එකක වැඩිවීම රු. 613,980,000
සියයට එකක අඩුවීම රු. 516,748,000

**(b) නිර්වාචිත දායකත්ව සැලසුම් – සේවක අර්ථසාධක අරමුදල**

අදාළ ප්‍රඥප්ති හා රෙගුලාසි වලට අනුකූලව සේවකයින්ගේ අර්ථසාධක අරමුදල් දායකත්වය සහ සේවකයින්ගේ භාරකාර අරමුදල් දායකත්වය සඳහා සේවකයින් සුදුසුකම් ලබයි. විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස මේවා හඳුනාගනු ලැබේ. සේවකයින්ගේ දළ වැටුප් වලින් 7%, 8% සහ 3% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල, විශ්ව විද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල සහ සේවක භාර අරමුදල සඳහා පිළිවෙලින් දායක වේ.

**2.3.5 අසම්භාව්‍ය වගකීම්**

නීතිමය තත්ත්ව පදනම් කොට ගෙන ඇති වන වගකීම් සම්බන්ධයෙන් කිසිදු වෙන් කිරීමක් ගිණුම්වල සිදුකොට නොමැත. 2018 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තු කර ඇති මුලු වගකීම රුපියල් මිලියන 10 කි.

**2.4 අරමුදල්, ප්‍රදාන සහ සංචිත ලැබීම සහ උපයෝගී කර ගැනීම පිළිබඳ වගවීම.**

විශේෂිත සංවර්ධන කටයුතු සඳහා විශ්ව විද්‍යාලයට විවිධ ප්‍රදානයන් ලැබුණි. අරමුදල්, ප්‍රදාන සහ සංචිත සීමා රහිත අරමුදල්, සීමිත අරමුදල් සහ පරිත්‍යාග අරමුදල් ලෙස වර්ගීකරණය කර ඇත.

**2.4.1 සීමා රහිත අරමුදල්**

සීමාසහිත අරමුදල් යනු පාලක සභාවේ අභිමතය පරිදි විශ්වවිද්‍යාලය සඳහා භාවිතා කළ හැකි අරමුදල් වන අතර විශ්වවිද්‍යාලයේ පොදු අරමුණු සපුරාලීම සඳහා පාලක සභාව විසින් නිශ්චිත අරමුණක් සඳහා නම් කරන ලද අරමුදල් වේ. නම් කරන ලද අරමුදල්වල ණය සඳහා විශ්වවිද්‍යාලය විසින් ලබා දී ඇති ප්‍රතිපාදන විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ඇතුළත් කෙරේ. අතිරික්ත අරමුදල් සීමිත අරමුදල් වලින් සීමා රහිත අරමුදල් වෙත මාරු කරනු ලබන්නේ අදාළ පරිත්‍යාගශීලීන්ගේ ගිවිසුම් අනුව හෝ අදාළ පරිත්‍යාගශීලියාගේ අනුමැතිය ඇතිව ය.

යොමු කිරීමේ කොන්දේසි නොමැති අවස්ථාවල දී මහජනතාවගෙන් ලැබෙන දායක මුදල් සහ පරිත්‍යාග ලැබුනු අවස්ථාවේ දී විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙන් හඳුනා ගැනේ.

**නම් කරන ලද අරමුදල් / සංචිත**

නිශ්චිත අරමුණක් සඳහා විශ්ව විද්‍යාලය විසින් නම් කරන ලද සීමාසහිත අරමුදල් නම් කරන ලද අරමුදල් ලෙස හඳුනා ගැනේ. විශ්වවිද්‍යාලය විසින් පහත සඳහන් අරමුදල් නම් කරන ලද අරමුදල් / සංචිත / ලෙජර් ගිණුම් ලෙස ගණනය කර ඇති අතර එම අරමුදල්වල අරමුණ පහත පරිදි විස්තර කෙරේ.

අරමුදල්

1. කො.වි.වි. සංවර්ධන අරමුදල
2. උපකුලපති අරමුදල
3. පීඨ සංවර්ධන අරමුදල

4. අධ්‍යයන අංශ සංවර්ධන අරමුදල
5. සෞඛ්‍ය රක්ෂණ අරමුදල
6. පුස්තකාල සංවර්ධන අරමුදල
7. පරිපාලන අරමුදල

### 2.4.2 සීමිත අරමුදල්

හඳුනාගත් ව්‍යාපෘතියක හෝ ක්‍රියාකාරකමක භාවිතය සඳහා ප්‍රදාන / පරිත්‍යාග ලැබෙන්නේ නම්, එම අරමුදල් ප්‍රතිස්ථාපිත අරමුදල් ගිණුමක තබා ඇති අතර එම හඳුනාගත් ව්‍යාපෘතියට අදාළ වියදම් සමඟ සැසඳීම සඳහා පුළුල් ආදායම් ප්‍රකාශයට මාරු කරනු ලැබේ. භාවිතයට නොගත් අරමුදල් ඔවුන්ගේ අරමුදල් ගිණුම්වල තබා ඇති අතර ඒවා අවශ්‍ය වන තෙක් සමුච්චිත අරමුදල් හා සංචිත යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත් වේ.
අනුමත ප්‍රදාන වියදම් ලැබුණු ආදායම ඉක්මවා ගිය විට සහ ඉතිරිය ලැබෙනු ඇති බවට නිශ්චිතභාවයක් තිබේ නම්, එම මුදල් මූල්‍ය තත්ව ප්‍රකාශයේ ලැබිය යුතු දේ හරහා හඳුනා ගැනේ.

### 2.4.3 පරිත්‍යාග අරමුදල්

වත්කම් අවසන් නොවී ඇති වත්කමක් ලෙස ලැබෙන විට, එම වත්කම් වලින් උපයන ලද ආදායම පමණක් හඳුනාගෙන ආදායමක් ලෙස භාවිතා කළ හැකිය.
අදාළ ගිවිසුම හෝ වාර්තාව වෙනත් ආකාරයකින් ප්‍රකාශ කරන්නේ නම් හැර, ඉහත එක් එක් කාණ්ඩය යටතේ ඇති අරමුදල් වලින් ලබාගත් ආයෝජන ආදායම සහ වෙනත් වාසි සුදුසු අරමුදල් සඳහා වෙන් කරනු ලැබේ. එක් එක් නිශ්චිත විභාගවල හොඳම කාර්ය සාධනය සඳහා විෂය ත්‍යාග සහ කුසලතා ත්‍යාග ප්‍රදානය කිරීම අරමුදල්වල අරමුණු වේ.

## 2.5 කොටස්

| ශ්‍රීපාලි | 637 | 632 | 170,683,218 | 196,658,033 | 59,964,164 | 58,035,593.95 | 230,647,383 | 254,693,627 | 35,972,087 | 37,730,865.51 | 266,619,470 | 292,424,492 | 418,555 | 462,697 |
| තාක්ෂණ | - | 175 | - | 70,478,054 | - | 16,069,982.50 | - | 86,548,036 | - | 10,447,628.90 | - | 96,995,665 | - | 554,261 |
| හෙද | - | 93 | - | 24,929,275 | - | 8,540,047.84 | - | 33,469,322 | - | 5,552,168.50 | - | 39,021,491 | - | 419,586 |
| එකතුව | **8,586** | **9,565** | **2,432,440,014** | **3,044,657,526** | **808,245,393** | **878,339,329** | **3,240,685,407** | **3,922,996,856** | **484,860,817** | **571,037,545** | **3,725,546,224** | **4,494,034,401** | | |

**

**A පරිපාලන පොදුකාර්ය පිරිවැය**

| මාතෘකාව | 2017 වියදම | 2018 වියදම |
|---|---|---|
| සා/ පරිපාලන | 163,626,766 | 186,279,072 |
| මූල්‍ය පරිපාලන | 43,125,251 | 45,130,094 |
| සැපයුම් | 9,882,086 | 9,137,841 |
| ආරක්ෂාව | 46,552,809 | 62,313,322 |
| ප්‍රවාහන | 45,931,885 | 43,746,143 |
| විභාග | 33,790,668 | 37,008,716 |
| ඉගනුම් සම්පත් | 76,505,846 | 95,005,560 |
| සෞඛ්‍ය සේවා | 16,900,231 | 16,077,425 |
| ශාරීරික අධ්‍යාපන | 32,812,149 | 34,377,623 |
| සුබසාධන | 40,618,917 | 45,681,910 |
| නඩත්තු | 172,314,626 | 191,319,418 |
| නේවාසිකාගාර | 50,843,091 | 79,318,483 |
| S.D.C. | 7,073,725 | 4,133,435 |
| කා.ම. සං. ම.( SDC) | 37,216,013 | 20,911,835 |
| තාක්ෂණ පීඨය | 18,886,182 | - |
| හෙද පීඨය | 3,346,866 | - |
| ඉංජිනේරු පීඨය | | 417,700 |
| තත්ව සහතිකකිරීම හා ප්‍රතීතනය | 2,556,648 | 1,500,000 |
| KEID | 1,983,635 | 2,033,406 |
| ශිෂ්‍ය අනුශාසක කාර්යාලය | 4,277,999 | 3,947,346 |
| **එකතුව** | **808,245,393** | **878,339,329** |

| | | **රු.** | රු. |
|---|---|---|---|
| | | **2017** | **2018** |
| **ශිෂ්‍යයකු සඳහා සාමාන්‍ය පිරිවැය** | | **433,909** | **469,842** |
| මුලු පිරිවැය | = | 3,725,546,224 | 4,494,034,401 |
| ශිෂ්‍ය සංඛ්‍යාව | | 8,586 | 9,565 |

**** ප්‍රාග්ධන පිරිවැය = වර්ෂය සඳහා ක්ෂය**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එච්ඊඩී/බී/යූඕසී /6/18/06 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2019 ජුනි 19 දින

UNIVERSITY OF COLOMBO 24 JUN 2019

26 JUN 2019

උපකුලපති
කොළඹ විශ්වවිද්‍යාලය

**කොළඹ විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත්:

1. ලේකම්, නගර සැලසුම් ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය
3. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

DFA

FYA

24/6/19 VC

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | එච්ඊඩී/බී/යූඔසී / 6/18/06 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2019 ජුනි 1[illegible] දින |

උපකුලපති

කොළඹ විශ්වවිද්‍යාලය

**කොළඹ විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය යන මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

## 1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව මූල්‍ය හා කළමනාකරණ පීඨයේ කලින් ගෙවීම් රු.487,670 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.431,051 ක් ලෙස දක්වා තිබීමෙන් රු.56,619 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) විවිධ ණයගැතියන් යටතේ භාණ්ඩාගාරය වෙතින් ලැබිය යුතු ලෙස රු.955,718,850 ක් දක්වා තිබුණි. මෙම මුදල ලබාදීම සඳහා භාණ්ඩාගාරයේ එකඟතාවයක් ප්‍රකාශකර නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ පීඨ සහ වෙනත් අංශ වෙතින් ලැබිය යුතු ශේෂ වටිනාකම රු.139,240,643 ක් ණයගැතියන් ලෙස දක්වා තිබුණි.

(ඈ) වත්කම් ඉවත් කිරීමේ අලාභය රු.621,955 වුවත් එය රු.4,175,980 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් රු.3,554,025 ක වෙනසක් පැවතුණි.

(ඉ) උපලේඛන අනුව ආයෝජන වටිනාකම රු.1,783,293,156ක් වූ අතර මූල්‍ය ප්‍රකාශනවල රු.1,783,693,156 ක් ලෙස දක්වා තිබීමෙන් රු.400,000 ක වෙනසක් පැවතුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

**2.1** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

**2.2** 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| | නීතිරීති / විධානයට යොමුව | | විස්තරය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | මුදල් රෙගුලාසි 371 හා 2015 ජූලි 14 දිනැති අංක 3/2015 දරනරාජ්‍ය මුදල් චක්‍රලේඛය | i. | ලබාගත් අත්තිකාරම් අදාළ කාර්යය නිමකොට කඩිනමින් පියවිය යුතු වුවත් අවස්ථා 48 කදී ලබා දී තිබූ එකතු වටිනාකම රු.3,801,491ක අත්තිකාරම් පියවීම සඳහා දින 60 සිට දින 291 ක් දක්වා ප්‍රමාද වී තිබූ අතර අවස්ථා 17 කදී එකතු වටිනාකම රු.5,528,964 ක විවිධ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පියවා නොතිබුණි. |
| | | ii. | විශ්වවිද්‍යාලය විසින් 2016 සහ 2017 වර්ෂවල ලබාදුන් රු.152,672 ක් වටිනා පුස්තකාල අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවා නොතිබුණි. |

iii. අත්තිකාරම් ලබාදීමේදී නිසි පුරෝකථනයන් මත අත්තිකාරම් මුදල් ලබාදිය යුතු වුවත් අවස්ථා 52 කදී රු.1,144,606 ක වියදමක් දැරීම සඳහා රු.2,877,187 ක් අත්තිකාරම් ලබා දී තිබුණි.

(ආ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය

| | |
|---|---|
| (i) X පරිච්ඡේදය 1.9 වගන්තිය | කාර්ය මණ්ඩලය විසින් ලබාගන්නා නිවාඩු සඳහා විධිමත් නිවාඩු ලේඛනයක් නඩත්තු කළ යුතු වුවද නියැදි පරික්ෂාවේ දී විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා එවැනි ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ii) XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන් පැමිණීම හා පිටවීමේ වේලාවන් සටහන් කළ යුතු වුවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 618 දෙනෙකුගේ පැමිණීම හා නිවාඩු සනාථ කරගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ රු.677,219,763 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |
| (ඇ) 2015 සැප්තැම්බර් 18 දිනැති අංක 13/2015 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | නිලවාහන හිමි තනතුරු දරන නිලධාරීන්ට අනුයුක්ත වාහන සඳහා ඉන්ධන දීමනාව මාසික වැටුපට එකතුකොට ගෙවීම් කළ යුතු නමුත් අදාළ නිලධාරීන්ට ඉන්ධන දීමනාවක් ලෙස නොගෙවා වෙන්කර ඇති වාහන සඳහා විශ්වවිද්‍යාලයේ ඉන්ධන ඇණවුම් මගින් ඉන්ධන ලබාදී තිබුණි. ඒ අනුව ඉන්ධන ඇනවුම් මගින් නිලධාරීන්ට හිමි මාසික ඉන්ධන දීමනාව ඉක්මවා රු.1,905,898 ක ඉන්ධන ලබා දී තිබුණි. |

2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) සැපයුම් අංශයේ 2018 වර්ෂයට අදාල භාණ්ඩ ඇනවුම් පිළිබඳ නියැදි පරීක්ෂාවේදී අවස්ථා 28 ක රු. 16,434,490 ක් වටිනා භාණ්ඩ සැපයීම මාස 02 සිට මාස 11 දක්වා ප්‍රමාද වී තිබුණි.

(ආ) ශ්‍රීපාලි මණ්ඩපයේ ජනමාධ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රායෝගික පුහුණු උපකරණ මිලදී ගැනීම සඳහා රු.12,441,324 ක් 2018 මැයි 02 දින ජපාන තානාපති කාර්යාලයෙන් ලැබී තිබුණද 2019 මැයි මාසය දක්වා එම මුදල් අදාළ අරමුණ වෙනුවෙන් යොදාගෙන නොතිබුණි.

(ඇ) විද්‍යා පීඨයේ කේ.ජී ශාලාව ප්‍රතිසංස්කරණය සහ වහලය අළුත්වැඩියා කිරීම සඳහා ලංසු ආරාධනාව පුවත්පත් 03 ක පළකර තිබූ අතර එක් එක් දැන්වීම් වල පැවති පරස්පරතාවය හේතුවෙන් නැවත සංශෝධිත දැන්වීමක් පළ කිරීමට සිදුව තිබූ අතර ඒ හේතුවෙන් ආයතනයට සිදුවූ පාඩුව රු.229,185 ක් සහ ලංසුකරුවන් තෝරාගැනීම තවත් මාසයකින් ප්‍රමාද වීම සිදුව තිබුණි.

3. වෙනත් නිරීක්ෂණ

(අ) ආයතනය තුළ සමාගමක් ආරම්භ කිරීමට පෙර ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන අමාත්‍යාවරයාගේ නිර්දේශ සහිතව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවත් එවැනි අනුමැතියකින් තොරව සමාගම් පනත යටතේ 2013 වර්ෂයේ දී කළම්බු සයන්ස් ඇන්ඩ් ටෙක්නොලොජි සෙල් නමින් ඇපයෙන් සීමිත සමාගමක් ලියාපදිංචි කර තිබුණි. මෙම සමාගමේ ප්‍රධාන කාර්යාලය කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයට අයත් ගොඩනැගිල්ලක පිහිටුවා විශ්වවිද්‍යාලය සතුව පවතින පරිගණක උපාංග ඇතුලු අනෙකුත් භෞතික හා මානව සම්පත් භාවිතා කර ඇති නමුත් විශ්වවිද්‍යාලය සතු දේපළ භාවිතය පිළිබඳ එකහතා ගිවිසුමකට ඇතුළත් වී නොතිබුණි. සමාලෝචිත

වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ සම්පත් භාවිතය වෙනුවෙන් රු.479,684 ක මුදලක් පමණක් විශ්වවිද්‍යාලය වෙත ගෙවා තිබුණි.

(ආ) අරමුදල් 123 කින් සමන්විත වූ "Designated Fund" නමින් වූ අරමුදලේ සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ගණුදෙනුවක් සිදු නොවූ අරමුදල් 33ක ට අදාළ රු.190,053,440ක වූ මුදලක් ඌණ උපයෝජිතව තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සියයට 5.5 ක පොළී අනුපාතයක් යටතේ සත් දින ඉල්ලුම් තැන්පතු වල ආයෝජනය කර තිබුණු රු.305,000,000 ක් වටිනා තැන්පතු 07කින් රු.55,000,000 ක් වටිනා තැන්පතු 04 ක් මාස 03 ක් තෙක් මුදල් කරගෙන නොතිබුණි. මෙම මුදල් ත්‍රෛමාසික තැන්පතු වල ආයෝජනය කර තිබුණේ නම් අවම වශයෙන් සියයට 10.5 ක පොළී ආදායමක් ලබාගැනීමට හැකියාව තිබූ අතර එසේ නොවීමෙන් රු.933,425 ක ආදායමක් ලබා ගැනීමේ හැකියාව මගහැරී තිබුණි.

(ඈ) කොළඹ විශ්වවිද්‍යාලයේ නේවාසික පහසුකම් ඉල්ලුම් කල ශිෂ්‍ය සංඛ්‍යාව හා එම පහසුකම ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව හා සැසඳීමේදී පළමු වසරේ සිට සිව්වන වසර දක්වා ශිෂ්‍ය කණ්ඩායම් සඳහා නේවාසික පහසුකම් ලබා දීම පිළිවෙලින් සියයට 22, 40, 44ක් සහ 33ක් ලෙස අවම මට්ටමක පැවති අතර නේවාසිකාගාර 06 ක තව දුරටත් සිසුන් 243 කට නේවාසික පහසුකම් සැපයීමට ඉඩපහසුකම් පැවති බව නිරීක්ෂණය විය. තවද වෙනත් නේවාසිකාගාර 02 ක් බදුකුලී පදනම මත ලබා ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේ රු.5,400,000 ක මුදලක් බදුකුලී ලෙස ගෙවා තිබුණි. මෙම නේවාසිකාගාරයන් හි නේවාසිකව සිටිය හැකි ශිෂ්‍ය සංඛ්‍යාව 108 ක් වුවද සත්‍ය වශයෙන් සිසුන් 55 ක් පමණක් නේවාසිකව සිටින බව නිරීක්ෂණය විය. මීට අමතරව භික්ෂු නේවාසිකාගාරය 2006 වර්ෂයේ සිට බදුකුලී පදනම මත පෞද්ගලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යන අතර මාසික කුලිය රු.325,000 ක් බැගින් 2018 වර්ෂය සඳහා රු.3,900,000 ක් ගෙවා තිබුණි. මෙම නේවාසිකාගාරයේ භික්ෂූන් 50 කට නේවාසිකව සිටිය හැකි වුවද ශිෂ්‍ය භික්ෂූන් 15 ක් පමණක් සිටින බව නිරීක්ෂණය විය.

(ඉ) විද්‍යා පීඨයේ ශිෂ්‍ය ධාරිතාවය 515 ක් වුවද බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 501 ක් වූයෙන් ශිෂ්‍යයින් 14 දෙනෙකු සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වී තිබූ අතර කළමනාකරණ පීඨය සඳහා බඳවා ගත හැකි ශිෂ්‍ය සංඛ්‍යාව 520 ක්ව තිබියදී 515 ක් පමණක් බඳවා ගැනීම තුළින් ශිෂ්‍යයින් 05 දෙනෙකු සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වී තිබුණි.

(ඊ) ශාස්ත්‍ර පීඨයේ ශිෂ්‍ය ධාරිතාවය 550 ක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දන්වා තිබුණ ද සත්‍ය වශයෙන්ම බඳවා ගැනීම් 713 ක් වූ අතර එය විශ්වවිද්‍යාල

ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත වාර්තා කර තිබූ සංඛ්‍යාවට වඩා සියයට 29.6 ක වැඩි වීමකි.

(එ) 2018 දෙසැම්බර් 31 දිනට ගිවිසුම් හා බැඳුම්කර කඩ කල ආචාර්යවරුන් 25 දෙනෙකුගෙන් රු.52,650,521 ක මුදලක් අයවීමට තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට මහාචාර්ය හා කථිකාචාර්ය අනුමත තනතුරු 723 ක් පැවති අතර තථ්‍ය සංඛ්‍යාව 586 ක් වීමෙන් පුරප්පාඩු 137 ක් විය. මේ තුළ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුරු පුරප්පාඩු 27 ක් පැවතුණි. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 183 ක් පැවතුණි.

(ඔ) 2018 වර්ෂයේ මූලධන වියදම් වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන රු.565,000,000 ක වටිනාකමින් රු.141,820,522 ක් පුනරාවර්තන වියදම් සඳහා වැය කර තිබුණි. එය ලද මුළු මූලධන ප්‍රතිපාදනයෙන් සියයට 18.76 ක් විය.

(ඕ) ශාක විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකු තම රෝගී තත්ත්වය හේතුවෙන් වරින් වර වෛද්‍ය නිවාඩු, විවේක නිවාඩු, සප්ත වාර්ෂික නිවාඩු ලබාගෙන තිබූ අතර 2015, 2017 සහ 2018 යන වර්ෂවලදී සේවයට වාර්තා කළ අවස්ථා 03 ක් වූ නමුත් දේශන වලට සහභාගි වීම හා පර්යේෂණ සුපරීක්ෂණය කිරීම යන කාර්යයන් වල නියැලී සිටි බව තහවුරු කිරීමේ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. 2018 වර්ෂයේ අධ්‍යයන කාලසටහන තුළ මෙම මහාචාර්යවයා වෙනුවෙන් දේශන පැය වෙන් කර නොතිබූ අතර මාස 09ක කාලය සඳහා රු.3,397,055 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. එසේම විද්‍යා පීඨයේ ආචාර්යවරයෙකුගේ විශ්‍රාම දිනය නිශ්චිත කරගැනීමට නොහැකි වීම හේතුවෙන් දේශන සහභාගිත්වයකින් තොරව වැටුප් හා දීමනා ලෙස මාස 5 ක් සඳහා රු.1, 012,674 ක් ගෙවා තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

15.07.2019

විගණකාධිපති,

ජාතික විගණන කාර්යාලය.

**කොළඹ විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

**.1 මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

කොළඹ විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය යන මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (1) 154 ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී .ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (6) 154 ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර ,විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

| .1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම | පිළිතුර |
|---|---|
| මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය. | |
| අ සමාලෝචිත වර්ෂයට අදාලව මූල්‍ය හා කළමනාකරණ පීඨයේ කලින් ගෙවීම් රු.487,670 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.431,051 ක් ලෙස දක්වා තිබීමෙන් රු.56,619 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | කලින් ගෙවීම් ගිණුමේ ශේෂය රු.56,619.00 ක් අඩුවෙන් ගිණුම්ගත කර ඇත. 2019 වර්ෂයේදී නිවැරදි වේ. |
| ආ විවිධ ණයගැතියන් යටතේ භාණ්ඩාගාරය වෙතින් ලැබිය යුතු ලෙස රු.955,718,850 ක් දක්වා තිබුණි. මෙම මුදල ලබාදීම සඳහා භාණ්ඩාගාරයේ එකඟතාවයක් ප්‍රකාශකර නොතිබුණි. | 2019 වර්ෂයේ ලැබූ ප්‍රතිපාදනයන්ගෙන් 2018.12.31 තිබූ ප්‍රාග්ධන වවුචර ගෙවීමෙන් අනතුරුව මහල්17 කින් යුත් ගොඩනැගිල්ල සඳහා ලැබීමට එකඟ වී තිබූ මුදල කැබිනට් මණ්ඩල තීරණය අනුව විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලට 2019 වර්ෂයේදී ගිණුම් ගතකර ඇත. |
| ඇ විශ්වවිද්‍යාලයේ පීඨ සහ වෙනත් අංශ වෙතින් ලැබිය යුතු ශේෂ වටිනාකම රු139240.,643 ක් ණයගැතියන් ලෙස දක්වා තිබුණි. | 2019 වර්ෂයේදී නිවැරදි වේ. |
| ඈ වත්කම් ඉවත් කිරීමේ අලාභය රු. 621, 955 වුවත් එය රු.4,175, 980 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් රු3,554, 025ක වෙනසක් පැවතුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී සිදුවූ වරදකි 2019 .වර්ෂයේදී නිවැරදිව පිළියෙල කිරීමට සටහන් කරගන්නා ලදී. |
| ඉ උපලේඛන අනුව ආයෝජන වටිනාකම රු.1,783,293,156ක් වූ අතර මූල්‍ය ප්‍රකාශනවල රු.1,783,693,156 ක් ලෙස දක්වා තිබීමෙන් රු.400,000 ක වෙනසක් පැවතුණි . | 2006 වර්ෂයේදී විද්‍යාල මන්දිර ගිණුමෙහි ශේෂයන් වෛද්‍ය පීඨයට මාරුකිරීමේදී මෙම වරද සිදුවී ඇත. 2019 වර්ෂයේදී නිවැරදි කරනු ලැබේ. |

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ,ආයතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර ,කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම ,පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි. 2018අංක 19 දරන ජාතික විගණන පනතේ (1) 16 උප වගන්තිය ප්‍රකාරව ,ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම් ,වියදම් ,වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ,වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ .සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ,ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත .වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර ,මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී .තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

  - 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ) 12 අ (වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර ,මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

  - 2018අංක 19 දරණ ජාතික විගණන පනතේ) (1) 6 ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

  - 2018අංක 19 දරණ ජාතික විගණන පනතේ) 6 i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය .

**2.1** 2018අංක 19 දරන ජාතික විගණන පනතේ) 12 ඇ (වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් ඍජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

**2.2** 2018අංක 19 දරන ජාතික විගණන පනතේ) 12 ඊ (වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

**නීතිරීති / විධානයට යොමුව**

)අ (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

මුදල් රෙගුලාසි 371 හා 2015 ජූලි 14 දිනැති අංක 2015/3 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය

| | | |
|---|---|---|
| i. | ලබාගත් අත්තිකාරම් අදාළ කාර්යය නිමකොට කඩිනමින් පියවිය යුතු වුවත් අවස්ථා 48කදී ලබා දී තිබූ එකතු වටිනාකම රු3.,801,491ක අත්තිකාරම් පියවීම සඳහා දින 60සිට දින 291ක් දක්වා ප්‍රමාද වී තිබූ අතර අවස්ථා 17කදී එකතු වටිනාකම රු5.,528, 964ක විවිධ අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පියවා නොතිබුණි . | අත්තිකාරම් පිළිබඳ නීතිරීති නිසි පරිදි ක්‍රියාත්මක කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දී ඇත. |
| ii. | විශ්වවිද්‍යාලය විසින් 2016 සහ 2017 වර්ෂවල ලබාදුන් රු152., 672ක් වටිනා පුස්තකාල අත්තිකාරම් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවා නොතිබුණි. | අත්තිකාරම් පිළිබඳ නීතිරීති නිසි පරිදි ක්‍රියාත්මක කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දී ඇත. |
| iii. | අත්තිකාරම් ලබාදීමේදී නිසි පුරෝකථනයන් මත අත්තිකාරම් මුදල් ලබාදිය යුතු වුවත් අවස්ථා 52කදී රු1.,144, 606ක වියදමක් දැරීම සඳහා රු2.,877, 187ක් අත්තිකාරම් ලබා දී තිබුණි. | අත්තිකාරම් පිළිබඳ නීතිරීති නිසි පරිදි ක්‍රියාත්මක කරන ලෙස නිලධාරීන්ට උපදෙස් දී ඇත. |

**ආ විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය**

**(i) X පරිච්ඡේදය 1.9 වගන්තිය**

| | |
|---|---|
| කාර්ය මණ්ඩලය විසින් ලබාගන්නා නිවාඩු සඳහා විධිමත් නිවාඩු ලේඛනයක් නඩත්තු කළ යුතු වුවද නියැදි පරීක්ෂාවේ දී විද්‍යා පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා එවැනි ලේඛනයක් පවත්වා නොතිබුණි . | මෙය ක්‍රියාත්මක කිරීම සඳහා 88 වන විගණන කමිටුවේදී සාකච්ඡා කරන ලදී .එහිදී එය පීඨාධිපති කමිටුව හරහා දැනුවත් කර විශ්වවිද්‍යාලයේ සියලුම පීඨ සඳහා ක්‍රියාත්මක කිරීමට යෝජනා විය. |

**XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති**

| | |
|---|---|
| අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන් පැමිණීම හා පිටවීමේ වේලාවන් සටහන් කළ යුතු වුවත් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 618 දෙනෙකුගේ පැමිණීම හා නිවාඩු සනාථ කරගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ රු677.,219, 763ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ රාජකාරී කටයුතු පැය 08 ට සීමා කළ නොහැකිය .එසේම අදාළ ආචාර්යවරුන් විසින් පවත්වන දේශන සඳහා සහභාගි වන සිසුන්ගේ අත්සන් ලබා ගැනීමට සිදුවන අතර එය අදාළ ආචාර්යවරයා දේශන වලට පැමිණි බව සනාථ කරන්නකි.<br><br>එසේම සනාතන සභාව විසින් සම්මත කර ඇති නියමයන් අනුව ආචාර්යවරුන් කටයුතු කරනු ලැබේ . |

(ඇ 2015 (සැප්තැම්බර් 18 දිනැති අංක 2015/13 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය

| | |
|---|---|
| නිලවාහන හිමි තනතුරු දරන නිලධාරීන්ට අනුයුක්ත වාහන සඳහා ඉන්ධන දීමනාව මාසික වැටුපට එකතුකොට ගෙවීම් කළ යුතු නමුත් අදාළ නිලධාරීන්ට ඉන්ධන දීමනාවක් ලෙස නොගෙවා වෙන්කර ඇති වාහන සඳහා විශ්වවිද්‍යාලයේ ඉන්ධන ඇණවුම් මගින් ඉන්ධන ලබාදී තිබුණි .ඒ අනුව ඉන්ධන ඇනවුම් මගින් නිලධාරීන්ට හිමි මාසික ඉන්ධන දීමනාව ඉක්මවා රු1.,905, 898ක ඉන්ධන ලබා දී තිබුණි . | 2019 වර්ෂයේදී චක්‍රලේඛය අනුව කටයුතු කිරීම සඳහා පාලක මණ්ඩලයේ තීරණයට ඉදිරිපත් කර ඇත. |

**2.3** 2018අංක 19 දරණ ජාතික විගණන පනතේ) 12  උ (වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

**2.4** 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ) 12 ඌ (වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස ,කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

| | |
|---|---|
| අ. සැපයුම් අංශයේ 2018 වර්ෂයට අදාළ භාණ්ඩ ඇනවුම් පිළිබඳ නියැදි පරීක්ෂාවේදී අවස්ථා28 ක රු .16,434,490 ක් වටිනා භාණ්ඩ සැපයීම මාස 02 සිට මාස 11 දක්වා ප්‍රමාද වී තිබුණි . | භාණ්ඩ ලැබීම් ප්‍රමාදයන් ඇත .සැපයුම්කරුවන් සමඟ එළඹෙන ගිවිසුම් සංශෝධනය කර 2019ජනවාරි සිට සියළුම ප්‍රමාද සැපයුම්කරුවන්ගෙන් ප්‍රමාද ගාස්තු අය කර ගැනීමට කටයුතු කර ඇත. |
| ආ. ශ්‍රීපාලි මණ්ඩපයේ ජනමාධ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රායෝගික පුහුණු උපකරණ මිලදී ගැනීම සඳහා රු.12,441,324 ක් 2018 මැයි 02 දින ජපාන තානාපති කාර්යාලයෙන් ලැබී තිබුණද 2019 මැයි මාසය දක්වා එම මුදල් අදාළ අරමුණ වෙනුවෙන් යොදාගෙන නොතිබුණි. | ජපාන තානාපති කාර්යාලයෙන් ලැබුණු ඇ.ඩො. 80278 ක මුදල කාර්යක්ෂමව උපයෝජනය සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත .එහිදී ප්‍රසම්පාදන සඳහා ලංසු කැඳවීම සහ ඇගයීම ඇතුළු මූලික කාර්යයන් දැනටමත් සිදුකර ඇත) .ඇමුණුම 1) |
| ඇ. විද්‍යා පීඨයේ කේ.ජී ශාලාව ප්‍රතිසංස්කරණය සහ වහලය අළුත්වැඩියා කිරීම සඳහා ලංසු ආරාධනාව පුවත්පත් 03 ක පළකර තිබු අතර එක් එක් දැන්වීම් වල පැවති පරස්පරතාවය හේතුවෙන් නැවත සංශෝධිත දැන්වීමක් පළ කිරීමට සිදුව තිබු අතර ඒ හේතුවෙන් ආයතනයට සිදුවූ පාඩුව රු 229,185.ක් සහ ලංසුකරුවන් තෝරාගැනීම තවත් මාසයකින් ප්‍රමාද වීම සිදුව තිබුණි . | ලංසු ආරාධනා පත්‍රය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූල නොවී පුවත්පත් දැන්වීම පළවූ බැවින් හා ලංසු කාලය දීර්ඝ කිරීමට ලංසු කරුවන් විසින් පූර්ව ලංසු රැස්වීම තීරණය වීම නිසා නැවත දැන්වීම් පලකිරීමට සිදුවිය. |

## .3 වෙනත් නිරීක්ෂණ

| | |
|---|---|
| අ. ආයතනය තුළ සමාගමක් ආරම්භ කිරීමට පෙර ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන අමාත්‍යවරයාගේ නිර්දේශ සහිතව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වුවත් එවැනි අනුමැතියකින් තොරව සමාගම් පනත යටතේ 2013වර්ෂයේ දී කළම්බු සයන්ස් ඇන්ඩ් ටෙක්නොලොජි සෙල් නමින් ඇපයෙන් සීමිත සමාගමක් ලියාපදිංචි කර තිබුණි. මෙම සමාගමේ ප්‍රධාන කාර්යාලය කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයට අයත් ගොඩනැගිල්ලක පිහිටුවා විශ්වවිද්‍යාලය සතුව පවතින පරිගණක උපාංග ඇතුලු අනෙකුත් භෞතික හා මානව සම්පත් භාවිතා කර ඇති නමුත් විශ්වවිද්‍යාලය සතු දේපළ භාවිතය පිළිබඳ එකඟතා ගිවිසුමකට ඇතුළත් වී නොතිබුණි .සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ සම්පත් භාවිතය වෙනුවෙන් රු479., 684ක මුදලක් පමණක් විශ්වවිද්‍යාලය වෙත ගෙවා තිබුණි | මේ පිළිබඳව අවශ්‍ය කටයුතු කිරීම සඳහා 2017 ජුලි මස 04 වන දින ප.ව 2.30 ට කාමර අංක05 හි පැවති 93 වන පොදු ව්‍යාපාර පිළිබද කාරක සභා රැස්වීමේදී අමාත්‍යාංශ ලේකම්ට පවරන ලදී. |
| ආ අරමුදල් 123 කින් සමන්විත වූ "Designated Fund" නමින් වූ අරමුදලේ සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ගණුදෙණුවක් සිදු නොවූ අරමුදල්33 ක ට අදාළ රු.190,053,440ක වූ මුදලක් ඌණ උපයෝජිතව තිබුණි. | සමාලෝචිත වර්ෂය තුල රු මිලියන 309.4ක් වැයකර තිබිණි .ඒ අනුව උපයාගත් අරමුදල් ඌන උපයෝජිත ගණනට එකඟ නොවේ. |
| ඇ සමාලෝචිත වර්ෂයේදී සියයට 5.5 ක පොළී අනුපාතයක් යටතේ සත් දින ඉල්ලුම් තැන්පතු වල ආයෝජනය කර තිබුණු රු. 305,000, 000ක් වටිනා තැන්පතු07 කින් රු.55,000,000 ක් වටිනා තැන්පතු 04 ක් මාස 03 ක් තෙක් මුදල් කරගෙන නොතිබුණි .මෙම මුදල් ත්‍රෛමාසික තැන්පතු වල ආයෝජනය කර තිබුණේ නම් අවම වශයෙන් සියයට 10.5 ක පොළී ආදායමක් ලබාගැනීමට හැකියාව තිබූ අතර එසේ නොවීමෙන් රු.933,425 ක ආදායමක් ලබා ගැනීමේ හැකියාව මගහැරී තිබුණි. | විශ්වවිද්‍යාලයේ නව ගොඩනැගිලි ඉදි කිරීමේ කොන්ත්‍රාත්තු 04 ක් තිබෙන අතර එම ව්‍යාපෘතීන්ගේ ගෙවීම් කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් මුදල් ලැබෙන තෙක් ප්‍රමාද කිරීම තුලින් ගිවිසුම ප්‍රකාරව ඔවුනට දඩ මුදල් ගෙවීමට සිදුවන බැවින් සත් දින තැන්පතු වල පවතින අතිරික්ත මුදල් තැන්පත් කරන ලදී. විශ්වවිද්‍යාල අරමුදලින් වනුයේද ස්ථාවර තැන්පතු මගින් මුදල් ඉපයීම නොවන බවද කාරුණිකව දන්වනු කැමැත්තෙමි. |
| ඈ. කොළඹ විශ්වවිද්‍යාලයේ නේවාසික පහසුකම් ඉල්ලුම් කල ශිෂ්‍ය සංඛ්‍යාව හා එම පහසුකම ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව හා සැසඳීමේදී පළමු වසරේ සිට සිව්වන වසර දක්වා ශිෂ්‍ය කණ්ඩායම් සඳහා නේවාසික පහසුකම් ලබා දීම පිළිවෙලින් සියයට22 , 40, 44ක් සහ 33ක් ලෙස අවම මට්ටමක පැවති අතර නේවාසිකාගාර 06 ක තව දුරටත් සිසුන් 243 කට නේවාසික පහසුකම් සැපයීමට ඉඩපහසුකම් පැවති බව නිරීක්ෂණය විය .තවද වෙනත් නේවාසිකාගාර 02 ක් බදුකුලී පදනම මත ලබා ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂයේ රු5.,400, 000ක මුදලක් බදුකුලී ලෙස ගෙවා තිබුණි .මෙම නේවාසිකාගාරයන් හි නේවාසිකව සිටිය හැකි ශිෂ්‍ය සංඛ්‍යාව 108 ක් වුවද සත්‍ය වශයෙන් සිසුන් 55 ක් පමණක් නේවාසිකව සිටින බව නිරීක්ෂණය විය .මීට අමතරව භික්ෂු නේවාසිකාගාරය 2006 වර්ෂයේ සිට බදුකුලී පදනම මත පෞද්ගලික ගොඩනැගිල්ලක පවත්වාගෙන යන අතර මාසික කුලිය රු325., 000ක් බැගින් 2018 වර්ෂය සඳහා රු3.,900, 000ක් ගෙවා තිබුණි .මෙම නේවාසිකාගාරයේ භික්ෂූන් 50 කට නේවාසිකව සිටිය හැකි වුවද ශිෂ්‍ය භික්ෂූන් 15 ක් පමණක් සිටින බව නිරීක්ෂණය විය . | නිර්ණායකයන් සපුරන සියළුම ශිෂ්‍ය ශිෂ්‍යාවන්හට නේවාසිකාගාර පහසුකම් ලබා දී ඇති අතර නේවාසිකාගාරයන්හි පුරප්පාඩු පවතින අවස්ථාවන්හිදී නිර්ණායකයන් ඉක්මවූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්හටද නේවාසිකාගාර පහසුකම් ලබා දීමට කටයුතු කර ඇත.<br>නේවාසිකාගාර වෙත ශිෂ්‍යයන් අනුයුක්ත කිරීමට නොහැකි වූයේ පහත සඳහන් කරුණු හේතුවෙනි.<br><br>*මුත්තයියා නේවාසිකාගාරයෙහි" බී "ගොඩනැගිල්ලේ වහලය හා සිවිලිම අබලන් වී ඇති බැවින් එහි අළුත්වැඩියා කටයුතු සිදුකරන තෙක් එම ගොඩනැගිල්ලේ සිටි 66 දෙනාගෙන් ශිෂ්‍යාවන් 44 දෙනෙක් වෙනත් නේවාසිකාගාර වෙත) ද සේරම් නව, හැව්ලොක්, බුලර්ස් (අනුයුක්ත කිරීමට සිදු වුණි .<br><br>**හැව්ලොක් නේවාසිකාගාරයේ පැරණි ගොඩනැගිල්ලෙහි කොටසක් කඩා ඉවත් කළ යුතුව තිබූ බැවින් එහි සිටි ශිෂ්‍යාවන් 148 දෙනෙකු 2018 අගෝස්තු මස සිට ඉවත් කර ඇත.<br><br>***එසේම හේවා මාවත නේවාසිකාගාරයෙහි නාන කාමර තුනක ජල කාන්දු පවතින බැවින් ශිෂ්‍යාවන් |

| | |
|---|---|
| | 10දෙනෙකු හට නේවාසිකාගාරයෙහි නේවාසික පහසුකම් ලබා දීමට නොහැකි වුණි .ඒවා ලබා දෙනු ලබන්නේ අවසන් වසර ශිෂ්‍යාවන් සඳහා පමණි .එහි පවතින පුරප්පාඩු පිළිබඳව ශිෂ්‍යාවන් දැනුවත් කර ඇතත් නේවාසිකාගාර පහසුකම් ලබා ගැනීම සඳහා නොපැමිණීම හේතුවෙන් මෙහි පුරප්පාඩු ඇති වී ඇත.<br><br>රාජගිරිය හා බොරලැස්ගමුව නේවාසිකාගාර කුලී පදනම මත ලබා ගෙන ඇත.<br>රාජගිරිය නේවාසිකාගාරයේ ශාස්ත්‍ර පීඨ අවසන් වසර ශිෂ්‍යයන් 45 දෙනෙකු සඳහා නේවාසික පහසුකම් ලබා දී තිබුණි .බොරලැස්ගමුව නේවාසිකාගාරයේ භෞත චිකිත්සක සිසුන් 16 දෙනෙකු සඳහා සහ නීති පීඨ පළමු වසර සිසුන් 5 දෙනෙකු සඳහා නේවාසික පහසුකම් ලබා දී තිබුණි.<br><br>කොළඹ විශ්වවිද්‍යාලය කුලී පදනම මත ග්‍රීන්පාත් හි පිහිටි නිවස භික්ෂු නේවාසිකාගාරයක් ලෙස මෙතෙක් පවත්වාගෙන යාමට සිදුව ඇත්තේ භික්ෂූන් වහන්සේලා වෙනත් නිවසකට යාම ප්‍රතික්ෂේප කරන බැවිනි .තවද ඔබගේ විගණන විමසුමෙහි එහි 50 නමකට නේවාසික පහසුකම් සැපයිය හැකි බව පෙන්නුවද ,විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු කරනු ලබන නේවාසිකාගාර පහසුකම් ලැබීම සඳහා සුදුසුකම් ලද භික්ෂූන් 23 දෙනෙකු සඳහා නේවාසික පහසුකම් සපයා දී ඇත. කොළඹ විශ්වවිද්‍යාලය සඳහා භික්ෂු නේවාසිකාගාරයක අවශ්‍යතාවය ඇති නමුත් එය ඉදි කිරීම ප්‍රමාද වී ඇත්තේ එම ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා සුදුසු ඉඩමක් මෙතෙක් සොයා ගැනීමට නොහැකිවීම නිසා වන අතර 2018.05.09වන දින උපකුලපතිතුමා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත යවන ලද ලිපිය මඟින් කොළඹ විශ්වවිද්‍යාලය සඳහා භික්ෂු නේවාසිකාගාරයක අවශ්‍යතාවය දන්වා ඇතත් මෙතෙක් ඒ සම්බන්ධව ප්‍රතිචාර ලැබී නොමැත. |
| ඉ විද්‍යා පීඨයේ ශිෂ්‍ය ධාරිතාවය 515 ක් වුවද බඳවා ගත් ශිෂ්‍ය සංඛ්‍යාව 501 ක් වූයෙන් ශිෂ්‍යයින් 14 දෙනෙකු සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වී තිබූ අතර කළමනාකරණ පීඨය සඳහා බඳවා ගත හැකි ශිෂ්‍ය සංඛ්‍යාව 520 ක්ව තිබියදී 515 ක් පමණක් බඳවා ගැනීම තුළින් ශිෂ්‍යයි න් 05දෙනෙකු සඳහා විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමි වී තිබුණි . | විශ්වවිද්‍යාලයේ සියළුම පාඨමාලා සඳහා සිසුන් තෝරා එවනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසිනි .එය අදියර කීපයකින් සිදු වේ .නමුත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තෝරා එවනු ලබන සිසුන් සියල්ලම ලියාපදිංචි නොවේ .එබැවින් පුරප්පාඩු පවතින අතර විද්‍යා පීඨයේ ප්‍රායෝගික පරීක්ෂණ සහ ඒ හා සම්බන්ධ න්‍යායාත්මක පාඨමාලා අධ්‍යයන වර්ෂය ආරම්භ වි සති දෙකක කාලයකට පසු ලියාපදිංචි කල නොහැකි බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දන්වා ඇති නමුත් සිසුවාගේ පාඨමාලාව අනුව පීඨාධිපතිගේ විශේෂ අනුමැතිය මත සිසුන් එම කාලයෙන් පසුවද ලියාපදිංචි කරනු ලබන අවස්ථා ඇත.<br>කළමනාකරණ පීඨය සඳහා සිසුන් 520 කට ශිෂ්‍ය ලියාපදිංචිය සඳහා ලිපි සහ විද්‍යුත් තැපැල් මාර්ගයෙන් දැනුම් දුන්නද ලියාපදිංචිය සඳහා පැමිණියේ සිසුන් 515 පමණි .මේ පිළිබඳව විශ්වවිද්‍යාල ප්රතිපාදන කොමිෂන් සභාවට දන්වා ඇත. |
| ඊ. ශාස්ත්‍ර පීඨයේ ශිෂ්‍ය ධාරිතාවය 550 ක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දන්වා තිබුණ ද සත්‍ය වශයෙන්ම බඳවා ගැනීම් 713 ක් වූ අතර එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත වාර්තා කර තිබූ සංඛ්‍යාවට වඩා සියයට 29.6 ක වැඩි වීමකි . | 2017වර්ෂයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය වෙත යොමුකරන ලද දේශිය සිසුන් 191 ක්ද, ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක UGC/AD 10 Foreign-Select-to Uni 2017/2016දරණ 2017/09/06 ඇති ලිපිය අනුව විදේශීය සුදුසුකම් ලත් සිසුන් දෙදෙනෙකු ද භූතානයේ රජයේ වෛද්‍ය පීඨයක් ස්ථාපිතව නොතිබීම මත විදේශ අමාත්‍යාංශය මඟින් පීඨය වෙත යොමු කරන ලද ඉල්ලීමක් මත කොළඹ වෛද්‍ය පීඨය හා භූතාන රජය අතර ඇති කරගත් ගිවිසුම අනුව ඔවුන්ගේ DAHE/SSSD/TC( 343/2017-2016/(25දරණ 2017/04/05 ඇති ලිපිය අනුව යොමුකරන ලද සිසුන් 08 න් 05 දෙනෙකු ද ලියාපදිංචි වී ඇත) .එකී ගිවිසුම ප්‍රකාරව වාර්ෂිකව වෛද්‍ය පීඨයට භූතාන සිසුන් 10 ක උපරිමයක් ඇතුලත් කර ගත හැක.<br>එසේම 2018 වර්ෂයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ |

| | |
|---|---|
| | වෛද්‍ය පීඨය වෙත යොමුකරන ලද දේශීය සිසුන් 190 ක්ද, ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක UGC/Ad/AS/1Foreign ඇති ලිපිය අනුව විදේශීය සුදුසුකම් ලත් සිසුන් 10 ක්ද, භූතාන සිසුන් 5ක්ද,)ඔවුන්ගේ අංක DAHE/SSSD/TC( 2013/2018-2017/(25ලිපිය අනුව (ලියාපදිංචි වී ඇත.<br><br>ඒ අනුව 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාවේ සංඛ්‍යාත්මක වැඩිවීමක් පෙන්නුම් කළ ද, අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව ඉක්මවා විදේශීය සිසුන් බඳවාගෙන නොමැත.<br>විශ්වවිද්‍යාලයේ සියලුම පාඨමාලා සඳහා සිසුන් තෝරා එවනු ලබන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසිනි .එය අදියර කීපයකින් සිදු වේ .නමුත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තෝරා එවනු ලබන සිසුන් සියල්ලම ලියාපදිංචි නොවේ .එබැවින් පුරප්පාඩු පවතින අතර විද්‍යා පීඨයේ ප්‍රායෝගික පරීක්ෂණ සහ ඒ හා සම්බන්ධ න්‍යායාත්මක පාඨමාලා අධ්‍යයන වර්ෂය ආරම්භ වී සති දෙකක කාලයකට පසු ලියාපදිංචි කල නොහැකි බව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත දන්වා ඇති නමුත් සිසුවාගේ පාඨමාලාව අනුව පීඨාධිපතිගේ විශේෂ අනුමැතිය මත සිසුන් එම කාලයෙන් පසුවද ලියාපදිංචි කරනු ලබන අවස්ථා ඇත.<br>කළමනාකරණ පීඨය සඳහා සිසුන් 520 කට ශිෂ්‍ය ලියාපදිංචිය සඳහා ලිපි සහ විද්‍යුත් තැපැල් මාර්ගයෙන් දැනුම් දුන්නද ලියාපදිංචිය සඳහා පැමිණියේ සිසුන් 515 පමණි .මේ පිළිබදව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දන්වා ඇත.<br>නීති පීඨයට බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව තීරණය කරනු ලබන්නේ නීති පීඨය මඟින් වන අතර බඳවා ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි නොවීමට හේතු නීති පීඨයෙන් විමසා යවා ඇති අතර පිළිතුරු ලැබුණු පසු හේතු ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වේ.<br>සාමාන්‍යයෙන් කලා පීඨය සඳහා සාමාන්‍ය ප්‍රවේශය සඳහා සිසුන් 550 ක් ලියාපදිංචි කර ගනී .<br><br>ඊට අමතරව පහත හේතු නිසා සිසුන් ප්‍රමාණය 605 දක්වා වැඩි වී ඇත .<br>*විශේෂ පාඨමාලා සඳහා සිසුන් ලියාපදිංචි කිරීම) New Admission for Special Subjects)<br>*අතිරේක ප්‍රවේශය සඳහා සිසුන් ලියාපදිංචි කිරීම) Additional Intake)<br>*විශේෂ අවශ්‍යතා ඇති සිසුන් ලියාපදිංචි කිරීම) Blind & Disabled Students) |
| එ. 2018දෙසැම්බර් 31 දිනට ගිවිසුම් හා බැඳුම්කර කඩ කල ආචාර්යවරුන් 25 දෙනෙකුගෙන් රු52.,650, 521ක මුදලක් අයවීමට තිබුණි . | ගිවිසුම් හා බැඳුම්කර කඩ කල ආචාර්යවරුන්ගෙන් අයවීමට ඇති මුදල් විවිධ ක්‍රම මගින් ලබා ගැනීම සඳහා කටයුතු කර ඇත.) ඇමුණුම 2( |

| | |
|---|---|
| ඒ. සමාලෝචිත වර්ෂය අවසාන වන විට මහාචාර්ය හා කථිකාචාර්ය අනුමත තනතුරු 723 ක් පැවති අතර තථ්‍ය සංඛ්‍යාව 586 ක් වීමෙන් පුරප්පාඩු 137 ක් විය .මේ තුළ ජ්‍යෝෂ්ඨ මහාචාර්ය තනතුරු පුරප්පාඩු 27 ක් පැවතුණි .අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 183 ක් පැවතුණි. | 2018.12.31 දින වන විට මහාචාර්ය හා කථිකාචාර්ය අනුමත තනතුරු 723 ක් තිබෙන අතර තථ්‍ය සංඛ්‍යාව 586 ක් වේ. ඒ අනුව පුරප්පාඩු ඇත්තේ 137 කි.<br><br>2018 වර්ෂය තුළදී නව බඳවා ගැනීම් 62 ක් සිදුකල අතර වර්ෂය අවසාන වන විට ඊට සාපේක්ෂව ආචාර්යවරුන් 24 දෙනෙක් සේවයෙන් විශ්‍රාම ගැනීම, ස්ථාන මාරු වීම, සේවයෙන් ඉල්ලා අස්වීම, සේවය හැර ගියා සේ සැලකීම, සේවය අවසන් වීම හා සේවයෙන් නිදහස් කිරීම මඟින් කාර්ය මණ්ඩලයෙන් ඉවත්වීම නිසා සැලකිය යුතු පුරප්පාඩු සංඛ්‍යාවක් විශ්වවිද්‍යාලය තුළ ඇතිවීම වැළැක්විය නොහැකි බව වැඩි දුරටත් දන්වා සිටිමි .<br><br>කෙසේ වුවද ,මෙම පුරප්පාඩු පිරවීම සඳහා විශ්විද්‍යාලය විසින් පුවත්පත් දැන්වීම් පල කිරීම, තේරීම් කමිටු පවත්වා බඳවා ගැනීම් සිදුකිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදුකර ගෙන යමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි) .ඇමුණුම 3 ) |
| ඔ 2018 (වර්ෂයේ මූලධන වියදම් වෙනුවෙන් භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන රු.565,000,000 ක වටිනාකමින් රු 141,820,522.ක් පුනරාවර්තන වියදම් සඳහා වැය කර තිබුණි .එය ලද මුළු මූලධන ප්‍රතිපාදනයෙන් සියයට 18.76 ක් විය. | ප්‍රාග්ධන වියදම් සඳහා ලැබූ මුදලින් පහත සඳහන් ආකාරයට පුනරාවර්තන වියදම් දරා ඇත.<br><br>1. ගොඩනැගිලි අළුත්වැඩියා රු.105,993,603<br>2. පර්යේෂණ හා සංවර්ධන රු.32,293,513<br>3. ධාරිතා ගොඩනැගීම රු.2,033,466<br>4. තත්ව සහතික කිරීම රු.1,500,500<br><br>1. ගොඩනැගිලි අළුත්වැඩියා<br><br>මෙම මුදල වියදම් කර ඇත්තේ එම වර්ෂය තුල වියදමක් ලෙස කපා හැරිය හැකි ගොඩනැගිල්ලේ වටිනාකම වැඩි නොවන ආකාරයෙන් කරනු ලබන, එදිනෙදා කළ යුතු අළුත්වැඩියා කටයුතු ආදිය වෙනුවෙන් දැරූ වියදම් සඳහාය.<br><br>2. පර්යේෂණ හා සංවර්ධන<br><br>පර්යේෂණ හා සංවර්ධන සඳහා ප්‍රාග්ධන සම්පාදනයෙන් අවම වශයෙන් 10% හෝ වෙන් කළ යුතු බවට ප්‍රතිපත්තිමය තීරණයක් භාණ්ඩාගාරය, අමාත්‍යාංශය ගෙන ඇත. ඒ අනුව වෙන් කරනු ලබන මුදලින් පර්යේෂණ සඳහා ගනු ලබන ප්‍රාග්ධන ස්වරූපයේ එනම් වර්ෂ කිහිපයක් පවතින ක්ෂය කළ හැකි වත්කම් ප්‍රාග්ධනිත කරන අතර ඉතිරි වැය පුනරාවර්තන ලෙස එම වර්ෂයේදීම කපා හරියි. මෙම මුදල් විලම්භිත අයභාර ලෙස තබා පර්යේෂණ අවසානයේදී එම වියදම් කපා හැරීමේ ගැටළුව පවතින බැවින් එම වර්ෂයේ වියදම ලෙස ගනු ලැබේ.<br>මෙම ක්‍රමය අපගේ දැනුම අනුව නිවැරදි ක්‍රමයක් යැයි හැඟෙන බැවින් වෙනත් ගිණුම් තැබීමේ ක්‍රමයක් ඇත්නම් එම ක්‍රමය යෝජනා කරන ලෙස ඉල්ලමි. එසේ වුවහොත් 2019 වර්ෂයේ සිට එම ක්‍රමයට ගිණුම් තැබිය හැක.<br><br>3. ධාරිතා ගොඩනැගීම හා තත්ව සහතික කිරීම |

| | |
|---|---|
| | මානව සම්පත් වැඩි දියුණු කිරීම් ගිණුම් වලට ගැනීමේ හා ක්ෂය කිරීමේ ක්‍රමයක් නොමැති බැවින් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම් ගත කර ඇත. වෙනත් ක්‍රමයක් ඇත්නම් යෝජනා කරන මෙන් ඉල්ලමි. |
| ඕ. ශාක විද්‍යා අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකු තම රෝගී තත්ත්වය හේතුවෙන් වරින් වර වෛද්‍ය නිවාඩු, විවේක නිවාඩු, සප්ත වාර්ෂික නිවාඩු ලබාගෙන තිබූ අතර ,2015 2017සහ 2018 යන වර්ෂවලදී සේවයට වාර්තා කළ අවස්ථා 03 ක් වූ නමුත් දේශන වලට සහභාගි වීම හා පර්යේෂණ සුපරීක්ෂණය කිරීම යන කාර්යයන් වල නියැලී සිටි බව තහවුරු කිරීමේ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය 2018 .වර්ෂයේ අධ්‍යයන කාලසටහන තුළ මෙම මහාචාර්යවයා වෙනුවෙන් දේශන පැය වෙන් කර නොතිබූ අතර මාස09 ක කාලය සඳහා රු3.,397, 055ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි .එසේම විද්‍යා පීඨයේ ආචාර්යවරයෙකුගේ විශ්‍රාම දිනය නිශ්චිත කරගැනීමට නොහැකි වීම හේතුවෙන් දේශන සහභාගීත්වයකින් තොරව වැටුප් හා දීමනා ලෙස මාස 5 ක් සඳහා රු1.,012 , 674ක් ගෙවා තිබුණි. | එම මහාචාර්යවරයා විසින් ඔහුගේ සප්ත වාර්ෂික නිවාඩු කාල සීමාව සඳහා 01-11-2015) සිට-10-2017 31දක්වා (අදාළ පර්යේෂණ ක්‍රියාකාරකම් සම්බන්ධ විද්‍යා පීඨයේ අනුමැතිය සහිත වාර්තාව-03-2019 19දිනැති ලිපිය මඟින් එවා ඇත) .ඇමුණුම 5)<br><br>තවද, මෙම ආචාර්යවරයා 21.02.2019 දිනැති ලිපිය මඟින් 21.05.2019 දින සිට සේවයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එම ඉල්ලීම විශ්වවිද්‍යාලයේ 10.04.2019 වන දින පැවති 551 වන පාලක සභාව විසින් අනුමත කර ඇත.<br>විද්‍යා පීඨයේ ආචාර්යවරයාගේ විශ්‍රාම යන දිනය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ UGC/HR/4/13/40 ලිපියට අනුව තීරණය කර ඇත. |



**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය චන්ද්‍රිකා එන් .විජේරත්න**

**උපකුලපති**

පිටපත් : ලේකම් /නගර සැලසුම්,ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
අධ්‍යක්ෂ ජනරාල්/ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව ,මහා භාණ්ඩාගාරය
අධ්‍යක්ෂ ජනරාල් / ජාතික අයවැය දෙපාර්තමේන්තුව ,මහා භාණ්ඩාගාරය